199 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 199 - இல. 10
**Volume 199 - No. 10**

2011 ජූනි 10 වන සිකුරාදා
2011 யூன் 10, வெள்ளிக்கிழமை
**Friday, 10th June, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ශෝක ප්‍රකාශය:**
ගරු ආචාර්ය නිශ්ශංක විජයරත්න මහතා

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
හඟුරන්කෙත මාදන්වෙල රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) -
[ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා] - පළමුවන වර කියවන ලදී

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා:**
පොලිතීන්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන සැලසීම සඳහා ජනාධිපති කොමිසමක්
කොළඹ නගරයේ වැසි ජලය බැස යාම ක්‍රමවත් කිරීම

**කල් තැබීමේ යෝජනාව:**
හොරණ ශ්‍රීපාලි මණ්ඩපය ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලයට අනුයුක්ත කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**அனுதாபத் தீர்மானம்:**
மாண்புமிகு கலாநிதி நிஸ்ஸங்க விஜயரத்ன

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
ஹங்குரான்கெத மாதென்வல ரஜ மகா விகாரை அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) –
[மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன] – முதன்முறை மதிப்பிடப்பட்டது

**தனி உறுப்பினர் பிரேரணைகள்:**
பொலித்தீன், பிளாஸ்டிக் போன்ற கழிவுப் பொருட்களை அழித்துவிடுவது தொடர்பாக பொதுமக்களுக்கு அறிவூட்டுமுகமாக நாடளாவிய ரீதியிலான நிகழ்ச்சித்திட்டமொன்றினை அமுலாக்குதல்
அரசியல் பழிவாங்கல்களுக்கு உள்ளானவர்களுக்கான நிவாரணம் அளிக்குமுகமாக சனாதிபதி ஆணைக்குழு
கொழும்பு நகரில் மழைநீர் வழிந்தோடுவதை ஒழுங்கு முறையாக்கல்

**ஒத்திவைப்புப் பிரேரணை:**
ஹொரணை ஸ்ரீ பாலி வளாகத்தை அரங்காடற் பல்கலைக்கழகத்துடன் இணைத்தல்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

VOTE OF CONDOLENCE:
Hon. (Dr.) Nissanka Wijeyeratne

PRIVATE MEMBERS' BILLS:
Hanguranketha Madanwela Rajamaha Vihara Development Foundation (Incorporation) –
[The Hon. Eric Prasanna Weerawardhana] - Read the First time

PRIVATE MEMBERS' MOTIONS:
Implementation of an Island Wide Programme to Educate the Masses in Destroying Waste Material such As Polythene, Plastic et cetera
Presidential Commission on Political Victimization
Regulating the Drainage of rainwater in the City of Colombo

ADJOURNMENT MOTION:
Affiliation of Horana Sripalee Campus with University of Performing Arts

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2011 ජුනි 10 වන සිකුරාදා*
*2011 யூன் 10, வெள்ளிக்கிழமை*
*Friday, 10th June, 2011*

*අ. භා. 1.30ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.*
*பாராளுமன்றம் பி.ப.1.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.30 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2010 වර්ෂය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 පෙබරවාරි 19 දිනැති අංක 1693/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 අප්‍රේල් 08 දිනැති අංක 1700/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 02 දිනැති අංක 1704/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(iv) (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව (2011 මැයි 16 දිනැති අංක 1706/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) සහ

(v) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 16 දිනැති අංක 1706/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග. [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් 2007 සහ 2008 වර්ෂ සඳහා ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා කෘෂිකර්ම කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු චන්දිම වීරක්කොඩි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Chandima Weerakkody - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) බූස්ස, කඳුරපේ, "ශාන්ති" නිවසෙහි පදිංචි එස්. චන්ද්‍රසේන ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ගාල්ල, ආනන්ගොඩ, විජයානන්ද මාවත, "වානු" නිවසෙහි පදිංචි යූ.ජී. ගාමිණීමහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) බද්දේගම, බද්දේගම දකුණ, "අමරගිරි" නිවසෙහි පදිංචි ඩී.කේ. අමරසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) ගාල්ල, කලේගාන, අද්දරකුඹුර, අංක 23 ඒ දරන ස්ථානයේ පදිංචි ඩී.ඩී.එස්. සැම්සන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) අතුරුගිරිය, මිලේනියම්සිටි, කලාප 04, නො. 1036 දරන ස්ථානයේ පදිංචි ඒ.ඒ. ප්‍රියකාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා - පැමිණ නැත.
ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා - පැමිණ නැත.
ගරු ගුණරත්න වීරකෝන් මහතා - පැමිණ නැත.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මම අම්බලන්ගොඩ එබේරමුල්ල, අංක 05 දරන ස්ථානයෙහි පදිංචි එල්.ඒ. බන්දුල සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Hon. Speaker, I present the following petitions:

1. A petition from Mrs. Rathnagopal Dilliamma of Vanatha Vasam, Annaicoddai, Jaffna;
2. A petition from Mr. Rasu Antony of No. 76/4, Rajasingham Veethy, Thirunagar, Jaffna

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මම බලන්ගොඩ, හටන්ගල පදිංචි ශ්‍රී.වී. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, මම උහන, ශ්‍රී. 7/11 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්. ජේමාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වසන්ත සේනානායක මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### මාතර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල් : යටිතල පහසුකම්
### மாத்தறை கோட்டக் கல்விக் காரியாலயம் நிருவகிக்கும் பாடசாலைகள் :உட்கட்டமைப்பு வசதிகள்
### SCHOOLS ADMINISTERED BY MATARA DIVISIONAL EDUCATION OFFICE : INFRASTRUCTURE FACILITIES

0930/’10

2. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මාතර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව, එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

(ii) ගොඩනැඟිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැඟිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවන් සපුරාලීම මඟින් මෙම පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම අවශ්‍යතාවන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் மாத்தறை வலயக் கல்விக் காரியாலயத்தின் கீழ் வரும் மாத்தறை கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படுகின்ற அரசாங்கப் பாடசாலைகளில்,

(i) துப்பரவு ஏற்பாட்டு வசதிகளற்ற பாடசாலைகளின் எண்ணிக்கை மற்றும் அப்பாடசாலைகளின் பெயர், முகவரிகள் யாவை,

(ii) கட்டிடத் தேவைப்பாடு கொண்ட பாடசாலைகளின் பெயர்கள் மற்றும் தேவைப்படும் கட்டிடங்களின் எண்ணிக்கை யாது,

என்பதை அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஆ) மேற்குறிப்பிட்ட தேவைகளைப் பூர்த்தி செய்வதனால் இப்பாடசாலைகளின் கல்வியில் தர ரீதியான அபிவிருத்தி ஏற்படுகின்றதென்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) அவ்வாறாயின், இத்தேவைகளை நிறைவு செய்வ தற்குத் தேவையான நிதியை இப்பாடசாலைகளுக்கு வழங்க அவர் நடவடிக்கை மேற்கொள்வாரா,

(ii) இதற்கு எவ்வளவு காலம் தேவைப்படும்

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House, in respect of the government schools administered by the Matara Divisional Education Office which comes under the Matara Zonal Education Office in Matara District,

(i) the number of schools without sanitary facilities and names and addresses of those schools; and

(ii) the names of the schools with building requirements and the number of buildings required ?

(b) Will he admit that a qualitative and quantitative development of education of the aforesaid schools will take place as a result of fulfilling the above mentioned requirements ?

(c) If so, will he state -

(i) whether action will be taken to provide the necessary allocations to fulfil those requirements; and

(ii) the period of time taken for it ?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 02යි.

01. මාර/කැකනදුර විජයබා කනිෂ්ඨ විද්‍යාලය - කැකනදුර

02. මාර/උනැල්ල ජයන්ති කනිෂ්ඨ විද්‍යාලය - උනැල්ල, පාලටුව

(ii) ගොඩනැඟිලි අවශ්‍යතා ඇති පාසල් නොමැත.

(ආ) ඔව්.

(ඇ) (i) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත කටයුතු කරමි.

(ii) මූල්‍ය පහසුකම් ලැබෙන ආකාරය අනුව කාලය තීරණය වේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. මේ පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයට පසු ගිය කාලයේ ලොකු ශක්තියක් වුණා, ගුණාත්මක යෙදවුම්. ගුණාත්මක යෙදවුම්වල පරිභෝජ්‍ය වියදම් සඳහා ලැබෙන මුදල ඉස්සරට වඩා භාගයකින් අඩු වෙලා තිබෙනවා. ප්‍රාග්ධන මුදල් ලැබෙන්නේම නැහැ. මේ නිසා පාසලට අවශ්‍ය කබඩ් එකක් මිලදී ගන්න, ඩීවීඩී,සීඩී යන්ත්‍රයක් මිලදී ගන්න හෝ ඒවායේ නඩත්තු කටයුතු ඇනහිටලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ප්‍රශ්න විසඳා ගන්න ඉතා වැදගත් වන්නේ ප්‍රාග්ධන වියදම් සඳහාත් යම් කිසි මුදලක් ලබා දීමයි. මේ වසරේදී ඒ ගැන අමාත්‍යාංශයේ අවධානය යොමු කරනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අවශ්‍ය පරිගණක, ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකක, ගණිතාගාර ඇතුළු මේ සියලු කාරණා සඳහා පළාත් සභා මඟින්නුත්, මධ්‍යම රජය මඟින්නුත් ප්‍රාග්ධන වියදම් සපයනවා. විශේෂයෙන්ම දරුවන්ගේ අධ්‍යයන කටයුතු සඳහා තමයි ඒ මුදල් ලබා දෙන්නේ. නමුත් ඔබතුමා මේ කියන කාරණාව පිළිබඳව විමර්ශනය කරලා, සොයලා බලලා, කටයුතු කරන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය. පාසල්වල ගුණාත්මක යෙදවුම් සඳහා මුදල් වෙන් කරන්නේ පාසල්වල ළමයි සංඛ්‍යාවට ප්‍රතිශතාත්මකව?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

පාසල්වල ළමයි සංඛ්‍යාව සහ ප්‍රතිශතය අනුවත් එහෙම කරනවා. ඒ නිර්ණායකයන් දෙකම සංසන්දනය කරලා තමයි ඒ කටයුතු කරන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

හරි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා සඳහන් කළා, ප්‍රාග්ධන වියදම් දෙන්න සූදානම් කියලා ගුණාත්මක යෙදවුම්වලට. එතකොට මගේ ප්‍රශ්නය වන්නේ දැන් අවුරුදු තුනක් තිස්සේ මේ මුදල් නොලැබීමයි.

අවුරුදු තුනක් තිස්සේ ගුණාත්මක යෙදවුම්වලට දෙන මුදලින් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පරිභෝජ්‍ය වියදම්වලින් ලැබෙන්නේ 2007 දුන්නාට වඩා අඩක් විතර අඩු මුදලක්. ප්‍රාග්ධන වියදම් 2008 අවුරුද්දේ ඉඳලා මේ දක්වා ලැබෙන්නේම නැහැ. මම ඉතා වග කීමක් ඇතුව මේ කියන්නේ. දැන් අවුරුදු තුනකින් නොලැබිලා ලැබෙන්න යන වෙලාවක මේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කියන විධියට මේ වසර තුළ ලැබෙනවා නම් ඒ ලබා දෙන මුදල සාධාරණව වැඩි විය යුතු මුදලක්ය කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිගන්නවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, ගුණාත්මක යෙදවුම් සඳහා මුදල් යෙදවීම සම්බන්ධයෙන් පළාත් සභාවට අපි පැහැදිලි නිර්ණායකයන් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මුළු රටේම පාසල් පද්ධතිය තුළ දැවැන්ත සංවර්ධනයක් ඇති කරමින් පවතින්නේ. ඒ, පාසල් දහසේ ව්‍යාපෘතිය සහ ප්‍රාථමික පාසල් නඟා සිටුවීමේ වැඩ පිළිවෙළ. මේ කාරණා දෙකේදී මධ්‍යම රජයත්, පළාත් සභාවත් ඒකාබද්ධව කටයුතු කරනවා. මේ කාලය පොඩ්ඩක් සංක්‍රාන්ති කාලයක් වාගේ තියෙන්නේ. මොකද මේ කාලයේ මේ වැඩ පිළිවෙළ සකස් කරමින් මුළු රට පුරා ව්‍යාප්ත වෙමින් ගත කරන කාලයක්. ඉතින් යම් ස්ථානයක අඩු පාඩුවක් තිබෙනවා නම් ඔබතුමාගේ ප්‍රශ්නය පිළිබඳ අපි අවධානය යොමු කරන්න සූදානම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

මම ස්තුතිවන්ත වනවා, සාධනීය පිළිතුරක් මට ලැබීම පිළිබඳව. මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි ගරු කථානායකතුමනි. දැන් පාසල් දහසේ ව්‍යාපෘතිය තිබෙනවා. ජාතික පාසල් තිබෙනවා. මේ ටිකම එකතු කළාම 1,500ක් කියමුකෝ. තව පාසල් 8,000ක් විතර තිබෙනවා. මේ ගුණාත්මක යෙදවුම්වල ප්‍රතිලාභය ලැබෙන්නේ මේ අනිකුත් පාසල් 8,000ට. දැන් පළාත් සභාවලට ඔබතුමන්ලා මේක දෙන්න කිව්වාට පළාත් සභාවලට යවන මුදල් වෙන වෙන කාරණාවලට යොදවන්නේ. ඒ නිසා මම ඉතා ගෞරවයෙන් ඇමතිතුමාගෙන් ඉල්ලනවා, ගුණාත්මක යෙදවුම්වල මේ ප්‍රාග්ධන වියදම් සඳහා දෙන මුදල් දැන් අවුරුදු තුනක් තිස්සේ නොලැබුණු නිසා මේ මුදල් අමාත්‍යාංශයෙන් යවද්දී මේ මුදල් අනිවාර්යයෙන්ම ගුණාත්මක යෙදවුම්වල ප්‍රාග්ධන වියදම් කියන අංශයට පමණක්ම යෙදවිය යුතුයි කියන තැනට පළාත් සභාවලට අවධාරණය කරන්න ඔබතුමා මැදිහත් වන්නය කියා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, ගුණාත්මක යෙදවුම් සඳහා ප්‍රාග්ධන වියදම් ලබා දීම පළාත් සභාව නිසියාකාරව කරනවාද කියා සොයා බලා ඉක්මනින් ඒකට පිළියමක් යොදන්න සූදානම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

## ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන් : ශිෂ්‍යාධාර
## இலங்கையிலுள்ள பல்கலைக்கழக மாணவர்கள்: உதவித் தொகை
## UNIVERSITY STUDENTS IN SRI LANKA : BURSARIES

1038/'10

4. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අධ්‍යාපනය ප්‍රගුණ කිරීම සඳහා ලබා දෙන සහන කවරේද;

(ii) එම සහනයන් ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට ශිෂ්‍යාධාර ලබා දෙන සිසුන් සංඛ්‍යාව කවරේද;

(iv) ලබා දෙන ශිෂ්‍යාධාරය සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රමාණවත්ද;

(v) ප්‍රමාණවත් නොවන්නේ නම්, ඊට හේතු කවරේද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இலங்கையின் பல்கலைக் கழகங்களில் கல்வி பயிலுகின்ற மாணவ மாணவிகளுக்கு கல்வியை வளர்த்துக்கொள்வதற்கு வழங்கப்படும் சலுகைகள் யாவையென்பதையும்,

(ii) மேற்படி சலுகைகளைப் பெற்றுக்கொள்கின்ற மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்,

(iii) தற்போது மாணவர் உதவித் தொகையைப் பெற்றுக் கொள்ளும் மாணவர்களின் எண்ணிக்கை யாதென்ப தையும்,

(iv) பெற்றுக்கொடுக்கப்படும் மாணவர் உதவித் தொகைகள் மாணவர்களின் கல்வி நடவடிக்கைக ளுக்கு போதுமானதா என்பதையும்,

(v) போதியதாயில்லாதிருப்பின் அதற்கான காரணம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education:

(a) Will he state-

(i) the assistance provided for University students in Sri Lanka at present to pursue their higher education ;

(ii) the number of students who receive such assistance ;

(iii) the number of students who receive bursaries at present ;

(iv) whether the bursary so provided is adequate for the educational activities of students ; and

(v) if it is inadequate, the reasons for it?

(b) If not, why?

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

(අ) (i)

- මූල්‍යාධාර
  - මහපොළ ශිෂ්‍යත්වය
  - ශිෂ්‍යාධාර
  - පරිත්‍යාග ශිෂ්‍යත්ව
- වෘත්තීය මාර්ගෝපදේශනය
- පරිගණක හා තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය
- ඉංග්‍රීසි අධ්‍යාපනය
- පුස්තකාල පහසුකම්
- නේවාසිකාගාර පහසුකම්
- සහනදායී ප්‍රවාහන ප්‍රවේශ පත්‍ර
- සහනදායී මිලට ආහාර පාන
- වෛද්‍යාධාර
- ආගමික හා සංස්කෘතික ක්‍රියාකාරකම්
- ක්‍රීඩා හා විනෝදාංශ

(ii)

| **සහනයන්** | **සහනයන් ලබන සිසුන් සංඛ්‍යාව** |
|---|---|
| මහපොළ ශිෂ්‍යත්වය | 2005/2006 අධ්‍යයන වර්ෂය -සිසුන් 7989<br>2006/2007 අධ්‍යයන වර්ෂය -සිසුන් 7811<br>2007/2008 අධ්‍යයන වර්ෂය -සිසුන් 8787<br>2008/2009 අධ්‍යායන වර්ෂය-සිසුන් 9006<br>2009/2010 අධ්‍යයන වර්ෂය -සිසුන් 8868 |
| ශිෂ්‍යාධාර | 2010 වර්ෂය සිසුන් 17953ක් සඳහා |
| පරිත්‍යාග ශිෂ්‍යත්ව (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින්) | 2010 වර්ෂය සිසුන් 51ක් සඳහා |
| වෘත්තීය මාර්ගෝපදේශනය | |
| පරිගණක/තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය | |
| ඉංග්‍රීසි අධ්‍යාපනය | |
| පුස්තකාල පහසුකම් | සියලුම සිසුන් සඳහා |
| සහනදායී ප්‍රවාහන ප්‍රවේශ පත්‍ර | |
| සහනදායී මිලට ආහාරපාන | |
| වෛද්‍යාධාර | |
| ආගමික හා සංස්කෘතික ක්‍රියාකාරකම් | |
| ක්‍රීඩා හා විනෝදාංශ | |
| නේවාසිකාගාර පහසුකම් | එක් එක් විශ්වවිද්‍යාලවල නිර්ණායකයන් අනුව තෝරා ගත් සිසුන් සඳහා |

(iii) ශිෂ්‍යාධාර - 2010 වර්ෂය සිසුන් 17953 සඳහා

(iv) ප්‍රමාණවත් වේ.

(v) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා, ඒ ලබා දුන්න පිළිතුර පිළිබඳව. මගේ අතුරු ප්‍රශ්න තුනක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම විශ්වවිද්‍යාලවල සිසුන්ට නේවාසිකාගාර පහසුකම් ලබා දීමේදී ලොකු ඌනතාවක් මේ වන විට පවතිනවා. මම අහන්න කැමැතියි ඔබතුමාගෙන්, ඒ අඩු පාඩුකම් සපුරාලන්නට ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද, මේ නේවාසිකාගාර ප්‍රශ්නයට තිරසාර විසඳුමක් ලබා දෙන්න කොපමණ කාලයක් ගත වනවාද කියන එක.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එතැනම ප්‍රශ්න දෙකක් නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

එක ප්‍රශ්නයයි.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, නේවාසිකාගාර අපි හදා ගෙන යනවා. මේ වසරේත් අපි විශ්වවිද්‍යාලවල නේවාසිකාගාර 12කට මුදල් වෙන් කරලා තිබෙනවා. නමුත් අපි උත්සාහ කරන්නේ සියලු දෙනාට මුළු කාලය තුළ නේවාසිකාගාර දෙන්න නොවෙයි. අප උත්සාහ කරන්නේ පළමුවෙනි වසරේ සහ අවසාන වසරේ දරුවන්ට නේවාසිකාගාර ලබා දෙන්නයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. මේ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයට අදාළ කාලීන ගැටලුවක් තිබෙනවා, ඔබත් මමත්, අප සියලු දෙනාත් දන්නා. ඒක තමයි විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැඩ වර්ජන නිසා සිසු පරපුරට බලවත් හානියක් සිද්ධ වෙලා තිබෙන එක. ඔබතුමාම මේ උත්තරීතර සභාව තුළදී පිළිගත්තා විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ටත්-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ලබා දුන් පිළිතුරුවලට ඒ අතුරු ප්‍රශ්නය අදාළ නැහැ මන්ත්‍රීතුමා. ඔබතුමා මොන පිළිතුරටද ඒ අතුරු ප්‍රශ්නය අහන්නේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම ඒ අතුරු ප්‍රශ්නය අහන්නේ, මේ වන විට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හදාරණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අධ්‍යාපනය ප්‍රගුණ කිරීම සඳහා ලබා දෙන සහන යටතේයි. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ අධ්‍යාපනික දැනුම ලබා දෙන මහාචාර්යවරුන්ගේ ප්‍රශ්නය සෘජුවම තිබෙනවා. එය විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනට බලපාන නිසායි මම මේ අතුරු ප්‍රශ්නය අහන්නේ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මම තවම ඇහුවේ නැහැ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පොඩ්ඩක්-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම තවම ඇහුවේ නැහැ. සමා වෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුරුවලට ප්‍රකාරව විශ්වවිද්‍යාල සිසු පරපුරේ අධ්‍යාපනයට සෘජුවම බලපානවා මේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැඩ වර්ජනය සහ එහි අද තිබෙන වර්තමාන තත්ත්වය. ඔබතුමාත් මේ ගරු සභාව තුළ පිළි අරගෙන තිබෙනවා විශේෂයෙන්ම ඉහළ වැටුප් තලයක විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, මහාචාර්යවරුන් ස්ථාපනය කළ යුතුයි කියලා. ඒ වාගේම බුද්ධි ගලනය වළක්වාලීමටත් මේක බොහෝ සේ ඉවහල් වෙනවා. ඒ නිසා මම අහන්න කැමැතියි ඔබතුමාගෙන් කවදාද විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ කථිකාචාර්යවරුන්ට සාධාරණ වැටුපක් ලබා දෙන්නට කටයුතු කරන්නේ කියලා?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ අදහස අනුව ඒ අතුරු ප්‍රශ්නය කිසි සේත්ම මේ ප්‍රශ්නයට අදාළ නැහැ. හැබැයි මෙතුමාට කරන ගරු කිරීමක් හැටියට මම ඒ ගැන කියන්න කැමැතියි.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට වැටුප් ප්‍රශ්නයක් තිබෙනවා. ඒක වැඩි කරන්න ඕනෑ. ඒක එක රැයෙන්, එක අය වැයෙන් කරන්න බැහැ. ඒකට කාලයක් ගත වෙනවා. ඒ නිසාම තමයි පසු ගිය අය වැයෙන් සියලුම රජයේ සේවකයන්ට සියයට 5ක වැටුප් වැඩි වීමක් දෙන වෙලාවේ මේ අයට සියයට 36.25ක වැටුප් වැඩි වීමක් දුන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන සහ අවසාන අතුරු ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම විශ්වවිද්‍යාල සිසු පරපුරේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය පිළිබඳවයි මා මේ අහන්නේ. මා හිතන්නේ ඔබතුමා කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ හොරණ ශ්‍රීපාලි මණ්ඩපය සෞන්දර්ය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන්නට තීන්දුවක් අර ගෙන තිබෙනවා. මම හිතනවා ඒක වැරැදි තීන්දුවක් කියලා. ඒ ගත්තු තීන්දුව කවදාද වෙනස් කරන්නේ කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, ඒක මේ ප්‍රශ්නයට කිසිම අදාළකමක් නැහැ. ගරු මන්ත්‍රීවරයෙක් ඒ සම්බන්ධ යෝජනාවක් අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව හැටියට ඉදිරිපත් කරලා තිබෙනවා. ඔබතුමාට ඕනෑ නම් ඒ අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. එතකොට මම උත්තර දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මට ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමා අවසර දෙනවා නම් මට පුළුවන් උත්තර දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මට නම් තිබෙන්නේ ස්ථාවර නියෝග අනුව ක්‍රියා කිරීමේ වගකීමයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වැදගත් දෙයක් අහන්නේ. ඒ මහපොළ ශිෂ්‍යාධාර සම්බන්ධයෙනුයි. සිසුන් 28,300ක් ගන්නවා විශ්වවිද්‍යාලවලට. ගරු ඇමතිතුමාගේ පිළිතුරෙන් හෙළිදරව් වුණේ 17,953කට විතරයි මුල්‍ය ආධාර ලබා දෙන්නේ කියන එකයි. මම මීට පෙරත් මේ ප්‍රශ්නය ඇහුවා. මම කිව්වා සියයට 55කට විතරයි එය ලබා දෙන්නේ කියලා. ඉතිරි අයගේ ඉදිරි අනාගතය සරු සාරවත් කරලා ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ කොහොමද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, ඇත්තටම අප මේ සහනාධාරය දෙන්නේ ආර්ථික වශයෙන් කිසියම් දුෂ්කරතා තිබෙන අයට තමයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දුෂ්කරතා තිබෙන ළමයින් සියයට 55කට 57කට වැඩිය ඉන්නවා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
විශ්වවිද්‍යාලවල එහෙම අය හිටියා. හැබැයි දැන් රටේ ආර්ථිකය ටිකක් උඩට ඇවිල්ලා. ඔය හුඟක් දරුවන්ගේ දෙමව්පියන් රජයේ සේවකයන්. රජයේ සේවකයන්ගේ ආදායමත් එක්ක ගත්තාම මේ තිබෙන නිර්ණායකයන් අනුව ඒ අයට-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රුපියල් 2,500ක වැටුප් වැඩිවීම ලබා දුන්නා නම් ප්‍රශ්නයක් වන්නේ නැහැ. ඒක දුන්නේ නැති නිසා ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ශිෂ්‍යාධාර ලබා ගන්න පුළුවන් වන්නේ රජයේ සේවයේ නැති දෙමවුපියන්ගේ දරුවන්ටයි. බහුතරයක් අයගේ දෙමවුපියන් රජයේ සේවයේ ඉන්නවා. එහෙත් දෙමවුපියන් රජයේ සේවයේ සිටියත්, දරුවන් දෙදෙනෙක් විශ්වවිද්‍යාලයේ ඉන්නවා නම් අපි ආධාර කරනවා. ඒ නිසා ඔය ගෙවන මුදල හොඳටම ප්‍රමාණවත්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6 -1145/'11 - (1) , ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මම සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7- 0658/'10 - (1) , ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පිළිතුරක් ලැබේවි කියන අපේක්ෂාවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මා මාසයක් කල් ඉල්ලනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, අපි ඊයේත් මේ ගැන කථා කළා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය හා සමාන ප්‍රශ්නයක් 08 වැනි දා අහලා, ඒ සඳහා අපි කල් ගත්තා. මේ ප්‍රශ්නය පළමු වරට අසන ප්‍රශ්නයක් ගරු කථානායකතුමනි. එම ප්‍රශ්නය අධිකරණය ඉදිරියේ තිබෙන කරුණකට අදාළ ප්‍රශ්නයක් නිසා එදා කල් ගත්තා. මේ ප්‍රශ්නය පළමු වන වතාවටයි අහන්නේ, ගරු කථානායකතුමනි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8- 0931/'10 - (1) , ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா )
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## දිළිඳු බවෙන් පෙළෙන පවුල්: විස්තර
## வறுமையில் வாடும் குடும்பங்கள்: விபரம்
## POVERTY-AFFLICTED FAMILIES : DETAILS

1039/'10

9. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 දෙසැම්බර් වන විට ශ්‍රී ලංකාවේ සිටි දිළිඳු බවෙන් පෙළෙන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුප්පත් පවුල් සංඛ්‍යාව ජනගහනයෙන් කවර ප්‍රතිශතයක්ද;

(iii) දුප්පත්කම ගණනය කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) එම ක්‍රමවේදය මඟින් සිදු කරනු ලබන ගණනය කිරීම් නිවැරදි වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 டிசம்பர் மாதமளவில் இலங்கையில் உள்ள வறுமையில் வாடும் குடும்பங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்,

(ii) இந்த ஏழைக் குடும்பங்களின் மக்கள் தொகையின் சதவீதம் யாதென்பதையும்,

(iii) வறுமையைக் கணிப்பிடும்போது பின்பற்றப் படுகின்ற முறைமையியல் யாதென்பதையும்,

(iv) இந்த முறைமையியலின் மூலம் மேற்கொள்ளப் படுகின்ற கணிப்பீடு சரியானதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state-

(i) the number of families afflicted with poverty in Sri Lanka as at December 2010;

(ii) the number of such poor families as a percentage of the total population;

(iii) the methodology adopted in calculating poverty ; and

(iv) whether calculations made using that methodology are accurate?

(b) If not, why ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් කරනු ලබන ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව 2009ට හා 2010ට ඇස්තමේන්තු කර ඇති දිළිඳු ගෘහ ඒකක සංඛ්‍යාව 3,57,834කි.

(ii) 2009 හා 2010 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ ප්‍රකාශිත ඇස්තමේන්තු අගයනයට අනුව දිළිඳු ජනගහනයේ ප්‍රතිශතය (දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ජනගහනයේ ප්‍රතිශතය) සියයට 7.6ක් පමණ වේ.

(iii) නිල දරිද්‍රතා රේඛාව එක් මසකට, එක් පුද්ගලයකුගේ අවම මූලික ආහාර සහ ආහාර නොවන අවශ්‍යතාවන් පිරිමසා ගැනීම සඳහා වැය වන වියදම ලෙස අර්ථ දැක්වේ. මාසික ඒක පුද්ගල මුළු පරිභෝජන වියදම දරිද්‍රතා රේඛාවට අඩු ගෘහ කාණ්ඩයන්හි වෙසෙන පුද්ගලයන්, දරිද්‍රතාවෙන් පෙළෙන්නන් ලෙස හැඳින්වෙන අතර එම ඒක පුද්ගල මුළු පරිභෝජන වියදම (ආහාර සහ ආහාර නොවන) ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් කරනු ලබන ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ පරිභෝජන හා වියදම් දත්ත උපයෝගී කර ගෙන ගණනය කරනු ලැබේ.

(iv) ඉහත ක්‍රමවේදය ජාත්‍යන්තරව පිළිගනු ලබන විද්‍යාත්මක ක්‍රමවේදයකි.

(ආ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, කරුණාකරලා (අ) (i) කොටසට පිළිතුර නැවත කියනවාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
3,57,834යි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ඔබතුමාගේ පිළිතුර අනුව අතුරු ප්‍රශ්න 03ක් තිබෙනවා අහන්න. ඔබතුමා සඳහන් කරපු ගෘහස්ත ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව ගෘහයක මූර්ත ආදායම සියයට 2කින් පහළ ගිහිල්ලා තිබෙනවා, 2006-2007 සහ 2009-2010 අතර.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
කොහෙන්ද ඒ සංඛ්‍යා ලේඛන ගත්තේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක ගෘහස්ත ආදායම් සහ වියදම් සමීක්ෂණයෙන්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, එහෙම වෙලා නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙම වෙලා තිබෙනවා. ඒක සත්‍යයක්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
එහෙම වෙලා නැහැ. මම ඔබතුමාට පැහැදිලි කරන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ ප්‍රශ්නය මා ඔබතුමාට යොමු කරන්නම්. ගෘහයක මූර්ත වියදමත් පහළ වැටිලා තිබෙනවා සියයට 3.6කින්. එතකොට මට ඔබතුමාගෙන් අහන්න තිබෙන්නේ මේකයි. මේ 2006-2007 සහ 2009-2010 කියන කාල වකවානු තුළ ගෘහස්ත මූර්ත ආදායම සියයට 2කින් අඩු වෙන කොට කොහොමද හිටිහැටියේම සියයට 15.2 ඉඳලා සියයට 7.6 දක්වා දුප්පත්කම අඩු වුණේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මා කියන්නම්. 2006 සහ 2007 කියන වර්ෂ දෙකේ ගෘහ ඒකකයක සාමාන්‍ය ඉපැයීම රුපියල් 26,286යි. නමුත් 2009-2010 වෙන කොට ගෘහ ඒකකයක ඉපැයීම රුපියල් 36,451ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ ගෘහ ඒකකයක ඉන්න පුළුවන් 05 දෙනෙක්, 06 දෙනෙක්. එතකොට 2006-2007 කාල වකවානුව සංසන්දනය කරලා බැලුවාම 2009-2010 කාල වකවානුව වෙන කොට ගෘහ ඒකකයක මුළු ඉපැයීම වැඩි වෙලා තිබෙනවා 36,451ක් දක්වා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමා වෙන්න. ඔබතුමා සඳහන් කරන්නේ නාමික. මා කියන්නේ, මූර්ත. නාමික කියන්නේ nominal. මූර්ත කියන්නේ real. ඒ කියන්නේ උද්ධමනයෙන් පසුව තමයි මූර්ත වෙන්නේ. මා කථා කළේ මූර්ත ගැන.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමා මේ කියන කථාව කියන්නේ; මූර්තමය කියන අගය ඔබතුමා හඳුන්වන්නේ ඔබතුමාටම ආවේණික වූ ක්‍රමවේදයකින්.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, නැහැ. එහෙම කොහොමද කියන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම පැහැදිලිව කියන්නම්. මේක මේ ගේන්න හදන්නේ වෙන තැනකට. මට තේරෙනවා එන්න හදන තැන.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද එන්න හදන තැන?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
2006 සහ 2007 කියන වර්ෂයන් හා සන්සන්දනය කරලා බැලුවාම 2009 සහ 2010 කියන වර්ෂයන් වන කොට ගෘහ ඒකකයන්හි ආදායම රුපියල් 36,000 දක්වා වැඩි වෙලා තිබෙනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කොහේද තිබෙන්නේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ - Department of Census and Statistics - වාර්තාවේ තිබෙන්නේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකරලා ප්‍රශ්නය අහන්න. ප්‍රශ්නයට උත්තරයට දෙන්න. කථා බහ, දෙබස් කරන්න ඉඩ දෙන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම ඔබතුමා කියන එක පිළිගන්නේ නැහැ. මගේ සටහන අනුව මම කියන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. 2010 දී අපේ රටේ සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 15ක් ඉන්නවා. හරියටම ගණන 15,73,000ක්. දළ වශයෙන් ගත්තොත් අපේ රටේ මුළු ජනගහනය පවුල් ලක්ෂ 49යි. එතකොට ප්‍රතිශතයක් හැටියට සියයට 32.6කට සමෘද්ධිය ලැබෙනවා. එහෙනම් කොහොමද දුප්පත්කමෙන් පෙළෙන ප්‍රතිශතය සියයට 7.6 වෙන්නේ? මොකද සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක වෙන්නේ දුගී දුප්පත්කම තුරන් කරන්න නොවෙයිද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු මන්ත්‍රීතුමා, මම ඒකයි කිව්වේ ඔබතුමා මේ කියන්න හදන ක්‍රමයෙන් සමහර විට මේ සභාව නොමඟ යන්න පුළුවන් කියලා. මොකද මේ සමෘද්ධිය කියන එක ගණනය කරන්නේ මෙහෙමයි. සමෘද්ධිලාභියාට සමෘද්ධිය ලැබුණාට පස්සේත්, මේ පවුල් සවි බල ගැන්වූවාට පස්සේත් ඔහු සමෘද්ධියට ඇතුළු වෙනවා.

එතකොට ඒක සමෘධිය ලබන පවුල් හැටියට නොවෙයි, සමෘද්ධි ප්‍රතිලාභයේ අනෙකුත් කොටස් ලැබෙන හැටියටයි සලකන්නේ. ඒ නිසා සමෘද්ධි පවුලක් සමෘද්ධි මට්ටමෙන් ඉහළ මට්ටමකට පත් වෙන කොට ඒ අය විවිධ වැඩසටහන්වලට ඇතුළු වෙලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඇහුවේ සමෘද්ධි මුද්දරය ලැබෙන අය ගැනයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

සම්පූර්ණ දුප්පත්කමේ ඉන්න පවුල් හැටියට ඒක ගණන් ගන්න එපා. ගරු කථානායකතුමනි, ඒක වැඩසටහන ඇතුළේ තිබෙනවා. සමෘද්ධි මුද්දරය ලැබෙන එක නොවෙයි, ඊට මෙහා පැත්තේ ඉන්න අනෙකුත් දීමනාවලට ඇතුළු වෙච්ච අය සම්පූර්ණයෙන් සමෘද්ධි වැඩසටහනේ ඉන්නවා. ඒක ගණනය කරන්න බැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් ඊ ළඟ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම බොහොම සාධාරණ ප්‍රශ්නයක් ඇහුවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

සාධාරණ ප්‍රශ්නයට උත්තරය දුන්නා. තමුන්නාන්සේ ඒ පිළිතුරෙන් සෑහීමකට පත් වෙන්න. ඒකෙන් අහන්න අනෙක් අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

පොඩ්ඩක් ගමේකමට උදව්වක් කරන්න. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය ඇහුවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැහැ, නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැහැ, නැහැ. ගරු කථානායකතුමනි, මම කිව්වේ සමෘද්ධිලාභී පවුල් කියන්නේ සමෘද්ධි මුද්දරය ලබන පවුල්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවන අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, සමෘද්ධිලාභී පවුල් කියන කොට මුද්දර තිබෙන අයම නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් තමුන්නාන්සේ පිළිතුරක් දුන්නා නේ. ඒ ඇති. ඊ ළඟට ඒකෙන් ප්‍රශ්නයක් අහනවා නම් ඒකට පිළිතුරු දෙන්න. දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න. නැත්නම් දීපු පිළිතුරෙන් සෑහීමකට පත් වෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

හොඳයි. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම අහනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වර්තමාන ආණ්ඩුව විවිධ සංවර්ධන ක්‍රියාදාමයන් දියත් කරනවා. ඒ දියත් කිරීමේ වැඩසටහන් හරහා සමාජයේ තිබෙන අසමානතාව - inequality එක - අඩු කරන්නට ඔබතුමන්ලා ඇපකැප වෙනවා. නමුත් මේ ගෘහස්ථ ආදායම් සහ වියදම් සංඛ්‍යා ලේඛනවලට අනුව 2006- 2007 සහ 2009-2010 සංසන්දනය කළාම පොහොසත්ම සියයට 20 බුක්ති විඳපු ගෘහස්ථ ආදායම සියයට 55.1 ඉඳලා සියයට 54.1ට අඩු වෙලා තිබෙනවා. නමුත් දුප්පත්ම සියයට 20 ඒ ගෘහස්ථ ආදායමෙන් බුක්ති වින්ද කොටස වැඩි වෙලා තිබෙන්නේ 4.4 සිට 4.5 දක්වා. දශම එකයි වැඩි වෙලා තිබෙන්නේ. ඉතින් මම අහන්න කැමැතියි, ඔබතුමන්ලා මේ වර්තමාන ආණ්ඩුව හරහා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ක්‍රියාත්මක කරන දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන හරහා මේ ඇති හැකි - නැති බැරි පරතරය අවම කිරීම අසාර්ථක වෙලා තිබෙනවා නේද කියලා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

නැහැ, අසාර්ථක වෙලා නැහැ. කලින් මේ සමීක්ෂණය වසර පහකට සැරයක් කළේ. දැන් වසර තුනකට සැරයක් කරනවා, ශීඝ්‍ර ආර්ථික වර්ධනයත් එක්ක. දැන් ඔබතුමාගේ සමහර සංඛ්‍යා ලේඛන වසර පහකට කලින් කරපු සමීක්ෂණවලින් ගත්ත ඒවා. නමුත් දැන් මෑතක ඉඳලා -2007 ඉඳලා- මේක වසර තුනෙන් තුනට කරනවා. ආදායම් මට්ටම වැඩිවෙමින් පවතිනවා. සාමාන්‍යයෙන් ලෝකයේ ඕනෑම රටක මේ පරතරයේ වෙනසක් තිබෙන බව ඇත්ත. නමුත් අපේ රටේ සාමාන්‍ය ජනතාවගේ ආදායම් මාර්ගය වැඩි වෙලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 11 - 1146/'11-(1), ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සීමාසහිත රක්නා ආරක්ෂණ ලංකා සමාගම: විස්තර
## வரையறுக்கப்பட்ட ரக்னா ஆரக்சன லங்கா கம்பனி:விபரம்
## RAKNA ARAKSHANA LANKA LIMITED : DETAILS

0690/ `10

**12. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) සීමාසහිත රක්නා ආරක්ෂණ ලංකා සමාගම සංස්ථාපිත කරනු ලැබුයේ කවදාද;

(ii) එම සමාගමේ කොටස්කරුවන් සහ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iii) ඉහත කී සමාගම ආරක්ෂක සේවා සපයන රාජ්‍ය ආයතනවල නම් කවරේද;

(iv) එම රාජ්‍ය ආයතන සඳහා ආරක්ෂාව සැපයීම සඳහා වූ කොන්ත්‍රාත් පිරිනමා ඇත්තේ නිසි ටෙන්ඩර් පරිපාටිය අනුවද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සීමාසහිත රක්නා ආරක්ෂණ ලංකා සමාගම එක් ආරක්ෂක නිලධාරියෙකු සඳහා අය කරන ගාස්තු ප්‍රමාණය කොපමණද;

(ii) ආරක්ෂක සේවා සැපයුම් අංශයේ මෙම වෙනස සිදු වීමට පෙර, ආරක්ෂක සේවා සැපයූ පෞද්ගලික අංශයේ සමාගම් අය කළ මුදල කොපමණද;

(iii) සීමාසහිත රක්නා ආරක්ෂණ ලංකා සමාගමේ ආරක්ෂක නිලධාරියෙකුට හිමි දෛනික සහ මාසික ගෙවීම් සහ අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

(iv) පසු ගිය වර්ෂ 3 සඳහා මෙම සමාගමේ ලාභ - අලාභ ගිණුම් වාර්ෂික පදනමින් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) வரையறுக்கப்பட்ட ரக்னா ஆரக்சன லங்கா கம்பனி எப்போது கூட்டிணைக்கப்பட்டது என்பதையும்,

(ii) அந் நிறுவனத்தின் பங்குதாரர்களினதும் பணிப் பாளர்களினதும் பெயர்களையும்,

(iii) மேற்படி கம்பனி பாதுகாப்புச் சேவை வழங்கும் அரசாங்கத் தாபனங்களின் பெயர்களையும்,

(iv) மேற்படி அரசாங்கத் தாபனங்களுக்கு பாதுகாப்புச் சேவையை வழங்குவதற்கான ஒப்பந்தம் முறையான கேள்விப் பத்திர நடைமுறை மூலமாக வழங்கப் பட்டதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) `ரக்னா ஆரக்சன லங்கா' நிறுவனத்தால் ஒரு பாதுகாப்பு அதிகாரிக்கு அறவிடும் கட்டணத்தையும்,

(ii) இச்சேவை பாதுகாப்புச் சேவைத் துறைக்கு மாற்றப்பட்ட தருணத்தில், பாதுகாப்புச் சேவையை வழங்கிவந்த தனியார்துறை கம்பனிகள் அறவிட்ட தொகையையும்,

(iii) வரையறுக்கப்பட்ட ரக்னா ஆரக்சன லங்கா கம்பனியின் பாதுகாப்பு அதிகாரியொருவருக்கு உரித்தான நாளாந்த மற்றும் மாதாந்த கொடுப்பனவு மற்றும் ஏனைய சலுகைகள் ஆகியவற்றையும்,

(iv) வரையறுக்கப்பட்ட ரக்னா ஆரக்சன லங்கா கம்பனியின் கடந்த மூன்று வருடங்களுக்கான இலாப நட்டக் கணக்குகளை வருடவாரியாகவும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state-

(i) as to when the Rakna Arakshana Lanka Limited was incorporated;

(ii) the names of the shareholders and the directors of the organization;

(iii) the names of the Government entities to which the aforesaid company provides security service; and

(iv) whether the contracts to provide security to those Government entities have been offered through the proper tender procedure?

(b) Will he also state-

(i) the rate charged per Security Officer by Rakna Arakshana Lanka Limited;

(ii) the amount used to charge by the private sector companies that provide security services, when the change was taken over in the security service sector;

(iii) the daily and monthly payments and any other benefits entitled to a security officer of the Rakna Arakshana Lanka Limited; and

(iv) the profit and loss account, of Rakna Arakshana Lanka Limited for the last three years on per year basis?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා

වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2006 ඔක්තෝබර් මස 23 දින ස්ථාපිත කරන ලදී.

(ii) ජයසුන්දර පුංචි බණ්ඩාර මහතා (ලේකම් - මුදල් අමාත්‍යාංශය), ප්‍රනාන්දු වඩුගේ පාලිත පියසිරි මහතා,(හමුදා සම්බන්ධීකරණ නිලධාරි -රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය), සිරිසේන සුනිල් ශාන්ත කුමාර මහතා (ලේකම් -සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය), වික්‍රමසිංහ බටදූවේ කිරින්දගේ උදේනි අයෝධ්‍යා මහතා(ලේකම් - ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යාංශය), පීරිස් පීටර් මොහාන් මෛත්‍රී මහතා (නීතිපති) හා හෙට්ටිආරච්චි සිරිපාල මහතා (අතිරේක ලේකම් - රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය) මෙම සමාගමේ කොටස්කරුවන් වන අතර අධ්‍යක්ෂවරු ලෙස ප්‍රනාන්දු වඩුගේ පාලිත පියසිරි මහතා, වික්‍රමසිංහ බටදූවේ කිරින්දගේ උදේනි අයෝධ්‍යා මහතා, හෙට්ටිආරච්චි සිරිපාල මහතා හා මරුක්කුදේව මහින්ද සාලිය මහතා කටයුතු කරනු ලැබේ.

(iii)
1. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
2. සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්
3. රජයේ කර්මාන්ත ශාලාව
4. මුදල් අමාත්‍යාංශය (මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ල)
5. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
6. පරමාණුක බලශක්ති අධිකාරිය
7. සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය
8. ශ්‍රී ලංකා වරාය අධිකාරිය- හම්බන්තොට වරාය
9. නාගරික සංවර්ධන අධිකාරිය -සෙත්සිරිපාය
10. ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී
11. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය
12. ලංකා බැංකුව
13. ලංකා රෝහල
14. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
15. අන්තරායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය
16. ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් (කටුනායක)
17. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
18. ඩී.පී.ග්ලෝබල් වෙන්චර් (පුද්ගලික) සමාගම
19. මාර්ග සංවර්ධන අධිකාරිය - බත්තරමුල්ල අධිවේගී මාර්ග කළමනාකරණ ව්‍යාපෘති කාර්යාලය
20. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
21. ආදායම් දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත
22. ජාතික රක්ෂණ භාර අරමුදල
23. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

(iv) ඔව්. මෙය රජය සතු ආයතනයකි.

(ආ) කොටසේ දීර්ඝ විස්තරයක් තිබෙනවා. කියවන්නද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, එක පුද්ගලයෙකුට කීයක් ගෙවනවාද කියලා කියන්න?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

(ආ) (i) කොට්ඨාස කළමනාකාර සඳහා රුපියල් 2,000ක් ද, ස්ථාන භාර නිලධාරි සඳහා රුපියල් 1,500ක් ද, කනිෂ්ඨ ආරක්ෂක නිලධාරි සඳහා රුපියල් 1,250ක් ද, කාන්තා ආරක්ෂක නිලධාරිනියන් සඳහා රුපියල් 1,250ක් ද දිනකට වැටුප ලෙස අය කරයි. මේ සියලු දෙනාම සේනාවල සිට විශ්‍රාම ගිය නිලධාරින්ය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඇමතිතුමනි, දෛනිකවද ඒ මුදල ගෙවන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Yes.

(ii) එම සමාගම් අය කළ මුදල් පිළිබඳ විස්තර මෙම අමාත්‍යාංශය සතුව නොමැත.

(iii) ස්ථාන භාර නිලධාරි,අවි සහිත/ පැය 08. දෛනික ගෙවීම - රු. 600.00යි. මාසික ගෙවීම - රු. 21,500.00 කනිෂ්ඨ ආරක්ෂක නිලධාරි, අවි සහිත/ පැය 08. දෛනික ගෙවීම රු.500.00යි. මාසික ගෙවීම රු.18, 900.00

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

කාන්තා ආරක්ෂක නිලධාරි, දෛනික ගෙවීම රු. 450.00යි. මාසික ගෙවීම රු.15,600.00

ආරක්ෂක නිලධාරින්ගේ ගෙවීම් අවි සහිත / අවි රහිත හා පැය 08 / පැය 10 / පැය 12 වැඩ මුර මත වෙනස් වේ.

ප්‍රතිලාභ

නොමිලේ නේවාසිකාර පහසුකම් ලබා දීම, නොමිලේ නිල ඇඳුම් කට්ටලයක් නිකුත් කිරීම, නොමිලේ රාත්‍රි තේ සලාකය, කම්කරු වන්දි රක්ෂණ ක්‍රමය යටතේ එක් අයෙකුට රුපියල් ලක්ෂ පහාමාරක (5 1/2) රක්ෂණය, සහනදායී ක්‍රමය යටතේ ඇස් කණ්නාඩි ලබා දීම, නොමිලේ වෛද්‍ය පරීක්ෂාව, නොමිලේ නීති උපදෙස්, වසර 05ක සේවා කාලයෙන් පසු පාරිතෝෂික දීමනාවක් හා වාර්ෂික ප්‍රසාද දීමනා ලබා දීම, පිට පළාත්වල සිට පැමිණ කොළඹ නේවාසිකව රාජකාරි කරන ආරක්ෂක නිලධාරින්/ නිලධාරිනියන්හට රුපියල් 1000ක මාසික දීමනාවක් ලබා දීම, සුබසාධන පවුල් සෞඛ්‍ය සේවාවන් නොමිලේ ලබා දීම හා මරණාධාර අරමුදල් ලෙස රුපියල් 150,000 දක්වා ලබා දීම මෙම සමාගම මඟින් නිලධාරින්ට ලබා දෙන ප්‍රතිලාභ ලෙස දැක්විය හැක.

(iv)

| ගිණුම් වර්ෂය | 2007/2008 | 2008/2009 | 2009/2010 |
|---|---|---|---|
| බදු පසු ලාභය | රු.13,465,727.00 | රු.57,480,862,00 | රු.71,972,473.00 |

(ඇ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තුතියි ගරු ඇමතිතුමනි. ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නයේ (ආ) (i) යටතේ අතුරු ප්‍රශ්නයක් අහනවා. ගරු ඇමතිතුමන් කිව්වා, වැඩ කරන security නිලධාරියකුට දවසකට රුපියල් 1,250ක් ලැබෙනවා කියලා. ඒ ගොල්ලන් හුඟ දෙනෙක් ඒ ගොල්ලන්ගේ අදහස් සහ ප්‍රශ්න තිබෙන අපට ඉදිරිපත් කර තිබෙනවා. ඒ ගොල්ලන්ට රුපියල් 17,800යි මාසයකට ලැබෙන්නේ. මෙතැන සියයට 45ක විතර පරතරයක් තිබෙනවා. රජයේ ආයතනයක් ලබා ගන්නා ඒ ශ්‍රමයට මාසයකට රුපියල් 33,400ක් ලැබෙන්න නියමිතව තිබෙනවා. නමුත් ගෙවන්නේ රුපියල් 17,800යි. මේ අයට මීට වැඩිය සාධාරණ ගෙවීමක් කරන්න බැරිද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ කරුණ පැහැදිලිව විස්තර කළා, ගරු කථානායකතුමනි. ඉතා වැදගත් වන්නේ, මේ සියලු දෙනාම සේනාවන්ගෙන් විශ්‍රාම ගිය නිලධාරින් වන එක. අපේ රට ආරක්ෂා කිරීමට පරිත්‍යාගයෙන් කටයුතු කරපු නිලධාරින් තමයි ඒ අය. ඒ අයගේ විශ්‍රාමයෙන් පසුවයි මේ සේවයට අරගෙන තිබෙන්නේ. ඒ ගැනත් සැලකිලිමත්වන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක වැරදියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දෙවැන්න, මේවා කේන්ද්‍රීය ස්ථාන. මේවා 2006 දීයි පටන් ගත්තේ. කොටි ගහනකොට කේන්ද්‍රීය ස්ථාන ආරක්ෂා කරන්න මෙවැනි ආරක්ෂක ආයතනයක් අවශ්‍ය නිසායි පටන් ගත්තේ. ඒකත් හොඳින් මතක තබා ගන්න. ඒ අනුව වාර්ෂිකව මේ සහන එන්න එන්න වැඩි කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියන කාරණාව පිළිබඳ වැඩි විස්තරයක් අපිට සපයන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමා පාර්ලිමේන්තුව නොමඟ යවන්න එපා. මෙහි වැඩ කරන අයට ඔබතුමන්ගේ පිළිතුර අනුව මාසයකට රුපියල් 37,700ක් ලැබෙන්න නියමිතයි. නමුත් ඒ අයට ලැබෙන්නේ රුපියල් 17,800යි කියන එක තමයි මා ප්‍රශ්න කළේ. උත්තරය සම්පූර්ණයෙන් වෙනස්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මා පාර්ලිමේන්තුව නොමඟ යවන්න උත්සාහ දැරුවේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අහපු ප්‍රශ්නයට උත්තර ලබා දෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා අහගෙන හිටියා නම් මේ කාරණය පැහැදිලි වනවා.

මම පැහැදිලි කළා පැය 08ක වැඩ මුරය,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ. අහ ගන්න. පැය 10ක වැඩ මුරය, පැය 12ක වැඩ මුරය වශයෙන් මේ දීමනා වෙනස් වෙනවා කියලා. ඒ අනුව ඔබතුමාට දීලා තිබෙන තොරතුරු ගැන යළිත් සොයා බලන්න. තව කාරණා තිබෙනවා නම් අහන්න. අපි කාරක සභාවේදී පිළිතුරු දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමා, ඔබතුමාගෙන් මම නැවත අහනවා. දවසකට ලැබෙන මුදල් ප්‍රමාණය රුපියල් 1,250යි. සමස්තයක් වශයෙන් පෞද්ගලික අංශය එක්ක බැලුවොත් සියයට 40ක් වැඩියෙන් ගෙවනවා. ගෙවන ප්‍රමාණය වැඩි වුණත්, ඒ වැඩ කරන පුද්ගලයාට ලැබෙන්නේ රුපියල් 17,600යි. මේක සාමාන්‍යයෙන් පෞද්ගලික අංශයත් එක්ක සම කළොත් ඒ ලැබෙන ප්‍රමාණය හරි. නමුත් රජයේ ආයතනයක් ටෙන්ඩර් නැතිව මේ කටයුතු භාර ගෙන සියයට 40ක් වැඩිපුර ගන්නවා. ඇයි මේවාට සාධාරණය ඉෂ්ට කරන්න බැරි? මේක පැය 8කට වැඩ කරන එකක් නොවෙයි. හැම කෙනාම වැඩ කරන්නේ පැය 8යි; overtime පැය 4යි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රජයේ සේවයට අමතරව අපි මේ අයට විශාල සහනයන් දෙනවා. ඒක මම කිව්වා. ඒ ගැන ඔබතුමා අවධානය යොමු කරන්න. ඔබතුමා ගණනක් හදා ගෙන, ඒක වැඩි කිරීම, එකතු කිරීම මත අහන ප්‍රශ්නයක් මේක. වැඩි කිරීම, එකතු කිරීමත් වැරදියි. හරියට වැඩි කරලා බලන්න. වැඩ කරන දින ගණන සහ අතිරේක පැය ගණන. මේ අය විශ්‍රාම ගිය අය. ඔබතුමා පිළිගන්නවාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම පිළිගන්න අවශ්‍ය නැහැ. ඒ අහිංසක වැඩ කරන අය වෙනුවෙන් තමයි මම මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අහිංසක වැඩ කරපු අය ගෙදර තියනවාද? විශ්‍රාම ගිය අය තමුන්නාන්සේලා ගෙදර තිබ්බා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට නොවෙයි මේ මුදල් ලැබෙන්නේ. ඒ අය ඔබතුමාගෙන් ප්‍රශ්නය අහලා තිබෙන්නේ සාධාරණ පිළිතුරක් ලබා දෙයි කියන බලාපොරොත්තුවෙන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අතක් නැති සොල්දාදුවෝ ඇවිල්ලා මේ රාජකාරි කරනවා මගේ ඇස් දෙකට දැකලා තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. ඒ වාගේ කවුරුවත් නැහැ. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ අයව හෙළා දකින්න එපා. තමුන්නාන්සේලා ඒ එක්කෙනෙකුටවත් සැලකුවේ නැහැ.එක්කෙනෙකුටවත් සැලකුවේ නැහැ. [බාධා කිරීමක්] ඒ අය වෙනුවෙන් සේවාවක් ඇති කළාම ඒක හෙළා දකින්න එපා. [බාධා කිරීමක්] ලජ්ජාවක් තිබෙන්න ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
උත්තර දෙන්න බැරි වුණාම පාර්ලිමේන්තුවේ කෑ ගහනවා. පඩි වැඩි කරලා දෙන්නකෝ කෑ ගහන්නේ නැතිව. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද, point of Order එක?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
විරුද්ධ පක්ෂයේ නායකතුමාගේ නායකත්වයෙන් දැන් වනිතා රැස්වීමක් මේ සභාව තුළ පවත්වනවාද කියලා මම අහනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ නැත.

## මාතර දිස්ත්‍රික්කයේ ලියාපදිංචි පෙර පාසල් : විස්තර
## மாத்தறை மாவட்டத்தில் பதிவு செய்யப்பட்ட முன்பள்ளிகள் : விபரம்
## REGISTERED PRE-SCHOOLS IN MATARA DISTRICT : DETAILS

0932/'10

13. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ තිබෙන ලියාපදිංචි පෙර පාසල් සංඛ්‍යාව, ඒවායේ නම් සහ ලිපිනයන් එක් එක් පළාත් පාලන ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පෙර පාසල්වල පාලිකාවන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iii) එම පෙර පාසල් පාලිකාවන්ට වැටුපක් ලබා දීමට වර්තමාන රජය කටයුතු කරන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தில் காணப்படும் பதிவு செய்யப்பட்ட முன்பள்ளிகளின் எண்ணிக்கை, அவற்றின் பெயர்கள் மற்றும் முகவரிகள் என்பன உள்ளூர் அதிகார சபைகளுக்கேற்ப வெவ்வேறாக யாவை என்பதையும்,

(ii) மேற்படி முன்பள்ளி ஆசிரியர்களின் பெயர்கள் மற்றும் தனிப்பட்ட முகவரிகள் யாவை என்ப தையும்,

(iii) மேற்படி முன்பள்ளி ஆசிரியர்களுக்கு சம்பள மொன்றை வழங்க தற்போதைய அரசாங்கம் நடவடிக்கை எடுக்குமா என்பதையும்,

(iv) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Child Development and Women's Affairs:

(a) Will he inform this House -

(i) separately, the number of registered pre-schools in the Matara District and their names and addresses in relation to each of the local authorities in that district;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) the names and private addresses of the wardens of the aforesaid pre-schools;

(iii) whether the present Government will take action to give a salary to those pre-school wardens; and

(iv) if not, the reasons for it?

(b) If not, why?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)

ගරු කථානායකතුමනි, පිළිතුර මෙසේයි.

(අ) (i) 2008 අංක 2 දරන දකුණු පළාත් පෙර පාසල් ප්‍රඥප්තියට අනුව, මාතර දිස්ත්‍රික්කයේ පෙර පාසල් ලියාපදිංචිය සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීම අවසන් කර ඇති අතර, ලියාපදිංචි බලපත්‍ර කිසිදු පෙර පාසලකට නිකුත් කර නැත. මේ පිළිබඳ දකුණු පළාත් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ අප අමතන ලද ලිපිය වැඩිදුර තහවුරු සඳහා ඔබ වෙත යොමු කරමි.

(ii) නිසි බලධරයා විසින් පෙර පාසල් ලියාපදිංචි කර නැති නිසා අදාළ නොවේ.

(iii) නැත. පෙර පාසල් පාලිකාවන් සඳහා ප්‍රාදේශීය සභාවෙන් වැටුපක් ගෙවනු ලැබේ.

(iv) දැනට රජය පෙර පාසල් ගුරුවරුන් සඳහා වැටුප් ගෙවන්නේ නැත.

(ආ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. පළාත් සභාව යටතේ ප්‍රඥප්තියක් හදලා තිබුණා වුණත්, මේ පිළිබඳව ඔබතුමාගේ අමාත්‍යාංශයට යම් මැදිහත් වීමක් කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා මේ පෙර පාසල් ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙළ පිළිබඳව අවධානය යොමු කරලා, කඩිනමින් ඒ පෙර පාසල් ලියාපදිංචි කරලා, යම් කිසි යාන්ත්‍රණයකට ඇතුළත් කර ගන්න කටයුතු කරනවාද?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

පළාත් සභාව සමඟත් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නම්. ඔබතුමාට වැඩිමනත් විස්තර ලබා දෙන්න මම කටයුතු කර තිබෙනවා ගරු මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය.වාර්ෂික විමධ්‍යගත ප්‍රතිපාදනවලින් වෙන් කරන පොඩි මූලධන ප්‍රතිපාදනය හැර, මේ පෙර පාසල් ගුරු භවතුන් සඳහා මුදල් වෙන් කිරීම සඳහා වැඩ පිළිවෙළක් මධ්‍යම රජයෙන් -ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන්- සිදු කරනවාද?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

කරුණාකරලා ප්‍රශ්නය ආපහු අහන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

සාමාන්‍යයෙන් මන්ත්‍රී කෙනෙකුගේ ප්‍රතිපාදනවලින් අපි පෙර පාසල් සඳහා වාර්ෂිකව මුදල් වෙන් කරනවා.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

විමධ්‍යගත මුදල්වලින්?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඔව්. විමධ්‍යගත මුදලින්. ඊට අමතරව, අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වනවාද? [බාධා කිරීමක්]

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

ගරු කථානායකතුමනි, මේ සභාව පොඩ්ඩක් නිශ්ශබ්ද කළොත් හොඳයි. මට පිළිතුරු දෙන්න බැහැ, බාධා වෙනවා.

අපේ අමාත්‍යාංශයෙනුත් යම් කිසි මුදලක් වෙන් කර තිබෙනවා. වැඩිමනත් වශයෙන් පළාත් සභාවලට ඒ අංශය භාරව තිබෙනවා. අපේ අමාත්‍යාංශයෙන් කෙරෙන වැඩ කොටස් වෙනම තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය. අය වැයෙන් මන්ත්‍රීවරුන්ට වෙන් කරන විමධ්‍යගත මුදල් තාම වෙන් කරලා නැහැ. ගරු ඇමතිතුමා කිව්වා, ඒක පාවිච්චි කරන්න පුළුවන් හැකියාවක් ඇති වේවි කියලා. නමුත් මුදල් අමාත්‍යාංශයෙන් මන්ත්‍රීවරුන්ට මෙම මුදල් තවම වෙන් කරලා නැහැ. අවශ්‍ය නම් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හරි, ඒක ගරු මුදල් අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා.

ප්‍රශ්න අංක 14 -1040/'10- (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15 -1149/'11-(1), ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය.

## සංස්කෘතික ත්‍රිකෝණයට අයත් ප්‍රදේශ : සංචාරකයින්
### கலாசார முக்கோணத்தின் வரலாற்றுச் சிறப்பு மிக்க இடங்கள்: சுற்றுலாப் பயணிகள்
### AREAS UNDER CULTURAL TRIANGLE : TOURISTS

0581/'10

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී සංස්කෘතික ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයේ සංචාරය කිරීමට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව කවරේද;

(ii) සංස්කෘතික ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයේ පිහිටි ඓතිහාසික ස්ථානවලින් උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය කවරේද;

(iii) බෞද්ධාගම ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳ පොළ ආකර්ෂණය කර ගැනීම සඳහා සංස්කෘතික ත්‍රිකෝණය ප්‍රයෝජනයට නොගන්නේ කවර හේතු නිසාද;

(iv) දැනටමත් එසේ ප්‍රයෝජනයට ගෙන තිබේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බෞද්ධ සංචාරකයෙකුට නැරඹීම සඳහා උනන්දුවක් ඇති කරවන සුළු ශ්‍රී ලංකාව තුළ පිහිටි වෙනත් ඓතිහාසික ස්ථාන පහක නම් කවර

(ii) ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන නඟා සිටුවීම සහ සුරැකීම සඳහා ඉහත ක්‍රියාවලිය තුළින් උපයා ගත් මුදල් රජය බෞද්ධ ආගමික ස්ථානවලට ලබා දෙන්නේද;

(iii) එසේ නම්, පසුගිය වර්ෂය තුළ එසේ මුදල් ලැබූ බෞද්ධ ආගමික ස්ථාන හෝ වෙනත් ස්ථානයන් කවරේද සහ එම එක් එක් ස්ථානයට ලැබුණු මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கலாசார, கலை அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த ஐந்து வருடங்களில் கலாசார முக்கோணத் திற்கு வருகை தந்த சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கையை வருடவாரியாகவும்,

(ii) கலாசார முக்கோணத்தின் வரலாற்றுச் சிறப்பு மிக்க இடங்களிலிருந்து ஈட்டிக்கொள்ளப்பட்ட வெளி நாட்டு செலாவணித் தொகையையும்,

(iii) பௌத்த மதத்தின் மேம்பாட்டிற்கும் சுற்றுலாப் பயணிகளுக்கான சந்தையை ஈர்ப்பதற்கும் கலாசார முக்கோணத்தை நாங்கள் ஏன் பயன்படுத்து வதில்லை என்பதையும்,

(iv) ஏற்கனவே அவ்வாறு செய்யப்பட்டிருப்பின் இவ் விடயம் தொடர்பாக மேற்கொள்ளப்பட்ட நடவடிக் கைகள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) பௌத்த சுற்றுலாப் பயணியொருவரின் கண்ணோட்டத்தில் அத்தகைய ஆர்வத்தைத் தூண்டக்கூடிய இலங்கையில் உள்ள வரலாற்றுச் சிறப்புமிக்க ஏனைய ஐந்து இடங்களையும்,

(ii) வரலாற்று ரீதியாக முக்கியத்துவம் வாய்ந்த இடங் களைத் தரமுயர்த்துவதற்கும் பாதுகாப்பதற்கும் மேற்படி நடவடிக்கை மூலம் ஈட்டப்பட்ட வைகளிலிருந்து அரசாங்கம் பௌத்த வணக்கஸ்த லங்களுக்குப் பணம் வழங்குகிறதா என்பதையும்,

(iii) அவ்வாறெனின், இவ்வணக்கத்தலங்களின் அல்லது இடங்களின் பெயர்களையும் கடந்த ஐந்து வருடங் களில் மேற்கூறியவாறு கிடைக்கப்பெற்ற பணத் தொகை யையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Culture and the Arts:

(a) Will he state-

(i) the number of tourists visited the Cultural Triangle for the last five years, on a per year basis;

(ii) the amount of foreign exchange earned from the historical sites of Cultural Triangle;

(iii) as to why we are not making use of Cultural Triangle for promoting Buddhism and attracting a tourist market; and

(iv) if already done so, the steps that have been taken in this regard?

(b) Will he also state-

(i) five other historical sites which draw such enthusiasm from a Buddhist Tourist's point of view in Sri Lanka;

[ගරු රවි කරුණානායක මහතා]

(ii) whether the Government gives the money to temples, earned from the above process for upgrading and protecting the historically vital sites; and

(iii) If so, the names of temples or other places and the amounts of money received as above for the last year?

(c) If not, why?

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)

(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

(අ) (i) පසු ගිය වර්ෂ 05 තුළ එක් එක් වර්ෂයේදී සංස්කෘතික ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයේ සංචාරය කිරීමට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව පහත පරිදි වේ.

| වර්ෂය | සංචාරකයින් ප්‍රමාණය |
|---|---|
| 2005 | 110,443 |
| 2006 | 138,232 |
| 2007 | 104,583 |
| 2008 | 112,190 |
| 2009 | 109,404 |
| 2010 | 788,887 |

(ii) සංස්කෘතික ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයේ පිහිටි ඓතිහාසික

ස්ථානවලින් උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය පහත පරිදි වේ.

| වර්ෂය | ආදායම (රුපියල් මිලියන) |
|---|---|
| 2005 | 284.7 |
| 2006 | 400.9 |
| 2007 | 279.8 |
| 2008 | 318.8 |
| 2009 | 422.9 |
| 2010 | 764.6 |

(iii) බෞද්ධාගම ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳ පොළ ආකර්ෂණය කර

ගැනීමට සංස්කෘතික ත්‍රිකෝණය ප්‍රයෝජනයට ගනු ලැබේ.

(iv) දෙස් විදෙස් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා අනුරාධපුර, පොළොන්නරුව, සීගිරිය, දඹුල්ල, මහනුවර හා ගාල්ල යන ලෝක උරුම ස්ථාන හා ඊට අමතරව රම්බා විහාරය හා තිස්සමහාරාමය, වයඹ සංස්කෘතික චතුරශ්‍රය යන ව්‍යාපෘතිවල ඇති පුරා විද්‍යා ස්මාරක හා භූමිය සංරක්ෂණය කර නඩත්තු කරගෙන යාම.

සීගිරිය නව කෞතුකාගාර හා ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථාන ඉදිකිරීම හා එමඟින් සිදු කරන පර්යේෂණ, ගවේෂණ තුළින් සොයා ගත් තොරතුරු සැපයීම මඟින් සංචාරක ආකර්ෂණය වැඩිදියුණු කර ගැනීම.

ව්‍යාපෘති ප්‍රකාශන අළෙවි සැල් හා ප්‍රධාන කාර්යාලයේ අළෙවි සැල් ස්ථාපිත කිරීම මඟින් පුරා විද්‍යා ක්ෂේත්‍රයට අදාළ ග්‍රන්ථ අළෙවි කිරීම, පෝස්ටර්, අත් පත්‍රිකා, මාර්ගෝපදේශක සිතියම්, මාර්ගෝපදේශක පොත් හා සංචාරක අත් පොත් මඟින් සංචාරකයින් හට මහ පෙන්වීමක් හා අවබෝධයක් ලබා දීම.

www.ccf.lk නමින් වෙබ් අඩවියක් පවත්වා ගනිමින් සංචාරකයින්ට අවශ්‍ය තොරතුරු ලබා දීම.

බටලීය අනුරු පාසල හා අනුරු අළෙවි සැල මඟින් පුරාවස්තුවල අනුරු නියමිත ප්‍රමිතියට සකස් කර අනුරු අලෙවිය වැඩි කිරීම සඳහා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.

ව්‍යාපෘතිවල ප්‍රචාරක අංශ මඟින් අවට පාසල් හා වෙනත් ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රදර්ශන ආදිය පවත්වා අනාගත පරපුරටත් අපේ උරුමය පිළිබඳව නව දැනුම ලබා දේ.

සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙත වාර්ෂිකව රුපියල් මිලියන 03ක් පමණ වටිනාකමක් ඇති සංචාරක ප්‍රවේශ පත්‍ර 750ක් ලබා දී ඒ මඟින් සංචාරක ප්‍රවර්ධන කටයුතුවල නියැළී සිටින විදේශීය ආයතන හා පුද්ගලයන් දිරි ගැන්වීම.

ලංකාවේ සංචාරක කර්මාන්තයේ නියැළී සිටින ආයතන මිලට ගනු ලබන සංචාරක ටිකට් පත් සඳහා 15:1 ලෙස ප්‍රසාද ටිකට් පත් නිකුත් කිරීම.

ප්‍රකාශන, VCD හා DVD මඟින් අපගේ ව්‍යාපෘති පිළිබඳව සංචාරක දැනුම පුළුල් කිරීම හා එමඟින් තව තවත් සංචාරකයින් ආකර්ශනය කර ගැනීම.

සියලු ගුවන් සමාගම්වලට නව නිර්මාණශීලී සංචාරක ස්ථාන පිළිබඳව නව VCD එකක් ලබා දීම.

(ආ) (i) පාහියන්ගල පුරාණ ස්ථානය

අරන්කැලේ සේනාසනය

පඬුවස්නුවර හා වයඹ සංස්කෘතික චතුරශ්‍රය

කිරින්ද හා සිතුල්පව්ව රජමහා විහාරය

සේරුවිල රජමහා විහාරය

(ii) ඔව්.

(iii) පසුගිය වර්ෂය තුළදී මධ්‍යම සංස්කෘතික අරමුදල විශාල මූල්‍ය

අර්බුදයකට මුහුණ දී සිටි බැවින් පසුගිය කාලයේ විහාරස්ථානවලට මුදල් සපයා දීමට නොහැකි විය. දැන් එය ආරම්භ

කොට ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා සවිස්තර උත්තරයක් ලබා දීම මා අගය කරනවා. ප්‍රශ්නයේ (අ) (i) කොටසින් මා අසා තිබුණේ "පසුගිය වර්ෂ පහ තුළ එක් එක් වර්ෂයේදී සංස්කෘතික ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයේ සංචාරය කිරීමට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව කවරේද?" කියායි. ඔබතුමාගේ පිළිතුර අනුව 2010 වර්ෂයේදී 780,000ක්ය කියායි කිව්වේ. නමුත් සංචාරක අමාත්‍යාංශය ඉදිරිපත් කරපු තොරතුරු අනුව මෙරටට පැමිණි සම්පූර්ණ සංචාරකයින් සංඛ්‍යාව 528,000යි.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ විදේශ සංචාරකයන් කියා නොවෙයි. සංචාරකයින් කිව්වාම, විදේශ සංචාරකයින් දේශීය සංචාරකයින් යන මේ දෙකොටසම අයත් වෙනවා. ඒ දෙගොල්ලගේම එකතුව තමයි ඒ. පැමිණි විදේශ සංචාරකයන්ගේ ප්‍රමාණය කොච්චරද කියා ඔබතුමා අසා තිබුණා නම් අපට ඒ සංඛ්‍යාව වෙනම සඳහන් කරන්න තිබුණා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, මා ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ- [බාධා කිරීමක්] හරි, කමක් නැහැ එහෙමවත් උත්තරය ලබා ගත්තා කියමුකෝ.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ඔබතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න. "මධ්‍යම සංස්කෘතික ත්‍රිකෝණයට අයත් මධ්‍යස්ථානවලට පැමිණි විදේශ සංචාරකයින් ප්‍රමාණය කොපමණද/" කියා ඇසුවා නම් අපට ඒ විධියට පිළිතුරු දෙන්න තිබුණා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ මීට පෙර ලංකාවේ සංචාරකයන් ඒ පැතිවලට ගිහින් නැහැ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයේ තිබෙන්නේ, "ප්‍රදේශයේ සංචාරය කිරීමට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව" කියලායි. ඇමතිතුමා දීපු උත්තරයේ සඳහන් වන්නේ ඒ ගැනයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් එක පාරට එම සංඛ්‍යාව 780,000ට වැඩි වුණාද? මේක මගේ දෙවන අතුරු ප්‍රශ්නය. 110,000 සිට 780,000ක් දක්වා එක පාරට වැඩි වුණාද?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ඔව්, ඉතින් ඔබතුමන්ලාගේ සහයෝගය තිබුණා නම් ඒ ප්‍රමාණය මීට වඩා වැඩි වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ සුද්දොත් එන්නේ නැත්තේ අපි නිසායි, ලංකාවේ අය එන්නේ නැත්තේත් අපි නිසායි. ඒක හෙණ ගහන වැඩක් නේ.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
යුද්ධය අවසාන වීමත් එක්ක ලොකු ප්‍රවර්ධනයක් ආරම්භ වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් ඒක තමයි මම අහන්නේ. මම මෙතැන ඇහුවේ සංචාරකයන් කිව්වාම ලංකාවේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊළඟ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මොකද, බෝම්බ පත්තු වෙන කාලයේ සංචාරකයන් ආවේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තව අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන් නේද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ ලංකාවේ අයත් සුද්දන් කියලා දැන් සලකන්නේ.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ඔබතුමා විදේශ සංචාරකයන් ප්‍රමාණය අහලා තිබුණා නම් අපි ඒකත් පැහැදිලිව සඳහන් කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Tourists කියන්නේ විදේශිකයන් නොවේද?

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
සංචාරකයන් කිව්වාම දේශීය සංචාරකයෝ ඉන්නවා, විදේශීය සංචාරකයෝ ඉන්නවා.

## පාසල් පද්ධතිය තුළ සිටින වැඩබලන විදුහල්පතිවරු: විස්තර

## பாடசாலை முறைமையில் உள்ள பதில் அதிபர்கள்: விபரம்

## ACTING PRINCIPALS IN SCHOOL SYSTEM : DETAILS

1007/'10

3. ගරු අජිත් කුමාර මහතා (ගරු අකිල විරාජ් කාරියවසම් මහතා වෙනුවට)
(மாண்புமிகு அஜித் குமார - மாண்புமிகு அகில விராஜ் காரியவசம் சார்பாக)
(The Hon. Ajith Kumara on behalf of the Hon. Akila Viraj Kariyawasam)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය:- (3):

(අ) (i) රජයේ පාසල් පද්ධතිය තුළ සිටින වැඩ බලන විදුහල්පතිවරුගේ සංඛ්‍යාව කොපමණද:

(ii) වැඩ බලන විදුහල්පතිවරු සිටින පාසල්වල විදුහල්පතින් ලෙස සේවය කිරීම සඳහා සුදුසුකම් ඇති, අධ්‍යාපන පරිපාලන සේවා විභාගය සමත්ව සිටින සංඛ්‍යාව කොපමණද;

(iii) ඊට අමතරව ඉහත පාසල්වල විදුහල්පති තනතුරු දැරීමට සුදුසුකම් ඇති, විදුහල්පති ශ්‍රේණීන් සමත්ව සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම විදුලහල්පතිවරු එම තනතුරු සඳහා පත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින තුළ ඇති ඉසුරු පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) නවෝද්‍යා පාසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් සඳහා පසු ගිය වර්ෂ පහ තුළ වෙන්කර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වයඹ පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වලට බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සේවකයින් බඳවා ගත් පාසල් කවරේද;

(iii) එම සේවකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க பாடசாலை முறைமையில் உள்ள பதில் அதிபர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(ii) பதில் அதிபர்கள் உள்ள பாடசாலைகளில், அதிபர்களாக கடமையாற்றுவதற்கான தகைமைகளைக் கொண்ட கல்வி நிர்வாக சேவையில் சித்தியடைந்துள்ளவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iii) அதற்கு மேலதிகமாக, மேற்படி பாடசாலைகளில் அதிபர் பதவிகளை வகிப்பதற்கு தகைமையுள்ள அதிபர் தரங்களில் சித்தியடைந்துள்ள அதிபர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iv) மேற்படி அதிபர்கள் குறித்த பதவிகளுக்கு நியமனம் செய்யப்படாமைக்கான காரணங்கள் எவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) நாட்டிலுள்ள இசுறு பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(ii) நவோதய பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iii) மேற்படி பாடசாலைகளுக்கு கடந்த 5 வருடங்களில் ஒதுக்கப்பட்ட நிதித்தொகை தனித்தனியே எவ்வளவு என்பதையும்,

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) வடமேல் மாகாண சபையின் கீழ் நிர்வகிக்கப் படுகின்ற பாடசாலைகளுக்கு ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ள பணியாள் தொகுதி, ஒவ்வொரு பதவிக்கும் அமைய தனித்தனியே யாதென்பதையும்,

(ii) அவ்வாறு ஊழியர்கள் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட பாடசாலைகள் எவை என்பதையும்,

(iii) ஊழியர்கள் ஆட்சேர்ப்புச் செய்யும் நடைமுறை எது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of acting principals in the government school system ;

(ii) the number of persons who belong the Sri Lanka Education Administrative Service and qualified to serve as principals in the schools in which acting principals are serving;

(iii) the number of principals who have Principal Grades and qualified to hold principal posts in the aforesaid schools in addition to the persons mentioned in (ii) above; and

(iv) the reasons for not appointing those principals to the aforesaid posts ?

(b) Will he state-

(i) the number of "Isuru" Schools in the island ;

(ii) the number of " Navodya" Schools in the island; and

(iii) separately, the amount of money allocated for the aforesaid schools during the last five years ?

(c) Will he inform this House -

(i) separately the number of employees that have been recruited to the schools coming under the purview of the North Western Provincial Council on the basis of the posts, for which they have been recruited;

(ii) the names of the schools for which employees have been recruited; and

(iii) the methodology adopted for recruiting the aforesaid employees?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa )

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2009.11.03 දිනට වසර 03ක් රාජකාරි ආවරණය කරන ලද සංඛ්‍යාව 2453 යි.

(ii) වැඩ බලන විදුහල්පතිවරුන් ඒ වෙනුවෙන් පත් කොට ඇත්තේ පළාත් පාසල් සඳහා වේ. රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව 341කි. එසේම ජාතික පාසල්වල විදුහල්පති තනතුර දැරීමට තරම් අධ්‍යාපන පරිපාලන සේවය සමත් ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් සිටී.

(iii) ශ්‍රී ලංකා විදුහල්පති සේවය 2-11 ශ්‍රේණිය -1958

ශ්‍රී ලංකා විදුහල්පති සේවය 3 පන්තිය - 1717

(iv) ශ්‍රී ලංකා විදුහල්පති සේවය 2 - 11 ශ්‍රේණිය හා 3 පන්තිය නිලධාරීන් පළාත් සභාවට තාවකාලික හා ද්විතීයික පදනම මත නිදහස් කර ඇති අතර විදුහල්පති තනතුරට පත් කරනු ලබන්නේ අදාළ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසිනි.

එසේම ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් බොහොමයක් වගකීම් සහිතව විදුහල්පති තනතුරු භාර ගැනීමට කැමැත්තක් නොදක්වන අතර නියෝජ්‍ය විදුහල්පති තනතුරුවල හා ගුරුවරුන් ලෙස රැඳී සිටිමින් සේවය කරති.

(ආ) (i) 104යි.

(ii) 493 යි.

(iii) ද්විතික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ආසියානු සංවර්ධන බැංකු ආධාර සඳහා ඉසුරු පාසල් 104ක් සඳහා එක් පාසලකට රුපියල් මිලියන 40ක් බැගින් රුපියල් මිලියන 4160ක් 2009-2012 වර්ෂය 04ක කාලසීමාව තුළ ආයෝජනය කෙරේ.

(ඇ) (i) අදාළ නැත.

(ii) අදාළ නැත.

(iii) දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පැවරී ඇති බලතල මත වයඹ පළාත් සභාව විසින් බඳවා ගැනීම් කර ඇත.

(iv) අදාළ නැත.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 5-1049/'10-(1), ගරු මොහමඩ් අස්ලම් මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

கௌரவ சபாநாயகர் அவர்களே, மாண்புமிகு மொஹமட் அஸ்லம் அவர்கள் சார்பாக நான் அந்தக் கேள்வியை தமிழிலே கேட்கிறேன்.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 10-1050/'10-(1), ගරු මොහමඩ් අස්ලම් මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

கௌரவ சபாநாயகர் அவர்களே, மாண்புமிகு மொஹமட் அஸ்லம் அவர்கள் சார்பாக நான் அந்தக் கேள்வியை தமிழிலே கேட்கிறேன்.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් තිබෙන්නේ ශෝක ප්‍රකාශ යෝජනා. අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආචාර්ය නිශ්ශංක විජයරත්න මහතාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව තවදුරටත් ඉදිරිපත් කිරීම. ඒ සඳහා පැයක කාලයක් තිබෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි,-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Speaker, I would like to raise a point of Order in keeping with the Standing Orders. This is a Privilege Matter regarding Parliament. Yesterday, the Hon.Anura Dissanayake raised a Question by Private Notice about the payment of wages to soldiers and misled Parliament. I met you in the Chamber, Sir. දෙවිධියක ගෙවීම් කරනවාය කියලා කිව්වා, විශ්‍රාම වැටුප - pension එක - පිළිබඳව. ඒ පිළිබඳව හරි විස්තරය පාර්ලිමේන්තුවේ අපේ කවුරු හරි ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් දිය යුතුය කියලා මා හිතනවා. නැත්නම් ගරු කථානායකතුමනි, ජනතාවට දෙන්නේ වැරැදි අදහසක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අපි ඒක ශෝක ප්‍රකාශවලට පස්සේ ගනිමු. දැන් ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා.

## ශෝක ප්‍රකාශය : ගරු ආචාර්ය නිශ්ශංක විජයරත්න මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு கலாநிதி நிஸ்ஸங்க விஜயரத்ன
## VOTE OF CONDOLENCE : HON. (DR.) NISSANKA WIJEYERATNE

[අ.භා.2.22]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත හිටපු අමාත්‍ය ගරු ආචාර්ය නිශ්ශංක විජයරත්න මැතිතුමා ඒ යුගයේ මුළු මහත් ශ්‍රී ලංකාවේම පිළිගත්ත, උගත්, අවංක, දක්ෂ හා කාර්ය ශූර පුරවැසියෙක් හැටියට තමයි කවුරුත් කල්පනා කළේ. එතුමාගේ අධ්‍යාපන කටයුතු ගැන කථා කරනවා නම්, එතුමා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ගෞරව උපාධියක් ලබා ගෙන ඇති අතර, සිවිල් සේවා විභාගයෙන්ද සමත් වෙලා තිබෙනවා.

එතුමා 1977 වසරේ පැවති මහ මැතිවරණයට කෑගල්ල දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත් වෙලා, ජයග්‍රහණය කර ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ රජයේ මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙලා, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමතිවරයා හැටියටද, අධිකරණ ඇමතිවරයා හැටියටද දේශපාලන ක්ෂේත්‍රයෙන් මේ රටට සේවයක් කළා. එතුමා පසු කාලීනව තානාපතිවරයෙක් හැටියටද, යුනෙස්කෝ සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකයෙක් හැටියටද, ඒ වාගේම ශ්‍රී දළ දා මාළිගාවේ දියවඩන නිළමේ හැටියටද කටයුතු කළා. එතුමා තම ජීවිතයේ මුල් කාලයේදී - එතුමාගේ ජීවිත කථාවේ අපි දුටුවා- හමුදා නිලධාරියකු ලෙසද කටයුතු කර තිබෙනවා. ඒ වාගේම පසුව දිසාපතිවරයෙක් හැටියටද, අමාත්‍යාංශ ගණනාවක ස්ථිර ලේකම්වරයෙක් හැටියටද එතුමා කටයුතු කර තිබෙනවා.

නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ සුවිශේෂ සේවාවක් හැටියට මා සලකන්නේ එතුමා ඒ අවස්ථාවේදී ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය නිර්මාණය කිරීමට දායකත්වයක් දක්වලා තිබීමයි. ඒ වාගේම ශ්‍රී ලංකා ජාතික කොඩිය නිර්මාණය කිරීමටද එතුමාගේ වැදගත් අදහස් කිහිපයක් ඒ නිර්මාතෘවරු ලබා ගත්ත බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. දැනට පවතින ජනාධිපති අරමුදල ආරම්භ කිරීමට එවකට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට උපදෙස් දී ඇත්තේද එතුමා බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ඒ වාගේම මෙරටේ සංස්කෘතික ත්‍රිකෝණය බිහි වුණේද මෙතුමාගේ අදහසක් අනුවයි කියන එකත් සඳහන් වෙලා තිබෙනවා. එසේම මහනුවර දළ දා ඇසළ පෙරහැර අරමුදල ඇති කිරීමට ද නව සුප්‍රීම් උසාවියේ ගොඩනැඟිල්ල ඉදි කිරීමට චීන ආධාර ලබා ගැනීමට ද කටයුතු කිරීමට එතුමා පුරෝගාමිත්වය දැරූ බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. මේ අනුව එතුමාගේ අභාවය කනගාටුදායක සිදුවීමක්. එමෙන්ම රටට වැඩදායක, ඵලදායක, විශිෂ්ට ගණයේ නායකයකු, පුද්ගලයකු අහිමි වූ බවයි අප මේ අවස්ථාවේදී සඳහන් කළ යුත්තේ.

නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ පුත්‍ර මනෝ විජයරත්න මැතිතුමාද පියාගේ අඩි පාරේ ගමන් කළා. ඔහු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හා ඇමතිවරයකු හැටියටද මැතක් වන තුරුම කටයුතු කළ බව මට මතකයි. ඔහු අපේ පාර්ලිමේන්තු කණ්ඩායමේ සාමාජිකයකු හැටියට එවකට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කෑගල්ල දිස්ත්‍රික්කයට විශාල වැඩ කොටසක් කරපු බව කෑගල්ල ජනතාව හොඳාකාරවම දන්නවා. නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ තවත් පුත්‍රයකු වන නෙරංජන් විජයරත්න මහතාට ද ශ්‍රී දළ දා මාළිගාවේ දියවඩන නිලමේ තනතුර ලබා ගනිමින් පියාගේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න අවස්ථාව ලැබුණා.

නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ පවුලේ සියලු දරුවන් අද සමාජයේ උසස් ස්ථානවල සිටින්නේ එතුමාගේ ගරුත්වයත් මඟ පෙන්වීමත් නිසා බව මම මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මනෝ විජයරත්න මැතිනිය අද ශ්‍රී ලංකා තානාපති ක්ෂේත්‍රයේ නියෝජනයක් කරන බව මේ අවස්ථාවේදී මා මතක් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත නිශ්ශංක විජයරත්න මැතිතුමාට නිවන් සුව ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි!

[අ.භා. 2.27 ]

**ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතාවය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ අභාවය වෙනුවෙන් අපගේ ශෝකය පළ කරන අවස්ථාවේ අපට ලබා දී ඇත්තේ ඉතා සුළු කාලයක් බව දූරකථන මඟින් දන්වා සිටි නිසා මගේ කථාව බොහොම කෙටියෙන් ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වුණා.

නිශ්ශංක විජයරත්න මැතිතුමා දීර්ඝ කාලයක් දේශපාලනයට, සමාජ සේවයට, රාජ්‍ය සේවයට කැප වුණු පරම්පරාවක එක පුරුකක්. එතුමා බුද්ධිමතෙක්, යහපත් ගුණාංගවලින් යුත් දේශපාලනඥයෙක්, ඉංග්‍රීසි භාෂාව ඉතාම දක්ෂ ලෙස හැසිරවිය හැකි දක්ෂ කථිකයෙක්, රාජ්‍ය තාන්ත්‍රිකයෙක්, සිවිල් නිලධාරියෙක් සහ සාහිත්‍යධරයෙක් වුණා.

අපේ ඉතිහාසය ගැන එතුමාට ඇත්තේ හසල දැනුමක්. ලංකා විශ්වවිද්‍යාලයෙන් ලංකා ඉතිහාසය පිළිබඳව ගෞරව උපාධියක් ලබා තිබූ අයකු වශයෙන් එතුමා සමඟ ටික වේලාවක් කථා කළ කෙනකුට තව ටික වේලාවක් කථා කරන්න හිතෙනවා. ඒක අපේ අත් දැකීමක්.

පළමු වරට මම එතුමා හඳුනා ගත්තේ 1977 මා පාර්ලිමේන්තුවට පත් වූ අවස්ථාවේ දීයි. දිනක් එතුමා සමඟ කථා කළ අවස්ථාවක ගල් ඔය ව්‍යාපාරය ගැන ලස්සන කථාවක් මා සමඟ කියන්නට යෙදුණා. මුලින්ම සිවිල් සේවයට බැඳී ආධුනිකයකු වශයෙන් මඩකළපුව කච්චේරියේ වැඩ කටයුතු කරන කාලයේ ගල් ඔය ඉතිහාසය ගැන වැඩිපුර දෙයක් දැන ගන්නට එතුමාට තිබුණු ආසාව නිසා ඒ පිළිබඳව තිබුණු පැරණි ලිපි ගොනු පරීක්ෂා කරද්දී, 1936 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ වාරිමාර්ග අධ්‍යක්ෂවරයාව සිටි ඉංග්‍රීසි ජාතික කෙනඩි මහතා ලියා තිබූ සටහනක් එතුමාගේ මතකයේ තිබුණා. ගල් ඔය පිළිබඳව මාගේ ඇති සම්බන්ධතාව හේතුකොට ගෙන එතුමා එම සටහන මට කියවන්නට යෙදුණා. එවිට මම එය ඉක්මනින්ම ලියා ගත්තා. 1999 වර්ෂයේ ගල් ඔය ව්‍යාපාරයේ පනස්වන සංවත්සරය වෙනුවෙන් සමරු කලාපයක් සකස්වන අවස්ථාවේ දී එම වාක්‍ය සටහන සමරු කලාපයේ යම් කිසි තැනකට ගැලපෙන වාක්‍ය කිහිපයක් වන නිසා මම එය සොයා ගන්නට උත්සාහ කළා. අසාර්ථක උත්සාහයකට පසු විසඳුම වශයෙන් මා කළේ නැවතත්

විජයරත්න මැතිතුමා හමු වී ඒ ගැන විමසීමයි. එතුමා එම වාක්‍ය එතුමාගේ මතකයේ රැඳී තිබුණු ආකාරයටම කියවන විට නැවතත් මම එය සටහන් කර ගත්තා. පසු දිනෙක අස්ථානගත වූ දින පොත සොයා ගත් මම එම වාක්‍ය කිහිපය සසඳා බලද්දී, වචන 70කින් සමන්විත එම වාක්‍ය කිහිපයේ එක වචනයක් වත් වෙනස් නොවී දෙවන වරට වර්ෂ 10කට පසුව මට කියවීම පිළිබඳව මා පුදුමයට පත් වුණා. ගල් ඔය සිහිනය එදා ඒ ඉංග්‍රීසි ජාතිකයා දුටු ආකාරයට ඒ වාක්‍ය කිහිපය තිබෙන්නේ මෙසේයි:

"I traversed thick jungles for the last two days with my Irrigation Assistant Ibrahim and now stand on the rock of Inginiyagala.

I see in my minds eye where a future dam should come. I would however advise the authorities to examine the problem from a human angle for under the Pattipola Aru a hardworking peasantry in a state of almost semi-serfdom, earning but the barest pittance as recompense for the severity of their service."

ගල්ඔය ව්‍යාපාරය පිළිබඳව අනාවැකියක් තමයි කෙනඩි මහත්මයා ඒ අවස්ථාවේදී පළ කළේ. මෙය ලස්සණට නිශ්ශංක විජයරත්න මැතිතුමා ලියා ගෙන තිබුණේ නැහැ. එතුමාගේ මනසේ රැඳී තිබුණු එකයි එහි වටිනාකම.

අප සමඟ මුලින්ම පාර්ලිමේන්තුවට තේරී පත් වූ එතුමා 1977 එක්සත් ජාතික පක්ෂ රජයේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමතිවරයා වශයෙනුත්, පසුව අධිකරණ ඇමතිවරයා වශයෙනුත් කටයුතු කළා. ඒ කාලය තුළදී අප රටට අමතක කළ නොහැකි විශාල වැඩ කොටසක් එතුමා අතින් සිදු වුණා.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දේ නිශ්ශංක විජයරත්න මැතිතුමායි. එම පනතේ ප්‍රතිඵලයක් වශයෙන් 1942 සිට 1978 දක්වා ලංකා විශ්වවිද්‍යාලයට පමණක් සීමා වී තිබූ විශ්වවිද්‍යාලය නිදහස්ව කටයුතු කිරීමට හැකි වන පරිදි කොළඹ විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය හා යාපනය විශ්වවිද්‍යාලය වශයෙන් විශ්වවිද්‍යාල 5ක් බිහි වුණා. රුහුණු විශ්වවිද්‍යාලයත්, විවෘත විශ්වවිද්‍යාලයත් ඇති කිරීමට එතුමා විසින් යෝජනා කළා.

එතුමා අධිකරණ අමාත්‍ය ධුරය දැරූ කාලයේදී චීන රජයේ ආධාර ලබා ගනිමින් කොළඹ උසාවි සංකීර්ණය ස්ථාපිත කළා. එතුමා යුනෙස්කෝ සංවිධානයේ විධායක කමිටුවේ සාමාජිකයෙක් වශයෙන් කටයුතු කළා. ලංකාවේ ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා සංස්කෘතික ත්‍රිකෝණය එතුමා ආරම්භ කළා. එමෙන්ම අඩු පහසුකම්වලින් යුත් අයට අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්ගේ සේවය ලබා ගැනීමට ජනාධිපති අරමුදල පිහිටුවූවා. අනුරාධපුර පූජනීය නගරය ඇති කිරීම සඳහාත්, අනුරාධපුර නව නගරය නිර්මාණය කිරීම සඳහාත් මූලිකත්වය ගෙන එතුමා කටයුතු කළා.

රුසියාවේ තානාපති ධුරය දැරූ එතුමා මහනුවර ශ්‍රී දළ දා මාලිගාවේ දියවඩන නිලමේ වශයෙනුත් වර්ෂ 10ක් සේවය කර තිබෙනවා.

රටට ජාතියට අපරිමිත සේවාවක් කළ එතුමා වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවේදී මෙම ශෝකය එතුමාගේ ආදරණීය බිරිඳ නීටා විජයරත්න මහත්මියටත්, නෙරංජන් විජයරත්න, මනෝ විජයරත්න, අනුරාධ විජයරත්න සහ නිසාංගනී විජයරත්න යන දූ පුතුන් වෙතත් පළ කරන බව දන්වා යවන ලෙස ගරු කථානායකතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

[අ.භා.2.34]

**ගරු ජගත් බාලසූරිය මහතා (ජාතික උරුමයන් අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஜகத் பாலசூரிய - தேசிய மரபுரிமைகள் அமைச்சர்)

(The Hon. Jagath Balasuriya - Minister of National Heritage)

ගරු කථානායකතුමනි, නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ අභාවය වෙනුවෙන් සොව පළ කරන මේ අවස්ථාවේදී එතුමා නියෝජනය කළ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු වශයෙන්ද එතුමා කිට්ටුවෙන් ඇසුරු කළ පුද්ගලයෙක් වශයෙන්ද වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම සතුටට කරුණක්. කුමන දේශපාලන මතයක් දැරුවත් නිශ්ශංක විජයරත්න වැන්නන් අද වැනි යුගයක පාර්ලිමේන්තුවට පත් වන්නේ නම් මෙරට ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වීමක් පමණක් නොව, යහ පාලනය වාගේම යහපත් දේශපාලන සංස්කෘතියක් බිහි වීමට එය ඉවහල් වනවා.

එතුමා දේශපාලනඥයකුට වඩා රාජ්‍ය තාන්ත්‍රිකයෙක් හැටියට හැඳින්වීමට හැකියි. ඇලෙක්සැන්ඩර් පෝප් කවියාගේ එක්තරා කවියක් මේ අවස්ථාවේදී මා කියන්න කැමැතියි. ඒ කවියේ අන්තර්ගතයෙන් බොහොමයක් නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ ගතිගුණවල අන්තර්ගත වෙලා තිබුණා. ඇලෙක්සැන්ඩර් පෝප් ඒ කවියෙන් මෙසේ කියා තිබෙනවා:

"Statesman, yet friend to truth! of soul sincere, In action faithful, and in honour clear;

Who broke no promise, served no private end, who gained no title, and who lost no friend".

ගරු කථානායකතුමනි, මේ කවියේ අන්තර්ගතය තුළ නිශ්ශංක විජයරත්න මහත්මයාගේ චරිතය එක්තරා මට්ටමකට නිර්මාණය කරනවා. එතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මහත්මයෙක්. විවිධ කුසලතා සමූහයක් ඇති විචිත්‍ර ආකර්ෂණීය පුද්ගලයෙක්. මානව දයාව, මානව භක්තිය අනුව ක්‍රියා කළ උගතෙක්. සැදැහැවත් බෞද්ධයෙක් මෙන්ම දේශප්‍රේමියෙක්. විශිෂ්ට රාජ්‍ය සේවකයෙක්. උගත් බුද්ධිමත් ඇමති කෙනෙක්.

එසේම පිළිගත් රාජ්‍ය තාන්ත්‍රිකයෙක්. දක්ෂ කථිකයෙක්. කවියෙක්. ඒ සියල්ලටම වඩා ඉතාම චාම් සරල ජීවිතයක් ගෙන ගිය මිනිසෙක් හැටියට අපට එතුමාව හඳුන්වන්න පුළුවන්.

විජයරත්න පවුල ගැන කථා කරන කොට අපට කියන්න පුළුවන් ලංකාවේ පාර්ලිමේන්තු ඉතිහාසයේ පුරුක් තුනක් අඛණ්ඩව උරුම කර ගත්ත පවුලක් බව. එතුමාගේ පියා ඊ.ඒ.පී. විජයරත්න මැතිතුමා ලංකා ජාතික සංගමයේ ගරු සභාපතිවරයෙක් හැටියට ක්‍රියා කළා. ඩොනමෝර් ක්‍රමය ලංකාවට ප්‍රථමයෙන්ම හඳුන්වා දෙන අවස්ථාවේදී 1931දී කෑගල්ල මැතිවරණ බල ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියට ක්‍රියා කළා. 1948 නිදහස ලබා ගන්නා අවස්ථාවේදී එතුමා සෙනෙට් මණ්ඩලයෙන් පත් වුණා, ස්වදේශීය කටයුතු පිළිබඳ සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා හැටියට. ඊට පසුව ඊ.ඒ.පී. විජයරත්න මහත්මයා ලංකාවේ බ්‍රිතාන්‍ය කොමසාරිස් ධුරයට පත් වුණා. මේ නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ පියායි.

නිශ්ශංක විජයරත්න මහත්මයාගේ විචිත්‍ර දේශපාලන ඉතිහාසය පිළිබඳ විවිධ අර්ථකථන මේ අවස්ථාවේදී ඉදිරිපත් වුණු නිසා මා ඒ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. නිශ්ශංක විජයරත්න මහත්මයාගේ පුතෙකු වූ මනෝ විජයරත්න මහත්මයාත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් පමණක් නොව නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියටත් ක්‍රියා කර තිබෙනවා.

[ගරු ජගත් බාලසූරිය මහතා]

එතකොට මේ පවුල ලංකා දේශපාලන ඉතිහාසයේ පුරුක් තුනක් අඛණ්ඩව නියෝජනය කරපු ඉතා විරල පවුලක් හැටියට හඳුන්වන්න පුළුවන්. නිශ්ශංක විජයරත්න මහත්මයා ලංකා විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ ගෞරව උපාධිධරයෙක්. එතුමා පිළිබඳව මහාචාර්ය කාලෝ ෆොන්සේකා මැතිතුමා එක්තරා අවස්ථාවකදී කියනවා, "He is an erudite man, who had read history in university and never stopped studying it" කියලා. එතුමාගේ තිබෙන සුවිශේෂ ලක්ෂණය තමයි එතුමා ඉහළ මට්ටමේ බුද්ධිමතෙකු වීම. සිංහල භාෂාව හා ඉංග්‍රීසි භාෂාව ඉතාමත් මැනවින් හැසිරවීමේ දක්ෂ බුද්ධිමතෙක්. එතුමා විවිධ අවස්ථාවලදී ඉංග්‍රීසි භාෂාවෙන් ලියූ විචිත්‍ර කවි සමූහයක් "Ape Appachchi : An Anthology of Our Father's Poems" යන නමින් පොතක් හැටියට 2001 දී එතුමාගේ දරුවන් විසින් පළ කරලා තිබෙනවා.

මේ සියල්ලටම වඩා එතුමා සරල චාම් පුද්ගලයෙක්. එතුමා රාජ්‍ය සේවයෙන් ඉවත් වෙලා සිටි අවස්ථාවේදී -ඒ යුගයේදී- ලංගම බස් රථයෙන් එතුමා කෑගල්ලට එනවා, කෑගල්ලට ඇවිත් බෑග් එකත් අරගෙන පයින්ම එතුමාගේ නිවසට යනවා. එතුමාට ශක්තියක් තිබුණා, කොළඹ ඉඳලා කෑගල්ලට මෝටර් රථයකින් පැමිණීමට සහ කෑගල්ලේ ඉඳලා තම වලව්වට යෑමට. නමුත් එතුමා එසේ කළේ නැහැ. එතුමාගේ සරල චාම් ගති පැවතුම් එයින් විදහා පානවා.

මේ අවස්ථාවේදී මට මතක් වෙනවා, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා ධජයේ යම් කිසි වෙනසක් කළ බව. ඒ වෙනස තමයි මෙතුමාගේ යෝජනාවක් අනුව බෝ කොළ හතරක් අපේ ජාතික ධජයට ඇතුළු කිරීම. ඒ බෝ කොළ හතරෙන් එතුමා සංකේතවත් කළේ, නියෝජනය කළේ මෙත්, මුදිතා, කරුණා, උපේක්ඛා කියන සංකල්ප හතරයි.

මෙවැනි විචිත්‍ර පුද්ගලයෙක් ගැන ගුණ කථනයක් කරන විට අපට දීර්ඝ වේලාවක් කථා කරන්න පුළුවන්. මොකද එතුමාගේ චරිතය ඒ තරම් විචිත්‍ර චරිතයක්.

ඒ වාගේම එතුමාගේ බුද්ධි මහිමය ගැන අපේ දයාරත්න ඇමතිතුමා කථා කළා. එතුමාත් එක්ක කථා කරන කොට අපට හිතා ගන්න පුළුවන් එක්තරා විශ්වකෝෂ දැනුමක් එතුමා තුළ තිබුණු බව. එතුමාගේ භාෂාව හැසිරවීම ගැන මම කලින් කිව්වා. ඒ වාගේම ඉංග්‍රීසි භාෂාවෙන් ලිවීමට එතුමා තුළ විශාල හැකියාවක් තිබුණා. එතුමා නැති වීම ලාංකික දේශපාලනයට විශාල පාඩුවක්. කෙසේ වෙතත් මේ අවස්ථාවේදී අපේ යුතුකමක් වන්නේ මේ පිළිබඳව එතුමාගේ පවුලේ දරුවන්ට අපගේ ශෝකය පළ කිරීමයි. අනාගතයේ ඒ පවුලේ උදවියට දේශපාලනයේ තවත් විචිත්‍ර රඟපෑමක් කිරීමට අවස්ථාවක් ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි.

[ අ. භා. 2.43]

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Hon. Speaker, I thank you very much for giving me an opportunity to speak on the Vote of Condolence on the death of the Hon. (Dr.) Nissanka Wijeyeratne who was a very close associate of mine. Our family has known Dr. Nissanka Wijeyeratne's family for about three generations and I gained a tremendous amount of knowledge from the Hon. (Dr.) Nissanka Wijeyeratne. He studied at Royal College and subsequently pursued higher studies at the University of Ceylon where he was honoured with a Bachelor of Arts in History. Then, he entered the Ceylon Civil Service and became a great administrator. His father was Sir Edwin Wijeyeratne who was a Member of the State Council for the Kegalle District, a Senator, an Ambassador for Sri Lanka in London and he was knighted also. With that background, Dr. Nissanka Wijeyeratne was a true human; a true gentleman. He was a philosopher; he was an academic; he was an administrator; he was a religious person; he was a poet and above all, he was a true human. That is what I would like to emphasize here. Although he was a Buddhist, he respected all other religions. He respected Hinduism; he respected Islam; he respected Christianity and he was of great value to the society.

I can well remember when he contested for the post of Diyawadana Nilame in 1975, I acted as his lawyer and I appeared on his behalf for the election. I was greatly privileged to serve him and from there onwards, I was greatly honoured by being with him in many fields, politically and otherwise. He was a Minister in His Excellency J.R. Jayewardene's Cabinet. Prior to that, he held the post the permanent secretary in two Ministries. Then, he was the Government Agent in Anuradhapura and the Acting Government Agent in Jaffna. He was the pioneer who started the Anuradhapura Sacred City Project. He established the Sri Lanka Cultural Triangle. When he served in the UNESCO, he was very keen to start this project. He was a true Buddhist and a person who really adhered to the principles of Buddhism. Being an administrator and a politician, he had administered this country to great heights and it is our duty as Members of this august Assembly at least to learn the great aspirations that he had in his mind. He was a great reader; a voracious reader. He knew administration of many languages. He knew and read on any subject. He could speak on any religion even without referring to any documentation; that was Dr. Nissanka Wijeyeratne.

In the same way, he was fortunate to have a lovely wife called Nita Dullewe and she was also a great pillar of strength for his success. He was also blessed with five children. The eldest son is Neranjan Wijeyeratne who was also the Diyawadana Nilame of the Sri Dalada Maligawa. The second son is Mano Wijeyeratne who was with the United National Party. Unfortunately, he is not with us in the UNP today. He had been a Member of Parliament for about 15 years. Today he is an adviser to His Excellency the President and he also was a great asset to his father. His wife is the Honorary Consul-General for Turkey. The third son is Anuradha Dullewe. He is a planter by profession and did a lot as far as his own field is concerned.

His fourth child was Lankesh Wijeyeratne. He was a lawyer by profession and a very lively person, but unfortunately he predeceased his father. The fifth child is Nishangani Wijeyeratne. She is the only daughter of the

late Dr. Nissanka Wijeyeratne. She got married to Mr. Hulangamuwa who is a chartered accountant and he is now the Director of Sunshine Holdings.

Hon. Speaker, thank you very much for giving me this opportunity to speak a few words in respect of Dr. Nissanka Wijeyeratne and I hope he would attain *nirvana.*

Thank you.

[අ.භා.2.50]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අද අපි ගෞරව දක්වන නිශ්ශංක විජයරත්න මැතිතුමා අපේ රටේ, අපේ දේශපාලන ඉතිහාසයේ ප්‍රබල දේශපාලන නායකයෙක්. එතුමා ඇමතිවරයෙක් හැටියටත්, රාජ්‍යතාන්ත්‍රිකයෙකු හැටියටත් ඒ වාගේම ආගමික නායකයෙකු හැටියටත් මේ රටට විශාල සේවාවක් කළා. ඒ වාගේම එතුමා මේ රටට සේවය කිරීමට හැකි දූ පුතුන් රාශියක් බිහි කරලා තිබෙනවා. ඔවුනුත් එතුමා වාගේම මේ රටට විශාල සේවාවක් කරන අයයි. ගරු කථානායකතුමනි, දේශපාලනඥයකුගේ වටිනාකම තක්සේරු කරන්න පුළුවන් වන්නේ එතුමා හදපු ගොඩනැඟිලි ගණනෙන්, පාලම් ගණනින් හෝ පාරවල් ගණනින් නොවෙයි. ඕනෑම දේශපාලනඥයෙකු යම් මතවාදයක් දැරුවා නම් ඒ මතවාදය සමාජ ප්‍රගමනය සඳහා සමාජගත කිරීම තුළ තමයි ඒ දේශපාලනඥයාගේ වටිනාකම මතු වන්නේ. අපේ රටේ, විශේෂයෙන්ම නොදියුණු යුගයක -අධ්‍යාපනය, සෞඛ්‍ය, සහ අනෙකුත් යටිතල පහසුකම්වලින් ඉතාමත් පහත් මට්ටමක තිබුණු යුගයක- මේ සියල්ල ජය ගැනීමට අධ්‍යාපනය ඉවහල් වන වග පැහැදිලි කරමින් අධ්‍යාපනය පිළිබඳව උනන්දුවක් ඇති කිරීමට විශේෂයෙන් මේ රටේ ශිෂ්‍ය පරම්පරාව වෙනුවෙන් විශාල කැප කිරීමක් කළා, ගරු කථානායකතුමනි. මට මතකයි ඒ කාලයේ එතුමා පුංචි දහම් පාසල්වලට ගිහිල්ලා දහම් පාසල් උත්සවවලදී අධ්‍යාපනයේ වටිනාකම දරුවන්ට කියා දුන්නු ආකාරය. මේ වාගේ ශ්‍රේෂ්ඨ නායකයෙක් අපේ රටට, අපේ ජාතියට අහිමි වුණා. ඒ වාගේම අපි මතක් කරන්න ඕනෑ, එතුමා ආගම සම්බන්ධයෙන් දරපු ස්ථාවරය වාගේම උඩ රට නියෝජනය කරමින්, උඩරට ජීවත් වෙමින්, උඩරට වැසියෙකු හැටියට උඩ, පහත දෙරටම යා කරන පාලමක් බවට පත් වුණාය කියන එක. මේ දෙරටම පුරවැසියන්ට සමානව සලකන්න කටයුතු කරන්න එතුමා කැප වෙලා ක්‍රියා කළා.

ගරු කථානායකතුමනි, එතුමාගේ මඟ යමින් දළ දා මාළිගාව භාරව කටයුතු කළ හිටපු දියවඩන නිළමේ නෙරන්ජන් විජේරත්න මැතිතුමා ගැන විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. කොටි ත්‍රස්තවාදින්ගේ බෝම්බයෙන් විනාශ වුණු දළ දා මාළිගාව අපේ රටේ බෞද්ධ ජනතාවටත්, ලෝකවාසී බෞද්ධ ජනතාවටත් පූජනීය ස්ථානයක් ලෙස නැවත වැඳ පුදා ගන්න එතුමාගේ කාලයේදී සකස් කරන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම පෙරහැර විධිමත්ව කිරීමට අවශ්‍ය සියලු විධිවිධාන එතුමා යෙදුවා. ගරු කථානායකතුමනි, ඒ එක්කම දළ දා මාළිගාවේ කෞතුකාගාරයක් ආරම්භ කිරීම පිළිබඳව එතුමා මුල් වෙලා ක්‍රියා කළා. මම හිතන්නේ ඒ කරපු කටයුතුම ඇති ගරු නිශ්ශංක විජයරත්න අපේ හිටපු අමාත්‍යතුමාට නිවන් දකින්න.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපි ඒ පවුල හා සම්බන්ධ වුණේ ජනාධිපති උපදේශක, හිටපු නියෝජ්‍ය අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී අපේ හිතවත් මනෝ විජයරත්න මැතිතුමා නිසායි. මම විපක්ෂයේත්, එතුමා ආණ්ඩු පක්ෂයේත්, මම ආණ්ඩු පක්ෂයේත්, එතුමා විපක්ෂයේත් වශයෙන් මේ පාර්ලිමේන්තුවේ අවස්ථා කිහිපයකී දී එතුමා සමඟ එක්ව මට කටයුතු කරන්න අවස්ථාව ලැබුණා. අපට විජයරත්නවරුන්ගේ අත් දැකීම ලැබුණේ එතුමාගෙන්; ඒ පහස ලැබුණේ එතුමාගෙන්. එතුමා අප සමඟ ඉතාම සහෝදරත්වයෙන්, පක්ෂ, පාට භේදවලින් තොරව කටයුතු කළා. විජයරත්න පවුල දිහා බලන කොට නිශ්ශංක විජයරත්න මැතිතුමා කොපමණ කෘතහස්ත, දක්ෂ, නිහතමානී දේශපාලනඥයෙක්ද කියන කාරණාව සම්බන්ධව සමස්ථ වශයෙන් අපට තක්සේරුවක් ගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, මට මතක් වෙනවා ඔබතුමාගේ -රාජපක්ෂවරුන්ගේ- සාටකය වාගේ නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ කර වටේත් සාටකයක් තිබුණා. සෑම දේශපාලනඥයෙකුටම යම් කිසි ලක්ෂණයක් තිබෙනවා. ඒ සාටකය තුළින් තමයි නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ ඒ ලක්ෂණය අපට මැවුණේ. එතුමා වාගේ ශ්‍රේෂ්ඨ නායකයෙක් අපේ රටට අහිමි වීම දරා ගත නොහැකි පාඩුවක්. එතුමා වෙනුවෙන් අපට කළ හැකි එක දෙයයි ඉතිරිව ඇත්තේ. අපි එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. එසේ ප්‍රාර්ථනා කරමින් අපේ පක්ෂයේත්, මගේත්, අප පවුලේත් ශෝකය විශේෂයෙන්ම එම මැතිණිය ඇතුළු පවුලේ සියලු දෙනාටම පුද කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.55]

**ගරු ඒ.ඩී. චම්පික ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு ஏ.டி. சம்பிக பிரேமதாச )
(The Hon. A.D. Champika Premadasa )

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ එක්සත් ජාතික පක්ෂයට ඓතිහාසික ආසනයක් වන දැදිගම ආසනය නියෝජනය කරමින් ශ්‍රී ලංකා මාතාවට කීර්තිමත් සේවාවක් ඉටු කළ දිවංගත ආචාර්ය නිශ්ශංක පරාක්‍රම විජයරත්න ශ්‍රීමතාණන් වෙනුවෙන් වර්තමාන දැදිගම සංවිධායකවරයා ලෙස මේ උත්තරීතර සභාව ඇමතීමට ලැබීම මා ලද භාග්‍යයක් හැටියට සලකනවා.

ගරු කථානායකතුමනි, නිශ්ශංක පරාක්‍රම විජයරත්න මැතිතුමා 1924 ජුනි 14 වැනි දින කෑගල්ල බුද්දෙහිමුල්ල වලව්වේදී උපත ලබා දෙමව්පියන්ගේ සෙවනෙහි ඇති දැඩි වී කොළඹ රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා, 1942 දී කොළඹ විශ්වවිද්‍යාලයට ඇතුළත්ව ඉතිහාසය පිළිබඳ උපාධියක් ලබා, 1948 දී සිවිල් පරිපාලන විභාගය සමත් වී, 1978 දී කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධියක් ලබා ගැනීමට තරම් දක්ෂ විය. එතුමා සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් ලෙසද, තොරතුරු අමාත්‍යාංශයේ ලේකම් ලෙසද, නියෝජ්‍ය ආගමන විගමන පාලක ලෙසද, ග්‍රාම සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙසද, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ලෙසද, ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සභාපති ලෙසද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙසද, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙසද, අනුරාධපුර සංස්කෘතික ත්‍රිකෝණයේ සභාපති ලෙසද, අනුරාධපුර සමුපකාර ග්‍රාමීය බැංකුවේ සභාපති ලෙසද, ගාල්ල උප දිසාපති ලෙසද කටයුතු කළා. රාජ්‍ය සේවයේ ගමන් කළ හැකි ඉහළම තනතුර වන මහ දිසාපති වශයෙන් 1959 දී අනුරාධපුර දිස්ත්‍රික්කය භාර ගත් අතර, යාපනය දිස්ත්‍රික්කයේ වැඩ බලන මහ දිසාපති ලෙසද එතුමා සේවය කළේය.

ගරු කථානායකතුමනි, එදා පොසොන් පුර පසළොස්වක පොහෝ දින මිහිඳු මහ රහතන් වහන්සේගේ ලංකා ගමනයෙන් පසු දෙවන පෑතිස් රජු ප්‍රමුඛ ශ්‍රී ලාංකිකයන් ශිෂ්ට සමාජයකට පරිවර්තනය වුණේ අනුරාධපුරය කේන්ද්‍රගත කර ගෙනයි.

[ගරු ඒ.ඩී. චම්පික ප්‍රේමදාස මහතා]

මෙම ඓතිහාසික අනුරාධපුර නගරය පූජනීය නගරයක් කිරීමේ කාර්යයේදී එතුමා පුරෝගාමිකයකු වූ බව 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සමරන මේ මොහොතේ සහ පොසොන් පුර පසළොස්වක පොහොය එළැඹීමට ආසන්න දිනක මා සඳහන් කරන්නේ බුද්ධාලම්බන ප්‍රීතියෙනි.

අනුරාධපුර දිස්ත්‍රික්කයට නොමැකෙන සිහිවටන එක් කළ මෙතුමා අඳ, ආබාධිත නිවාස ඉදි කරමින්, බාලක, බාලිකා නිවාස ඉදි කරමින් සමාජයේ කොන් වන පිරිස සමාජගත කිරීමට වෙහෙස විය.

ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවය තුළින් සුවිශාල ජනතා මෙහෙවරක් ඉටු කළ මෙතුමා 1970 ජනවාරි 05 වන දින රාජ්‍ය සේවයෙන් සමු ගත්තේය. ශ්‍රී ලංකාවේ බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ බඳු වූ ඓතිහාසික සෙංකඩගල පුරවරයේ මහනුවර ශ්‍රී දළ දා මාළිගාවේ දියවඩන නිලමේ තනතුර 1975 දී ලබා ගනිමින් එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයටත් මුළු ශ්‍රී ලංකාවාසී ජනතාවටත් අභිමානයක් ලබා දුන් බව සඳහන් කරන්නේ ගෞරවයෙන් හා ආඩම්බරයෙනි. මෙතුළින් සම්බුද්ධ ශාසනයේ පැවැත්මට අමිල සේවයක් කළ එතුමා දේශපාලයට පිවිස එක්සත් ජාතික පක්ෂයෙන් දැදිගම ආසනයේ සංවිධායකවරයා ලෙස 1976 වර්ෂයේ පත්ව තවත් ඓතිහාසික අවස්ථාවක් ඉතිහාස පිටුවක සටහන් කළේය.

ගරු කථානායකතුමනි, 1977 මැතිවරණයෙන් දැදිගම ආසනය ජය ගන්නා එතුමා ගරු ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමාගේ රජයේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස ද, 1980 දී අධිකරණ අමාත්‍යවරයා ලෙස ද කටයුතු කළේය. එතුමාගේ දේශපාලන ජීවිතය ආලෝකමත් වන්නේ ගුරු පත්වීම්, බැංකු සේවක පත්වීම්, වගා නිලධාරි, විශේෂ සේවා නිලධාරි පත්වීම් ඒ වාගේම ලංගම, බන්ධනාගාරය, වරාය ආදී ආයතනවලට පත්වීම් ලබා දෙමින් රැකියා අවස්ථා 15,000කට ආසන්න ප්‍රමාණයක් ලබා දීමෙනි.

ගරු කථානායකතුමනි, තම අමාත්‍යාංශවල වගකීම හා කාර්යභාරය මැනවින් අවබෝධ කර ගත් එතුමා ජනතාවට වඩාත් ඵලදායි සේවයක් ඉටු කරමින් වැඩිහිටි අධ්‍යාපන ව්‍යාපෘතිය හඳුන්වා දීම මෙන්ම දැදිගම, වාරියගොඩ ස්වර්ණ ජයන්ති විද්‍යාලය, ඇත්නාවල විද්‍යාලය ප්‍රමුඛ පාසල් පද්ධතිය සංවර්ධනය කිරීම මෙන්ම, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය සභාව, වරකාපොල පොදු වෙළඳ පොළ, ආයුර්වේද රෝහල, ප්‍රධාන තැපැල් කාර්යාලය, තුල්හිරිය උසාවිය ප්‍රමුඛ ජනතා අවශ්‍යතා ඉටු කිරිමේ රාජ්‍ය ආයතන ආරම්භ කොට ඒ ප්‍රදේශය විශාල වශයෙන් දියුණු කළේය. එතුමා ජනතාවගේ හිතට සිසිලක් ලබා දුන්නා පමණක් නොව හිසට සෙවණක් ලබා දෙමින් දැදිගම, මනරන්ගම, පරාක්‍රම ගම, පල්ලේගම, ඇත්නාවල, අලව්ව නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර දුන්නේය.

ගරු කථානායකතුමනි. මා කථා කරන විජයරත්න මැතිතුමන්ගේ පවුල පිළිබඳව ද වචනයක් සඳහන් නොකළොත් එය එතුමාට කරන විශාල අගෞරවයක් ලෙස මා දකිනවා. නිශ්ශංක පරාක්‍රම විජයරත්න මැතිතුමාට මෙලෙස සුවිශාල ජනතා මෙහෙවරක් කරන්නට තම දෙමපියන්ගෙන් ලැබුණු ආභාසය මෙන්ම දයාබර බිරිඳ වන සීතා දුල්ලෑව විජයරත්න මැතිනියගෙන් ද ලැබුණේ සුවිශාල නිහඬ සේවයකි. ඒවා සිහිපත් කර එතුමිය අදත් සතුටු වන බව මා විශ්වාස කරනවා.

නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ වැඩිමහල් පුත්‍ර රත්නය වන නෙරන්ජන් විජයරත්න මැතිතුමා තම පියාගේ අඩි පාරේ යමින් මහනුවර ශ්‍රී දළ දා මාළිගාවේ දියවඩන නිලමේ තනතුරට පත් වෙමින් සුවිශාල මෙහෙවරක් ඉටු කළ අතර එයින් කෑගල්ල දිස්ත්‍රික්කයටත්, මුළු ශ්‍රී ලංකාවටත්, දැදිගමටත්, විශේෂයෙන් මා උපන් රඹුක්කන ආසනයටත් ලබා දුන්නේ සුවිශාල ගෞරවයකි. අද එතුමා මා නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයට විශාල මෙහෙවරක් කරන බව සතුටින් මතක් කරනවා. මා හිතමිත්‍ර මනෝ විජයරත්න මැතිතුමා, නිශ්ශංක පරාක්‍රම විජයරත්න මැතිතුමාගේ දෙවන පුත්‍රරත්නය ලෙස තම පියතුමාගේ දේශපාලන ගමනට එක්ව දැදිගම ආසනය නියෝජනය කරමින් අප පක්ෂයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූවා පමණක් නොව අමාත්‍යාංශ කිහිපයකම අමාත්‍යවරයකු ලෙස ද පරිණතව කටයුතු කළා.

එතුමාගේ ඒ සේවය අපි අගය කරන්න ඕනෑ. තෙවන පුත්‍රයා වන අනුරාධ දුල්ලෑව සමාජයේ උසස් ලෙස ජීවත් වන අතර බාලම පුත්‍රයා වූ ලංකේෂ් විජයරත්න මහතා අප නොසිතූ පරිදි අපෙන් සමු ගත්තේය. පුතුන් සිව් දෙනෙකුගේ පවුලට එක් දියණියක් එක් කර ගැනීමට නිශ්ශංක විජයරත්න මහතා වාසනාවන්ත විය.

ගරු කථානායකතුමනි, පෞද්ගලික ජීවිතය, පවුල් ජීවිතය, සමාජ ජීවිතය රාජකාරි ජීවිතය ඉතාමත් සාර්ථකව ගත කරමින් දශක හයකට ආසන්න කාලයක් මහජනතාව වෙනුවෙන් කැප වී මහජනතාව සමඟ ජීවත් වූ අප ශ්‍රී ලංකා මාතාවගේ ශ්‍රේෂ්ඨ පුත්‍රයෙකු වූ නිශ්ශංක පරාක්‍රම විජයරත්න මැතිතුමා 2007 ජනවාරි 07 වන දින අපෙන් වෙන් විය.

එතුමාගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී එතුමාගේ පවුලේ සියලු දෙනාටම කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකයත් ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

[අ.භා. 3.04 ]

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු කථානායකතුමනි, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයෙක්, ඒ වාගේම සෙනෙට් සභාවේ සාමාජිකයෙක් වූ ශ්‍රීමත් එඩ්වින් විජයරත්න මැතිතුමාටත් එම මැතිනියටත් දාව 1924 ජූනි 14 වන දින දේශමාන්‍ය ආචාර්ය නිශ්ශංක පරාක්‍රම විජයරත්න මැතිතුමා කෑ ගල්ලේදී උපත ලැබුවා. කොළඹ රාජකීය විද්‍යාලයෙන් හා ඇලෙක්සැන්ඩ්‍රා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ එතුමා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ගෞරව උපාධියක් ලබා ගනිමින් එතුමාගේ උසස් අධ්‍යාපනය නිම කළා. 1954 දී මෙරට සිවිල් සේවයට බැඳුණු එතුමා 1956 වසරේදී ගාල්ලේ සහකාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙනුත් ඉන් පසුව යාපනය සහ අනුරාධපුර මහ දිසාපති වශයෙනුත් ක්‍රියා කළා. අනුරාධපුර පූජා භූමිය, පැරණි වටිනා පුරාවිද්‍යාත්මක ස්ථාන විනාශ වෙමින් පවතින යුගයක එතුමා පූජා භූමිය සංරක්ෂණය කොට අංග සම්පූර්ණ පූජනීය භූමියක් බවට පත් කොට අනුරාධපුරය නව නගරය ඇති කිරීමට මූලික අඩිතාලම දැම්මා. ඒ වාගේම සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරලා 1973 දී පරිපාලන සේවයෙන් විශ්‍රාම ලැබුවා. 1

975 දී බෞද්ධයන්ගේ අති පූජනීය සිද්ධස්ථානය වන ශ්‍රී දළ දා මාළිගාවේ දියවඩන නිලමේ තනතුරට පත් වූ එතුමා ජාතියේත් බෞද්ධාගමේත් ප්‍රෞඪත්වය කියාපාන ශ්‍රී දළ දා මාළිගාව දියුණුවටත්, බෞද්ධාගමේ දියුණුවටත් විශාල මෙහෙවරක් ඉටු කළා. 1976 දී කෑගල්ල දිස්ත්‍රික්කයේ දැදිගම ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායක වශයෙනුත් සිට 1977 පැවැති පාර්ලිමේන්තු මැතිවරණයෙන් දැදිගම ආසනයේ මහජන නියෝජිතයා බවට පත් වෙලා එම ආණ්ඩුවේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙනුත් ඒ වාගේම අධිකරණ අමාත්‍යවරයා වශයෙනුත් 1977 සිට 1988 දක්වා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ජනතාවට සේවයක් ඉටු කළා. එතුමා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් සේවය

කරන කාලයේදී ගම්බද ප්‍රදේශවල අධ්‍යාපනය නැංවීමටත්, පවතින ගුරු හිඟය නැති කිරීමටත් ගුරුවරුන් විශාල ප්‍රමාණයක් බඳවා ගෙන ඒ තුළින් ගුරුවරුන් දුෂ්කර පාසල් සඳහා යොමු කර තිබෙනවා. එතුමා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එවකට පැවැතියේ එකම විශ්වවිද්‍යාලයයි. කොළඹ, පේරාදෙණිය, ශ්‍රී ජයවර්ධනපුර, කැලණිය, යාපනය පමණක් නොව විවෘත විශ්වවිද්‍යාලයත් ආරම්භ කිරීම සඳහා එම පනත ඉවහල් වුණා. එතුමා අධිකරණ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන සමයේදී චීන රජයේ උපකාරය ඇතුව අලුත්කඩේ නව උසාවි සංකීර්ණය පිහිටුවීමට හැකියාවක් ලැබුණා. එතුමා 1989 දී රුසියාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා වශයෙනුත් සේවය කළා. කෘතහස්ත දේශපාලනඥයකු වශයෙන් ජාතික මෙහෙවරක් ඉටු කළා. දියවඩන නිලමේ වශයෙන් මෙරට බෞද්ධ ආගමික වශයෙන්මෙන්ම සංස්කෘතික වශයෙන් ද සේවයක් ඉටු කළා. රාජ්‍ය සේවකයකු වශයෙන් අප සමාජයටත් ඒ වාගේම තානාපතිවරයකු වශයෙන් ජාත්‍යන්තර මට්ටමෙන් අප රටටත් කීර්තියක් ලබා දුන් ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ සියලුම ජනතාවට ගෞරවයක්. එතුමා කළ ආකාරයට එවැනි සේවාවක් ඉටු කළ හැකි, ඒ වාගේම එවැනි සේවාවක් ඉටු කරන දරු පරපුරක් එතුමා මෙරටට දායාද කර තිබෙනවා. රඹුක්කන මීදුම වලව්වේ දීර්ඝ කාලයක් ජීවත් වූ මෙතුමාට එම ගමේ විසූ මගේ පියාත් ඒ වාගේම මගේ සීයාත් සමඟ ඉතා කිට්ටු සම්බන්ධතාවක් තිබුණා. ගමේකම අමතක නොකළ සමාජ අත් දැකීම් සමඟ අපේ ගම් ප්‍රදේශයට විශාල සේවාවක් කරපු එතුමා උගත් ඉතා නිහතමානි නායකයෙක්.

ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමාට මීදුම ජනතාව, උඩුගම සහ යටගම; මුළු කෑගල්ල දිස්ත්‍රික්කයේම ජනතාව වෙනුවෙන් මේ අවස්ථාවේදී නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම එතුමාගේ මැතිනියට, නෙරන්ජන් විජයරත්න මැතිතුමා ඇතුළු වර්තමාන දැදිගම ආසනයේ සංවිධායක හා හිටපු අමාත්‍ය මා හිතවත් මනෝ විජයරත්න මැතිතුමා ඇතුළු එම පවුලේ සියලු දෙනාටම මගේත් මාගේ පවුලේ ශෝකයත් ප්‍රකාශ කරමින් මා නවතිනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඊළඟට ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே,பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

[අ.භා.3.10]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ පරිපාලන ක්ෂේත්‍රයේත්, දේශපාලන ක්ෂේත්‍රයේත් හිටපු මහා සද්ධන්ත නායකයකුගේ අභාවය ගැන මේ උත්තරීතර සභාවේ ශෝකය පළ කරන මේ අවස්ථාවේ වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන මගේ ස්තුතිය පළමුකොටම පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාමත් කීර්තිමත් රාජ්‍ය පරිපාලන නිලධාරියකු වූ දිවංගත ආචාර්ය නිශ්ශංක විජයරත්න මැතිතුමා අප උපදින්නටත් ඉස්සර ඔබතුමාගේත් මගේත් දිස්ත්‍රික්කය වන ගාල්ල දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපතිවරයා ලෙස 1957 දී කටයුතු කළා. වර්ෂ 1957 සිට 1962 දක්වා කාලය තුළ අනුරාධපුරයේ මහ දිසාපතිවරයා ලෙස කටයුතු කරමින් සුවිශේෂ මෙහෙවරක් ඉටු කරන්නට එතුමා සමත් වුණා.

1959 හර්තාලය ඇති වුණ වෙලාවේ අනුරාධපුරයේ දිසාපති ලෙස සිටියදී යාපනයේ දිසාපති ලෙසත් එතුමා පත්වීම් ලැබුවා. මැදවච්චියෙන් එහාට යන්න බැරි වුණ මොහොතක යාපනයට ගිහිල්ලා කච්චේරිය නැවත රජයේ පාලනයට අර ගන්න, යාපනයේ රාජ්‍ය පරිපාලනය ඇති කරන්නට ඒ අවස්ථාවේදී නිශ්ශංක විජයරත්නයන් සමත් වුණා. අනුරාධපුරයේ දිසාපතිවරයා ලෙස කටයුතු කළ කාලය තුළ අනුරාධපුරය පූජා නගරයක් කළා. ශ්‍රී මහා බෝධිය ඉදිරිපිට පාර, රුවන්වැලි සෑය ඉදිරිපිට පාර වහලා මේ සියල්ල පූජා නගරයට පරිවර්තනය කරන්න එතුමා සමත් වුණා. ඒ වාගේම අනුරාධපුර නගරය ඉතාම සැලසුම් සහගත නව නගරයක් බවටත් නිර්මාණය කරන්න එතුමාට පුළුවන්කම ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුරාධපුරයේ ගුවන් තොටුපළක් ආරම්භ කරලා විවෘත කරන්නත් නිශ්ශංක විජයරත්න මැතිතුමා නිසා පුළුවන් වුණා. අපි දැක්කා පසු ගිය යුද්ධ කාලයේදී ඒ තුළින් මොන තරම් ප්‍රයෝජනයක් ලැබුණාද කියලා. අනුරාධපුරයේ අද තිබෙන ජනාධිපති මන්දිරය එදා දිසාපතිවරයාගේ නිවස හැටියටයි පාවිච්චි කළේ. ඒ දිසාපති මැදුර අද ජනාධිපති මැදුර වෙලා තිබුණත්, දිසාපතිවරයෙක් හැටියට ඒ මැදුර අවසානයට පාවිච්චි කළ දිසාපතිවරයා වුණේ නිශ්ශංක විජයරත්න මැතිතුමායි.

එතුමා අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙසත් ක්‍රියා කළා. විවිධ ක්ෂේත්‍රවල තනතුරු, තානාන්තර හොබවමින් අමිල සේවාවක් නිශ්ශංක විජයරත්න මැතිතුමා අතින් සිද්ධ වුණා.

1965 අවුරුද්දේදී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් පදවියට එතුමා පත් වුණා. 1969 අවුරුද්දේදී හුරුල්ලේ මැතිතුමා තමයි ප්‍රවාහන ඇමතිතුමා වශයෙන් හිටියේ. එතකොට ප්‍රවාහන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් හැටියටත්, පසු කාලයේදී වැඩ බලන ලේකම් හැටියටත් නිශ්ශංක විජයරත්න මැතිතුමාව පත් කළා. 1970 සමඟි පෙරමුණ ආණ්ඩුවේ සංස්කෘතික අමාත්‍යාංශය සහ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය යන දෙකේම එක විට ස්ථිර ලේකම්වරයා ලෙස එතුමාව පත් කර ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1972 අවුරුද්දේදී ජනරජ ලාංඡනය නිර්මාණය කළ කමිටුවේ ලේකම්වරයා හැටියටත් එතුමාව තමයි පත් කළේ. ජනරජ ලාංඡනය දකින විට අපට එතුමාව සිහිපත් වනවා. ඒ ජනරජ ලාංඡනයේ තිබෙන ඉර සහ හඳ එතුමාගේ යෝජනාවක්. ඒකේ තිබෙන ධර්ම චක්‍රය යෝජනා කළේ බණ්ඩාරනායක මැතිනිය. ඒකේ තිබෙන පුන් කළස මහගමසේකරයන්ගේ යෝජනාවක්. බොහොම නිර්මාණශීලී කෙනෙක් කියන එක එතුමා ඔප්පු කරලා මේ වාගේ දේවලට අත ගැහුවා. අවසානයේ, අපේ ප්‍රදේශයේ අපවත් වුණ කලාශූරී මාපලගම විපුලසාර හාමුදුරුවෝ තමයි මේ සියල්ල ඇතුළත් කරලා ජනරජ ලාංඡනය චිත්‍රයට නැඟුවේ.

ජනරජ කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරමින් සිංහ කොඩියේ තිබුණ පුටු කකුල් හතර වෙනුවට බෝ කොළ හතර ඊට එකතු

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

කරන්නත් අපේ නිශ්ශංක විජයරත්න මැතිතුමා කල්පනා කළා. 1972 මැයි 22 වන දා කොළඹ රාජකීය විද්‍යාලයේ නව රඟහල ඉදිරිපිට ජාතික කොඩිය ළෙල දෙන කොට නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ සිතුවිලි කොයි තරම් අලංකාරද කියන එක රටම දැක ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට තවත් රාජ්‍ය ආයතන ගණනාවකම තනතුරු හොබවන්න හැකියාව ලැබුණා. පුවත් පත් මණ්ඩලයේ සභාපතිකමත්, ආයුර්වේද සංස්ථාවේ සභාපතිකමත් ඒ අතරින් කැපී පෙනුණා. නිශ්ශංක විජයරත්න මැතිතුමා සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් හැටියට ඉන්දැද්දී තමයි ශ්‍රී දළ දා මාළිගා පරිශ්‍රය පූජා නගරයක් බවට පත් කිරීමේ මූලික වැඩ කටයුතු ආරම්භ කළේ. ඒ වෙලාවේ දළ දා මාළිගා පූජා භූමියේ මායිම් නිර්ණය කිරීමේ කටයුතු ආරම්භ කරලා කණු හතරක් හිටවන්න එතුමාට පුළුවන් වුණා.

1973 දී පමණ එතුමා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගියා. 1975 දී ශ්‍රී දළ දා මාළිගාවේ දියවඩන නිලමේ තනතුරට ඉදිරිපත් වෙලා, ඒ තනතුරට පත් වීමේ භාග්‍ය නිශ්ශංක විජයරත්න මැතිතුමා ලැබුවා. දියවඩන නිලමේ ලෙස පත් වෙලා ශ්‍රී දළ දා මාළිගාවේ දියුණුවට ඉතාම විශාල සේවාවක් එතුමාගේ අතින් ඉටු කළා. එතුමා 1975 දියවඩන නිලමේ හැටියට පත් වෙලා ඉන්න කොට 1975 සැප්තැම්බර් 17 වෙනි දා ජේ.ආර්. ජයවර්ධන අපේ හිටපු විපක්ෂ නායකතුමාගේ උපන් දිනය දවසේ ශ්‍රී දළ දා මාළිගාවේ පිරිත් පින්කමක් කරන්න තීරණය කරලා, ඊ.එල්. සේනානායක මැතිතුමායි, නොයෙල් විමලසේන මැතිතුමායි ගිහින් ඒ පිරිත් පින්කම පවත්වන්න දියවඩන නිලමේතුමාගෙන් අවසර ඉල්លුවා. එතුමා මහානායක හාමුදුරුවරුන් හම්බ වෙලා ඒ ගැන කියලා අවසර අර ගත්තා, පිරිතක් නිසා. එතකොට තිබුණ සමඟි පෙරමුණ ආණ්ඩුව ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ උපන් දිනයට පිරිතක් කියන්න ඉඩ දුන්නා කියලා 24 පැයෙන් මහ මළුව රජයට පවරා ගන්න ක්‍රියා කළා. ඒ සිද්ධිය ගැන නිශ්ශංක විජයරත්න දියවඩන නිලමේතුමාට ලොකු හිත් රිදුමක් ඇති වුණා.

ඒ ගැන කල්පනා කරලා, කෙසේ හෝ මේ මහ මළුව යළිත් දළ දා මාළිගාවට පවරා ගැනීමේ අධිෂ්ඨානයක් එතුමා තුළ ඇති වුණා.

නිශ්ශංක විජයරත්න මැතිතුමා බොහොම සරල ජීවිතයකුයි ගත කළේ. එතුමා බස් එකේ, කෝච්චියේ ගමන් කරපු කෙනෙක්. දවසක් එතුමා මහනුවර ඉඳලා කොළඹ එන්න කෝච්චියට නැග්ගා. කොළඹ ආවේ මහ මළුව පවරා ගැනීමට විරුද්ධව නඩුවක් දමන්න හිතා ගෙන. කෝච්චියේදී එතුමාට බොහොම අහඹු දෙයක් සිදු වුණා. එදා ගාමිණී දිසානායක මැතිතුමාත් මහනුවර සිට කොළඹට එන්න කෝච්චියේ නැඟලා හිටියා. නිශ්ශංක විජයරත්න මැතිතුමා කොළඹ එන ගමන් මේ දෙදෙනා කෝච්චියේදී මුණ ගැහුණා. පසුව කොටුව දුම්රිය පොළේදී ගාමිණී දිසානායක මැතිතුමාත් සමඟ බහින කොට ගාමිණී දිසානායක මැතිතුමාව කැඳවා ගෙන යන්න කාර් එක ඇවිත් තිබුණා. ගාමිණී දිසානායක මැතිතුමා නිශ්ශංක විජයරත්න මැතිතුමාට එතුමාගේ කාර් එකේ නඟින්න ආරාධනා කළා, එතුමාව කොළඹින් බස්සන්නම් කියලා. ගාමිණී දිසානායක මැතිතුමා ආවේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආරාධනාවකට, එතුමාව මුණ ගැහෙන්න. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, ගාමිණී දිසානායක මැතිතුමාට එදා එන්න කිව්වේ රුක්මන් සේනානායක මැතිතුමා ඉවත් වුණාට පස්සේ දැදිගමට, එක්සත් ජාතික පක්ෂයට හොඳ සංවිධායක කෙනකු තෝරා ගැනීම ගැන සාකච්ඡා කරන්නයි. ඉතින් ගාමිණී දිසානායක මැතිතුමා තමන්ගේ කාර් එක වෝර්ඩ් ප්ලේස් එකට ඇතුළු කළාම අහම්බෙන් වාගේ ජේ.ආර්. ජයවර්ධන මහත්තයා කාර් එක නවත්වන තැනට ඇවිල්ලා හිටියා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා දැක්කා, නිශ්ශංක විජයරත්න මැතිතුමා ඉන්නවා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා නිශ්ශංක විජයරත්න මැතිතුමාට ආරාධනා කළා, "බහින්න, තේ කෝප්පයක් බීලා යන්න" කියලා. මේ ගමනේ කිසිම අරමුණක් ගැන ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා දැන ගෙන සිටියේ නැහැ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා හිතුවා, ගාමිණී දිසානායක මැතිතුමාට එන්න කිව්වේ දැදිගමට සංවිධායක කෙනකු තෝරා ගන්න කථා කරන්න නිසා, නිශ්ශංක විජයරත්න මහත්තයා දැදිගම සංවිධායකකමට සුදුස්සකු විධියට හිතලා එතුමාව එක්ක ගෙන ආවායි කියලා.

නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ පියා වන සර් එඩ්වින් විජයරත්න මැතිතුමා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක්. ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කැබිනට් එකේ හිටපු ඇමතිවරයෙක්; ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේත් හොඳ මිත්‍රයෙක්. ඒ වාගේම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා දැන ගෙන සිටියා, සේනානායකවරුන්ගේ බොහොම කුළුපඟ හිතවතකු හැටියට සර් එඩ්වින් විජයරත්න මැතිතුමා හිටපු බව. ජේ.ආර්. ජයවර්ධන මහත්තයා හිතුවා, සේනානායකලා ළඟින් ආශ්‍රය කරපු, සේනානායකලාට බොහොම ළෙන්ගතුකමක් දක්වපු එඩ්වින් විජයරත්නගේ පුතා වන නිශ්ශංක විජයරත්න තමයි රුක්මන් සේනානායකගෙන් පස්සේ දැදිගම සංවිධායකකමට සුදුස්සා කියලා. අහම්බෙන් වාගේ එතුමාට දැදිගම සංවිධායකකම භාර දුන්නා. භාර දීලා එතුමා දේශපාලනයට ප්‍රවිශ්ට වුණා. ඒ වාගේම 1977 දී දැදිගම ආසනය විශිෂ්ට ලෙස ජයග්‍රහණය කරලා, ආණ්ඩුව කළ පළමුවන කර්තව්‍යය හැටියට, නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ තිබුණු අධිෂ්ඨානය පරිදි, මහ මළුව යළි දළ දා මාළිගාවට පවරා ගැනීමේ කටයුත්ත අතිවිශාල ජනකායකගේ සහභාගිත්වයෙන් එතුමාගේ ආශාව පරිදි ඉටු කළා.

හැත්තෑහතේ ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුවේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමති ලෙස පත් වෙලාත් අධ්‍යාපන ක්ෂේත්‍රයට විශාල සේවාවක් ඉටු කළා. උසස් අධ්‍යාපන ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමායි, රොනී ද මැල් ඇමතිතුමායි එක්ක එකතු වෙලා රුහුණු විශ්වවිද්‍යාලය පටන් ගන්න එතුමාට පුළුවන් වුණා; යාපනයේ වෛද්‍ය විද්‍යාලය ඇති කරන්න පුළුවන් වුණා. විශ්වවිද්‍යාල සියල්ල පුළුල් කරන්න ඒ කාලයේ කටයුතු කරන කොට නිශ්ශංක විජයරත්න ඇමතිතුමා ඒකට සම්පූර්ණ නායකත්වය දුන්නා. 1980 ගණන්වලදී පිරිවෙන් පනත ගෙනෙන්න එතුමාට පුළුවන් වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අදටත් පිරිවෙන් පවත්වා ගෙන යන්න පුළුවන් වෙලා තිබෙන්නේ ඒ පනත ගෙනාපු නිසායි. පිරිවෙන් ගුරුවරුන්ට වැටුප් ගෙවන්න රජයේ ආධාර ලබන්න පුළුවන් වෙලා තිබෙනවා, නිශ්ශංක විජයරත්න මැතිතුමා දුර දිග බලා වැඩ කරපු ඇමතිවරයෙක් වුණු නිසා. 1981 දී UNESCO ආයතනය සමඟ සාකච්ඡා කරලා, UNESCO Council එකේ සභාපති හැටියට එඩ්මන් වික්‍රමසිංහ මහත්තයාටත්, එහි ලේකම් හැටියට නිශ්ශංක විජයරත්න මහතාටත් පුළුවන් වුණා, ලංකාවේ සංස්කෘතික ත්‍රිකෝණ වැඩ පිළිවෙළ පටන් ගන්න. ඒ වැඩ පිළිවෙළ නිසා අනුරාධපුරය, පොළොන්නරුව, මහනුවර, සීගිරිය සංචාරක පුරවර හැටියට දියුණු වන හැටිත් අද අපට දකින්නට පුළුවන් වෙලා තිබෙනවා. සංස්කෘතික ත්‍රිකෝණය හරහා ශ්‍රී දළ දා මාළිගාවේ පූජා භූමියේ වැඩ කටයුතු සම්පූර්ණ කර ගන්නට එතුමාට පුළුවන් වුණා. ඒ අනුව මහ මළුව, ක්වීන්ස් හෝටලය දක්වා දිගු කර ගන්නටත් එතුමාගේ කල්පනාව අනුව පුළුවන්කම ලැබුණා. එතුමා දියවඩන නිළමේ කාලයේදී ශ්‍රී දළ දා මාළිගාවේ පෙරහැරට විනයක් ඇති කළා. පෙරහැරේ ගමන් කරන කොට අලි ඇතුන්ගේ ඇඳුම්, ඒ ගමන් කරන අයගේ ඇඳුම් ගැන පවා එතුමා හොයලා බැලුවා.

ඇසළ පෙරහැර භාරය - Esala Perahera Trust - ආරම්භ කිරීමටත්, ඒ හරහා පෙරහැරටත්, කලාකරුවන්ටත්, ශ්‍රී දළ දා මාළිගාවේ සතර මහා දේවාලවලටත් විශාල සේවයක් කරන්න පුළුවන් වුණා.

නිශ්ශංක විජයරත්න මැතිතුමා ඉටු කරපු තවත් සුවිශේෂ සේවයක් තමයි ජනාධිපති අරමුදල ඇති කිරීම. එතුමා එහි නිර්මාතෘවරයායි. වර්තමාන ජනාධිපතිවරයා දක්වා හැම ජනාධිපතිවරයෙකුගෙන්ම ජනාධිපති අරමුදලෙන් අද විශාල සේවයක් වනවා. නිශ්ශංක විජයරත්න මැතිතුමා තමයි ඒක නිර්මාණය කළේ.

දැනුමින් පොහොසත්ව හිටපු නිශ්ශංක විජයරත්නයන් පොත් පත් කියවීමේ පුදුම රුචිකත්වයක් තිබුණු කෙනෙක්. නිතරම එතුමාගේ අතේ පොතක් තිබුණා. ඇවිදින පුස්තකාලයක් - "Walking Library" - කියලා එතුමාගේ යාළුවෝ එතුමා ගැන නිතර කථා කළා. හැම දාම රෑ එක දෙක වන තුරු පොත් කියෙව්වා. හැබැයි උදේට එතුමාට හත හමාර, අට වන තුරු නැඟිට ගන්න ටිකක් අමාරුකම තිබුණා, රෑ එළි වන තුරු පොත් කියවපු නිසා. සමහර දාට කැබිනට් රැස්වීම්වලටත් ප්‍රමාද වෙලා එන ගතියක් තිබුණා. හැබැයි කවදාවත් එතුමා පරක්කු වුණාට ජේ.ආර්. ජයවර්ධන මහත්තයා මොකුත් අහන්නේ නැහැ. මොකද, ජේ.ආර්. ජයවර්ධන මහත්තයා දන්නවා, එතුමා රෑ එළි වන තුරු පොත් කියවන කෙනෙක් කියලා. ඉංග්‍රීසියෙන් poems ලියන්න එතුමාට සහජ දක්ෂතාවක් තිබුණා. හැම දාම කැබිනට් රැස්වීම්වලදී යම් යම් රසවත් සිද්ධීන් සිදු වුණාම ඒක poem එකක් හැටියට ලියලා ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, ලලිත්, ගාමිණී ඒ වාගේම විමලා කන්නන්ගර ඇමැතිනිය වාගේ අයට යවන සිරිතක් තිබුණා. ඒ හැමෝම ඒවා කියවලා හුඟක් රස වින්දා.

අධිකරණ ඇමති කාලයේ මහනුවර උසාවි සංකීර්ණය ඉවත් කරන්නත්, ඒ ප්‍රදේශය පූජා නගරයට පාවිච්චි කරන්නත් එතුමා කටයුතු කළා. ඒ වාගේම චීන ආධාර අරගෙන කොළඹ නව උසාවි සංකීර්ණය ඇති කළේත් නිශ්ශංක විජයරත්න මැතිතුමායි.

ආදරණීය භාර්යාවකගේ ඒ වාගේම පුතාලා හතර දෙනෙකුගේ හා දියණියකගේ සෙනෙහෙබර පියෙක් වන්නට එතුමාට පුළුවන් වුණා. ලොකු පුතා නෙරංජන් විජයරත්න, තමන්ගෙන් පස්සේ දියවඩන නිලමේ ලෙස පත් වෙලා කටයුතු කරපු කාලයේ අවශ්‍ය සියලුම අවවාද අනුශාසනා පියා වශයෙන් ලබා දුන්නා. දළ දා මාළිගාවට බෝම්බ ගැහුවාම ඒක යළි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය සියලු උපදෙස් තමන්ගේ පුතාට ලබා දෙන්න නිශ්ශංක විජයරත්න මැතිතුමා ක්‍රියා කළා. මාළිගා ප්‍රතිසංස්කරණ අරමුදල ඇති කරලා මහජන ආධාරවලින් මිලියන 140ක් -ලක්ෂ 1,400ක්- වැය කරලා දළ දා මාළිගාව ප්‍රතිසංස්කරණය කරන්න පුළුවන් වුණේ නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ උපදෙස් අනුවයි. දෙවැනි පුතා මනෝ විජයරත්න දේශපාලනයට ඇවිල්ලා ඒ පරම්පරාවේ වාර්තාවක් තියන්නට සමත් වුණා. මනෝ විජයරත්න මැතිතුමාත් ඇමතිවරයෙක් වුණා. තමාත්, තම පියාත්, පියාගේ පියාත් ඇමතිකම් කරපු විජයරත්න පරපුරේ තුන්වැනි පුරුක හැටියට මේ පාර්ලිමේන්තුවේ ඔහු ගත කළේ තමන්ගේ පියා වාගේම දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරුන්ගේ ආදරය, ගෞරවය, ලෙන්ගතුකම දිනා ගත්ත ආදරණීය චරිතයක් හැටියටයි. තෙවැනි පුතා අනුරාධ පළාත් සභා මන්ත්‍රීකමක් කළා. බාලම පුතා ලංකේෂ් තරුණ නීතිඥවරයෙක්. හැබැයි අවාසනාවට එතුමා හදිසියේ තරුණ වියේදීම මිය ගියා. එකම දියණියට තමන්ගේ නමට ගැළපෙන විධියට නමක් දාන්න කටයුතු කළා. නිශාංගනී යනුවෙන් දියණියට නම් තැබුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුවන්ට ආදරයට කථා කළේ හැම තිස්සේම ගැම්කමයි, ආදරයයි දෙකම මුසු වන වචනවලින්. වරෙන්, පලයන්, දීපන්, කාපන්, බලපන් කියලා තමයි හැම තිස්සේම දරුවන්ට කථා කළේ. දරුවා දියවඩන නිලමේද, ඇමතිද කියලා බැලුවේ නැහැ. ඕනෑ සභාවකදී එහෙම තමයි දරුවන්ට ආදරයෙන් කථා කළේ. දරුවන්ට පියා ගැන බොහොම ලොකු සෙනෙහසක්, ආදරයක් වාගේම ගෞරවාන්විත බියකුත් තිබුණා. පියාත් එක්ක නිතර ගමන් බිමන් යන්න, කෑම මේසයේ එකට වාඩි වෙන්න දරුවෝ ටික හරියට භය වුණා. මොකද, නිතරම ප්‍රශ්නයක් අහනවා. ප්‍රශ්නයට උත්තර දුන්නේ නැත්නම් අමුතු විධියේ දඬුවම් දෙන සිරිතක් තිබුණා, දරුවෝ හදන්නට ඕනෑ නිසා. සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් හැටියට සිටියදී දවසක් ලොකු පුතාත් එක්ක පොළොන්නරුවේ රාජකාරි ගමනක් යන්න වාහනයේ යන කොට දඹුල්ලේදී පුතාගෙන් ඇහුවා දඹුලු විහාරයේ ඉතිහාසය දන්නවාද කියලා. පුතා දැන ගෙන හිටියේ නැහැ, ඉතිහාසය. මොකක්ද මේ තාත්තා කළේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාලයේ හැටියට රුපියල් 10ක් කියන්නේ ලොකු ගණනක්. රුපියල් 10ක් දීලා වාහනයෙන් බැස්සුවා, දඹුලු විහාරයට ගිහිල්ලා ඉතිහාසය ඉගෙන ගෙන වරෙන්, මම රට පොළොන්නරුවේ circuit එකේ ඉන්නවාය කියලා. මේ පුතා පයින් පන්සලට ගිහිල්ලා බස් එකේ නැඟලා රෑ හතට විතර පොළොන්නරුවට ආවා. එන කොට පියා කෑම කන්නේ නැතිව බලා ගෙන ඉන්නවා පුතා circuit එකට එන තුරු. ආවාට පස්සේ ඉස්සෙල්ලාම ඉගෙන ගත්ත දේවල් හරිද කියලා බලලා ඊට පස්සේ තමයි කෑම මේසයට එක්ක ගෙන ගියේ.

නිශ්ශංක විජයරත්න චරිතය හරි සුන්දර චරිතයක්. ගස් කොළන්වලට, මල් පැළවලට හරි ආදරෙයි. කාලයක් පේරාදෙනිය circuit එකේ හිටියා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා හැටියට. කොහේ හරි යන කොට මල් පැළයක් දැක්කොත් වාහනය නවත්වනවා. දරුවන්ට කියනවා "පළයන් ගිහිල්ලා මල් පැළයෙන් අතු කැල්ලක් ඉල්ලා ගෙන වරෙන්" කියලා. ඉතින් ළමයි හරි භයෙන් තමයි යන්නේ. මොකද කොතැනකදී හරි මල් පැළයක් දැක්කොත් වාහනය නවත්වනවා. ගිහිල්ලා ඒවා ඉල්ලා ගෙන එන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා poems 1000ක් විතර ලියපු කොළ කෑලි ගෙදර තිබුණා. දරුවෝ ටික තාත්තාට කියන්නේ නැතුව මේවා ඔක්කොම එකතු කරලා පොතක් හැටියට නිර්මාණය කරලා "අපේ අප්පච්චී" කියා පොතක් ගැහුවා. එතුමාගේ උපන් දිනය තිබුණු ජුනි මාසයේ 14 වැනිදා දවසක Russian Centre එකට එන්නය කියලා දරුවෝ ටික -තාත්තා කලින් මේ ගැන දැන ගෙන සිටියේ නැහැ- "අපේ අප්පච්චී" කියා නම් තැබූ තාත්තාගේ poems එකතු කරලා හදපු පොත එතුමාට පිළිගැන්නුවාම එදා එතුමා විශාල සතුටක් ලැබුවා.

නිශ්ශංක විජයරත්න මැතිතුමා ගැන කතා කරනවා නම් බොහෝ දේ කියන්න තිබෙනවා. නමුත් ඉතා සුළු වෙලාවකදී මේ වාගේ දැවැන්ත දේශපාලන චරිතයක් ගැන, මේ වාගේ මහා පරිණත උගතෙක් ගැන, මේ තරම් විශාල සේවයක් කරපු කෙනෙක් ගැන කතා කරන එක ලොකු ප්‍රශ්නයක්. එතුමාගේ පුතුන් වන නෙරන්ජන්, මනෝ, ලංකේෂ් අපි විටින් විට හොඳින් ආශ්‍රය කළා. ඉතාම සුන්දර පුද්ගලයන් හැටියට අප ඔවුන් හඳුනා ගෙන තිබෙනවා. මගේ බාප්පා වූ රූපා කරුණාතිලක මැතිතුමා සමඟ පාර්ලිමේන්තුවේදී ඉතාමත් ලෙන්ගතු මිතුරන් හැටියට එතුමා මිය යන තුරුම කුලුපගව ආශ්‍රය කළා.

මම මීට වඩා දීර්ඝ කතාවක් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. රටට මේ තරම් විශාල සේවයක් ඉටු කළ පරිපාලන නිලධාරියෙක්, දියවඩන නිලමේවරයෙක්, විදේශ තානාපතිවරයෙක්, කැබිනට් අමාත්‍යවරයෙක් වූ ආචාර්ය නිශ්ශංක විජේරත්න මැතිතුමාගේ අභාවය ගැන අපි අතිශයින් සංවේගයට පත් වෙනවා. එතුමාගේ ආදරණීය භාර්යාවටත්, පුතුන් හතර දෙනාටත්, එකම දියණියට, ලේලිවරුන්ට, බෑණනුවන්ට සහ මුණුබුරු මිණිබිරියන්ට අපේ සාතිශය සංවේගය පුද කරන මෙන් ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමින් එතුමාට නිවන් සැප ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 3.27]

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැදිගම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝක යෝජනාව ගෙනෙන මේ අවස්ථාවේදී සංස්කෘතික අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙක් ලෙසත්, සංස්කෘතික විෂය භාරව හිටපු අමාත්‍යවරයකු ලෙසත්, මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටු වූ නායකයා ලෙසත් එතුමා පිළිබඳව පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීවරුන් අදහස් පළ කළ බව අපි දැක්කා. විශේෂයෙන් කොළඹ රාජකීය විද්‍යාලය සහ ඇලෙක්සැන්ඩ්‍රා යන විද්‍යාලවලින් අධ්‍යාපනය ලබා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ගෞරව උපාධියක් ලැබූ මෙතුමා පරිපාලන ක්ෂේත්‍රයේ ඉතාමත් බැරෑරුම් අවස්ථා ගණනාවකදී තමන්ගේ හසළ බුද්ධිය, ප්‍රායෝගිකභාවය ප්‍රයෝජනයට ගෙන පරිපාලන ක්ෂේත්‍රයේ විවිධ කාර්ය භාරයන් ක්‍රියාත්මක කර තිබෙනවා. 1956දී ගාල්ලේ සහකාර ආණ්ඩුවේ ඒජන්තවරයා වශයෙන් පත් වී පසුව අනුරාධපුරයේ මහ දිසාපතිවරයා හැටියටත්, යාපනයේ මහ දිසාපතිවරයා හැටියටත් එතුමා කටයුතු කර තිබෙනවා. විශේෂයෙන් අනුරාධපුර පූජා නගරය පිහිටු වීමේ කාර්යයේදී එතුමා ඉතාමත් ප්‍රායෝගික නායකයෙක් විධියට, බෞද්ධයෙක් විධියට විවිධ බටහිර බලපෑම්වලට යටත් නොවී ඒ කටයුත්ත ඉටු කළා. අදත් පරිපාලන නිලධාරීන් පුහුණු වීමේ වැඩසටහන්වලදී අනුරාධපුර පූජා නගරය පිහිටු වීමේදී එතුමා දක්වපු විවිධ ප්‍රායෝගික කුසලතාවන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන්ට, ඒ වාගේම සහකාර ලේකම්වරුන්ට පැහැදිලිව පෙන්වා දෙන්න කටයුතු කරනවා.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන් අනුරාධපුර ගුවන් තොටුපළ ඉදි කිරීම සඳහා ඉඩම් අත් පත් කර ගැනීම පිළිබඳ කාරණයේදී එතුමා ඉතාමත් ගැඹුරින් කටයුතු කළා. අනුරාධපුර කෞතුකාගාරය නිර්මාණය කිරීමේදී විවිධ අංශ කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කරන්න එතුමාට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම 1962 දී යාපනයේ දිසාපතිවරයා වශයෙන් සිටි කාලයේදී එදා යාපනයේ ජනතාව අතර තිබුණු ඒ මිතු දහම, ඒකාබද්ධතාවය, සුහදතාවය මත සිංහල, දමිළ, මුස්ලිම් යන ඒ සියලු ජන කොටස් එකතු කර ගෙන -එක පාර්ශ්වයක් විතරක් නොවෙයි අනික් හැම පාර්ශ්වයක්ම එකතු කර ගෙන- වැඩ කරන්න එතුමාට පුළුවන් වුණා. ඒ කාලයේදී යාපනයේ තිබුණු විවිධ පාසල්වල සිංහල ශිෂ්‍යයන් විශාල ප්‍රමාණයක් ඉගෙන ගෙන තිබෙනවා. උදාහරණයක් හැටියට දිවංගත මෛත්‍රීපාල සේනානායක මැතිතුමා, දිවංගත කේ.බී. රත්නායක මැතිතුමා, අපේ ගරු අමාත්‍ය එස්.බී නාවින්න මැතිතුමාගේ සොහොයුරා වැනි විශාල පිරිසක් යාපනයේ අධ්‍යාපනය ලබා තිබෙනවා. ඒ මිතු දහම යාපනයේ පාසල් තුළ විතරක් නොවෙයි අනෙක් සෑම තැනකදීම ක්‍රියාත්මක කරන්න එතුමා විශාල මහන්සියක් දැරුවා.

1965 වර්ෂයේ එතුමා ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ ලේකම්වරයා විධියටත්, 1970 දී සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්වරයා විධියටත් කටයුතු කරමින්, මේ අමාත්‍යාංශවල පරාසය වෙනස් කරමින්, අලුත් නිර්මාණ, අලුත් වැඩසටහන් ක්‍රියාත්මක කරන්න කටයුතු කළා. එසේම මධ්‍යම සංස්කෘතික අරමුදල වාගේ අරමුදල් ක්‍රියාත්මක කරමින් මහනුවර, අනුරාධපුර, පොළොන්නරුව කියන දිස්ත්‍රික්ක කේන්ද්‍රගත කරමින් මෙයට අනුගත යුනෙස්කෝ ආධාර ලබා ගන්නත් එතුමා කටයුතු කළා. එතුමා යුනෙස්කෝ සංවිධානය හරහා මේ කටයුතු කාරණා ක්‍රියාත්මක කිරීම නිසා ඒ අරමුදල මේ වෙන කොට විශාල ආදායම් ලබන අරමුදලක් බවට පත් වෙලා තිබෙන බව සංස්කෘතික විෂය භාර අමාත්‍යවරයා විධියට අද මට කියන්න පුළුවන්. අද විශාල වශයෙන් සංචාරකයන්ගේ පැමිණීමත් එක්ක මුදල් නොමැති ඒවාට ඒ අරමුදලින් අපි ආධාර ලබා දෙනවා. අප ගිය සතියේ මධ්‍යම සංස්කෘතික අරමුදලින් මිලියන 20ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලබා දුන්නා, පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා. ඒ එතුමා ආරම්භ කරපු වැඩ පිළිවෙළක් නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්ත ලෝක වාසීන්ගේ ගෞරවයට පාත්‍ර වෙච්ච දළ දා වහන්සේ ආරක්ෂා කරමින් දීර්ඝ කාලයක් දළ දා මාළිගාවේ දියවඩන නිලමේවරයා විධියට කටයුතු කරමින්, පෙරහැරට අලුත් අංග ඉදිරිපත් කරලා, ඒ වාගේම ඒ පරම්පරාගත නාට්‍ය ශිල්පීන්ට විශේෂ වූ සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් දළ දා මාළිගාව ඉතාමත් ඉහළ පූජනීය ස්ථානයක් බවට පත් කරන්න, විනයගරුක ස්ථානයක් බවට පත් කරන්න එතුමාගේ කාලය තුළ දී ඉතා විශාල කැපවීමක් කළා.

නිශ්ශංක විජයරත්න මැතිතුමා මේ කටයුතුවලින් බැහැර වුණාට පස්සේ එක්සත් ජාතික පක්ෂයේ ඉල්ලීම මත කෑගල්ල දිස්ත්‍රික්කයේ දැදිගම මැතිවරණ කොට්ඨාසයේ සංවිධායකවරයා විධියට පත් වුණා. ඒ කාලයේ අද වාගේ දිස්ත්‍රික් ක්‍රමයක් තිබුණේ නැති නිසා එතුමා දැදිගම මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ලොකු කාර්ය භාරයක් ඉෂ්ට කළා. එම ආසනයේ පාසල්, රෝහල්, විශේෂයෙන්ම අද දැදිගම තිබෙන ප්‍රධාන රෝහල, ඒ වාගේම අනිකුත් ගොඩනැඟිලි, විද්‍යාල ආදිය විශාල ප්‍රමාණයක් ගොඩ නඟන්න එතුමාට ඒ කාලය තුළ පුළුවන්කම ලැබුණා. 1981 දී අධිකරණ අමාත්‍ය ධුරය භාර ගත් මොහොතේදී විශේෂයෙන් එතුමා අලුත් කටයුතු කාරණා කීපයක් කළා වාගේම, පිරිවෙන් පනත හා සංඝාධිකරණ පනත වැනි ගැඹුරු විවේචනවලට භාජනය වෙච්ච පනත් ගණනාවක් ගේන්නටත් එතුමාට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම එතුමා යුනෙස්කෝ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතයා වශයෙන් කටයුතු කළා. එහෙම කටයුතු කරන කාලයේ එතුමාට ලංකාවේ හුඟක් කාරණාවලට, ආසියාවේ හුඟක් කාරණාවලට යුනෙස්කෝ නියෝජිතයෙක් විධියට වැඩ කර ගන්නට පුළුවන්කම ලැබුණා. එතුමා වසර ගණනාවක් තානාපති සේවාවේ -විශේෂයෙන් රුසියානු තානාපතිවරයා විධියට- යෙදී සිටියා.

එතුමාගේ මව වන ලීලාවතී පෙතියාගොඩ මැතිනියගේ පරම්පරාව ගැන කථා කළොත්, මම අධ්‍යාපනය ලැබූ විද්‍යාලයේ -කුරුණෑගල මලියදේව විද්‍යාලයේ- විදුහල්පතිවරයෙක් හැටියට කටයුතු කරපු පෙතියාගොඩ මැතිතුමා ඒ පරම්පරාවේ ඉතාමත් දීප්තිමත් විදුහල්පතිවරයෙක් බව මම මතක් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායතුමනි, ඓතිහාසික කන්ද උඩරට පරම පූජනීය වූ දළ දා වහන්සේ ආරක්ෂා කිරීම උදෙසා පොදු මහත් ජනතාවට මහ පෙන්වමින් ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම පිණිස සුවිශේෂ මෙහෙවරක් ඉටු කළ දැදිගම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මෙන්ම, විවිධ අමාත්‍ය ධුර ගණනාවක් හෙබ වූ ආචාර්ය නිශ්ශංක පරාක්‍රම විජයරත්න මැතිතුමාට නිවන් සුව අත් වේවායි මා ප්‍රාර්ථනා කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාගේ දයාබර දූ දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන මෙන්ද ගෞරවයෙන් ඉල්ලා සිටිමි. බොහොම ස්තුතියි.

[ අ.භා. 3.35]

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

I am happy to be able to participate at this point and speak a few words to express my respect and condolence to the family of the late Hon. (Dr.) Nissanka Wijeyeratne,

who was the son of Sir Edwin Wijeyeratne and Lady Leela Wijeyeratne. I have many reasons to speak today.

One is that the Hon. (Dr.) Nissanka Wijeyeratne represented Parliament from the District of Kegalle, which I too represent. My father was a contemporary and a close friend of the Hon. Nissanka Wijeyeratne. Furthermore, the Hon. Nissanka Wijeyeratne's son, Manoda Wijeyeratne and I were also colleagues who contested together and served together in this House. At the same time the late Nissanka Wijeyeratne's brothers, Dr. Cuda Wijeyeratne and the late Tissa Wijeyeratne, were very close family friends. I remember when I was a child I used to go to see Dr. Cuda Wijeyeratne as our family doctor. The late Tissa Wijeyeratne was a close friend of my father who studied together in England. They had two completely opposing political doctrines - my father was a Conservative and the late Tissa Wijeyeratne was a Marxist, but they were good friends. All this has a certain bond and an obligation for me to say a few words of this great man.

His children, Neranjan, Manoda, Anuradha, Lankesh and Nishangani, have served the community in one way or the other. They have been worthy children of a worthy father. I think lots of things have been said about his service. So, I need not repeat them. But, it is important to say that he went to Jaffna as the Government Agent with Major General Richard Udugama in the wake of the 1958 riots. He was sent there to look after the issues and he did a grand job. In his service in Anuradhapura as the Government Agent, the late Mrs. Sirimavo Bandaranaike entrusted on him the implementation of the Anuradhapura Sacred City Project and everybody knows how well he did that. He held many positions and finally, under the late President J.R. Jayewardene's Government, which was made of many giants, the Hon. Nissanka Wijeyeratne was one of those great giants in that Cabinet. He had an exemplary period of service and he was the Education Minister and even today, people in all villages in the Kegalle District speak about the service he rendered. A lot of people were given education, jobs and the level of the service was greatly enhanced by the work during his period. This is one of the things people still speak about.

The highlight of his career which really shows his greatness, not only as a politician, but as a statesman also was that when he was the Minister of Justice. Following the 1983 riots, there was a prison riot in Sri Lanka in July in which dozens of people were killed in prison. As the Minister of Justice, the Hon. Nissanka Wijeyeratne resigned from his portfolio. This is something exemplary and something we do not see today. That was his greatness that went beyond being a simple politician and to be graded as a true statesman. When he became the Diyawadana Nilame and after that, little did he or his family think that his son would also succeed him as Diyawadana Nilame. I think Mrs. Nita Wijeyeratne can be one of the few or perhaps the only mother in Sri Lanka who can say that she had a husband as the Diyawadana Nilame and also a son also as the Diyawadana Nilame. She holds that honour.

I would say that the Hon. Nissanka Wijeyeratne was a man of great versatility. In his public life, he displayed not only wisdom but wisdom with humour also. He was a lovable man. Once Professor Carlo Fonseka had introduced him as a scholar, a poet, a politician, an ambassador and a prestigious civil servant; a lot of words to describe a single person. In fact, as my Colleague the Hon. Gayantha Karunatilleka rightfully said, the collection of his poetry, which was called "*Ape Appachchi*" put together by his children was actually a great collection of his works.

I would also like to recollect a story that somebody told me. The Hon. Nissanka Wijeyeratne was a close of friend of Prof. Carlo Fonseka. During the 1980s, in the uprising of the JVP insurrection, Prof. Carlo Fonseka's son was in trouble with the army and there was an imminent arrest. At that time, the Hon. Nissanka Wijeyeratne intervened and ensured that his friend's son was all right. He went to great extents to make sure that he was not taken in.

Now, again when you look at his son, the Hon. Mano Wijeyeratne, there was a similar episode at one point, when Mr. C.A. Chandraprema was taken to the fourth floor and was being harassed, the Hon. Mano Wijeyeratne was one of the first few with his wife Bharathie who got involved to make sure that Mr. C.A. Chandraprema was not harassed unduly and that he was released. So, you see the greatness that runs in the family. That is something we should appreciate.

In closing my remarks, I would like to say that one of the greatnesses of the Hon. Nissanka Wijeyeratne was not only that he loved and respected Buddhism, but he equally loved and respected other faiths and religions also. I express my condolences and respect to the family on behalf of the people of Kegalle District.

Thank you.

[අ.භා.3.42 ]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)

(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ජීවත් වුණු ඉතාමත් ශ්‍රේෂ්ඨ ගණයේ මනුෂ්‍යයකු ගැන වචන කිහිපයක් කථා කරන්න ඔබතුමා මට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා.

ගරු නිශ්ශංක විජයරත්න අමාත්‍යතුමා මට මුණ ගැසුණේ, 1983 අවුරුද්දේ. මම නවක මන්ත්‍රීවරයකු හැටියට පාර්ලිමේන්තුවට පත් වෙලා ඇවිල්ලා ඉතාම භයෙන් හා සැකෙන්

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

මේ ගරු සභාවේ හැසිරෙන වෙලාවකදී එතුමා මාව කැඳවා ගෙන ගියා එතුමාගේ කාමරයට. ගිහිල්ලා මේ ගරු සභාවේ හැසිරෙන ආකාරය ගැන, මේ ගරු සභාවේ කටයුතු කළ යුතු ආකාරය ගැන හා දේශපාලන ක්ෂේත්‍රයේ කටයුතු කළ යුතු ආකාරය ගැන මට හොඳ දේශනාවක් පැවැත්වූවා, මේ විධියට කරන්න, මේ විධියට කරන්න කියලා. මම එදා තමයි එතුමාගේ දැනුම් සම්භාරය ගැන, එතුමාගේ අත් දැකීම් සම්භාරය ගැන අවබෝධයක් ලැබුවේ. එතුමා කෙරෙහි එදා අප තුළ තිබුණු ගෞරවය අදත් අපේ සිත්වලින් ඉවත් වෙලා නැහැ. මන්ත්‍රීවරුන්ට ඉතා හොඳින් සලකලා, සෑම මන්ත්‍රීවරයෙකුටම ලොකු සැලකිල්ලක්, ගෞරවයක් ලබා දුන්නු පුද්ගලයෙකු හැටියටයි අපි එතුමාව දැක්කේ. ඒ වාගේ ශ්‍රේෂ්ඨ ගතිගුණ තිබ්බ්ච, හොඳ උත්තම ගණයේ මහත්මයෙක්. අපි ඒ කාලයේ එතුමාව දැන ගෙන සිටියේ ගුරු පත්වීම් රාශියක් දුන්නු ඇමතිවරයා හැටියටයි.

නිශ්ශංක විජයරත්න මැතිතුමා මහජනයාත් එක්ක ඉතාම සමීපව කටයුතු කරන්න පුළුවන් හැකියාවක් තිබුණු ශ්‍රේෂ්ඨ නායකයෙක්. එතුමාගේ දැනුම ගැන, එතුමා කරපු කටයුතු ගැන මේ ගරු සභාවේ බොහෝ දෙනා මේ අවස්ථාවේ කරුණු ඉදිරිපත් කළා. මම එතුමාව දන්නේ ඈත අතීතයේ ඉඳලා. එතුමා අපේ පළාතට සම්බන්ධයි. ඒ සම්බන්ධතාවත් අපට ලොකු හයියක්, ධෛර්යයක් වුණා අපේ සම්බන්ධතාවන් ගොඩනගා ගන්න. නිශ්ශංක විජයරත්න මැතිතුමා හුඟක් වෙලාවට තමන්ගේ අදහස් නිදහස්ව ප්‍රකාශ කරපු ශ්‍රේෂ්ඨ ගණයේ මන්ත්‍රීවරයෙක්. හැම දෙයකම එල්බ ගෙන සිටියේ නැහැ. යමක් විනිවිද දැකීමේ හැකියාව, අඩු පාඩුවක් දැක්කාම ඒ ගැන කථා කිරීමේ හැකියාව තිබුණා. ඒ වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ තරම් කාරණා එතුමාගේ මනසේ තිබුණා. ඒ තරම් විශාල දැනුමක් තිබුණ කෙනෙක් එතුමා. එතු මා සුදුසු අවස්ථාවේදී සුදුසු විධියට කටයුතු කරපු නායකයෙක්.

එතුමාගේ දරුවකු වන මනෝද විජයරත්න මැතිතුමාත්, මේ ගරු සභාවේදී අපිත් එක්ක ඉතාම සමීපව කටයුතු කළා. එතුමාත් නිවැරදිව කටයුතු කරන, නිවැරදි දැක්මක් ඇති පුද්ගයෙක්. එතුමා අපිත් එක්ක එකතු වෙලා, අතිගරු ජනාධිපතිතුමා සමඟ එකතු වෙලා මේ රටේ කළ යුතු දේ මොනවද කියන එක හඳුනා ගෙන කටයුතු කරන්න ඉදිරිපත් වුණා. නිශ්ශංක විජයරත්න මැතිතුමා එතුමාට දීපු දායාදයක් හැටියටයි මම ඒක දකින්නේ. රට වෙනුවෙන් විශාල කැක්කුමකින්, සිංහලයා, බෞද්ධයා වෙනුවෙන් හැම දාම එතුමා අපිත් එක්ක කරුණු කථා කළා. සිංහලකම ගැන, බෞද්ධකම ගැන, මේ රටේ උරුමය ගැන එතුමා ඉතා ගැඹුරින් කරුණු හදාරපු, ඒ වෙනුවෙන් අති විශාල කැපවීමක් කරපු පුද්ගලයෙක්.

පසු ගිය වකවානුවේ ඇති වුණු යම්, යම් ප්‍රශ්න ගරු නිශ්ශංක විජයරත්න මහතා ඒ යුගයේ දැකලා තිබුණා. ඒ නිසා මේ රටේ අවශ්‍යතාව හඳුනා ගෙන හිටපු නායකයකු හැටියට එතුමාගේ අභාවය අපට, මේ සමාජයට දරන්න බැරි තරම් පාඩුවක් හැටියටයි මම දකින්නේ. මම හොඳටම දන්නවා අද එතුමා ජීවත් වෙලා සිටියා නම් මේ රජයත් එක්ක එකතු වෙලා, අද ගෙන යන මේ රට ගොඩ නැඟීමේ දැවැන්ත කර්තව්‍යයට එතුමාත් එකතු වන බව. ඒ ගැන කිසිම සැකයක් නැහැ. මොකද, එතුමා බලාපොරොත්තු වුණු දේවල් තමයි අද මේ රටේ සිද්ධ වෙන්නේ. මේ රට බේරා ගෙන, මේ රට සංවර්ධනය කරා ගෙන යන ආකාරය ඒ යුගයේ එතුමාගේ සිහිනයක් හැටියට තිබුණා. ඒ වැඩ පිළිවෙළ අද ක්‍රියාත්මක වෙනවා. එය ක්‍රියාත්මක වන බව එතුමා දැන ගෙන සිටියා නම් එතුමා අපිත් එක්ක අද මේ ස්ථානයේ ඉන්නවා. රට වෙනුවෙන් ඒ තරම් හොඳ කැක්කුමක්, බලාපොරොත්තු රාශියක් සිත් තුළ තියා ගෙන ජීවත් වෙලා කටයුතු කරපු නායකයෙක් එතුමා.

නිශ්ශංක විජයරත්න මැතිතුමාව මම දකින්නේ තමන්ගෙන් පසුව එන අලුත් නායකයන්ට ඉතා හොඳ ආදර්ශයක් දුන්නු නායකයකු හැටියටයි. එතුමාගේ දරුවකු හැටියට මනෝද විජයරත්න මැතිතුමාත් ඒ කටයුත්ත ඉතාමත් සාර්ථකව ඉෂ්ට කර ගෙන යනවා. එතුමා නිවැරදි තීරණ අරගෙන, මේ රට වෙනුවෙන්, ජාතිය වෙනුවෙන්, සිංහලයා වෙනුවෙන්, බෞද්ධයා වෙනුවෙන් ගෙන යන මේ වැඩ පිළිවෙළට රජයත් එක්ක එකතු වෙලා, මේ රජයට සහයෝගය දක්වලා තිබෙනවා. ඒ සහයෝගය, ඒ ආශිර්වාදය අද අපට ලැබෙමින් පවතිනවා. අපි ඒ ගැන සතුටු වෙනවා වාගේම නිශ්ශංක විජයරත්න මැතිතුමා දුන්නු ඒ දායාදයන්ට මගේ ගෞරවණීය ස්තුතියත් පළ කරමින්, එතුමාට නිවන් සුව අත්වේවා! කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

[අ.භා. 3.47 ]

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ කාලයේ හිටි දැවැන්ත යුග පුරුෂයකු ගැන කථා කරන වෙලාවක, මතක් කරන වෙලාවක එතුමා අනුස්මරණය කරමින් වචන කීපයක් කථා කරන්නට මට අවස්ථාව දීම ගැන මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නිශ්ශංක විජයරත්න හිටපු ඇමතිතුමා ගැන, එතුමා කරපු සේවාව ගැන අප මේ සභාව තුළ අදට දින දෙකක් කථා කරනවා. විශාල පිරිසක් මේ ශෝක ප්‍රකාශ යෝජනාවට අදහස් දක්වා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1977 පාර්ලිමේන්තුවට දැදිගමින් තේරී පත් වෙච්ච මන්ත්‍රීවරයකු හැටියට පමණක් නොවෙයි, ඉතිහාසයේ මේ රටට විවිධ ක්ෂේත්‍රවලින් නොයෙක් ආකාරයේ දායකත්වයන් ලබා දීපු පවුලක ඉතාම උතුම්, ඒ වාගේම ප්‍රතාපවත් පෞරුෂයක් තිබුණු පවුලක කෙනකු හැටියට ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමා හඳුන්වන්න පුළුවන්.

ශ්‍රීමත් එඩ්වින් විජයරත්න මැතිතුමාට දාව ලීලාවතී විජයරත්න ආර්යාවට උපන් නිශ්ශංක විජයරත්න මැතිතුමා ඒ කාලයේ රාජකීය විද්‍යාලයට ගිහිල්ලා අධ්‍යාපනය ලැබුවා. එතුමා බොහොම හොඳ ඉංග්‍රීසි දැනුමක් තිබුණු කෙනෙක්. එතුමාගේ සහෝදරයන් හැටියට තිස්ස විජයරත්න මහත්මයාත්, කුඩා විජයරත්න මහත්මයාත් මේ ඉතිහාසයේ නොමැකෙන නමක් තියපු උදවිය. එක් සහෝදරයෙක් බැරිස්ටර්වරයෙක්. තවත් සහෝදරයෙක් විශේෂඥ වෛද්‍යවරයෙක්. ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ඉතිහාසය පිළිබඳ ගෞරව උපාධිය ලබපු කෙනෙක්. සිවිල් සේවයට ඇතුළත් වූ එතුමා එම සේවයට අමරණීය මෙහෙවරක් ඉටු කළා. මේ රටේ ඉතිහාසය මතක තියා ගන්න පුළුවන් පවුලක් හැටියට තමයි සබරගමුවෙන් බිහි වෙච්ච විජයරත්න පවුල අපට හඳුන්වන්නට පුළුවන් වන්නේ.

උපදිසාපතිවරයකු හැටියට, දිසාපතිවරයකු හැටියට, අමාත්‍යාංශ ස්ථිර ලේකම්වරයකු හැටියට, ඇමතිවරයකු හැටියට එතුමා කරපු සේවය මගේ කාලය සීමා කරමින් මට ලබා දී තිබෙන මේ විනාඩි පහ තුළ නම් මට කියන්න අමාරුයි. මෙහි පෙනෙන්නට තිබෙන රාජ්‍ය ලාංඡනය නිර්මාණය කරන කොට ඒ කමිටුවේ සභාපතිවරයා වුණේ එතුමා. ඒ වාගේම ජාතික කොඩියේ කොන් හතරට බෝ කොළ හතර එකතු කරන එකේ අදහස ලැබුණේ එතුමාගෙනුයි කියලාත් අපි දන්නවා. විශේෂයෙන්ම දියවඩන නිලමේවරයා හැටියට කටයුතු කරපු අවුරුදු 10 කාලය තුළ සිංහල බෞද්ධ උරුමය, සිංහල බෞද්ධ අනන්‍යතාව, සිංහලකම, ගමේකම රැක ගන්න එතුමා කටයුතු කළා. රාජකීය විද්‍යාලයේ ඉගෙන ගත්තත් එතුමා අපේ පක්ෂයේ

හිටපු, නියම ගැමිකම හඳුනා ගත්තු නායකයෙක්. 1977 පාර්ලිමේන්තුවට තේරී පත් වූ එතුමා එකල මේ රටේ තිබුණු දැවැන්ත ගුරු හිඟය පියවන්න අධ්‍යාපන ඇමතිවරයා හැටියට කටයුතු කළාය කියන එක අප අමතක කරන්න හොඳ නැහැ. එදා එතුමා ලංකා විශ්වවිද්‍යාලය හැටියට තිබුණු විශ්වවිද්‍යාලය වෙනම විශ්වවිද්‍යාල පහක් බවට පත් කළා. ඒ විශ්වවිද්‍යාල පහට අමතරව රුහුණ විශ්වවිද්‍යාලයත් ඇති කරලා විවෘත විශ්වවිද්‍යාලයත් ඇති කරපු එක අපට අමතක කරන්නට බැහැ.

ජාතීන් කිහිපයක් ජීවත් වන මේ රටේ සුළු ජාතික දරුවන්ට තම ජාතික අනන්‍යතාව ආරක්ෂා වන විධියට පාසල් නිල ඇඳුම ඇඳීමේ අයිතිය ලබා දුන්නේත් ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමායි.

සංස්කෘතික ත්‍රිකෝණය ඇති කරපු එක, ඒ වාගේම අනුරාධපුරය පූජා නගරයක් කරපු එක එතුමා කළ තවත් විශේෂ කාර්යයන් දෙකක්. මේ හැම එකක් මඟින්ම අද මේ රටට දැවැන්ත සේවයක් ඉටු වෙනවා. නොයෙකුත් මූල්‍යමය ආධාර ලබා දෙමින් සෞඛ්‍ය ආදි ක්ෂේත්‍රයන්ට අවශ්‍ය උදවු උපකාර කරන ජනාධිපති අරමුදල පිහිටුවන්නත් ගරු නිශ්ශංක විජයරත්න හිටපු ඇමතිතුමා එදා මුල් වුණා කියන එක, ඒක එතුමාගේ යෝජනාවක් හැටියට සිදු වුණාය කියන එක අප අමුතුවෙන් මතක් කරන්නට අවශ්‍ය නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ගැන කථා කරන කොට එතුමාගේ සේවය ගැන දීර්ඝ වශයෙන් කියැවුණා. එතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට, අධිකරණ ඇමතිවරයා හැටියට සේවය කරපු හැටි, ඒ වාගේම අලුත්කඩේ උසාවි සංකීර්ණය ලබා ගන්න එදා චීන සමූහාණ්ඩුවෙන් උදවු උපකාර ගන්න කටයුතු කරපු හැටි අපට මතකයි. මේ හැම එකක්ම සදා අනුස්මරණීයයි.

විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ, දයාබර පුතනුවන් හතර දෙනෙක්, දියණියක් සිටි පියෙක් හැටියට එතුමාගේ ජීවිතයේ අවසාන කාලය බොහොම සන්තෝෂයෙන් ගත කරන්නට එතුමාට පුළුවන් වුණු බව. මොකද, එතුමා ජීවිතයේ නොයෙකුත් අවස්ථාවන්වල දරපු තනතුරු සහ ලබපු අත් දැකීම් සියල්ල ඉදිරියට ගෙන යන්නට එතුමාගේ පුතනුවන් හතර දෙනාට පුළුවන්කම ලැබුණා. දියවඩන නිලමේ හැටියට එතුමාගෙන් පසුව නෙරංජන් විජයරත්න මැතිතුමාටත්, තමන්ගේ දේශපාලන ගමන් මඟ ගෙන යන්න මනෝද විජයරත්න මැතිතුමාටත්, ඒ වාගේම අනුරාධ විජයරත්න මහතාටත්, ඒ වාගේම තමන්ගේ අධ්‍යාපනය පිළිබිඹු කරන්නට අධි නීතිඥවරයෙක් හැටියට ලංකේෂ් විජයරත්න මහතාටත් හැකියාව ලැබුණා. මේ දරුවෝ හතර දෙනා තමන්ගේ පියාගේ අඩිපාරේ යමින් මේ මහා යුග පුරුෂයාගේ ගමන් මඟ ඉදිරියට ගෙන යන්නට කටයුතු කළාය කියන එකත් මේ අවස්ථාවේ දී මතක් කරන්නට කැමැතියි. විශේෂයෙන්ම ලංකේෂ් විජයරත්න පුතනුවන් ඉතාම තරුණ වයසේ දී ජීවිතයෙන් සමු ගත්තත් ඒ පවුලේ තිබුණු බැඳීම, ඒ පවුලේ තිබුණු අනන්‍යතාව නිසා මේ රට තුළ සදා නොමැකෙන නමක් තබා ගන්නට විජයරත්න පවුලට හැකියාවක් ලැබී තිබෙනවාය කියන එකත් මතක් කරනවා. අවසාන වශයෙන් ඒ යුග පුරුෂයාණන් වන නිශ්ශංක විජයරත්න මැතිතුමාට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

[අ.භා. 3.54 ]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Deputy Speaker, I rise in this House today to pay my humble tribute to the memory of a great personality who rode as a colossus in the political, religious and social firmament of Mother Lanka. He inherited a noble culture; a great Buddhist background. An intellectual of repute, a scholar of fame, a philosopher in his own right, an advocate of religious persuasions and an enlightened personage of multi-religious concepts - he is Deshamanya Dr. Nissanka Parakrama Wijeyeratne.

Sir, I have lot of things to say but, you are limiting my speech. Therefore, I would only say this much. I chose to speak particularly in English because people in India adore him. The should understand what I am saying about their hero. He has attended several conferences in India particularly in Kayalpatnam and his scholarly disposition is still being talked about in the corridors of the Indian Muslim leaders and even in the Tamil Nadu State Assembly.

Deshamanya Dr. Nissanka Wijeyeratne was born to a leading family in Sabaragamuwa on 14$^{th}$ June, 1924. He passed away on 07$^{th}$ January, 2007 at the ripe age of 82. He was the son of that great Buddhist nationalist, Sir Edwin Wijeyeratne, who served as the Minister of Home Affairs and Rural Development. It is during this time Sir, one of our greatest patriots, a national leader, a freedom fighter and the leader of the Muslim community, Dr. T.B. Jayah, came in close contact with Sir Edwin Wijeyeratne and carried the National Flag of Sri Lanka to its greater glory!

A former old Royalist, Dr. Wijeyeratne, graduated with BA (Honours) in History at the University of Ceylon, and thereafter served in the then prestigious Ceylon Civil Service. He was conferred an honorary Doctorate of Philosophy by the University of Colombo in 1978.

He was the secretary to the Ministry of Cultural Affairs. When he was the Chairman of the Radio Ceylon I came in very close contact with him. He wanted Muslim scholars to come and record their speeches in their own language. He encouraged the recital of the Holy Quran through the radio at that time which is being well carried forward by Mr. Hudson Samarasinghe, the present Chairman of the SLBC. He was elected to the post of the Diyawadana Nilame or Chief Lay Custodian of the Temple of the Tooth in Kandy for ten years from 1975. In fact, his eldest son, Neranjan Wijeyeratne served in that post thereafter. Dr. Wijeyeratne also delved deeply into Sri Lankan sociology and religious philosophy. He entered politics and was elected from the Dedigama electorate at the General Election in 1977. He served as the Minister of Education, Higher Education and Justice in 1977. He served as Sri Lanka's Ambassador to the Soviet Union in 1990 following the foot steps of his great father who was the first High Commissioner of Independent Sri Lanka in Great Britain. He was an Executive Committee Member of UNESCO and his profound interest in scholarship was seen in the interest he showed in his proposal to revive the ancient library at Alexandria.

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

It is during that time, Sir, he came in close contact with Dr. Ananda Guruge, Dr. A.M.A. Azeez who was another great scholar, a senator and the principal of Zahira College, Dr. S.I. Imam of the University of Peradeniya and Dr. Allama M.M. Uwise. He got the real taste of the Islamic lessons from these great Muslim Savants. Dr. Wijeyeratne's in-depth knowledge on Islam was remarkable, and was seen in his participation at the Islamic-Tamil Research Conference held at Keelakarai in Tamil Nadu, India. His deep interest and affiliation to the spiritual guru of Sufism in Islam, the ubiquitous Mohideen Guru Bawa, in his search for spiritual enlightenment was legendary. He made inroads into the works of Imam Gazali, Ibnu Arabi and the famous poets like Omar Khayyam, Imam

Sa ‘adi, Kusro and Allama Iqbal.

His in-depth knowledge on Islam was revealed when he addressed a distinguished gathering at a ceremony to celebrate Allama Iqbal organized by the Pakistan High Commission in 1980s wherein he spoke in depth on "The significance of *Tawaf"* or circumambulation around the *Ka'aba* at Makkah in the Kingdom of Saudi Arabia.

A collection of the late Dr. Wijeyeratne's famous English poems ranging over two decades was published titled, "*Ape Appachchi*: An Anthology of Our Father's Poems*"* in 2001. He was honoured with the sublime title of "*Deshamanya*" by the President of the country.

Sir, there is another significant contribution he made to make the Sri Lankan history colourful. That was in regard to the declaration of the National Flag. The present National Emblem of Sri Lanka was created in 1972 under the ideas and guidance of late Dr. Nissanka Wijeyeratne. At that time, he was the Permanent Secretary to the Ministry of Cultural Affairs and the Chairman of the National Emblem and Flag Design Committee. The designer of the National Emblem was the Venerable Mapalagama Wipulasara Maha Thero.

During the same year, in 1972, four leaves of the *Bo* tree were added to the four corners of the Sri Lankan National Flag under the direction of late Dr. Nissanka Wijeyeratne. Prior to 1972, the corners of the flag were occupied by symbols depicting spearheads. The four *Bo* leaves added by late Dr. Nissanka Wijeyeratne reflect the core principles: *Mettha*, loving kindness; *Karuna*, compassion; *Upeksha*, equanimity and *Muditha*, happiness.

Sir, as the Cabinet Minister of Education and Higher Education, late Dr. Nissanka Wijeyeratne introduced the Universities Act No. 16 of 1972. The new superior court complex in Colombo was established by late Dr. Nissanka Wijeyeratne with Chinese Government aid during his tenure as the Cabinet Minister of Justice. He established the Sri Lanka Cultural Triangle with aid from UNESCO for preservation of national heritage sites in Sri Lanka and proposed the Sri Lankan President's Fund which provides health and education assistance to the needy and underprivileged even today.

The Hon. Nissanka Wijeyeratne also set up the Sacred City of Anuradhapura and shifted the urban city to the newly created Anuradhapura town and he is responsible for the establishment of the Anuradhapura Airport.

Sir, this House had been adorned by distinguished personalities in the past representing generations. I can recall the names of the late Right Hon. D.S. Senanayake, the Hon. Dudley Senanayake and now the Hon. Vasantha Senanayake. Then, Sir, there is the Rajapaksa family of the late Hon. D.M. Rajapaksa, the Hon. D.A. Rajapaksa, the Hon. Lakshman Rajapaksa, the Hon. Roy Rajapaksa and the His Excellency Mahinda Rajapaksa, the Hon. Chamal Rajapaksa, the Hon. Basil Rohana Rajapaksa, the Hon. Namal Rajapaksa and the Hon. (Mrs.) Nirupama Rajapaksa. Then, there is the distinguished family of the Gunawardanes of Boralugoda firm. Hon. Philip Gunawardene, the Hon. Robert Gunawardene, the Hon. (Mrs.) Kusuma Gunawardena, the Hon. Indika Gunawardena, the Hon. Dinesh Gunawardena and the Hon. Gitanjana Gunawardena and his aunt, the Hon. (Mrs.) Vivienne Goonewardene and the Hon. Leslie Goonewardene too.

Then comes, Sir, our hero, the late Sir Edwin Wijeyeratne, the late Hon. (Dr.) Nissanka Wijeyeratne and the Hon. Mano Wijeyeratne. The Hon. Mano Wijeyeratne was very close to us when he was in the Government. He sat next to me, Sir. Whenever I wanted to raise a point of Order, he was very helpful in getting the Erskine May. As a result, Sir, I was able to stop the Proceedings of the House twice or thrice when the then Deputy Speaker, the late Hon. Anil Moonesinghe was presiding. He came to Puttalam and started the palmyrah industry there. He was also gifted with a great, versatile and able wife, Bharathi, whom we know very well, was the Consul-General for Turkey in Sri Lanka. The Hon. Mano Wijeratne's family's shadow overshadowed her when she sought the assistance of the Turkish Government to put up a massive and colourful housing scheme, architecturally very beautiful, in the Weligama area.

Then, Sir, I must also not forget the late Hon. T.B. Ilangaratne and Hon. (Mrs.) Tamara Ilangaratne and the late Hon. Rajaratna and the Hon. (Mrs.) Kusuma Rajaratna. Then, there is the Mudliyar, A. Sinnalebbe who proposed a Motion on the National Flag in the State Council. There were Mudliyar A. Sinnalebbe, the Hon. Latheef Sinnalebbe and the Hon. Rizvi Sinnalebbe. We must also not forget the late Hon. Reggie Ranatunga, the Hon. Arjuna Ranatunga and the Hon. Ruwan Ranatunga

who are with us. There were the Hon. M.E.H. Mohamed Ali and the Hon. M.E.H. Maharoof who came from Eastern Province.

He also served as a Second Lieutenant in Ceylon Artillery of the Ceylon Army Volunteer Force. Though I have so many things to tell about his life, Sir, I would only say that we condole with the members of his family.

Lastly I would like to quote from "Thirukkural" which he asked me to quote every time when I was with him because he liked books and other things. There is a quotation which aptly describes the man: "அந்தணர் என்போர் அறவோர்மற் றெவ்வுயிர்க்குஞ் செந்தண்மை பூண் டொழுக லான். " அதாவது "எல்லா உயிர்களிடத்தும் அருளை மேற்கொண்டு ஒழுகும் ஆன்றோரே அந்தணர் என்று சிறப்பிக்கப் படுவர்" என்று திருவள்ளுவர் கூறுகின்றார். That means, “one who showers loving kindness - *Meththa* - is the one who is considered of a noble birth”.

[ අ.භා. 4.04]

**ගරු නවින් දිසානායක මහතා(රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**

(மாண்புமிகு நவீன் திஸாநாயக்க - அரசாங்க முகாமைத்துவ மறுசீரமைப்பு அமைச்சர் )

(The Hon. Navin Dissanayake - Minister of Public Management Reforms)

Thank you, Hon. Deputy Speaker. I wish to associate myself with the Vote of Condolence on the late Hon. (Dr.) Nissanka Wijeyeratne for two reasons: mainly because he was a very close colleague and associate of my father, late Hon. Gamini Dissanayake and also for the fact that I am a very good friend of the Hon. (Dr.) Nissanka Wijeyeratne’s son, the ex-Parliamentarian and Minister, the Hon. Mano Wijeyeratne.

The Hon. (Dr.) Nissanka Wijeyeratne comes from a very noble lineage in Sabaragamuwa. He was a politician par excellence, a civil servant and also a diplomat in the final stages of his life. I would say that the Hon. (Dr.) Nissanka Wijeyeratne is a politician of the old-school, where honour and integrity mattered a great deal. He was a star in the galaxy of stars in the 1977 Cabinet of the late President J.R. Jayewardene.

Men of the calibre of Ranasinghe Premadasa, Lalith Athulathmudali, Gamini Dissanayake, Nissanka Wijeyeratne, Ronnie de Mel, E.L. Senanayake were all members of this "Superstar Cabinet' and I am very happy to say that the Hon. (Dr.) Nissanka Wijeyeratne was an old-school politician who held the principles of integrity and honour as the core values of his political career.

A politician like Nissanka Wijeyeratne was motivated by the core principle of service to the people. Power to him was service; power to him meant empowerment of people; power to him meant nourishment and upliftment of the constituency that he served in Kegalle. Therefore, as a Cabinet Minister of Education he was able to give a large number of appointments to graduate teachers. Also, the fact that he comes from a very distinguished lineage mattered a great deal to him because he knew that he has to uphold the very noble principles of integrity that his family stood up for.

His brother Tissa Wijeyeratne was a barrister by profession. He served as a Sri Lankan Ambassador to France and Switzerland, Additional Secretary to the Ministry of Foreign Affairs and Defence and as the Senior Adviser on Foreign Affairs to the then Prime Minister, (Mrs.) Sirimavo Bandaranaike. The late Hon. (Dr.) Nissanka Wijeyeratne also has one younger brother, Dr. Cuda Wijeyeratne who is a consultant psychiatrist. He was also a noble member of the Ceylon Civil Service. He had also served for a brief period in the Ceylon Artillery Volunteers as a Second Lieutenant.

His contribution to the National Flag was mentioned earlier in this noble august Assembly. He also had a large role to play as the Minister of Justice in establishing the new Superior Courts Complex. He was the singular force behind the establishment and construction of that courts complex, maintaining close ties with the People’s Republic of China.

The Hon. Alhaj A.H.M. Azwer mentioned the fact that he brought in the Universities Act, No. 16 of 1978. But, I would like to emphasize here that the University of Ceylon was the only university in Ceylon from 1942 until 1978. As a result of this Act, it was separated into five independent universities: University of Colombo, University of Peradeniya, University of Jayewardenepura, University of Kelaniya and University of Jaffna. So, you can see the contribution he had made by looking at the emphasis given to his service. Although we talk about this today, not many people know about it. But, the fact that we have five very strong independent universities running today in this country is a large measure to the contribution that the Hon. (Dr.) Nissanka Wijeyeratne had made.

Also, as a politician in the J.R. Jayewardene Cabinet from 1977 to 1989, he distinguished himself as a very humble human being, whose core values were never compromised. So, in this sense, I feel, my friend and colleague, the Hon. Mano Wijeyeratne, has to play a larger role than he is playing now and contribute in a much more meaningful and positive way to the values that his father brought forward through his generation.

So, I do not want to take too much more time here. I am very happy to be associated with this Vote of Condolence. On this occasion, I convey my condolences to the Hon. (Dr.) Nissanka Wijeyeratne’s family. May he attain Nibbana!

Thank you very much.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිශ්ශංක විජයරත්න මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් මම ඒ සමඟ එකඟ වීමට කැමැත්තෙමි. විශේෂයෙන්ම එතුමාගේ නැසී ගිය ආදරණීය පුත් ලංකේශ් විජයරත්න මහතා සමඟ තිබුණු පෞද්ගලික මිත්‍රකමත්, ඒ වාගේම මනෝ විජයරත්න මහතා සහ භාරතී විජයරත්න මහත්මිය සමඟ තිබෙන පෞද්ගලික මිත්‍රකමත් මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමැත්තෙමි. අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට මම නියෝග කරමි.

ප්‍රධාන කටයුතු ආරම්භ කිරීම. යෝජනා පිළිබඳ දැනුම් දීම, ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

Mr. Deputy Speaker, on behalf of the Leader of the House of Parliament, I move,

"That the proceedings on Item Nos. 1, 2 and 3 appearing on the Order Paper be exempted at this day's sitting from the provisions of Standing Order 20(7)."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### හඟුරන්කෙත මාදන්වෙල රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### ஹங்குரான்கெத மாதென்வல ரஜ மகா விகாரை அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### HANGURANKETHA MADANWELA RAJAMAHA VIHARA DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"හඟුරන්කෙත මාදන්වෙල රජමහා විහාර සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා, ගරු රවි කරුණානායක මහතා.

Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake )

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon MR. DEPUTY SPEAKER left the Chair, and THE HON. ALHAJ A.H.M. AZWER took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Yes, Hon. Ravi Karunanayake, you can move your Motion now.

## පොලිතීන්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
## பொலித்தீன், பிளாஸ்டிக் போன்ற கழிவுப் பொருட்களை அழித்துவிடுவது தொடர்பாகப் பொதுமக்களுக்கு அறிவூட்டுமுகமாக நாடளாவிய ரீதியிலான நிகழ்ச்சித்திட்டமொன்றினை அமுலாக்குதல்
## IMPLEMENTATION OF AN ISLAND WIDE PROGRAMME TO EDUCATE THE MASSES IN DESTROYING WASTE MATERIAL SUCH AS POLYTHENE, PLASTIC ET CETERA

[අ. භා. 4.12 ]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I move,

"That this Parliament resolves that an island wide programme to educate the masses in destroying waste material such as polythene, plastic etc., be implemented since the usage of polythene and plastic material has rapidly increased in the island and large scale environmental pollution is taking place due to the indiscriminate disposal of such material."

The reason as to why this Private Members' Motion is being brought in, is, not that you can eradicate the usage of polythene, but the reduction of such waste material, which is highly non-destructible would certainly help to reduce pollution in this country. As you know, Sir, there can be waste material in any place of a city in a country. Even when we pass places like Parliament, we can see there is enough waste material. All we want to do is to ensure the reduction of such waste material.

Sir, if you take the reduction of waste material, it only helps to reduce the pollution. If I take the Colombo Municipal Council as an example, which has only five Electorates with 2.5 million people, you would know that there is roughly 850 tons of waste material coming out of it. Of this waste material, 65 per cent is supposed to be wet waste material and 35 per cent being dry material. Of the 35 per cent dry waste material, I have been informed reliably by professionals who are in the recycling process, that polythene accounts for almost 30 to 40 per cent of the garbage.

So, you can see that at least about a hundred tons of polythene has come into use. Now, this is the reason why being responsible citizens, it is necessary to guide the people in the correct way and this Private Members' Motion is only to raise awareness.

We have a very active Minister and I am sure he has already embarked on this. Of course, that does not necessarily mean that the law by itself can bring this problem under control, but awareness and I think deterrent effects will certainly bring this under control. So, I am sure your Ministry would have done the needful, but I would appreciate if you could raise more public awareness programmes through media. For example, television is a medium through which you can reduce the people's unawareness on these types of things. It is true that polythene certainly can help reduce the cost of living; there is no question about it, but the resultant factor is that using of polythene will increase environmental pollution. So, that is a spin-off effect on both sides: on one side it will reduce the initial cost and on the other, it will increase the cost for the recycling process. On that note, I would appreciate if the Ministry can raise certain awareness programmes through the state media and I am sure that that can play a very positive deterrent effect to the people concerned.

Furthermore, I am informed that Al Gore who has been fighting for global warming has mentioned in his address to world in various issues that when you try to destroy such polythene which is difficult to destroy, it affects the Ozone Layer and global warming will take place.

Now, here it is not something that what is done in Colombo will have an impact on the world by itself. But, if every country, every city put its act together, then we will certainly have a safer world tomorrow. Now, that is the concept which I thought and the necessity to bring in such a Private Members' Motion and to solicit the assistance of the Government in order to make this issue known and ensure that it goes forward. Hon. Minister, if you look at the country by itself, you would see that a lot of areas where earlier things were done by paper are done by polythene now. I think one of the biggest offenders are the political parties themselves. But, I am sure the political parties have realized this and over the last couple of years they have changed their attitudes and a more user - friendly or more ozone-friendly materials are back again. Unfortunately, the cost factor is the prohibiting factor in doing such reversal activities. So, the Government must look into these type of things and give tax relief, where required, because recyclable paper or recyclable polythene is not all that cheap. So, all I want to do is not to take too much of time in trying to labour the point because I am only trying to preach to the converter. But, Hon. Minister, I am sure your Ministry can play a much more proactive role to educate the younger generation in destroying waste material such as polythene.

Today, the Hon. S.B. Dissanayake is doing a ferocious and changing attitude towards the higher education which I appreciate. Likewise you can do something from the lower grade so that the people will inculcate in their thinking that, this is the way forward. Then, they are also held responsible as world citizens or as the citizens of the nation and that inculcation will help them to make a safer world tomorrow.

[ගරු රවි කරුණානායක මහතා]

Hon. Minister, sometimes you might come out with the question as to how you can collect the money. I thought of linking one particular area which will help in order to ensure such revenues are obtained. I know that getting resources is not all that easy, but if you look at the Galle Face Green - that is how I basically thought of this idea - you can see the amount of polythene that is collected in one particular evening. Now, just in front of that you have got the land which was there for the army headquarters that was sold out to Shangri-La Hotel. Now Shangri-La, maybe a flagship company, coming into the country. There was a tax of 100 per cent that was enforced on such a company, but today that company is exempted from paying that 100 per cent tax in Sri Lanka. That tax exemption amounts to Rs. 6.75 billion. Now, Rs. 6.75 billion is not collected from them. So, you could say, "Okay, you are a flagship company. Ensure that you pay "x" amount of money for environmental activities". This could be a way to generate money and I am sure you could take this idea up with the Cabinet of Ministers and ensure that if it is difficult to obtain such revenues, this is the way you could probably get those revenues from companies which are exempted from tax because a sum of Rs. 6.75 billion is not a small amount.

It certainly can be utilized for the betterment of the country's activities for which money is starving. Furthermore, when you look at this, it only provokes me to think about the areas of obtaining money for this type of activities. I have just received the booklet that comes along with the Annual Report of 2010 issued by the Central Bank and in this I was searching for where the revenues of this sale are shown. But, I do not see the revenue booked in under the accounts of Sri Lanka. Every country has a Balance Sheet. Every country has a Profit and Loss Account. On that basis, you account for the revenue that comes in and the costs that you incur. When you look at the book that shows fiscal responsibility, it is necessary that the revenue you generate be shown in it. But, I do not see the money that has come in from the sale of land to Shangri-La Hotels shown in the accounts of Sri Lanka. I would like to ask the question - we, Parliamentarians are held responsible for public probity according to Article 148 of the Constitution on financial matters - why monies that have come in have not been booked in the accounts? This Rs. 6.75 billion is only from Shangri-La Company. What about CATIC company, which is another Hong-Kong company that has bought another 5 acres from close by, for which the tax exemption is accumulating to Rs.11 billion? For that, the tax exemption was Rs. 11 billion - that is Rs.11,000 million. That has not been accounted. That shows that it is absolutely wrong according to the accounting system. You would wonder as to why I am venturing out from the subject of polythene to accounting, but I am only trying to tell you how you can bring money in, if you do not have money in your Ministry, Hon. Minister. Therefore, I am only digressing from that area to say that, if by chance you do not have money, this is the way that you can tell the Cabinet of Ministers of how you can collect money for your activities.

So, I do not want to take too much time on this. I hope that this House would unanimously resolve on this Motion since through this we are trying to educate, inculcate and ensure that each citizen of our country plays a role in terms of reducing global warming whereby little Sri Lanka also would be able to play our role for the sake of the world we live in. I hope we would get a unanimous resolution on this Motion and also I hope that the Hon. Minister would carry this project forward before too long.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Thank you, Hon. Member. Hon. D.M. Swaminathan will second this Motion.

[අ. භා. 4.22 ]

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

I second the Motion and I just want to speak a few words on this. Can I speak a few words, Mr. Presiding Member?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Of course.

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Thank you. I think this is a very important project. Implementation of this project is important especially to younger generation. They should be educated on the eradication of polythene and throwing waste material around the streets of Colombo. But I think the Government has now taken some stringent measures in this regard. I can see that there are bins kept all over the Colombo city and there is a basic system put in place in that way. I must say that it is a commendable thing. As the Hon. Ravi Karunanayake clearly laid out, the Galle Face Green becomes completely a mess on Sunday evenings. I think the main reason for this country gets flooded and mainly the city of Colombo gets flooded is due to the blockage of drains. Drains at the place where I stay in get completely blocked within a couple of minutes after a heavy shower. So, there is something radically wrong in the system. These are the factors that are really blocking the system.

There is another fact that I would also like to bring to your knowledge, Mr. Presiding Member. We are now

talking about environment. I have seen a number of vehicles owned by the security forces, like army and police, that belch out fumes while we are talking about a Green System in this country. I have not taken down the numbers of those vehicles. But, I just wanted to bring it to your kind notice that we should put a stop to this because the environment has now changed. I must say that today the Government has taken steps to give a good facelift to Colombo and we must congratulate the Government for it but there are many more things to be attended to. This system should be eradicated for the sake of the younger generation. Schools should be notified how to eradicate the usage of polythene and implement this project.
Thank you.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ. භා. 4.23 ]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළේ ඉතාමත් කාලෝචිත යෝජනාවක්. ඈත අතීතයේ ශ්‍රී ලංකාවේ මේ ප්‍රශ්නය තිබුණේ නැහැ. උදාහරණයක් ගත්තොත් ඒ කාලයේ ආහාර පවා විකුණන්න තිබුණේ එක්කෝ කෙසෙල් කොළවල ඔතලා; එහෙම නැත්නම් අල කොළවල ඔතලා; ඒ වාගේ ස්වාභාවික දේවල් පාවිච්චි කරලායි. නමුත් ජනගහනය වැඩි වෙද්දී ඒවා සොයා ගැනීමේ ඇති අපහසුතාව තුළ තමයි ඔය පොලිතීන්, ප්ලාස්ටික් බිහි වුණේ. දැන් මේ සම්බන්ධයෙන් බලන විට වැඩි ඈත යන්න අවශ්‍ය නැහැ. සිංගප්පූරුව කොහොමද මේක පාලනය කරලා තිබෙන්නේ? නිකම්වත් කොළ කෑල්ලක් වැරදි තැනක දැම්මොත් ඒ මනුෂ්‍යයා අල්ලා ගෙන ගිහිල්ලා එක්කෝ සිර දඬුවමක් නියම කරනවා. නැත්නම් විශාල මුදලකින් දඩයක් ගෙවන්න සිද්ධ වෙනවා. ඒ වාගේ නීතියක් මේ රටේ ක්‍රියාත්මක කරන්න ඕනෑ. ගෝල් ෆේස් පිට්ටනියේ නම් මේ තත්ත්වය සෑහෙන දුරට පාලනය කරන්න ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා උත්සාහ කරනවා. බෝඩ් ගහලා තිබෙනවා. ඒ වාගේම ඒ අපද්‍රව්‍ය එකතු කරන්න ස්ථාන සකස් කරලා තිබෙනවා. ඒත් උදේට අපි ඇවිදින්න ගියාම අපට පේනවා ප්ලාස්ටික් කෑලි, පොලිතීන් කෑලි ඇතුළු මොන තරම් අපද්‍රව්‍ය විසි කරලා දාලා තිබෙනවාද කියලා. එම නිසා නීතිය තදින් ක්‍රියාත්මක කළොත් තමයි මේ තත්ත්වය නවත්වා ගන්න පුළුවන් වෙන්නේ. තවම අපේ රටේ ජනතාව මේකේ තිබෙන බැරෑරුම්කම තේරුම් අරගෙන නැහැ.

ඇත්ත වශයෙන්ම මට මතකයි ප්‍රේමදාස මැතිතුමා ඒ කාලයේ ජනාධිපති වෙලා ඉන්න වෙලාවේ නීතියක් දැම්මා දේශපාලන රැස්වීම්වලට පොලිතීන් පාවිච්චි කරන්න බැහැ කියලා. බොහොම සාර්ථකව ඒ වැඩ පිළිවෙළ කෙරී ගෙන ගිහිල්ලා ටික කාලයක් ගියාට පස්සේ ඒ නීතිය ක්‍රියාත්මක කිරීම අතපසු වෙලා ගිහිල්ලා ආයෙත් පොලිතීන් භාවිතය පටන් අරගෙන තිබෙනවා. ඒ, සැරසිලිවලට. නමුත් ඊටත් වඩා ආහාර ද්‍රව්‍ය ඇසුරුම්වලට පාවිච්චි කරන්න එහෙම නැත්නම් බඩු මුට්ටු පාර්සල් කරන්න අද පොලිතීන් පාවිච්චි කරනවා. ඒ පාවිච්චි කළාට ඒවා තැන් තැන්වල දාලා යන එක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය. ඒ නිසා මගේ ඉල්ලීම මෙය පාලනය කරන්න නම් නීතිය තදින්ම ක්‍රියාත්මක කළ යුතුයි කියන එකයි. මේවා තැනින් තැන විසි කරලා දමනවා නම්, ඒවා නිසි පිළිවෙළට ඒ තැන්වල තැන්පත් කරන්නේ නැත්නම් කිසිම කෙනෙකුට ලිහිලක් නොදී, බුරුලක් නොදී ඒ අයට තදබල දඬුවම් දීලා කටයුතු කළ යුතුයි. මා ඉස්සෙල්ලා කියාපු විධියට සිංගප්පූරුවේ නම් කොළ කෑල්ලක් බිමට දාලා තිබෙනවා දකින්නම හම්බ වෙන්නේ නැහැ. පොලිතීන් පමණක් නොවෙයි, ප්ලාස්ටික් පමණක් නොවෙයි, මොනවත් නැහැ. මොකද, මුල් කාලයේදී ඒ නීතිය ගෙනාපුවාම ඒ නීතිය කඩාපු අයට තදබල ලෙස දඬුවම් දීපු නිසා ඒක දැන් එහෙමම නතර වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුරෝපයේ රටවල්වලත් හුඟක් දුරට එහෙමයි. ඒ නිසා අපේ රටේත් ඒ නීතිය ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරනවා නම්, විශේෂයෙන්ම ඒ අදාළ නිලධාරි මහත්වරු ඒවා පිළිබඳව සොයා බලලා කටයුතු කරනවා නම් මේ ප්‍රශ්නය අපට පාලනය කර ගන්න පුළුවන් වන බව කියමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ. භා. 4.26]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී ඉදිරිපත් කරපු පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පිළිබඳව මුලින්ම මා ස්තුතිවන්ත වනවා. මා ගරු සභාවේ නොසිටියත් එතුමා කියන දේ මා අහගෙන හිටියා. එතුමා කෘමිනාශක ගැනත් කථා කළා. ඒ ගැන මා ඉතාම ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම පොලිතීන් භාවිතාව ඇතුළුව ලංකාවේ අද පැන නැඟී තිබෙන ප්‍රශ්නයට සමස්ත විසඳුමක් ඉදිරිපත් කිරීමේ කාලීන අවශ්‍යතාව පැන නැඟිලා තිබෙනවා. මා කැමැතියි පොලිතීන් ඇතුළුව මීට අදාළව අපේ පාරිසරික තත්ත්වය පිළිබඳව පුළුල් අදහසක් මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්න. පළමුවැනි එක, අද අපේ සමස්ත පරිසර පද්ධතිය තුළ පොලිතීන් අපද්‍රව්‍ය, කැළිකසළ විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ලෝකයේ බොහෝ රටවල් මේ කැළිකසළ මේ හැම දෙයක්ම තමන්ගේ රටේ සම්පතක් බවට කළමනාකරණය කර ගෙන තිබෙනවා.

විශේෂයෙන් අපි පසු ගිය වකවානුවේ රජයක් හැටියට මේ සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපත්ති ගණනාවක් දියත් කරන්න උත්සාහ කළා. වර්තමාන පරිසර ඇමතිතුමා ඉන්නවා. කලින් හිටපු පරිසර ඇමතිතුමා යටතේ අපි විශේෂ ව්‍යාපෘති ගණනාවක් දියත් කළා, මේ කැළිකසළ කළමනාකරණය කිරීම සම්බන්ධව. අපට සන්තෝෂ වන්න පුළුවන් තත්ත්වයකට එය පරිවර්තනය කර ගන්න බැරි වුණා. නමුත් අපි ඒ සම්බන්ධයෙන් යම් අත්තිවාරමක් දමලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාතය, ජලය දූෂණය වීම සම්බන්ධ කාරණය ගැන අපි විශාල වශයෙන් සාකච්ඡා කරනවා. අද අපේ රටේ අපේ ජලය සම්පූර්ණයෙන් දූෂණය වෙලා තිබෙනවා; ඒ වාගේම අපේ වාතය සම්පූර්ණයෙන් දූෂණය වෙලා තිබෙනවා; ඒ වාගේම අපේ මහ පොළොව සම්පූර්ණයෙන් දූෂණය වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ස්වභාවිකව ඇති වූ දෙයක් නොවෙයි. මේ වන විට රටේ ඉතා භයානක ප්‍රශ්නයක් පැන නැඟලා තිබෙනවා. මම ස්තුතිවන්ත වෙනවා, අද දිවයින පත්තරේ කතු වැකිය සම්බන්ධයෙන්. අද දිවයින පත්තරේ කතු වැකිය විශේෂ අවධානයට පාත්‍ර කරන්න ඕනෑ. අපි ඊයේ දිනයේදීත් විශේෂ පුවත් පත් සාකච්ඡාවක් කළා, ශ්‍රී ලංකාවේ පරිභරණය වන කෘමිනාශකවල අධික ලෙස ආසනික් ඇතුළත් වෙලා තිබෙන එක ගැන.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
පොහොරවල.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

නැහැ. කෘමිනාශකවල. කෘමිනාශක පරිහරණයේදී අපි pesticides,weedicides, insecticides කියලා කියනවා. එතකොට කෘෂි යෙදවුම් හැටියට දිලීරනාශක, වල්නාශක සහ කෘමිනාශක වශයෙන් ප්‍රධාන කොටස් තුනකට පාවිච්චි කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කෘෂි යෙදවුම්වල අද ආසනික් අන්තර්ගත වෙලා තිබෙනවා. අද එක්තරා පුවත් පතක් මහජනතාව නොමඟ යැවීම සඳහා ඒ ගැන වාර්තාවක් පළ කරලා තිබෙනවා. මොකක්ද ඒ වාර්තාවෙන් කියලා තිබෙන්නේ? ඒ වාර්තාවෙන් මේක එක්තරා මහාචාර්යවරයකු දේව කතාවකින් කියාපු බොරුවක් -ව්‍යාජයක්- බවට අඟ වන්න හදලා තිබෙනවා. අපට වැදගත් වන්නේ දෙවියන්ගේ පණිවුඩයකින් ආවද, වෙනත් කවුරු හරි කියලාද කියන කාරණය නොවෙයි. අපට වැදගත් වන්නේ ඒක නොවෙයි. දැනට විද්‍යාගාරවල කරන ලද පරීක්ෂණවලදී ඉතා පැහැදිලිවම කෘමිනාශකවල ආසනික් අන්තර්ගත වෙලා තිබෙන බවට තොරතුරු අනාවරණය වෙලා තිබෙනවා. විශේෂයෙන් කැලණිය විශ්වවිද්‍යාලයෙත්, රජරට විශ්වවිද්‍යාලයේත් ඒ පිළිබඳව විද්‍යාගාරවල කරපු පරීක්ෂණවලදී හෙළි වෙලා තිබෙනවා ඒවායේ ආසනික් තිබෙන බව. 2001 වර්ෂයේ මේ පාර්ලිමේන්තුව අතිවිශේෂ ගැසට් නිවේදනයකින් ආසනික් අන්තර්ගත වීම -ඒ කියන්නේ කෘමිනාශකවල අන්තර්ගත වීම- සම්පූර්ණයෙන්ම තහනම් කරලා තිබෙනවා.

අද බහුජාතික සමාගම්වල සමහර අය රජයට පක්ෂව ඉන්නවා. සමහර අය රජයට විරුද්ධව ඉන්නවා. මේ ගොල්ලන් හෙට දවසේ එක්සත් ජාතික පක්ෂය බලයට පත් වුණොත්, එහෙම නැත්නම් වෙනත් ආණ්ඩුවක් බලයට පත් වුණොත් ඒ ආණ්ඩුව පස්සේයි ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බහු ජාතික සමාගම් අද සම්පූර්ණයෙන්ම රාජ්‍ය නිලධාරින් අත් අඩංගුවට අරගෙන වාගේයි ඉන්නේ.

පසු ගිය අවුරුදු 20ට පමණක් ආසනික් අන්තර්ගත වීම නිසා මේ රටේ රජරට සාමාන්‍ය ගොවි ජනතාව 20,000කට වඩා ප්‍රමාණයක් ජීවිතවලින් වන්දි ගෙවලා තිබෙනවා. මේ වන විට කුරුණෑගල දිස්ත්‍රික්කය, අනුරාධපුර දිස්ත්‍රික්කය, පොළොන්නරුව දිස්ත්‍රික්කය, ඒ වාගේම කන්තලේ, අම්පාරේ සමහර ප්‍රදේශ සම්පූර්ණයෙන්ම වකුගඩු ආබාධවලින් විශාල වශයෙන් රෝගී තත්ත්වයට පත් වෙලා ඉන්නවා. 20,000ට අධික ප්‍රමාණයක් මැරිලා තිබෙනවා. ඒ හා සමාන ප්‍රමාණයක් රෝගී තත්ත්වය නිසා අද මරණයට දින ගනිමින්, මරුවා එන තුරු බලා ගෙන ඉන්න තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එයට ප්‍රධාන හේතුව මොකක්ද කියලා හොයන්න අවුරුදු 20කට අධික කාලයක් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මිලියන ගණන් සල්ලි දීලා තිබෙනවා. මේ සල්ලිවලට මොනවාද කරලා තිබෙන්නේ? රාජ්‍ය ආයතනවල ඉන්න නිලධාරින් සම්පූර්ණයෙන් රටට වංචා කරලා තිබෙනවා. විදේශික ආයතන රටට වංචා කරලා තිබෙනවා. අද අපි මේවා කියන්නේ ඉතාම සාක්ෂි සහිතවයි. විදේශීය විද්‍යාඥයන් සතු තොරතුරු සහිතවයි, අපි කියන්නේ. ඉතාම නිර්භයව කියනවා, මේ සමාගම් ඉතාම දැනුවත්ව මේ සිද්ධිය වෙලා තිබෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ලංකාදීප" පුවත් පතේ තිබෙන විස්තරය අනුව මේ සමාගම්වල නියෝජිතයන් පිළිඅරගෙන තිබෙනවා තමන් එවන කෘමිනාශකවල ආසනික් අන්තර්ගත වෙලා තිබෙන බව. ඒ බව ඔවුන් පිළිගෙන තිබෙනවා. අද එක එක පත්තරවල එක එක දේවල් පළ කරනවා. අපේ ජලය දූෂණය වෙලා; අපි ආහාරයට ගන්න දේවල් දූෂණය වෙලා. අපි හිතනවා ගොටුකොළ හරි ගුණයි; පළා හරි ගුණයි කියලා. අපි කන සියලුම ආහාරවල අද මේක අන්තර්ගත වෙලා තිබෙනවා. එතකොට මේ යුරෝපය ඇතුළු බොහෝ දියුණු යැයි කියන රටවල් තමයි අපට මේවා එවන්නේ. ඒ සමාගම් තමයි අපට එවන්නේ. එතකොට ඒ බහු ජාතික සමාගම්, අපේ රටේ තැරැව්කරුවන් විධියට ඉන්න ඒජන්ත සංවිධාන හා ඒ හා සම්බන්ධිත සංවිධාන තමයි ඒවාට යොද වන්නේ. ඔවුන් අවුරුද්දකට බිලියන ගණනක මුදලක් ලබා ගන්නවා.

ගරු මන්ත්‍රීතුමෙක් සඳහන් කළා යූරියා සම්බන්ධව. යූරියාවල ආසනික් තිබෙනවා කියලා අනාවරණ වෙලා නැහැ. නමුත් යූරියා යෙදවීමත් අද ලෝකය ප්‍රතික්ෂේප කරනවා. විශේෂයෙන්ම අපේ ලංකාවට ගෙන්වන යූරියා, ලෝකයේ අනෙක් රටවල යොදන යූරියාවලට වඩා ගුණයෙන් බාල බව අනාවරණ කර ගෙන තිබෙනවා. යූරියා භාවිතයෙන් අපි විශේෂයෙන්ම නයිට්‍රජන් ලබා ගැනීමට බලාපොරොත්තු වනවා. ගසක වර්ධනය සඳහා නයිට්‍රජන් ලබා ගැනීම මුල් කර ගෙන තමයි අපි යූරියා යෙදවීම කරන්නේ. යූරියා කියන්නේ ඉන්ධනවලින් ලබා ගන්නා අතුරු නිෂ්පාදනයක්. එතකොට රත්තරන් ඇතුළු වෙනත් නිෂ්පාදනවල අතිරේකයක් හැටියට තමයි අපට ආසනික් ලැබෙන්නේ. ලෝකයේ දියුණු රටවලට තමන්ගේ නිෂ්පාදනවලින් අතිරේකයක් හැටියට ලැබෙන මේ ආසනික්වලට කර ගන්න දෙයක් නැහැ. ඉතින් ඒ ගොල්ලන් මොනවාද කරන්නේ? ඒවා කෘමිනාශක හැටියට අපේ රටවලට එවනවා.

දෙවන ලෝක යුද්ධයේදීත්, ඒ වාගේම 1970 ගණන්වලදීත් විශාල වශයෙන් මිනිසුන් මැරීම සඳහා, කැලෑ විනාශ කිරීම සඳහා මේ ආසනික් යෙදා ගෙන තිබෙනවා. ඇත්ත වශයෙන්ම ආසනික් යොදන්නේ මිනිසුන් මරන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි අද දින "දිවයින" පත්තරේ කතුවැකිය ඓතිහාසික වාර්තාවක් වන නිසා, මා එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලමින් මේ අවස්ථාවේ දී **සභාගත*** කරනවා.

එම කතුවැකියේ සාරාංශගත කරලා මේ සියලුම තොරතුරු අන්තර්ගත කර තිබෙනවා.

වරායේ සේවය කරන සමන්ත කියන නිලධාරියකුගේ මැදිහත් වීම නිසා, ජනාධිපතිතුමාගේ විශේෂ නියෝගයක් මත අපට පුළුවන් වුණා ඒ විෂ රසායනික බෙහෙත් ප්‍රමාණය එළියට එන එක නවත්වා ගන්න. ඒ විෂ රසායනික බෙහෙත්වල ආසනික් අන්තර් ගත වෙලා තිබුණු බව අද අනාවරණ කර ගෙන තිබෙනවා. අපට ආරංචි වෙලා තිබෙනවා, රාජ්‍ය නිලධාරින් කණ්ඩායමක් සඳුදා වනකොට කියන්න කුමන්ත්‍රණය කර තිබෙනවා ලු, "එක කොටසක විතරක් ආසනික් තිබෙනවා, අනෙක් ඒවා යේ නැහැ. ඒ නිසා භාගයක් අපි නිකුත් කරන්නම්" කියන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ප්‍රශ්නයක් පැන නඟිනවා, ආසනික් තිබෙනවා නම් ඒවා එවපු ජර්මනිය ඒවා භාර ගන්නවාද කියලා. දැන් අපට දැන ගන්නට තිබෙන පරිදි ආසනික් තිබෙනවා කියනවා නම්, ඒ රටෙන් එව්වත්, ඒ රට නැවත ඒවා භාර ගන්නේ නැහැ. ඊළඟට, මේ ආසනික් ප්‍රමාණය ලංකාව පුරා බෙදා හරින්නට බැරි නම්, කොහොමද මේවා විනාශ කරන්නේ කියන එක ගැන පවා අද ලංකාව තුළ ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා.

---

*** *කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නුදුරු දිනයක යාපනයට ගියා. යාපනයේ විශ්වවිද්‍යාලයේ සිටින ගුරුවරයෙක්, ඒ වාගේම නිලධාරියෙක් මට ඇවිල්ලා කිව්වේ, අද මුළු යාපනයේම තිබෙන ප්‍රශ්නය වෙන මොකක්වත් නොවෙයි, ළිං වතුර සම්පූර්ණයෙන් දූෂණය වෙලා තිබෙන එකයි. යුද්ධය නොවෙයි ප්‍රශ්නය. අද මුළු යාපනයේම ළිංවල වතුර දූෂණය වෙලා. ඒකට ප්‍රධාන හේතුව, දුම්කොළ වගාවටත්, ලූනු වගාවටත් අධික ලෙස මේ කෘමි නාශක පාවිච්චි කිරීමයි. ඒ වාගේම එළවලු වගාවට අධික ලෙස කෘමි නාශක පාවිච්චි කිරීම. එතකොට අනුරාධපුරයේ පමණක් නොවෙයි, යාපනයේ ජනතාවත් අද මේ භයානක අනතුරට මුහුණ දෙමින් ඉන්නවා.

දෙමළ ජාතික සන්ධානය හෝ වේවා මෙම පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු හෝ වේවා පක්ෂ භේදයකින් තොරව, ජාතික පදනම්වලින් තොරව මේ මහ පොළොව විනාශ කිරීමේ මහා අපරාධයට විරුද්ධව එකතු වන්නට ඕනෑ. ඒ මන්ත්‍රීවරුන්ට මා ආරාධනා කරනවා, මේ කාර්යයට එකතු වන්නය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාර්යය යටපත් කිරීම සඳහා අද දැවැන්ත වැඩ පිළිවෙළක් දියත් කර ගෙන යනවා. එක විශ්වවිද්‍යාලයක නියෝජිතවරියකගේ වාර්තාවක් පත්‍රයක පළ වෙලා තිබෙනවා මා දැක්කා. එතුමියගේ වාර්තාවට අනුව එතුමිය කියා තිබුණා, "මේක බොරු අනාවරණයක්. එක්තරා මහාචාර්යවරුන්ගේ හිතලුවක්. මොකක්ද වෙන ලෝකයකින් ආපු අදහසක් පළ කිරීමක්"ය කියලා. මා අද එතුමියට දුරකථනයෙන් කථා කළා. මා කැමැති නැහැ, පාර්ලිමේන්තුවේ එතුමියගේ නම කියලා කථා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා එතුමියගෙන් මේ සම්බන්ධයෙන් ඇහුවාම එතුමිය කිව්වා, "කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාගාරයේ ඒවා පරීක්ෂණයට ලක් කරන භාජනයේ -උපකරණයේ- ප්‍රශ්නයක් තිබෙනවා" කියලා. මා ඇහුවා, එහෙම නම් රජරට විශ්වවිද්‍යාලයේත් එහෙම තිබෙනවාද කියලා. අපි කියන ආසනික් ප්‍රමාණය අඩු වැඩි වීම වෙනස් වන්නේ ඒ විද්‍යාගාරයේ උපකරණයේ වරදක් නිසා කියලායි එතුමිය කියන්නේ. නමුත් එම විද්‍යාගාරයේ පමණක් නොවෙයි, දැන් රජරට විශ්වවිද්‍යාලයේත් මේ පරීක්ෂණය කරලා තිබෙනවා. ඒ වාගේම රජයේ තවත් ආයතන ගණනාවකත් පරීක්ෂණය කරලා තිබෙනවා. මේ වන කොට අත් අඩංගුවට ගෙන, මෙතෙක් වරායේ රඳවා තබා ගෙන තිබෙන ඒවා පිළිබඳව වාර්තා පැය 24න් දෙන්න පුළුවන්. අද වන තුරු ඒ සම්බන්ධයෙන් කිසිම වාර්තාවක් රටට ලබා දීලා නැහැ. මේක තමයි මිනී මැරීම.

අද විදේශික රටවල් කියනවා, අපේ රටේ මානව හිමිකම් කඩ වනවාය කියලා. ජර්මනිය, යුරෝපා වළල්ලේ රටවල්, ඒ වාගේම එක්සත් ජනපදය ප්‍රමුඛ රටවල් කියනවා, ලංකාවේ මහා යුද අපරාධයක් සිද්ධ වුණා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි භයානකම අපරාධය. 20,000කට වඩා ජනතාව මේකෙන් මරා තිබෙනවා. තවත් මිනිස්සු මරණයට දින ගණිනවා. ඒ වාගේම කාන්තාවන් ගබ්සා වෙලා තිබෙනවා. අපි කන ආහාර නිසා විශේෂයෙන් රජරට ප්‍රදේශයේ ජනතාවට පමණක් නොවෙයි, අපටත් හිටි ගමන් හෘදයාබාධ ඇති වනවා; heart attack හැදිලා මිනිස්සු හිටි ගමන් මැරෙනවා. එයට ප්‍රධාන හේතුව ආසනික්. වෙන ප්‍රශ්නයක් නොවෙයි. අද කී දෙනකුට හිටි ගමන් heart attack හැදෙනවාද? අපි දන්නේ නැහැ, අද අපි පාර්ලිමේන්තුවෙන් එළියට යන කොට මැරෙයිද කියලා. මොකද, ප්‍රධාන හේතුව ශරීරයේ ආසනික් අන්තර්ගත වීම.

ඒ විතරක් නොවෙයි. මිනිසුන්ගේ දියවැඩියා රෝගයට ප්‍රධාන හේතුව ඒකයි. අධික රුධිර පීඩනය ඇති වීමටත් ආසනික් අන්තර්ගත වීම ප්‍රධාන වශයෙන් බලපානවා. ඕනෑ කෙනකුට අන්තර් ජාලයට ගිහින් බලන්න පුළුවන්. එහි තොරතුරුවල තිබෙනවා, ආසනික් කියන්නේ මිනී මරන රසායනික සංඝටකයක් කියලා. මේ සංඝටකය මිනිසුන්ට කොයි ආකාරයෙන්ද බලපාන්නේ කියලා ඕනෑම කෙනකුට දැන ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව අද අපේ වතුර දූෂණය වෙලා තිබෙනවා. අපට හුස්ම ගන්න බැරි තරම් අපේ වාතය දූෂණය වෙලා තිබෙනවා. අපේ අනාගත පරම්පරාවට අයිති මේ පොළොව අද සම්පූර්ණයෙන්ම මේ වස විසෙන් විනාශ කරලා තිබෙනවා. මේකෙන් ගොඩ එන්න කොපමණ ධනයක් වැය කරන්න වෙයිද කියලා අපට කියන්න බැහැ.

අද ඉන්දියාව ලෝක කොහොඹ මධ්‍යස්ථානය බවට පත් වෙලා තිබෙනවා. අද ඉන්දියාවේ විද්‍යාඥයෝ එක හඬින් නැඟී ඉන්නවා, විශාල හඬක් ගෙන යනවා කෘමිනාශක භාවිතාවට විරුද්ධව. කොහොඹවලින් කෘමිනාශකවල කාර්ය ඉෂ්ට කරන්න පුළුවන්. ලංකාවේ කොහොඹ හැදෙනවා. එහෙම නම් ලංකාවට මේක කරන්න පුළුවන්. ලංකාවේ කොහොඹ ගැන පර්යේෂණ කරන්න ආයතනයක් තිබෙනවාද? මොන විද්‍යාගාරයද පර්යේෂණ කරන්නේ? කොහොඹ ඇටේ ගැන ජනතාවට කියලා දෙන්නේ මොන රූපවාහිනී නාලිකාවද? අද ඒ කිසි දෙයක් ගැන කථා කරන්නේ නැහැ. අද අපි පෙළපාළි යනවා, උද්ඝෝෂණ කරනවා විතරයි. අද "දිවයින" පත්තරේ වාර්තා වුණා. ඊයේ "ලංකාදීප" පත්තරේ වාර්තා වුණා. හරි නම් අද මෙතැන විවාද වෙන්නේ ඕනෑ මේ ප්‍රශ්නය ගැනයි.

මම උදේ ගරු කථානායකතුමා හමු වෙලා එතුමාට කිව්වා," ගරු කථානායකතුමනි, මේ රටේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේ ගැන අපේ පාර්ලිමේන්තුවේ කථා කරන්න අවශ්‍යයි." කියලා. මා නියෝජනය කරන පක්ෂය එක්සත් ජනතා නිදහස් සන්ධානය ඇතුළේ තිබෙන පක්ෂයක්. මම පක්ෂ නායකයකු හැටියට පාර්ලිමේන්තුව තනිව නියෝජනය කරනවා නම් විතරයි ඒ අවස්ථාව ගන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම ප්‍රායෝගිකව මේ වාගේ ප්‍රශ්නයක් ආවාට පස්සේ ඒ ගැන මේ පාර්ලිමේන්තුව තුළ සබුද්ධික පිරිසක් හැටියට මැති ඇමතිවරු සාකච්ඡා කරන්න ඕනෑ. මේක විහිළුවක් නොවෙයි. අපේ මහපොළොවට අද විෂ කවලා ඉවරයි. අන්තර්ජාතික වශයෙන් අපට මොන විධියට මේක බලපායිද කියලා කාටවත් කියන්න බැහැ. ඒ වාගේම අපි කියන්න කැමැතියි කවුරු ධනයට යට වුණත්, කවුරු බලයට යට වුණත්, සමාගම් කොච්චර ලොකු වුණත් අපි දිවි හිමියෙන් අනාගත පරම්පරාව වෙනුවෙන් නිර්භයව මේකට පෙනී ඉන්නවා කියලා. අපි මරණයට බය වෙන්නේ නැහැ. ඒ නිසා මින් ඉදිරියට විශේෂයෙන්ම එළඹෙන දින කිහිපය තුළ මේ පිළිබඳව අපට කළහැකි හැම දෙයක්ම අපි කරනවා. අපි මේකට විරුද්ධව ලංකාවේ නඩු දානවා. පැහැදිලිවම අපි අධිකරණයට යනවා. ඒ වාගේම අපි මේවා එවපු සමාගම්වලට විරුද්ධව පැහැදිලිවම ජාත්‍යන්තර අධිකරණයට යනවා. අපි මේ වෙනකොට ඒ පිළිබඳව සියලු කාරණා සොයා ගෙන යනවා. ජාත්‍යන්තර අධිකරණය තුළ මේ සමාගම්වලට විරුද්ධව අපට කළ හැකි හැම දෙයක්ම කරනවා. අද ලංකාවට විරුද්ධව දරුස්මාන් වාර්තාව ගෙනැල්ලා නඩු පවරන්න හදනවා. මේ සමාගම් තමයි ඊට වඩා භයානක. මේ, ලෝකයේ බලවත් රටවල් දුප්පත් යැයි කියන රටවල්වලට කරන අපරාධ! ඒක හන්දා මේවාට විරුද්ධව අපි නැඟී සිටිනවා.

අද අපේ වාතය කොයි ප්‍රමාණයෙන් දූෂණය වෙලාද, අපේ ජලය කොයි ප්‍රමාණයෙන් දූෂණය වෙලාද කියලා අපේ රටේ සාකච්ඡාවක් වෙන්නේ නැහැ. අපේ රටේ විද්‍යාගාර තිබෙනවා. විද්‍යා හා තාක්ෂණික අමාත්‍යාංශයේ විද්‍යාගාර තිබෙනවා. තවත් නොයෙකුත් අමාත්‍යාංශවල විද්‍යාගාර තිබෙනවා. විශ්වවිද්‍යාලවල විද්‍යාගාර තිබෙනවා. නමුත් බොහොම සරලව පැය තුන හතරකින් කළ හැකි එහෙම නැත්නම් සතියකින් දෙකකින් කළ හැකි පර්යේෂණ කරලා, දත්ත වාර්තා කිසිවක් අපි ලබා ගන්නේ නැහැ. මේ තිබෙන විෂ අද අපේ ගස් කොළන්වලට ගිහිල්ලා අපි කන ආහාරවලට ඇවිල්ලා තිබෙනවා.

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

අද උදේ මම කැලණිය විශ්වවිද්‍යාලයේ ඒ කථිකාචාරිණියට කථා කරලා ඇහුවා, එතුමිය කියන ආසනික් කතන්දරය ගැන. මම එතුමියගෙන් ඇහැව්වා, ශ්‍රී ලංකා පොළොවේ ආසනික් තිබෙන බවට කවදාවත් වාර්තාවක දැක තිබෙනවාද කියා. එතුමිය කියනවා, අපි කන ආහාරවල පොඩ්ඩක් හරි තියෙනවා කියලා. මම ඇහුවා, කොහොමද එන්නේ කියලා. ඇත්තෙන්ම ශ්‍රී ලංකා පොළොවේ ආසනික් නැහැ. ඒක විද්‍යාත්මකව ඔප්පු කරපු සත්‍යයක්. එහෙම තියෙද්දී අද මේ රටේ සීඅයිසී ඇතුළුව -මම අනෙක් නම් කියන්න යන්නේ නැහැ- අනෙකුත් සමාගම් අපේ රටේ පාරම්පරික වී ටික අත් අඩංගුවට අරගෙන තිබෙනවා. අපේ ජාන බැංකු ටික අපේ දේශපාලනඥයෝ තුට්ටු දෙකට විකුණලා දාලා තිබෙනවා. රාජ්‍යයක් යටතේ තිබිය යුතු අපේ ආහාර සුරක්ෂිතතාව තුට්ටු දෙකට විකුණලා තිබෙනවා. අපේ රජය අද වහාම මේ සම්බන්ධයෙන් ස්ථාවර ප්‍රතිපත්තියකට පැමිණිලා මේ කෘමිනාශක ප්‍රශ්නය පිළිබඳව යම් කිසි තීරණාත්මක වැඩ පිළිවෙළකට එයි කියලා අපි කල්පනා කරනවා.

අද පොලිතීන් ප්‍රශ්නය පිළිබඳව පරිසර දූෂණය පිළිබඳව කථා කරන එක හොඳයි. ඊටත් වඩා වැදගත් වන්නේ මෙයයි. අද මේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය පිළිබඳව රටේ ජාතික සංවාදයක් අවශ්‍යයි. ඒ බව මේ පාර්ලිමේන්තුවේදී මා ප්‍රකාශ කර සිටින්නට කැමැතියි. මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

***සභාමේසය මත තබන ලද කතුවැකිය :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆசிரியத்தலையங்கம் :*
*Editorial tabled:*

# දිවයින

2011 ජූනි මස 10 වැනිදා සිකුරාදා

අංක 223, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 13.
දුරකථනය - 2448402, 2497500
ෆැක්ස් - 2344253, 2448103
වෙබ් අඩවිය - www.divaina.com
ඊ මේල් - divaina@unl.upali.lk
දැන්වීම් අංශය - 2436892 (ප්‍රධාන කාර්යාලය)
ෆැක්ස් - 2344252,2497543
බෙදාහැරීම් අංශය-2497568, 2497519, 2497580
ෆැක්ස් - 2334564

## ආසනික් මාරයා

රජරට ජනයා පරිභෝජනය කරන ආහාරවල ආසනික් නමැති විෂ වර්ගය බහුලව අඩංගු වී ඇති බවත්, එම ආහාර පරිභෝජනය කරන රජරට ජනයා තුළ බහුල ලෙස වකුගඩු රෝග ඇති බවත් රජරට සහ කොළඹ විශ්වවිද්‍යාලවල විද්‍යාර්ථීන් විසින් කෙරුණු පර්යේෂණයකදී හෙළි වී තිබේ. රජරට වකුගඩු කතාව ටිකක් පරණ කතාවකි. මුලදී මෙයට හේතුව අධික කිවුලක් සහිත ජලය බවට සැක කරන ලදී. ඊළඟට එම ජලය යෙදූ ආහාර ඇළුමිනියම් භාජනවල පිසීමේදී හටගන්නා අන්තර් ක්‍රියාවක් නිසා ආහාරවලට වස මුසුවන බව සැක කරන ලදී. පසු කාලයේදී කෙරුණු පර්යේෂණවලදී වාර්තා වූයේ මේ වස වර්ගය නිශ්චිත වශයෙන් ම ආසනික් බව ය. ආසනික් යෙදූ කෘෂි නාශක සහ කෘමි නාශක බහුල ලෙස රජරට කුඹුරුවල හා හේන්වල පාවිච්චි කෙරෙන බවත් එමගින් ආසනික් විෂ ආහාර භෝගවලට උරා ගන්නා බවත් පෙර කී සරසවි දෙකේ විද්‍යාර්ථීන් විසින් හෙළි කර ගනු ලැබ ඇත. බහුජාතික සමාගම්වල වාසනාවට පහළ වූ කුඩමැට්ට, තුනැස්ස, තුන්හිරියා, ගිරාපලා යනාදී වල් පැළ සමූහයකුත් ගොයම් මැස්සන් සමූහයකුත් ලංකාවේ ඇත. මේ පැළ සහ සතුන් මර්දනය කිරීම සඳහා කෙළවරක් නැති නම්වලින් වෙළෙඳපොළට එන කෘෂි සහ කෘමිනාශක සමූහයකුත් ලංකාවේ ඇත. මෙවා බොන්නට හිතෙන අන්දමේ පිරියක් ඇති වන පරිදි රූපවාහිනී නාලිකා මගින් ප්‍රචාරය කරන ආකාරය අපි දැක ඇත්තෙමු. අසා ඇත්තෙමු. සිංහල ගොවිතැන් ක්‍රමයට අනුව මෙයට වසර 100 කට පෙර රසායනික ද්‍රව්‍ය මගින් වල්පැළ හෝ කෘමීන් නැසීමක් තිබුණේ නැත. එකල ගොවීහු විවිධ කෙම් ක්‍රම සහ වෙනත් සාම්ප්‍රදායික ක්‍රම පාවිච්චි කළහ. මඩු කෙටීම (මඩු ගසක මල් වංගෙඩියක දමා කුඹුර අසල තබා කෙටූ විට එමගින් හට ගන්නා දුගඳට කෘමීහු පලා යති) දළුක් ගැසීම (දළුක් කිරි කුඹුරට ගසා කෘමීන් පලවා හැරීම) දුම්මල ගාන ලද කුල්ලකින් ලියැද්දේ සිටින කෘමීන් අල්ලා ගැනීම යනාදිය ඒවායින් ඉතා ස්වල්පයකි. අද වන විට විවිධ රසායනික ද්‍රව්‍ය සමඟ හැප්පී කෘමියා ශක්තිමත්ව සිටින නිසා මේ ක්‍රමවලින් ප්‍රයෝජනයක් නැත. අද මඩු කෙටීමට කුඹුරට යන ගොවියා පලවා හැර වංගෙඩිය සහ මෝල්ගස අහසින් ගෙන යෑමට තරම් කෘමියා දක්ෂ ය. ඒ සමඟම කෘෂි නාශක සමඟ හොඳට හැප්පී සිටින වල්පැළ කොතරම් ශක්තිමත් ද යත් අනාගතයේදී ඒවායින් ලී බඩු පවා හැදීමට හැකි වනවා ඇත. තත්ත්වය මෙසේ තිබියදී බහුජාතික ව්‍යාපාරිකයෝ දවසින් දවස ස්වකීය කෘෂි නාශක සහ කෘමි නාශකවල විස සහිත රසායනික සංයුතිය ඉහළ නංවයි. එවිට ගොවීහු ඒවාට පුරුදු වෙති. එවිට යළිත් වරක් විස ප්‍රතිශතය ඉහළ නැංවේ. විස යනු ඇඟට ටික ටික පුරුදු කළ විට දරාගත හැකි දෙයකි. උදාහරණයක් මෙසේ ය. රුසියාවේ අවසන් සාර් රජ පවුල තුළ රිංගාගෙන එම පවුලේ සියලු කාන්තාවන් අපහරණය කළා වූ ග්‍රෙගරි රස්පුටින් නමැති පූජකයා ටිකෙන් ටික වස කෑමට පුරුදුව සිටි කෙනෙකි. පසු කාලයේදී ඔහු මැරීමට කුමන්ත්‍රණය කළ රුසියන් කුමාරවරු පිරිසක් මිනිසුන් දස දෙනකු මැරිය හැකි තරම් පොටෑසියම් සයනයිඩ් ප්‍රමාණයක් කේක්වලට දමා ඔහුට කන්නට දුන්නේ ය. වස කෑමට පුරුදුව සිටි රස්පුටින් එම කේක් කා මළේ නැත. ඔහු මැරීම සඳහා පපුවට වෙඩි තැබීමට සිදු විය.

සාමාන්‍යයෙන් පිළිගන්නා වෛද්‍ය ප්‍රමිතීන්ට අනුව මිනිස් වකුගඩු කට්ටලයකට දැරිය හැකි ආසනික් ප්‍රමාණය කිලෝවකට මයික්‍රෝ ග්‍රෑම් 20 කි. මිලි ග්‍රෑම් එකකට මයික්‍රෝ ග්‍රෑම් 1000 ක් තිබේ. ග්‍රෑම් එකකට මිලි ග්‍රෑම් 1000 ක් තිබේ. වකුගඩුවකට දැරිය හැකි ආසනික් ප්‍රමාණය කොතරම් කුඩා ද යන්න දැන් ඔබට වැටහෙනවා ඇත. රජරට ජනයාගේ වකුගඩු කට්ටලයක ආසනික් මයික්‍රෝ ග්‍රෑම් 300 ත් 400 ත් අතර ඇති බව සොයාගෙන ඇත. මේ සියල්ල එන්නේ කෘෂි හා කෘමි නාශක හරහා ය. මෙවා ලංකාවට ගෙන්වන්නේ ඇමරිකාව, බ්‍රිතාන්‍යය, ජර්මනිය, ස්විට්සර්ලන්තය යන රටවලිනි. වසර 2001 ජූනි 26 වැනිදා නිකුත් කෙරුණු ගැසට් පත්‍රයට අනුව ආසනික් හෝ ආසනික් සංයෝග සහිත කෘෂි හා කෘමි නාශක ලංකාවට ගෙන්වීම, බෙදාහැරීම, විකිණීම, පාවිච්චි කිරීම තහනම් ය. එසේ නම් බහුජාතික සමාගම් සූදානම් වන්නේ හිතාමතාම අනුක්‍රමයෙන් අප මැරීමට ද? ආසනික් නිසා පිළිකා, හෘදයාබාධ, දියවැඩියාව, හටගනී. මේ සියල්ල මරණයෙන් කෙළවර වීමට ඉඩ තිබේ.

[අ.භා. 4.42]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලිතීන් භාවිතය පිළිබඳ සහ ඒවා මේ රටින් බැහැර කිරීම පිළිබඳව දැනුවත් කිරීමක් කළ යුතුයි කියන අදහස ඇතිව තමයි රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ යෝජනාව මේ සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව අවුරුදුපතා ටොන් දෙලක්ෂයක් පමණ ප්ලාස්ටික්, පොලිතීන් ඇතුළු ඒ වාගේ ද්‍රව්‍යයන් ආනයනය කරනවා. දියුණු සමාජයක දකින ප්‍රධාන දෙයක් තමයි ප්ලාස්ටික් භාවිත කිරීමෙන් නොයෙකුත් ආහාර ද්‍රව්‍ය ආවරණය කිරීම එහෙම නැත්නම් ඒවා පැකට් කිරීම කරන එක. නොයෙක් අංශවලින් මේ කටයුතු දියත් වෙලා තිබෙනවා. ඒ නිසා අපට තියෙන ප්‍රශ්නය මේ ප්ලාස්ටික් භාවිතය නැතිනම් පොලිතීන් භාවිතය එකවරම අහෝසි කිරීමේ හැකියාවක් ප්‍රායෝගික වශයෙන් අපට තිබෙනවාද කියන එකයි.

මේ පිළිබඳ සාකච්ඡාවක් මීට වසර කිහිපයකට කලින් කරලා, යම් කිසි ප්‍රතිශතයක් සෙස් බද්දක් හැටියට අය කිරීමට ඉඩ දීමට මේවා ගෙන්වන සමාගම් එකඟ වෙලා තිබෙනවා. ඒ අනුව එවකට සියයට එකක්ව තිබුණු සෙස් බද්ද මේ වෙන කොට සියයට 10ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ සෙස් බද්ද පාවිච්චි කරලා මධ්‍යම පරිසර අධිකාරිය ප්ලාස්ටික් පසු භාවිත ව්‍යාපෘතියක් ආරම්භ කරලා තිබෙනවා. ඒ අනුව මෙය මුල් වසර තුන සඳහා ක්‍රියාත්මක වුණත්, මම මේ විෂය භාර ඇමතිවරයා හැටියට පත් වුණාට පස්සේ තවත් වසර තුනක් සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය එයට ලැබුණා. ඒ අනුව මේ සඳහා මුළු ආයෝජනය හැටියට බලාපොරොත්තු වෙන්නේ රුපියල් මිලියන 1,050ක්. මේ හරහා බලාපොරොත්තු වෙන්නේ රවි කරුණානායක මන්ත්‍රීතුමා කියපු කාරණය වන මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමයි; ජනතාව දැනුමෙන් සන්නද්ධ කිරීමයි.

ඊ ළඟට මේවා එකතු කිරීම පිළිබඳව යම් කිසි ආකාරයක යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම, ඒ එකතු කරන දේවල් නැවත බැහැර කිරීම පිළිබඳව -එහෙම නැත්නම් recycle කිරීම පිළිබඳව- වැඩ කටයුත්තක් ආරම්භ කිරීම කියන කාරණාව තමයි ඊ ළඟට කරලා තිබෙන්නේ. ඒ අනුව මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම් පිළිබඳ වැඩ කටයුතු රාශියක් 2008, 2009 සහ 2010 කියන අවුරුදුවල අපි කරලා තිබෙනවා. ඒ යටතේ අපි පාසල් සිසුන් දැනුවත් කිරීම් කරලා තිබෙනවා. ආණ්ඩුවේ ආයතන දැනුවත් කිරීම් කරලා තිබෙනවා. ඒ වාගේම පළාත් පාලන ආයතන දැනුවත් කිරීම් කරලා තිබෙනවා. ඊ ළඟට අපේ අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන දැනුවත් කිරීමත් අපි කරලා තිබෙනවා.

අපි මේ සඳහා වැඩ පිළිවෙළවල් රාශියක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. දළ දා මාළිගාවේ පෙරහැර වෙලාවේ අපි මේ පිළිබඳව මහ ජනයා දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ශ්‍රී පාද වන්දනා සමයේදී අපි ඒ කටයුත්ත කරලා තිබෙනවා. කතරගම ඇසළ පෙරහැරේදී අපි ප්ලාස්ටික් එකතු කිරීම සහ ඒවා බැහැර කිරීමේ වැඩ කටයුතු කරලා තිබෙනවා. මඩු පල්ලියේදී අපි ඒක කෙරුවා. තලවිල, මුන්නේශ්වරම්, නාගදීපය, නල්ලූර් කෝවිල, "දැයට කිරුළ" ප්‍රදර්ශනය යන ස්ථානවල වාගේම සෙට්ටිකුලම් IDP ස්ථානයේත් අපි ඒක කළා.

ඊ ළඟට මේ ප්ලාස්ටික් සහ පොලිතීන් එකතු කරලා recycle කරන්න පුළුවන් අය -ඒවා එකතු කරන්නන් සහ ඒ කරන ආයතන - බිහි කරන්නත් අපි කටයුතු කරලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේදී බේරුවල, කෙච්චිමලේ පල්ලියේ මංගල්ලය තිබෙනවා. මේ පිළිබඳව එතැනටත් ඔබතුමාගේ අවධානය යොමු කළොත් හොඳයි.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

කොහේද ස්ථානය?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බේරුවල, කෙච්චිමලේ මුස්ලිම් දේවස්ථානය.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

සභාපතිතුමා ඉන්නවා. මම එතුමාට දන්වන්නම් ඔබතුමාගේ ඉල්ලීම ක්‍රියාත්මක කරන්න කියලා. 2007දී සාමාන්‍යයෙන් 30ක් පමණ සිටි මේ එකතු කිරීම් කරන්නන් මේ වෙන කොට අපි සියයට ආසන්න මට්ටමකට දියුණු කරලා තිබෙනවා.

ඊ ළඟට මේ එකතු කිරීම් සඳහා පළාත් පාලන ආයතන එක්ක සම්බන්ධ වෙලා ඒ අපද්‍රව්‍ය වෙන් කරලා, ඒ කියන්නේ ප්ලාස්ටික් වෙනම එකතු කරන්න අවශ්‍ය කරන බහලු 390,000ක් දැනට අපි බෙදා තිබෙනවා. ඒ වාගේම ඒවා වෙන වෙනම ඇසුරුම් කිරීම සඳහා වන රඳවනයන් 2,000ක් විතර දැනට අපි බෙදා දීලා තිබෙනවා. ඒ වාගේම අලුතෙන් ලබා දෙන ට්‍රැක්ටර් රථවල එහෙම නැත්නම් trailerවල මේවා වෙන වෙනම එකතු කරන ක්‍රමවේදයක් අපි හඳුන්වා දීලා තිබෙනවා.

විශේෂයෙන්ම අපට ආණ්ඩුවෙන් ලැබී තිබෙන මුදල් අනුව අපි සෑම පළාත් පාලන ආයතනයකම කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කරනවා. අපි දැන් සෑහෙන පමණ ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ ව්‍යාපෘතිවලදී අපේ එක උපදේශයක් තමයි ඒ පළාත් පාලන ආයතනවලින් මේ රඳවනයන් ඔවුන්ට අඩු මිලට ලබා දෙන්න කියන එක. ඒවා වෙන වෙනම එකතු කිරීමට, ඒ කියන්නේ කැළි කසළ එහෙම නැත්නම් දිරා යන කුණු එක විධියකටත්, බෝතල් සහ බෝතල් කැබලි එක තැනකටත්, ඒ වාගේම පොලිතීන් සහ ප්ලාස්ටික් එක විධියකටත් එකතු කරන්න ඕනෑ කියලා අපි උපදෙස් දීලා තිබෙනවා. ඒ වාගේම මේවා එකතු කිරීමේ යම් යම් ස්ථානත් අපි පිහිටුවා තිබෙනවා. අපි මේ සඳහා බෙත්තාරාම ක්‍රීඩාංගණයේ ස්ථාවර රැඳවුම් හතරක් දමා තිබෙනවා. සුගතදාස ක්‍රීඩාංගණයේ ඇතුළත සහ පිටත, කෝට්ටේ රජ මහා විහාරයේ, ඊ ළඟට Cricket Board එකේ, දෙහිවල සත්තු වත්තේ එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවා තිබෙනවා. රාගමත් අපි එක ස්ථානයක් නම් කරලා තිබෙනවා. කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේත් තිබෙනවා. ඒ වාගේම මධ්‍යම පරිසර අධිකාරියේ තිබෙනවා. දේවි බාලිකා විද්‍යාලය, මුස්ලිම් බාලිකා විද්‍යාලය, ඩී.එස්. සේනානායක විද්‍යාලය, යුනිලීවර් ආයතනය සහ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේත් තිබෙනවා. මේ වෙලාවේ මා ඉතා සන්තෝෂයෙන් කියනවා, මේවා recycle කරන ආයතන -ඒ පිළිබඳව යෙදෙන ආයතන- 47ක් දැනට ලංකාවේ තිබෙන බව. මේවා එකතු කරන්නන් 83 දෙනෙක් ලංකාවේ ඉන්නවා. ඒ නිසා ඉදිරියේදී මේ තත්ත්වය හුඟක් දියුණු වන බව අපි දන්නවා. මොකද, විරුද්ධ පක්ෂය කිව්වත් නැතත් අමාත්‍යාංශයක් හැටියට අපට වග කීමක්

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

තිබෙනවා, මේ කැළි කසළ බැහැර කිරීම පිළිබඳව වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න. ඒ සඳහා දැනටමත් වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ඇත්තටම මෙය අපට වුවමනා වෙලා තිබෙනවා.

කොළඹ නගරයේ එකතු වන කුණු කසළ බැහැර කිරීමට අපි දැනටමත් අවසරයක් දීලා තිබෙනවා. ඇත්තටම කුණු කසළ බැහැර කිරීමට ජනයා උනන්දු කර වීම සඳහා තිබෙන ප්‍රශ්නය තමයි නවීන ක්‍රමයට කුණු කසළ බැහැර කරන ක්‍රමවේදයක් අපට නැතිකම. ලෝකයේ දියුණු රටවල එහෙම ක්‍රමවේදයන් තිබෙනවා. කුණු කසළ බැහැර කිරීමේ එක් මධ්‍යස්ථානයක් සඳහා ඉල්ලීමක් දැනටත් අපට ලැබී තිබෙනවා. ඒක කැබිනට් මණ්ඩලය අනුමත කර තිබෙනවා. එහෙම වුණොත් අපට ඉතාම නවීන පන්නයේ එකක් හම්බ වෙයි. එහෙම වුණාම අපට පුළුවන් නිවාස හිමියන්ට කියන්න, කුණු කසළ බැහැර කිරීමේදී ඒවා වෙන් වෙන්ව ඇසිරීම සඳහා ක්‍රියා කරන්නය කියා. නමුත් අතිනවීන ක්‍රමයකට ගියොත් සෑම නිවෙස් හිමියෙක්ම ඒ සඳහා ගෙවීමක් කරන්න ඕනෑ. ලෝකයේ අතිනවීන ක්‍රමයන් භාවිතා කරන හැම රටකම නිවෙස් හිමියන් විසින් ඒ සඳහා සෑහෙන මුදලක් ගෙවිය යුතුව තිබෙනවා.

අපි වාගේ රටක් හැම පැත්තම කල්පනා කරන්න ඕනෑ. කොරියානු ආධාර අපිට ලැබිලා තිබෙනවා, ඉතාම නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කරලා කසළ වැළලීමේ ක්‍රමවේදයක් ඇති කිරීම සඳහා. ඒ සඳහා පළමු ස්ථානය දොම්පේ ආරම්භ කරන්න මේ දවස්වල සියලු කටයුතු කර ගෙන යනවා. අපිට තවත් ස්ථාන පහක් සඳහා ආධාර හම්බ වනවා. ඒ වාගේම කසළ බැහැර කිරීමේ නවීන මධ්‍යස්ථානයන් සඳහා රටවල් ගණනාවක් -ජපානය, චෙකොස්ලෝවැකියාව, ඉන්දියාව වාගේ රටවල් ගණනාවක්- අපට තමන්ගේ කැමැත්ත උනන්දුව ප්‍රකාශ කර තිබෙනවා. මේ ආදී වශයෙන් අපි බොහෝ අවස්ථාවල ක්‍රියා කරනවා. ඇත්තටම අපි ආරම්භ කර තිබෙන වැඩ පිළිවෙළක් ගැනයි රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කළේ. නමුත් එතුමාගේ අදහස හොඳයි. ප්ලාස්ටික් පසු භාවිතය විතරක් නොවෙයි, ප්ලාස්ටික් භාවිතය අවම කිරීමටත් අපි ක්‍රියා කරන්න ඕනෑ. මම ඇමතිවරයා වෙන්න කලින් ඇත්තටම මේ පිළිබඳව යම් එකඟතාවක් තිබුණා. ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානවලින් ප්ලාස්ටික් කවර විශාල තොගයක් එළියට එනවා. ඒ එළියට ඒම පිළිබඳ යම් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න සූදානම් වුණු වෙලාවේ මේ පිළිබඳ අධිකරණමය නඩු තීන්දුවක් ලබා දීම නිසා අපිට ඒ පිළිබඳව පොඩි වෙනසක් කරන්න සිදු වුණා. දැනටමත් මධ්‍යම පරිසර අධිකාරියට මේ පිළිබඳව කියලා අවශ්‍ය කටයුතු කර තිබෙනවා.

තවත් වැදගත් කාරණාවක් අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ ගෙනාවා. ඒ තමයි කෘමිනාශක සහ වල් නාශක පිළිබඳව. ඇත්තටම මේ පිළිබඳව සම්පූර්ණ බලතල තිබෙන්නේ මේ පිළිබඳව වූ රෙජිස්ට්‍රාර්වරයාට; Registrar of Pesticides. ඒ වාගේම ලංකාවට ගෙන්වන සෑම කෘමිනාශකයක් වල් නාශකයක් පිළිබඳවම අවසර දිය යුතුව තිබෙන්නේ මේ රෙජිස්ට්‍රාර්වරයා විසින්. මේක කෘෂිකර්ම අමාත්‍යාංශය සම්බන්ධ ප්‍රශ්නයක් නිසා ඉදිරි දිනකදී එම අමාත්‍යාංශයෙන් උත්තර ලැබෙනවා ඇති. නමුත් අපි දැනටත් පුළුවන් මට්ටමෙන් සම්බන්ධ වන්න කියා මධ්‍යම පරිසර අධිකාරියට දන්වා තිබෙනවා. මධ්‍යම පරිසර අධිකාරිය ලංකාවේ ගංගාවල සහ ජල මාර්ගවල ගලා යන වතුරේ තත්ත්වය නිරන්තරයෙන්ම පරීක්ෂාවට ලක් කරනවා. අපේ ගංගා ජලයේ ආසනික් තත්ත්වයන් විශාල මට්ටමට වැඩි වෙලා කියා අපිට මධ්‍යම පරිසර අධිකාරියෙන් දැන ගන්න ලැබිලා නැහැ. මේ කාරණා පිළිබඳව අපි තවදුරටත් කටයුතු කරනවා.

අපේ රටේ ආණ්ඩුවේ ප්‍රධාන ප්‍රශ්නය කුණු කසළ බැහැර කිරීම පමණක් නොවෙයි. වඩා හොඳ පවිත්‍රතාව සහිත, සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් අපේ රටේ ජනතාවට උරුම කර දීම අවශ්‍ය වනවා. ඒ සඳහා අවශ්‍ය සියලු කටයුතු අපි ක්‍රියාත්මක කරනවා. මම දන්නවා මේ වෙන කොටත් කෘෂිකර්ම ඇමතිතුමා මේ පිළිබඳව ස්වකීය අවධානය යොමු කර තිබෙනවාය කියලා. ඒ අනුව මේ සියලු කාරණාවල සත්‍යතාවක් තිබෙනවා දැයි බලා, සත්‍යතාවක් තිබෙනවා නම් ඒ පිළිබඳව ක්‍රියා කිරීමට කටයුතු කරන බව මතක් කරනවා. මේ අනුව මේ ප්‍රශ්නය පිළිබඳව සාධාරණ පිළිතුරක් ලැබුණා කියා මම විශ්වාස කරනවා.

ප්ලාස්ටික් සහ පොලිතීන් භාවිතය අවම කිරීම සඳහා කටයුතු කිරීමට අපේ අදහස යොමු වෙලා තිබෙනවා. මේක ඉතාම ප්‍රායෝගික ප්‍රශ්නයක්. අවසාන වශයෙන් මම මෙහෙම කියන්න කැමැතියි. ඉස්සර අපි පුංචි කලයේ ගමේ ගෙදරක කඩෙන් භූමිතෙල් ටිකක් ගේන්න වුණාම එකම එක බෝතලයයි තිබුණේ. කඩේට ගියොත් සීනි රාත්තල කිරලා දෙන්නේ, එහෙම නැත්නම් වෙනත් අමු ද්‍රව්‍යයක් කිරලා දුන්නේ කඩදාසි කොළයක. නමුත් අද එහෙම භූමිතෙල් බෝතලයක් දකින්නත් නැහැ. කඩදාසිවලට බඩු කිරන කඩ දකින්නත් නැහැ. හැමෝම අද ප්ලාස්ටික් භාවිතයට හුරු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා වෙනදාට වඩා විශාල කැළිකසළ ප්‍රමාණයක් ගෙදරකට එකතු වෙනවා. කඩේට ගිහින් ආවොත් ගේනෙන බඩු එක්ක තව ප්‍රමාණයක් කැළිකසළ එකතු වෙනවා. ඒ නිසා මේවා කළමනාකරණය කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම පිළිබඳ ගැටලුවට අද මේ රටේ තිබෙන සෑම පළාත් පාලන ආයතනයක්ම මුහුණ දීලා තිබෙනවා. ඒක මම දන්නවා. මෙතැන පළාත් සභා කටයුතු භාර නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. එතුමන්ලාත් මේ කාරණය පිළිබඳව සැලකිලිමත් වෙනවා.

සමාජයක් දියුණු වෙන කොට, සමාජයක් වෙනස් වෙන කොට, ඇසුරුම්කරණය පිළිබඳව අලුතෙන් වෙළඳ පොළ ක්‍රියාත්මක වන විට, ඇසුරුම්කරණය පිළිබඳව නව අදහස්වලින් පිරුණු වෙළඳ පොළක් අපට හම්බ වන විට අපි ප්‍රාථමික ගණයෙන් උඩට යනවා. එසේ උඩට යන කොට අපට එකතු වෙන මේ වාගේ දේවල් ප්‍රතිචක්‍රීකරණය කිරීමත් එක්තරා විධියක දියුණු තාක්ෂණය පාවිච්චි කරලා කරන්න ඕනෑ. මේ සඳහා අවශ්‍ය කරන තාක්ෂණය ලබා ගැනීමට අපි උත්සාහ කරනවා වාගේම ඒ සඳහා පළාත් පාලන ආයතනවලටත් ලොකු මිලක්, එහෙම නැත්නම් ලොකු වියදමක් දරන්න සිද්ධ වෙනවා. මේ කාරණාව දැන ගෙන රජය මේ සියලු කාරණා වෙනුවෙන් වසරකට රුපියල් බිලියන 5කට වැඩි මුදල් ප්‍රමාණයක් "පිළිසරු" කියන වැඩ පිළිවෙළ යටතේ අපට ලබා දීලා තිබෙනවා. මේ හරහා සියලුම පළාත් පාලන ආතනවලට තමන්ගේ කැළිකසළ බැහැර කිරීම සඳහා වන ක්‍රමවේදයන් නිර්මාණය කරන්න අපේ බලාපොරොත්තුවක් තිබෙනවා. දැනට අපි ඒවා සෑහෙන ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ඉදිරි ප්‍රමාණයත් අපි ලබා ගන්නවා. මේ සඳහා අපට පළාත් පාලන අමාත්‍යාංශයේත් සහාය ලැබෙනවා. අපි දෙන්නේ අවශ්‍ය මූල්‍යමය කටයුතු පමණයි. ඒ අනුව ඉදිරියේදී කැළි කසළින් තොර, ඒ වාගේම ප්ලාස්ටික් භාවිතයෙන් තොර ජනතාවක් හැටියට අපට නැඟිටින්න වෙන කොට මේ දැනුවත් කිරීමත් ඉතා වැදගත් වෙයි කියා මම හිතනවා. මේ සියලු කාරණා සම්බන්ධ කර ගෙන අපි ඒ කටයුත්ත කරන්න බලාපොරොත්තු වන බව මතක් කරනවා. ඒ කියපු කාරණා සම්බන්ධයෙන් අපි හුඟක් දුර ගිය බවත් මතක් කරමින් මේ පිළිබඳව ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මාගේ වචන අස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Ravi Karunanayake, he has five minutes to reply. He is not here.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට දෙවැනි යෝජනාව ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරනවා ඇති.

## දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන සැලසීම සඳහා ජනාධිපති කොමිසමක්
## அரசியல் பழிவாங்கல்களுக்கு உள்ளானவர்களுக்கான நிவாரணம் அளிக்குமுகமாக சனாதிபதி ஆணைக்குழு
## PRESIDENTIAL COMMISSION ON POLITICAL VICTIMIZATION

[අ. භා. 4.58]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස මා පහත සඳහන් යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා:

"අතීතයේ සිට මේ දක්වා තමන් දරන දේශපාලන මතය නිසා පීඩාවට හා දේශපාලන පළිගැනීම්වලට ලක් වූ අයගේ පැමිණිලි විභාග කර සහන සැලසිය හැකි පූර්ණ බලැති ජනාධිපති කොමිසමක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

මා මෙම පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉදිරිපත් කරමින් කරුණු කිහිපයක් දක්වන්නට ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා ඕනෑම කෙනකුට දේශපාලන මතයක් දරන්න අයිතියක්, අවස්ථාවක් ලැබෙන්න ඕනෑ බව. ඒක ලෝකය පිළිගත්ත මූලික සිද්ධාන්තයක්. සියලුම නීතිවලින්, මූලික අයිතිවාසිකම්වලින් සහ මානව හිමිකම්වලින් මෙය තහවුරු කරලා තිබෙනවා. ඒ වාගේම අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්ති ගණනාවකින්, පරිච්ඡේදයකින් තමන්ට කැමැති දේශපාලන මතයක් දැරීමේ අයිතිය රටක් විධියට අපි පිළිඅරගෙන තිබෙනවා. ඒ වාගේම ඒ සම්බන්ධිත ලෝක සම්මුතින්වලට අපි අත්සන් තබා තිබෙනවා. ඒ නිසා දේශපාලන මතයක් දැරීමේ අයිතියත්, ඒ වාගේම වෘත්තීය අයිතිවාසිකම් - වෘත්තීය සමිති කිරීමේ, තම වෘත්තීය වෙනුවෙන් අරගල කිරීමේ අයිතිවාසිකම- ලබා දීමට රටක් විධියට අපි ව්‍යවස්ථාවලින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වාගේම බැඳුණු සම්මුතීන් අනුව එකඟ වෙලා තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය එසේ වුවත්, එහෙම කිව්වත්, එහෙම පිළිගත්තා වුවත් අපේ රටේ දේශපාලන ඉතිහාසය දිහා බලන කොට මේ මූලික සිද්ධාන්ත, මේ අයිතිවාසිකම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්, අණපනත් ඉතාම කැත විධියට අමු අමුවේ උල්ලංඝනය කරපු අවස්ථා බොහොමයක් තිබෙනවා. එය ඉතිහාසයේ ඉඳලාම අද මේ අවස්ථාව වන කොටත් ඉතාම පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා එය කල්පනා කරලා තමයි මම මේ ගරු සභාවට මේ යෝජනාව ඉදිරිපත් කළේ.

පසු ගිය දේශපාලන ඉතිහාසය පිළිබඳව දීර්ඝ වශයෙන් කථා කරන්නට වේලාවක් නොවුණත්, එවකට රජය, මේ රටේ වැඩ කරන ජනතාව තමන්ගේ ජීවත්වීමේ අයිතිය වෙනුවෙන්, වැටුප වෙනුවෙන් කරපු අරගලයේදී - ඔබතුමාට හොඳට මතක ඇති - 1980 ජූලි වැඩ වර්ජකයන් 1,14,000ක් ඉතාම ශෝචනීය විධියට එළියට දැම්ම බව ඔබතුමා දන්නවා. අද පවා ඔවුන්ගේ දරුවන්, ඔවුන් ඉතාම දුඃඛිත තත්ත්වයකට පත් වෙමින් ඉන්නවා. ඔවුන්ට ලබා දෙනවායි කිව්ව සහන නොලැබී, තවමත් දුක් පීඩා විඳින ජනතාවක් බවට පත් වී සිටිනවා. ඒ ඛේදවාචකයේ ප්‍රතිඵල සැහෙන කාලයක් තිබුණා. සමහරුන්ට දිවි නසා ගන්න සිද්ධ වුණා, සමහරු දිවි නසා ගත්තේ නැති වුණත් ඉතාම දුක් පීඩා විඳලා මිය ගියා. ඒක අපි දැක්කා. ඒ වාගේම පසු ගිය කාලාන්තරය තිස්සේම මේ කාරණය අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ මොහොත වන කොටත් තමන්ගේ දේශපාලන මතය දැරීමේ අයිතිය උල්ලංඝනය කරන, වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමේ අයිතිය උල්ලංඝනය කරන ඉතාම නරක විධියේ තත්ත්වයක් පෙනෙන්න තිබෙනවා. මේ රටේ පසු ගිය කාලයේ සම්මත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන, නීති අණපනත් පවා ඉතාම නරක විධියටයි පාවිච්චි කරන්නේ. විශේෂයෙන්ම රාජ්‍ය සේවකයන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී ඉන්න තිබුණු අවස්ථාව, අයිතිවාසිකම් ලබා ගන්න තිබුණු අවස්ථාව අද රාජ්‍ය සේවා කොමිසම ඒ වාගේම අනෙකුත් ආයතන - අධිකරණය පවා - දේශපාලනීකරණය කිරීම නිසා නැති වී ගොස්, අද ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන තත්ත්වයකට පත්ව තිබෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය සේවා කොමිසම දේශපාලන අධිකාරියක් බවට පත් කිරීම හරහා අද මේ දේශපාලනමය පළිගැනීම් කිරීමේ අවියක් බවට එය පත් කර ගෙන තිබෙනවා. එහි ප්‍රතිඵල අද පෙනෙන්න තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, පසු ගිය කාලයේ දිගින් දිගටමත් -වර්තමාන රජය පවා- මේ වන විටත් තමන්ට එරෙහි දේශපාලන මත දරන අයට එරෙහිව විශේෂයෙන්ම රාජ්‍ය සේවයේදී, වෘත්තීය සටනේදී දේශපාලන මත දරන අයට විවිධ ප්‍රහාරයන් එල්ල කරමින් තිබෙනවාය කියලා. විශේෂයෙන්ම අපි දන්නවා, පසු ගිය කාලයේ පුරාම වරාය අධිකාරිය රජයට එරෙහි දේශපාලන මත දරන, දේශපාලන ක්‍රියාකාරකම්වල යෙදෙන, වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් අරගල කරන අයට ඉතාමත් නින්දිත විධියේ ප්‍රහාරයක් එල්ල කළ බව. ඒ වෙනුවෙන් ඔවුන්ගේ අරගලය කර ගෙන යද්දී ඔවුනට අවශ්‍ය සහනය ලබා දුන්නේ නැහැ. සමහර අවස්ථාවල අධිකරණයට පවා යන්න සිද්ධ වුණා; මේ ගරු සභාවේ කථා කරන්නත් සිද්ධ වුණා.

මේ වන කොට ඉතාම නරක විධියේ, නින්දිත විධියේ දේශපාලන මැදිහත් වීමක් කරමින් සිටින ආයතන කීපයක් මා තමුන්නාන්සේට, මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නම්. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මේ වන විට තමන්ට එරෙහි දේශපාලන මතයක් දරන අයට දිගින් දිගටම ප්‍රහාර එල්ල කරමින් සිටිනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතිහාසයේ වෙච්ච දේවල් ගැන අපි තක්සේරු කරලා තිබෙනවා, ඉතිහාසයේ වෙච්ච දේවල් වැරදියි කියන සාකච්ඡාමය සභා වෙලා තිබෙනවා. එහි ප්‍රතිඵල අපි භුක්ති විඳලා තිබෙනවා. ඒ ඉතිහාසයේ වෙච්ච දේවල්ම අද නැවත නැවතත් ඉතාම නරක විධියට, ශෝචනීය විධියට සිද්ධ වෙමින් තිබෙනවා.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ, විශේෂයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථා සේවක සංගමයේ නියෝජ්‍ය ලේකම් බී.එස්.ජී. පෙරේරා මහත්මයාට, ඒ වාගේම භාණ්ඩාගාරික සී.එච්. සමන්කුමාර මහත්මයාට දිගින් දිගටම ස්ථාන මාරුවීම් ලබා දී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. "ඔවුන්ට ඒ ස්ථාන මාරු වීම් දුන්නු තීරණය අසාධාරණයි, ඒක දේශපාලන පළිගැනීමක්, ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් කෙළෙසීමක්" කියලා අපේ රටේ මානව හිමිකම් කොමිසම දුන්නු තීරණයෙන් කියා තියෙද්දීත් 2011 මැයි මාසයේ 12 වන දා කරපු නිර්දේශය ප්‍රතික්ෂේප කරලා, ඒක පැත්තකට දාලා ඔවුන්ගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඔවුන්ට දේශපාලන වශයෙන් පළිගැනීමක් කරනවා. ඒ නිසා අද මේ මොහොත වන කොටත් ඒ පළිගැනීම සිද්ධ වනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මහවැලි අධිකාරියේ,

[ගරු අජිත් කුමාර මහතා]

මහවැලි සේවක සංගමයේ සභාපති හා ලේකම්, වසරක් තිස්සේ මාරු කරලා තිබෙනවා.

මොකක්ද වැරැද්ද? විනය පරීක්ෂණ හෝ ඒ ආයතනය තුළ ක්‍රියාකාරිත්වයේ, ඔවුන්ට පවරපු වගකීමේ, රාජකාරියේ වැරැද්දක් හෝ නොවෙයි. එකම වරද තමයි වෙනස් දේශපාලන මතයක් දැරීම. ඒ වාගේම සමෘද්ධි අධිකාරියේ වෘත්තීය සමිතියක ලේකම්වරයෙක් වන චාමර මද්දුම මහත්මයා මාස තුනක් තිස්සේ සේවයෙන් ඉවත් කරලා තිබෙනවා, මාධ්‍යවලට තොරතුරු දුන්නාය කියන චෝදනාවක් ගොනු කරමින්. තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, දේශපාලන මතයක් දැරීමේ අයිතිය මේ මොහොත වන විටත් උදුරා ගෙන තිබෙනවා; උල්ලංඝනය කරමින් තිබෙනවා. තරුණ සේවා සභාව, ශ්‍රී ලංගම වැනි ආයතනවලත් මේ තත්ත්වය ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. මා කිව්වේ නිදර්ශන කීපයක් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ගුරු සේවය තුළ මේ තත්ත්වය ඉතාම ශෝචනීය විධියට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. මේ රටේ අදත් සාධාරණ මතයක්; නිදහස් මතයක්; විකල්ප මතයක් දරන අයට ඒ ඉඩකඩ නැති කරලා තිබෙනවා. අද එය දිගින් දිගටම යනවා. එක කණ්ඩායමක දේශපාලන මතයකට බලහත්කාරී ලෙස අනික් අය ඇදා ගන්නට කරන උත්සාහයක් විධියට මේක දකින්න පුළුවන්. ඒ නිසා ශිෂ්ටාචාර සමාජයක්, දියුණු යැයි සලකන සමාජයක්, අලුත් නීති, මූලික අයිතිවාසිකම් නීති අණපනත් සම්මත කරන සමාජයක් එවැනි තත්ත්වයක් අනුමත කරයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. මේ ගරු සභාව, මේ රට එවැනි තත්ත්වයක් අනුමත කරයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ලෝකය එවැනි තත්ත්වයක් අනුමත කරයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරනවා. දේශපාලන පළිගැනීම්වල නරකම දෙයක් අපි දැක්කා, මේ සභාවේ. ඔබතුමා දන්නවා, මේ රටේ යුද මෙහෙයුමේදී ඒ සඳහා මැදිහත් වුණු හිටපු යුද හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා වෙනස් දේශපාලන මතයක් දැරීම නිසා, වෙනත් දේශපාලන පක්ෂයක වැඩ කිරීම නිසා, ජනාධිපතිවරණයට ඉල්ලීම නිසා අද මොකක්ද කරලා තිබෙන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන පළිගැනීම් පිළිබඳව ප්‍රබලම උදාහරණය මේ රටේ වර්තමාන රජය පෙන්වමින් තිබෙනවා. දේශපාලන පළිගැනීම් කරන විධිය ගැන පෙන්වලා තිබෙනවා. ශිෂ්ට සම්පන්න ලෝකයට අශිෂ්ට උදාහරණයක් අද පෙන්වලා තිබෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා, ඔහුගේ දේශපාලන පළිගැනීම ඔහු සිරගත කිරීමෙන් නැවතිලා නැහැ කියලා. ඔහුට බොරු චෝදනා ගොනු කිරීමෙන් නවත්වලා නැහැ.

ඒ විතරක් නොවෙයි, එතැනින් එහාට ගිහිල්ලා අවුරුදු 40ක් තිස්සේ තමන් මහන්සි වෙලා වැඩ කරලා, තමන්ගේ දැනුම හැකියාව තමන්ගේ වටිනාකම මේ රටට එකතු කරලා ඔහු උපයා ගත්ත විශ්‍රාම වැටුප පවා ඔහුට අහිමි කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. යුද හමුදාපතිවරයාට, නාවික හමුදාපතිවරයාට, ගුවන් හමුදාපතිවරයාට යන මේ ත්‍රිවිධ හමුදාපතිවරුන්ට ඒ ජයග්‍රහණය වෙනුවෙන් රජය ඉඩම් ලබා දුන්නා. ෆොන්සේකා මහතාට ලබා දුන්නු ඉඩම් කැල්ල පවා අහිමි කරලා වැට කොටු මායිම් ගහලා පොලිස් මුර පොළවල් දාලා දේශපාලන පළිගැනීමේ උපරිමය පෙන්වලා තිබෙනවා. මේ ශිෂ්ට සම්පන්න ලෝකය කියලා අපි කථා කරන ලෝකයට අශිෂ්ට උදාහරණයක් වර්තමාන රජය පෙන්වලා තිබෙනවා. ඔහුට විතරක් නොවෙයි, ඔහුගේ දූ දරුවන්ට, ඔහුගේ බිරිඳට විටින් විට කරදර කරමින් තිබෙනවා අපි දැක්කා. පසු ගිය කාලයේ සරත් ෆොන්සේකා හිටපු යුද හමුදාපතිතුමාගේ දියණිය ලංකාවට එන කොට ගුවන් තොටුපොළේදී බාධා කළා. ඒ විතරක් නොවෙයි, ඔහුගේ ඥාතීන්ට, හිතවතුන්ට බාධා කරනවා. ඔහුගේ දේශපාලන මතය දරන අයගෙන්, ඔහුට සහයෝගය දුන්නු අයගෙන් දිගින් දිගටම පළිගැනීම් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය දේශපාලන පළිගැනීම්වල ඉහළම මට්ටමේ තිබෙන අශිෂ්ටම උදාහරණයක්. ඒ වාගේම ඔහු උපයා ගත්ත පදක්කම් පවා අද උදුරා ගෙන තිබෙනවා. ඒ පදක්කම් අහෝසි කරලා තිබෙනවා. ඒ වාගේම අපි දැක්කා පසු ගිය සතියක ප්‍රකාශ කළා, එතුමාට අවශ්‍ය සියලු පහසුකම් මේ රජය ලබා දුන්නාය කියලා. නමුත් අපි කියන්න ඕනෑ, මේ රජය ලබා දුන්නු පහසුකමක් නොවෙයි තිබෙන්නේ කියලා. අධිකරණය ඉස්සරහට ගිහිල්ලා තමයි එතුමාට රූපවාහිනිය ගන්න වුණේ, ශාරීරික ව්‍යායාම කරන කට්ටලය ගන්න වුණේ, බෙහෙත් ගන්න යන්න අවසරය ගන්න වුණේ. මේ සියලු දේවල් කරන්න වුණේ එතුමාට උසාවිය හරහා නියෝගයක් අරගෙනයි. ඒවා ලැබුණේත් රජයෙන් නොවෙයි, ඔහුගේ පෞද්ගලික හිතවතුන්ගෙනුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙනස් දේශපාලන මතයක් දරන අයට දිගින් දිගටම ඉතිහාසයේ ඉඳලාම පළිගැනීම් සිදු වුණා. ඒ ඉතිහාසයේ වෙච්ච පළිගැනීම්වලට සාධාරණ වන්දියක්, ඔවුන්ට වෙච්ච අඩන්තේට්ටම්වලට, ඒ මූලික අයිතිවාසිකම් කඩ කිරීමට අවශ්‍ය සාධාරණ විසඳුමක් ලබා දුන්නේ නැහැ වාගේම අද වන කොටත් ඒ පළිගැනීම් දිගින් දිගටම කරමින් පවතිනවා. ඒ නිසා මා මේ ගරු සභාවේ අවධානය යොමු කර සිටිනවා, ඉතිහාසයේ සිට ඒ දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සාධාරණය ඉෂ්ට කරන්න, ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න, ඔවුන්ට ලබා දිය යුතු වන්දිය ලබා දෙන්න කියලා. ඒ වාගේම අද මේ මොහොතේ සිදු වන දේශපාලන පළිගැනීම් නතර කරලා ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරන්න.

අද තිබෙන එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව වෙනස් වී හෙට තිබෙන්නේ වෙනත් එකක් වෙන්න පුළුවන්. ඒ මොනම ආණ්ඩුවකින් හරි වෙනස් මත දරන අයට දේශපාලන පළිගැනීමක් නොකර, තමන්ගේ මතය දැරීමේ අයිතිය ලබා දීලා, "දේශපාලන පළිගැනීම්" කියන ඒ නරක වචන දෙක මේ රටෙන් ඉවත් කරන්න මැදිහත් වෙන්නය, ඒ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා වූ පූර්ණ ජනාධිපති කොමිසමක් පත් කරන්නය කියා මේ සභාවෙන් ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. එම යෝජනාව ස්ථිර කරන්නේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

[අ.භා. 5.10]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින් ඒ පිළිබඳව වචන කිහිපයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. අපි දන්නවා අපේ රටේ දේශපාලන ඉතිහාසයේ ආණ්ඩු මාරු වෙනවා වාගේම ඒ ආණ්ඩු මාරු වෙන හැම වාරයකදීම දේශපාලන පළිගැනීම් පිළිබඳ කමිටු පත් කර තිබෙන බව. අද මේ ආණ්ඩු පක්ෂයේ ඉන්න ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළුව අපේ ඉදිරියේ ඉන්න ගරු ඇමතිතුමන්ලා ඉතිහාසය පුරා තමන්ගේ පාක්ෂිකයන් වෙනුවෙන් -ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් වෙනුවෙන්- දේශපාලන පළිගැනීම් පිළිබඳ කමිටුවලදී කරුණු ඉදිරිපත් කර තිබෙනවා.

අපි දන්නවා බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුකාර අලවි මවුලනා මැතිතුමා වැනි අය කම්කරු නායකයන් හැටියට දේශපාලන පළිගැනීම් කමිටුව ඉදිරියේ 1977 දී කරුණු ඉදිරිපත් කළා. 1977න් පසුව 1980 වන කොට නැවත වතාවක් ජූලි වර්ජකයන්ට දේශපාලන පළිගැනීම් කමිටුවලදී කරුණු ඉදිරිපත් කරන්න සිද්ධ වුණා. 1994 දී මට මතකයි පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව බලයට පත් වුණු මුල් අවස්ථාවේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනිය දේශපාලන පළිගැනීම් කමිටු පත් කළා. නැවත පත් කළේ 2001 දීයි. දැන් අපි 2011යි ඉන්නේ.

ලංකාවේ ආණ්ඩු මාරු වෙන වාරයක් ගානේ දේශපාලන පළිගැනීම් පිළිබඳ කමිටු පත් කර තිබෙනවා. ඒවායේත් සමහර හාස්‍යජනක සිදුවීම් වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර රාජ්‍ය ආයතනවල නිලතල අනුව, තත්ත්වය අනුව, වෘත්තිය මට්ටම් අනුව, සුදුසුකම් අනුව ඒ තැන්වල ඉන්න නිලධාරි මහත්වරු ඉහළ නිලධාරියාට Sir කියනවා. ඊළඟ ආණ්ඩුව බලයට පත් වුණාම Sir කියපු කෙනා පල්ලෙහාට ගිහිල්ලා, පහළ සිටි පුද්ගලයා පළිගැනීම් කමිටුවෙන් promotion තුන හතරක් අරගෙන ප්‍රධානියාට වඩා උඩට ගිහින් තිබෙනවා. කලින් හිටපු ප්‍රධානියා දැන් එදා පහළ හිටපු කෙනාට Sir කියනවා. එහෙම මාරු වීම් වෙනවා. දේශපාලන පළිගැනීම් කමිටුවල නිර්දේශ නිසා ආණ්ඩු මාරු වන කොට තනතුරු මාරු වෙන්නේ promotion එක්ක. මොකද, ඒ නිර්දේශ සකස් වෙන්නේ තමන්ගේ ආණ්ඩුවක් තිබෙන කොට, තමන් බලයේ ඉන්න කොට, බලයේ ඉන්න කට්ටිය හැන්දෙන් බෙදා ගන්නා ආකාරය අනුවයි. එතැනදි ඊට වඩා ලොකු අසාධාරණයක් සිද්ධ වෙනවා. ඒ කියන්නේ පළිගැනීම වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට වෙන්න ගිහිල්ලාත් සිද්ධ වෙන්නේ අසාධාරණයක්. අන්න ඒ නිසා තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු මාරු වීමේ ක්‍රියාවලිය ගැන නොසලකා, ආණ්ඩු මාරු වීම කෙසේ සිද්ධ වුණත්, ඒ මොන ආණ්ඩුවකින් හරි දේශපාලන පළිගැනීම් සිද්ධ වෙනවා නම් ඒවා වළක්වන ආකාරයේ කාර්ය සාධනයක් අවශ්‍ය වෙලා තිබෙන්නේ. ඒවා වළක්වා සහතිකයක් තියෙන්න ඕනෑකම තිබෙනවා, රාජ්‍ය සේවයේ මොන දේශපාලන මතය දැරුවත් ඒ දේශපාලන මතය අනුව පළිගැනීම්වලට ලක් නොවනවාය කියා. එහෙම පළිගැනීමකට ලක් වෙන කෙනෙකුට යුක්තිය ඉෂ්ට වන ස්ථානයක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒක තමයි දැන් අවශ්‍ය වෙලා තිබෙන්නේ. එහෙම නොවුණොත් රාජ්‍ය සේවයේ කොන්ද කෙළින් තියා ගෙන වැඩ කරන මිනිස්සු නැති වෙනවා.

ලංකාවේ දේශපාලන ඉතිහාසයේ මැතිවරණ ප්‍රකාශන පෙරළා බැලුවොත් හැම මැතිවරණ ප්‍රකාශනයකම තිබෙනවා, ඊළඟට දේශපාලන පළිගැනීම් කරන්නේ නැති ආණ්ඩුවක් හදනවාය කියා. හැබැයි එහෙම කිව්වාට වැඩක් නැහැ. භාවිතයේදී, නැවත ක්‍රියාකාරිත්වයේදී ඒ දේවල් ඒ ආකාරයටම සිද්ධ වෙනවා. ඇත්තෙන්ම අද මේ යෝජනාව කාලෝචිත යෝජනාවක්. දේශපාලන පක්ෂයකට ඇඟිල්ල දික් කරන යෝජනාවක් නොවෙයි. ඒ වාගේම මේක යාවත්කාලීන කරන්න පුළුවන් වන්නේ, ආපස්සට -අපේ ඉතිහාසයට- ගිහිල්ලා ලංකාවේ දේශපාලන ඉතිහාසය පුරාම සිද්ධ වෙලා තිබෙන්නේ මෙවැනි අසාධාරණකම් නම් ඒවා නිර්මාණය වෙච්ච හේතු හොයලා ඒ හේතු නැති කරන්න පුළුවන් ආකාරයේ ජනාධිපති කොමිසමක් පත් කිරීමෙනුයි. ඒ ජනාධිපති කොමිසම කියන එකෙන් අපි අදහස් කරන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කොමිසමක් නොවෙයි. ඒක අවධාරණය කරන්න ඕනෑ. එහෙම වුණොත් ආයෙත් වෙන්නේ පරණ වැරැද්දමයි. පත් වෙන්න ඕනෑකම තිබෙන්නේ මොන ආණ්ඩු බලයේ හිටියත් ඒ ආණ්ඩු හැම එකකදීම මිනිස්සුන්ට පොදුවේ බලපාන ආකාරයට කටයුතු කළ හැකි කොමිසමකුයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ජනාධිපති කොමිසමක් පත් කරන්නේ ජනාධිපතිතුමා තමයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ. ඒ ජනාධිපතිතුමා දැන් ඉන්න හින්දා පත් කරන එක නේ. එහෙම වුණාම තමයි ඒක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කොමිසමක් වන්නේ. එහෙම නොවෙයි, ඒක ස්වාධීන එකක් වන්න ඕනෑ. දැන් මේ යෝජනාවේ තිබෙන වැදගත්කම ඒකයි. ස්වාධීන ජනාධිපති කොමිසමක් පත් වෙන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කවුද ඒක පත් කරන්නේ?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක පත් කරන්නේ ජනාධිපතිතුමා තමයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විධායක ජනාධිපතිතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒ ජනාධිපතිතුමා කියලා කියන්නේ ජනාධිපති ධුරය විසින්. ජනාධිපති කොමිසම කියන්නේ ඒක නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙනම් වෙන නමක් කියන්න. මොකද, ජනාධිපති කොමිසමක් වන්නේ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ජනාධිපති කොමිසමක් තමයි. නමුත් ඒක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කොමිසමක් නොවිය යුතුයි කියලායි මම මේ කියන්නේ. ඔබතුමාට දැන් තේරෙනවා ඇති කියලායි මා හිතන්නේ. ඒක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කොමිසමක් වුණොත් ඒ ජනාධිපති කොමිසමෙනුත් වැඩක් නැහැ. දැන් මෙතෙක් ඉතිහාසය ගැන මම කථා කළේ ඒකයි. අපේ රටේ දේශපාලනය කරපු නිසා ප්‍රජා අයිතිය අහෝසි වෙච්ච සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ ඉඳලා දේශපාලනය කරපු නිසා හිරගත වෙච්ච සරත් ෆොන්සේකා මහත්තයා දක්වා දේශපාලන ඉතිහාසයේ ආපස්සට හැරිලා බැලුවොත් එහෙම, ආණ්ඩු මාරු වෙන හැම වාරයක් ගානේම බෙල්ල කැපිච්ච මිනිස්සු හැම රාජ්‍ය ආයතනයකම ඉන්නවා. වෘත්තිය වශයෙන් කප්පාදුවට ලක් වෙච්ච අය ඉන්නවා. ඒ නිසා දරුවෝ දීග දෙන්න බැරිව අසරණ වෙච්ච, දුප්පත් වෙච්ච පවුල්, ඉහිරිලා විසිරිලා ගිහිපු, කඩා වැටිච්ච ජීවිත ඕනෑ තරම් තිබෙනවා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

දැන් ජනාධිපති කොමිසමක් ඕනෑ. අන්න ඒ තත්ත්වය වෙනස් කරන්නයි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සන්ධාන බලයක් තිබුණත්, එක්සත් ජාතික පාක්ෂිකයන්ට වුණත්, ජනතා විමුක්ති පෙරමුණේ පාක්ෂිකයන්ට වුණත් සාධාරණයක් ඉෂ්ට කර ගන්න පුළුවන් ජනාධිපති කොමිසමක් ඕනෑ. ඔබතුමා ඒ ප්‍රශ්නය නඟපු එක හොඳයි. මොකද මේකේ අර්ථ නිරූපණය පැහැදිලි වෙන්න ඕනෑ නිසා. ඒ නිසා එවැනි ජනාධිපති කොමිසමක් ඇති කරන්න මේ යෝජනාව බලවත් බලපෑමක් වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම මෙය ස්ථිර කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් ආණ්ඩු පක්ෂය පැත්තෙන් විජය දහනායක නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා.5.16]

**ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்ட லுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ අජිත් කුමාර මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව ස්ථිර කළේ මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය බල ප්‍රදේශයේ -මගේ බල ප්‍රදේශයේම- මන්ත්‍රීතුමෙක් වන අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමායි. ඒ සම්බන්ධව අපට ගොඩක් කරුණු කථා කරන්න පුළුවන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දේශපාලන පළිගැනීම්වලට ලක් වෙච්ච අය ගැන බැලුවොත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය තමයි පසු ගිය කාලවල එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඇතුළේ විශාල වශයෙන් හානියට ලක් වුණේ.

අපට මතකයි, 1994 දී ඒ ආණ්ඩුව එදා දේශපාලන වශයෙන් පීඩාකාරී තත්ත්වයට පත් වෙච්ච, ස්ථාන මාරුවීම් දුන්න, එහෙම නැත්නම් සේවයෙන් පහ කරපු එහෙමත් නැත්නම් නොයෙක් ආකාරයේ අසාධාරණ විධියට පළිගැනීම්වලට ලක් වෙච්ච අයට සහනයක් දෙන්න ක්‍රියාත්මක වෙච්ච ආකාරය. අපේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා රාජ්‍ය සේවයේ ඕනෑම කෙනෙකුට නිදහසේ තමන්ගේ දේශපාලන මතය දරන්න ලෝකයේත් ලංකාවේත් සෑම තැනම ඉඩ තිබෙනවා කියලා. අපිත් ඒක විශ්වාස කරනවා ගරු මන්ත්‍රීතුමනි. නමුත් පසු ගිය කාලවල ඉතිහාසය ගැන බැලුවොත් අපට පෙනී යනවා ඒ දේශපාලන පළිගැනීම්වලට ලක් වෙන්න ආණ්ඩු පෙරළෙන්න, අලුත් ආණ්ඩු පිහිටුවන්නම අවශ්‍ය වුණේ නැහැ කියලා. මම අතීතයේ ගොඩක් ඈතට යන්නේ නැහැ. ඒ කාලවල අපි දේශපාලනය නොකළත් අපි ගොඩක් කරුණු ගැන අහලා තිබෙනවා. දේශපාලන වශයෙන් තමන්ගේ මතය ප්‍රකාශ කරන්න ඉදිරිපත් වෙච්ච, ඡන්ද අයිතිය පාවිච්චි කරන්නවත් ඉඩ තිබුණු යුගයක් පසු ගිය කාලවල තිබුණේ නැහැ. අපි දකිනවා ඒවා වැරැදියි කියලා. නමුත් අද ඒවා නිවැරැදි වෙමින් තිබෙනවාය කියන විශ්වාසයක් අපිට තිබෙනවා. මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අපිට මතකයි එදා ආණ්ඩු පෙරළෙන කොට දිසාපතිවරු පවා ස්ථාන මාරුවීම් කළ ආකාරය. ඒ විතරක් නෙවෙයි, තමන්ට තමන් ජීවත් වන නිවහනේ ඉන්න බැරි තත්ත්වයක් තිබුණා. ඉතින් එහෙම තත්ත්වයක් තිබුණු රටක වර්තමානය දෙස බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි සතුටු වෙනවා අද එවැනි තත්ත්වයක් නැති වීම පිළිබඳව. යම් යම් සිද්ධි ගැන කථා කරලා එතුමන්ලා දැක් වූ සමහරක් මත ගැන බලන කොට මම දකින්නේ සමහරක් වැරැදි කළොත් ඒවාට දඬුවම් තිබෙන බවයි. අධිකරණයක් හරහා ක්‍රියාත්මක වෙන නීති පද්ධතියක් තුළින් තමයි ඒවා ක්‍රියාත්මක වන්නේ. එහෙම නැතිව දේශපාලන නායකත්වයකින්, නැත්නම් වෙනත් ආකාරයක මූලිකත්වයකින් එහෙම පළිගැනීම් වර්තමාන යුගයේ සිදු වෙලා නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපිත් හොඳට ඇස් කන් ඇරගෙන තමයි මේවා දිහා බලා ගෙන ඉන්නේ. ඒ නිසා අද අපි ගොඩක් සතුටු වනවා. මම අතීතයේ සිට ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධ නොවුණත්, යම් ආකාරයක දේශපාලන පසු බිමක තමයි ජීවත් වුණේ. ඒ නිසා දේශපාලන පළිගැනීම් සිද්ධ වුණේ කුමන ආකාරයෙන්ද කියලා අපි දැක තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මතකයි 1977 ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කළාට පසු ඡන්දය ඉල්ලපු අයට එළියට බහින්න බැරි වුණා. ඒ විතරක් නොවෙයි, ඊට පසු කාල වකවානුව ඇතුළේ ඡන්දය දෙන්න ගිය අයට වෙච්ච දේ අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි සමහර රජයේ නිලධාරින් පවතින මැතිවරණ ක්‍රමය ක්‍රියාත්මක කරන්න එළියට බහින කොට ඔවුන්ගේ ජීවිත පවා නැති වෙලා තිබෙනවා. නමුත් අද අපි එවැනි තත්ත්වයක් දකින්නේ නැහැ. අපි දකිනවා, ඉතිහාසයේ විශාල වශයෙන් වැරදි සිද්ධ වෙලා තිබෙන බව. ඒ වැරදි නිවැරදි වෙමින් යන වෙලාවක් අද තිබෙන්නේ. පෞද්ගලික හේතූන් මත සමහර ස්ථානවල සමහර අයට දේශපාලන වශයෙන් රිදවීම් කරන්න සමහරු බලාපොරොත්තුවෙන් ඇති. අපි විශේෂයෙන්ම කියනවා, රජයක් හැටියට ඒවාට කිසිම ආකාරයේ උදව් උපකාර කිරීමක් වර්තමාන යුගයේ අපි දකින්නේ නැහැ කියන එක. ඒ නිසා අද ඒ නිදහස විශාල ලෙස ලැබිලා තිබෙන බව අපි දකිනවා.

මීට කලින් කථා කළ මන්ත්‍රීතුමන්ලා කිව්වා, අද සේවක අරගල සිද්ධ වෙනවා, වෘත්තිය සමිති ක්‍රියාත්මක වෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් අසාධාරණයක් සිද්ධ වෙමින් තිබෙනවා නම් එළියට ඇවිල්ලා වැඩ වර්ජන කරලා ඒ අසාධාරණය නැවත සැරයක් ආපස්සට ගන්න පුළුවන් තරමේ නිදහසක් අද මේ රටේ තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මගේ පෞද්ගලික මතයේ හැටියට එතුමා කියන ආකාරයේ කොමිසමක අවශ්‍යතාවක් මම දකින්නේ නැහැ. අද අපි දකිනවා, සමහර ස්ථානවල ඒ වාගේ පොඩි පොඩි සිද්ධීන් සිද්ධ වුණත් ඒවා වහාම නිවැරදි කරන්න රජයක් හැටියට ක්‍රියාත්මක වෙලා තිබෙන බව. එතුමා යම් යම් ආයතන කිහිපයක් ගැන සඳහන් කළා. සමහර විට යම් ආයතනයක යම් අයෙක් වරදක් කළොත් ඒ සඳහා දඬුවමක් දෙන්න සූදානම් කළත්, ඒක දේශපාලන මතයක් උඩ සිදු වෙච්ච දෙයක් කියලා අපට කියන්න බැහැ. මොකද මේ රජය දිගින් දිගටම මැතිවරණ කිහිපයකින් ජයග්‍රහණය කරලා, අවුරුදු ගණනාවක් තිස්සේ ජයග්‍රාහීව ගමන් කරන රජයක්. දේශපාලනය කරපු නිසා මේ ආකාරයට දඬුවම් ලැබුණාය කියලා වෙනදා වාගේ අපි පත්තරවල දකින්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි යම් අයෙකුට අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා නම් අධිකරණය ඉදිරියට ගිහිල්ලා සාධාරණය ඉෂ්ට කර ගන්න පුළුවන් තත්ත්වයක් අද මේ රටේ තිබෙනවා. ඉතිහාසයේ වැරදි සිද්ධ වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා වර්තමානය තුළ ජනාධිපති කොමිසමක් පත් කරලා දේශපාලන වශයෙන් පළිගැනීම්වලට ලක් වූ අයට සහන ලබා දෙන්න ඕනෑය කියන මතයේ අපි නැහැ.

අපි දන්නවා -අපි අහලා තිබෙනවා- එදා, 1980 ජූලි වර්ජකයෝ ලක්ෂ ගණනක් එළියට දමලා, ඔවුන්ගෙන් යම් පිරිසකට යම් ආකාරයක සහනයක් ලබා දෙන්න පුළුවන්කමක්

ලැබුණත්, ඒ සියලු දෙනාටම ඒ සහනය ඒ ආකාරයෙන් ලැබුණේ නැහැ කියලා. නමුත් අපි ඉතාම සතුටින් කියනවා, රාජ්‍ය සේවයේ නිලධාරින්ට කොන්ද කෙළින් තියා ගෙන වැඩක් කරන්න පුළුවන් තත්ත්වයක් අද තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ මේ වර්තමාන යුගයේ අපිට සියලුම මඟ පෙන්වීම් කරන දේශපාලන නායකත්වය සහ මේ රජය දරන මතය උඩ මෙවැනි කොමිසමක අවශ්‍යතාවක් තිබෙනවාය කියලා අපි කිසි සේත්ම සිතන්නේ නැති බවයි. අද සියලු දෙනාට සාධාරණත්වය ඉෂ්ට වෙන ආකාරයට මේ රජය ක්‍රියාත්මක වනවා. ඒ විතරක් නොවෙයි, සමහර අයගේ පෞද්ගලික ප්‍රශ්න එහෙම නැත්නම් ඒ අය කරපු යම් වැරදි උඩ සිදු වූ දෙයක් දේශපාලන පළිගැනීමක් කියලා අර්ථ නිරූපණය කරනවා නම් අපි ඒ මතයට එකඟ වෙන්න සූදානම් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ යෝජනාව ඉදිරිපත් කිරීම හා ස්ථිර කිරීම කරලා තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙක්. අපේ දකුණු පළාතේ, මාත් එක්ක ඉතා හිතවත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කළා. ඉතින් අපි එතුමන්ලාට කියනවා, අද දකුණු පළාතේ විතරක් නොවෙයි මුළු රටේම හොඳ නිදහසක් තිබෙනවා කියලා. අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා දෙනියාය ගැන දන්නවා. කියන්න ඕනෑ නැහැ. එදා තත්ත්වයේ නොවෙයි අද තිබෙන්නේ. අද කිසි කෙනෙකුගේ ප්‍රචණ්ඩත්වයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ ගරු මන්ත්‍රීතුමනි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ තත්ත්වය උඩ ජනාධිපති කොමිසමක අවශ්‍යතාවක් නැතෙයි කියලා මගේ අදහස් ප්‍රකාශ කරමින් නවතිනවා. ස්තුතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා රජය වෙනුවෙන් පැහැදිලි කළේ, ජනාධිපති කොමිසමක අවශ්‍යතාවක් නැහැ කියලා. ඒක නේද ගරු නියෝජ්‍ය ඇමතිතුමා පැහැදිලි කළේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔව්. අවසන්වරට ඒකයි කිව්වේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ජනාධිපති කොමිසමක් අවශ්‍ය වෙන්නේ නැහැ. ගැටලු තිබෙනවා නම් කරුණු ඉදිරිපත් කරලා අමාත්‍යාංශ මට්ටමින් විසඳා ගන්න පුළුවන්; විසඳා දීලාත් තිබෙනවා එයයි අපේ ස්ථාවරය.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි එහෙම නම් යෝජනාව ඉදිරිපත් කළ ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා පිළිතුරු කථාව කරන්න.

[අ.භා.5.25]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව ස්ථිර කළ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට හා රජය වෙනුවෙන් ඒ සම්බන්ධව අදහස් දක්වපු නියෝජ්‍ය අමාත්‍ය විජය දහනායක මැතිතුමාටත්, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාටත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ ගැටලුවත් මේක තමයි; ඛේදවාචකයත් මේකම තමයි. අපි කවුරුත් පිළිගන්නවා මේ රටේ ඉතිහාසයේ ඉඳලාම යම් යම් අය දේශපාලන පළිගැනීම්වලට ලක් වුණා කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයට වැඩියෙන් වුණා, ජනතා විමුක්ති පෙරමුණේ අයට අඩුවෙන් වුණා කියලා ඒ කාරණය පටු කරනවා නම්, තිබෙන එක ප්‍රශ්නයක් ඒක. කාලාන්තරයක් තිස්සේ මෙහෙම ප්‍රශ්න වුණා. අදත් වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඒක ලඝු කළා, කාගේ හෝ පෞද්ගලික වැරදි අඩු පාඩුකම්වලට දඬුවමක් දෙනවා නම් ඒක ප්‍රශ්නයක් නැහැ කියලා. නමුත් අපි මේ ගරු සභාවේ නිශ්චිතව මතු කළ උදාහරණවලට අනුව, වරාය අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය වැනි ආයතනවල හා ගුරු ක්ෂේත්‍රය යනාදී ක්ෂේත්‍රවල අය නිශ්චිතවම කරපු වැරැද්දකට මාරු කිරීමක් හෝ පළිගැනීමක් හෝ දඬුවම් දීමක් හෝ නොවෙයි මේ කරලා තිබෙන්නේ. අපි කවුරුත් එකඟයි මේ රටේ මූලික නීතියට -ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට- අනුව, ආයතන සංග්‍රහය අනුව හා තිබෙන අණ පනත් අනුව කාට හෝ දඬුවමක් දෙනවා නම්. නමුත් මානව හිමිකම් කොමිෂන් සභාව නිර්දේශ කරලා තියෙද්දී, -විශේෂයෙන්ම මම ඒකට උදාහරණයට කිව්වේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව- ඒ නිර්දේශ පවා ක්‍රියාත්මක නොකර දේශපාලන පළිගැනීමක් කරමින් සිටිනවා. ගරු ඇමතිතුමා එහෙම නෙවෙයි කියනවා නම්, අපට ඒ පිළිබඳව අදාළ අමාත්‍යාංශවල උපදේශක කාරක සභාවලදී සාකච්ඡා කරන්න පුළුවන්. ඒ කරුණු අභියෝගයට ලක් කරන්න පුළුවන්. ඒවා ඉතා පැහැදිලියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා මේ යෝජනාව ඉදිරිපත් කළේ මේ රජය ගැන හිතලා විතරක් නොවෙයි. මේවා ඉස්සරත් වුණා, අදත් වෙනවා, ඉදිරියේදීත් මේ විධියට වෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසායි.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

එහෙම තත්ත්වයක් තිබෙනවා නම් ඒ ගැටලුව ඉදිරිපත් කරලා අමාත්‍යාංශ මට්ටමින් අපට විසඳා ගන්න පුළුවන් කියන මතයක මම ඉන්නවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ප්‍රශ්නයෙන් ප්‍රශ්නය මතු වන කොට අමාත්‍යාංශ මට්ටමින් එකින් එක සාකච්ඡා කරමින් විසඳනවා වෙනුවට, මේ දේශපාලන පළිගැනීම් කියන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් නැවැත්වීම සඳහා වැඩ පිළිවෙළක් ඕනෑය කියන එක තමයි අපේ අදහස. ප්‍රශ්නයක් එන කොට ඇමතිතුමාට කථා කරලා, උපදේශක කාරක සභාවේ කථා කරලා විසඳන්න පුළුවන් විධියේ තත්ත්වයකින් නොවෙයි අද මේවා සිද්ධ වෙන්නේ. වෙනස් මතයක් දරන අය පළිගැනීමට ලක් වෙන තත්ත්වයක් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, අද මේ වාගේ දේවල් ගැන පුවත් පත්වල වාර්තා වෙන්නේ නැහැ කියලා. අපට එහෙම අහන්න දකින්න ලැබෙන්නේ නැහැ කියලා. ඒක ඇත්ත. මොකද,

[ගරු අජිත් කුමාර මහතා]

අද දේශපාලන පළිගැනීම්වල ප්‍රමාණය කොච්චරද කියනවා නම් සමහර දේවල් පුවත් පතක වාර්තා නොවන මට්ටමට ඇවිල්ලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පුවත් පත් මාධ්‍යවේදියකු මේ රටේ වෙන අසාධාරණය පිළිබඳව වාර්තා කළොත්, එය ඔහුගේ ජීවිතය පිළිබඳ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. දේශපාලන පළිගැනීම්වල ස්වභාවය ඒකයි. අද ඒ තරමට දුර දිග ගිහිල්ලා තිබෙනවා. කෙනෙක් වෙනස් මතයක් දරන එක තමන්ගේ ජීවිතය අහිමි වීම දක්වා ඇවිල්ලා තිබෙනවා. මාධ්‍යවේදීන් විධියට ගත්තොත් ප්‍රගීත් එක්නැළිගොඩ මහත්මයාට මොකක්ද වුණේ? "ලංකා" පුවත් පතට මොකක්ද වුණේ? වෙබ් අඩවිවලට මොකක්ද වුණේ? ඒ නිසා දේශපාලන පළිගැනීම්වල ප්‍රමාණය අද ඒ මට්ටමට ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප කරා කළ යුත්තේ කලින්ට වඩා අද හොඳයි කියන එක නොවෙයි. අද මේ ලෝකය තිබෙන තත්ත්වයට අනුව, මේ දියුණු තත්ත්වයට අනුව, අද පවතින ශිෂ්ට සම්පන්න තත්ත්වයට අනුව අද අපේ රට නැති එක ගැනයි. වහල් යුගයේ තිබුණු තත්ත්වයට වඩා අද හොඳයි කියලා අපට කියන්න පුළුවන්. අප එහෙම සන්සන්දනය කරන එක වැරදියි. අද තිබිය යුතු මට්ටමට මේ රට නැහැ කියන එක තමයි අපේ මතය. මේ රටේ ඇති නීති, අණ පනත්, අනුව මේ රටේ පාලනයන් හරහා යහපත් තත්ත්වයක් ප්‍රකාශයට පත් වෙන්නේ නැහැ කියන එක තමයි අප මතු කරන කාරණය. ඒ නිසා මේ සඳහා ස්ථිරසාර වැඩ පිළිවෙළක් ඕනෑ කියන කාරණය නැවත වතාවක් මතු කරමින් මගේ යෝජනාව නැවත වතාවක් ඉදිරිපත් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.***
*வினா விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.*
*Question put, and negatived.*

## කොළඹ නගරයේ වැසි ජලය බැස යෑම ක්‍රමවත් කිරීම
## கொழும்பு நகரில் மழை நீர் வழிந்தோடுவதை ஒழுங்குமுறையாக்கல்
## REGULATING THE DRAINAGE OF RAIN WATER IN THE CITY OF COLOMBO

[අ.භා. 5.29]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"කොළඹ නගරයේ තවමත් පවතින්නේ වසර 100කටත් වඩා පැරණි ජලය බැස යන කානු පද්ධතියක් වන අතර එය නිසියාකාරව ක්‍රියාත්මක නොවන බැවින් පැය භාගයක පමණ අඛණ්ඩ වර්ෂාවකින් කොළඹ නගරයම ජලයෙන් යටවන තත්ත්වයකට පත්ව ඇති හෙයින්ද, අවිධිමත් ලෙස ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි හා අනවසර ඉදිකිරීම්වලින් පරිසරයට හානි සිදු වන හෙයින්ද, අධික වැසි අවස්ථාවලදී කොළඹ නගර සහා බල ප්‍රදේශය තුළ ඇති වන ගංවතුර ආපදා තත්ත්වය අවම කිරීම සඳහා වැසි ජලය ක්‍රමවත්ව බැස යාමට හැකිවන පරිදි අදාළ කානු පද්ධතිය නවීකරණය හා ශුද්ධ පවිත්‍ර කර විධිමත්ව පවත්වාගෙන යා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

එම යෝජනාව පිළිබඳව අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබීම ගැනත් මම සන්තෝෂ වෙනවා. ගෙවී ගිය කාල වකවානුව තුළ පැවැති රජයන් හා විෂය භාර නිලධාරීන් වර්තමානයට ගැළපෙන ලෙස ක්‍රියාත්මක වී නොමැති බැවින් ජාතික මට්ටමේ වටිනාකමක් ඇති මෙවන් දේවල් දීර්ඝ කාලයකට බලපවතින සේ ප්‍රතිසංස්කරණය කළ යුතු බව පැහැදිලිවම ප්‍රකාශ කරන්න පුළුවන්.

එදා මෙන් නොව අද කොළඹ නගරය තුළ ජනගහනය බහුල වීම, ගෙවල් දොරවල් බහුල වීම තුළින් අද මේ ප්‍රශ්නය වඩාත් උග්‍ර අතට පත් වෙලා. එය හරියට ඔඩු දුවපු පිළිකාවක් වාගේ යැයි අපට කියන්න පුළුවන්. නගරයේ හයෙන් පහක් විවෘතව තිබුණු භූමි ප්‍රදේශය වේගයෙන් හිඟ වෙමින් පවතිනවා. හයෙන් පහක්ව තිබුණු විවෘත ප්‍රදේශ වර්තමාන තත්ත්වය අනුව තුනෙන් දෙක දක්වා අඩු වෙලා තිබෙනවා. නාගරීකරණයත් සමඟ අලුතින් concrete දමලා, සිමෙන්ති දමලා ගෙවල් හදන නිසා, පාරවල් හදන නිසා වැහි වතුර කෙළින්ම පොළොවට වැටිලා පොළොවට උරා ගන්නවා වෙනුවට ඒවා ගලා ගෙන යනවා කානු පද්ධතිවලට. ඒ තත්ත්වයට මුහුණ දෙන්න පුළුවන් විධියට ඒ කානු පද්ධති සහ සෙසු ඇළ මාර්ග හදලා නොතිබුණාම මේ උවදුරට මුහුණ දෙන්න අපට සිද්ධ වෙනවා. මෙයට වග කිව යුත්තේ දුක් විඳින ජනතාව නොව යම් බලපුළුවන්කාරකම් ඇති කොටස් බැව් මා පැහැදිලිව පවසන්න ඕනෑ. කොළඹ නගරයේ තදාසන්න ප්‍රදේශයට ස්වභාවයෙන්ම උරුම කර දුන් ජල පෝෂිත ස්ථාන මේ කොටස් විසින් අත්තනෝමතික ලෙස පරිහරණය කිරීම, ගොඩ කිරීම නිසා මේ තත්ත්වය වඩාත් උග්‍ර අතට පත් වෙලා. වැරැදි අනුමත කිරීම්, අනවසරයෙන් ගොඩ කරන ලද ඉඩම් සහ ඉදි කරන ලද ගොඩනැඟිලි මෙන්ම නිවාස හේතුවෙන් මේ තත්ත්වය එන්න එන්නම භයානක අතට හැරිලා තිබෙනවා. පැය භාගයක් වැස්සත් මුළු කොළඹ නගරයම වැසි ජලයෙන් යට වීම ඊට උදාහරණයක්. සොබාදහම මිනිසා ජීවත් කරවනවා මෙන්ම සොබාදහම සුරැකීම අපගේ යුතුකමක් බැව් මා සැම දෙනාටම පැහැදිලිව ප්‍රකාශ කරන්න කැමැතියි.

සාමාන්‍යයෙන් ලොවෙහි දකින්නට තිබෙන දෙයක් වන්නේ, දුක් විඳින මිනිසා ඔවුන්ගේ ජීවිතය ගැට ගසා ගන්නට සොබාදහමට අභියෝග කිරීමයි.

කොළඹ නගරය තුළ මෙය හාත්පසින්ම වෙනස් වනවා. කොළඹ නගරයේ මෙය සිදු වන්නේ බල පුළුවන්කාරකම තුළිනුයි. ඒ නිසා අනවසර ඉදි කිරීම් ශීඝ්‍රයෙන් වැඩි වෙලා තිබෙනවා. එය වහා වෙනස් කළ යුතුයි. එය වෙනස් නොවන්නේ නම් ජල ගැලීම්වලින් පසුව ඇති වෙන්නා වූ රෝග සහ වසංගත රෝගවලින් අපේ මිනිසුන්ට විඳින්නට සිදු වී තිබෙන දුක් දොම්නස් අනන්තයි. ඒ නිසා නිදහස් සෞඛ්‍ය සේවාව වෙනුවෙන් රජයට අති විශාල මුදල් සම්භාරයක්ද වියදම් කිරීමට සිදු වනවා. ජලය බැස යන කානු පද්ධති හිරවීමෙන් ඇනහිටින නගර ක්‍රියාකාරිත්වය මිල කළ නොහැකි තරම් වනවා. මේ සඳහා ක්‍රමවත් හා විධිමත් වැඩ පිළිවෙළක් වහාම ක්‍රියාත්මක කළ යුතු යුගයකට අපි දැන් අවතීර්ණ වෙලා තිබෙනවා.

මේ සම්බන්ධයෙන් අධ්‍යයනයක යෙදෙන නිපෝන් කොයිකො සමාගමේ නිරීක්ෂණ අනුව කොළඹ නගරය සහ ඒ ආශ්‍රිතව හෙක්ටෙයාර් 380ක් එනම්, අක්කර 950ක් වත් ජල රැඳවුම් ප්‍රදේශ අප විසින් පවත්වාගෙන යා යුතුව තිබෙනවා. එහෙත් එම ප්‍රමාණය අක්කර 600ක් පමණ දක්වා දැනට අඩු වී ඇති බව නිරීක්ෂණ දත්තයන් අනුව දක්නට ලැබෙනවා. මේ ඉරණමට අපට මුහුණ දීමට සිදු වූයේ 1970 දශකයේ මැද භාගයේ සිට බැව් පැහැදිලිවම අප සැවොම දන්නා කරුණක්. මේ වනවිටත් ජල රැඳවුම් ප්‍රදේශ අලුතින් ගොඩනැඟීමට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් දැනටමත් වැඩ සටහන් ආරම්භ කර තිබෙනවා. ඒ ගැන අපි සන්තෝෂ වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමානයේ සිට අනාගතයට ගැළපෙන පරිදි සංවර්ධනය කිරීමට සුදුසු ඉඩම් හා ප්‍රදේශ කොළඹට තදාසන්නයේ නොමැති වීම ඉතාමත්ම භයානක තත්ත්වයක්. නොබෝදා නවසීලන්තයේ සිදු වූ ක්‍රයිස්චර්ච් භූමි කම්පාව තුළින් එහි භයානකත්වය අප දැක්කා. අද මේ රැස්ව සිටින උත්තරීතර පාර්ලිමේන්තුවේ අපටද ජලය ගැලීමේ භයානකත්වයට මුහුණ දෙන්නට සිදු වුණා. රට කරවන ස්ථානයට ඒ අන්දමින් මුහුණ දීමට සිදු වූවා නම්, අඩු ආදායම් ලබන අපගේ සාමාන්‍ය මිනිසුන්ට මුහුණ දෙන්නට සිදු වන ඉරණම පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කොට, එම දුක් විඳින ජනතාව වෙනුවෙන් අද කථා කිරීමට අවස්ථාව ලැබීම ඔවුන් හට කරන ඇගයීමක් හැටියට අපට විදහා දක්වන්නට පුළුවන්.

කොළඹ නගරයට පමණක් රැස් වන ජලය බැස යන ජල මාර්ග පද්ධති, පසෙකින් මහා සාගරවලටද, පසෙකින් ඇළ වේලිවලටද යොමු කොට තිබෙනවා. ඒවා සම්බන්ධ වන පාලම් හා බෝක්කු අද විනාශ මුඛයට පත් වෙලා තිබෙනවා. ඒ සඳහා මා යෝජනා කර සිටින්නේ ජල විද්‍යා ඉංජිනේරුවරු, ශිල්පීය හා තාක්ෂණයෙන් හෙබි නිර්මාණශීලී විශේෂඥයන්ගේ දැනුම් පද්ධතියක් ඒකරාශී කර ගෙන දීර්ඝ කාලයකට බලපවතින වැඩ පිළිවෙළවල් සකස් කළ යුතු බවයි. ඒ වාගේම මේ එක් රැස් වන ජලය ක්‍රමානුකූලව පොළොව යටින් එලන ලද පයිප්ප හරහා මේ නගරයෙන් ඔබ්බට මුහුදු ප්‍රදේශවලට ගෙන යා යුතුයි, විශේෂයෙන්ම පහත් බිම් නගරය තුළත් තිබෙන නිසා. බොහෝ සංවර්ධිත රටවල් මෙම ක්‍රම උපයෝගීකොට ගෙන තිබෙනවා. මේවාට අධික වියදම් දරන්නට සිදු වන්නට පුළුවන්. නමුත් මෙවැනි ක්‍රම රටක දීර්ඝ කාලීන පැවැත්මට බොහෝ සෙයින් ඉවහල් වනවා. දිනෙන් දින අපේ නගරයේ ඉඩම්වල වටිනාකම වැඩිවන නිසා එම ආයෝජනය දීර්ඝ කාලීනව අපට වාසියක් හැටියට හරවා ගන්නට පුළුවන් වනවා.

මහ කොළඹ ප්‍රදේශය තුළ ගංවතුර පාලනය කිරීමේ හා පරිසරය වැඩි දියුණු කිරීමේ දී JBIC ව්‍යාපෘතිය යටතේ මෙවැනි ආකාරයකට පයිප්ප යොදා බම්බලපිටියේ "ග්ලේන් ඇවනිව්" පෙදෙස හරහා පොළොව යටින් වැසි ජලය ඉවත් කිරීමට විධි විධාන සකස් කරමින් විදේශීය ආධාර යටතේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ඉතා සතුටුදායක ලෙස කර ගෙන යන බැව් පෙන්වා දෙන්නට පුළුවන්. යම් යම් පවතින අදාළ ඇළ මාර්ග පද්ධති නඩත්තු කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර උපකරණ ආදිය අසලට ගෙන යාමට බාධා වන ආකාරයේ කැණීම් කර තිබෙන බැවින් පැරණි ක්‍රම, විෂය භාර ඉංජිනේරු මහතුන්ටද ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මෙවැනි අවස්ථාවල අනවසර ඉදි කිරීම් ඉවත් කළ යුතු අතර, සුදුසු පරිදි අදාළ ස්ථානවලට ගෙන යා හැකි කුඩා පරිමාණයේ යන්ත්‍ර උපකරණ ඒ සඳහා යොදා ගැනීමටද අපගේ අවධානය යොමු කළ යුතු යි. මේ සඳහා විවිධ ක්‍රමවේදයන් යොදා ගැනීමට ද අපගේ ඉංජිනේරුවරුන්ට දක්ෂතා තිබෙන බවද මෙහිදී පැහැදිලිව සඳහන් කිරීමට පුළුවන්. අවශ්‍ය වන්නේ ඊට අවශ්‍ය බාහිර පරිසරය ඔවුන්ට සකස් කර දීම බවද මෙහිදී සඳහන් කළ යුතුමයි. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නල මාර්ග හා ජල රැඳවුම් ප්‍රදේශ බාහිර බාධාවලින් තොරව නඩත්තු කිරීමටත්, ඒවා කලින් කල සුද්ධකොට කිසිදු බාධාවකින් තොරව ජලය බැස යාමට සුදුසු පරිදි සකස් කිරීමටත් ඔවුන් දරන උත්සාහයන්ට අප විසින් දිය හැකි සෑම සහයෝගයක්ම ලබා දිය යුතු යයි මා විශ්වාස කරනවා.

ජල රැඳවුම් ප්‍රදේශ ව්‍යාප්ත කිරීම සඳහා අලුතින් ජල රැඳවුම් ප්‍රදේශ කිහිපයක් දැනටමත් හඳුනා ගෙන ඇති අතර, තලවතුගොඩ හා පැලවත්ත, "වෝටර්ස් එජ්" අසල භූමි ප්‍රදේශය, පාර්ලිමේන්තුව ඉස්මත්තේ තිබෙන ජල රැඳවුම් ප්‍රදේශ සංවර්ධනය කිරීම සහ ඒවා කඩිනමින් අවසන් කිරීමද ඉක්මනින් කළ යුතුව තිබෙනවා.

පාර්ලිමේන්තු සංකීර්ණය අවට ජලය කඩිනමින් බැස යාමට ඉවහල් වන වේරැස් ගඟ ව්‍යාපෘතිය පිළිබඳව මූලික විමර්ශන කටයුතු දැනටමත් ක්‍රියාත්මක වන බැව් පෙනෙන්නට තිබෙනවා. මෙම ව්‍යාපෘතින් කාර්යක්ෂමව කඩිනමින් කළහොත් රාජගිරිය දෙසින් ගලා එන ජලය වේගයෙන් පහළට ගලා යාමට පහසු වන බැව් සඳහන් කරන්නට පුළුවන්.

මෙම කාර්යයන් විධිමත්ව හා සැලසුම් සහගතව කිරීමට යෝජිත ව්‍යාපෘති කිහිපයක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කිරීමට උත්සාහ ගෙන තිබෙනවා. ඒ අතර බත්තරමුල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජලය බැස යාමට වැඩ පිළිවෙළවල් සකස් කිරීම හා රාජගිරිය HSBC බැංකුව අසල ප්‍රදේශයේ ජලය බැස යාම කළමනාකරණය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති අතර මාදිවෙල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අක්කර 15ක් පමණ ජලය රැඳවුම් ප්‍රදේශ සකස් කිරීමේ වැඩසටහන මඟින් දැනටමත් අක්කර 6ක් පමණ හාරා සකස් කොට සංවර්ධනය කිරීමටත් කටයුතු කර තිබෙනවා.

මෙම කාර්යයන් සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, කොළඹ මහ නගර සභාව හා අදාළ පළාත් පාලන ආයතන මනා සම්බන්ධීකරණයකින් හා ජනතා සහභාගිත්වයකින් කටයුතු කළ යුතුව තිබෙනවා. මේ සඳහා අවශ්‍ය ප්‍රදේශ ලබා දීම හා අවශ්‍ය විදේශීය ආධාර ලබා ගැනීම සඳහා අදාළ අංශ සමඟ සහයෝගයෙන් වැඩ කටයුතු කිරීමේ වැඩ පිළිවෙළක් මෙයට හඳුනා දිය යුතුව තිබෙනවා. සාමාන්‍ය ජන ජීවිතයට කෙළින්ම බලපාන මෙම ගැටලුව කඩිනමින් විසඳා ගැනීමෙන් අපගේ ජන ජීවිතයට වන හානිය අවම කොට උසස් ජීවන තත්ත්වයක් නගරාසන්නව පවත්වා ගෙන යාමට හැකි බැව් පැහැදිලිවම මෙම ගරු සභාවට මා කියා සිටිනවා.

ස්වභාව ධර්මයෙන් සිදු වන උපද්‍රවයන්ට අභියෝග කිරීමෙන් කිසි විටෙකවත් ඒවා නතර කර ගැනීමට නොහැකි බැව්, පසු ගිය දා ලෝකයේ දියුණුම රටක් වූ ජපානයට මුහුණ දීමට සිදු වූ ව්‍යසනයෙන් පැහැදිලි වනවා. "ලොව සියලුම භෞතික සම්පත් ලෝක සත්ත්වයා ජීවත් කර වීම සඳහායි" යන්න බුදු රජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා. අපි සියලු දෙනාම ඒ අනුව යමින් සොබා දහම සුරකෙන පරිදි සියලු සංවර්ධනයන් සිදු කළ යුතුයි යන්න මා මේ ගරු සභාවට අවධාරණය කරන්න කැමැතියි.

පොඩි වැස්සකට පවා කැලණි ගඟ උතුරා යාම නිසා කැලණි ගඟ ආශ්‍රිතව ජීවත් වන ජනතාවට ප්‍රජා ශාලාවන් සොයා ගෙන යන්න සිද්ධ වනවා. කැලණි ගඟ පිටාර ගැලීම නිසා විශේෂයෙන් තොටළඟ, දෙමටගොඩ, වනාතමුල්ල, කඩුවෙල සහ කැලණි ගඟ ආශ්‍රිතව ජීවත් වන ජනතාවට සිදු වන අපහසුතාවන් සඳහා යම් කිසි සහන ලබා ගැනීමට විවිධ ස්ථානයන් කරා යන්නට සිදු වනවා. උදාහරණයක් ලෙස ග්‍රාම නිලධාරි ළඟට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, පළාත් සභාවට, අවසානයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයටත් යන්නට සිද්ධ වනවා. එම නිසා මෙවැනි අවස්ථාවලදී මේ පීඩා විඳින අහිංසක ජනතාව වෙනුවෙන් මුහුණ දීමට මෙම ආයතනයන්ගෙන් සැදුම්ලත් ජාතික සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලෙස මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

අද පොඩි වැස්සකට පවා අවතැන් වුණු අයට ප්‍රාදේශීය සභාවට, නගර සභාවට, පළාත් සභාවට, එහෙම නැත්නම් ජාතික වශයෙන් ඇති ස්ථානයකට ගිහින් රස්තියාදු වන්න සිද්ධ වනවා. තමන්ට වුණු වින්නැහියට, එහෙම නැත්නම් දේපොළ හානියට, තමන්ගේ ජීවිතවලට වන හානියට, දරුවන්ගේ පොත් පත් ටික නැති වුණාම යන්න තැනක් නැහැ. මෙම වැසි ජලය නිසා අසනීප තත්ත්වයට පත්වන අය, ඒ වාගේම දුක් විඳින අය විශාල අභියෝග රාශියකට මුහුණ පානවා. එම නිසා මෙම යෝජනාව අතිශය වැදගත් කියා මා විශ්වාස කරනවා.

[ගරු තිලංග සුමතිපාල මහතා]

අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් පරිදි, වර්තමාන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අධීක්ෂණය යටතේ නාගරික සංවර්ධන අධිකාරියට සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට මෙම කටයුතු පැවරීමෙන් අනතුරුව නගර සංවර්ධනය කිරීමේ නව වැඩ පිළිවෙළවල් පැහැදිලිවම දකින්නට ලැබෙනවා. ඒ මඟින් ලැබෙන නගර අලංකාරය තුළින් සෝභමාන වන ලක් මැණියන් දෙස දෙවරක් බලන්නට හැකි බැව් මා පවසා සිටින්නේ කිසියම් අභිමානයකින් මෙන්ම එම ක්‍රියාකාරකම්වලට ගෞරව කිරීමෙනි. මේ සියලු ව්‍යායාමයන් සොබා දහමට පටහැනිව නොගොස් ඉටු විය යුතුයි යන්න සිහිපත් කරමින්, "සොබා දහමට නොවන අවනත ලොවේ කිසිවක් නෑ" යන සොඳුරු වදන් මා මෙම සභාවේ තබමින් මා නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. එම යෝජනාව ස්ථිර කරන්නේ ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමා.

[අ.භා.5.42]

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව පැය ගණනක් සාකච්ඡා කළ යුතු, ලංකාවේ බස්නාහිර පළාතේ ඉතාම වැදගත් අර්බුදයක් පිළිබඳව කෙරුණු යෝජනාවක්. තමුන්නාන්සේලාට ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ඒ ගැන පැහැදිලි කළා. නමුත් මම මේ කාරණයත් කියා සිටින්න අවශ්‍යයි. කැලණි ගඟ ගලන කොට කලුඅග්ගල කියන ස්ථානයේ ඉඳලා තොටළඟ දක්වා එකම ගංවතුර කලාපයකට හැරිලා තිබුණා. මේ ගංවතුර කලාපයේ තොටළඟ යට වෙලා, දෙමටගොඩ යට වෙලා පුංචි බොරැල්ල, බොරැල්ල යට වෙලා තුන්මුල්ලට ඇවිල්ලා තමයි ගංවතුර නතර වුණේ. ඒ නිසා මුළු කොළඹ නගරයෙන්ම ඉතිරි වුණේ කොටහේන, මාළිගාකන්ද, අලුත්කඩේ සහ දෙහිවල Hill Street කියන ස්ථාන හතර විතරයි. ගංවතුරක් ආපුවාම ඉංග්‍රීසි ආණ්ඩුව තිබුණු කොටුව -අක්කර 224යි කොටුව ප්‍රදේශයේ තිබෙන්නේ.- තනි වෙලායි තිබුණේ.

මේ සඳහා ඉංග්‍රීසි ආණ්ඩුව කටයුතු දෙකක් කළා. එකක් තමයි කැලණි ගඟෙන් එන වතුර නතර කිරීම සඳහා ඔරුගොඩවත්තට ගොතටුවේ ඉඳලා අති විශාල පස් බැම්මක් හදපු එක. ඒකෙන් ගඟේ ඉඳලා එන වතුර ටික නගරය ඇතුළට ඒම නතර වුණා. දෙවැනි කටයුත්ත තමයි, ඒ ගොල්ලන් කිසිම දවසක ගංවතුරට යට වන්නේ නැති පාරක් හදපු එක. ඒ, කිරිල්ලපන ඉඳලා කලුඅග්ගල දක්වා අලුත් පාර. "High level" කියන්නේ higher than the flood level කියන එකටයි. ඒකයි හැදුවේ. ඒක ඇත්ත වශයෙන්ම මැටි තාප්පයක්. ඒකේ බෝක්කු නැහැ. බෝක්කු අඩුයි. මේ පාඩම මට කියලා දුන්නේ ලංකාවේ සුප්‍රසිද්ධ ඉංජිනේරු මහත්මයකු වන කුලසිංහ මහත්මයා පැය තුනක lecture එකක් හැටියටයි. එතුමාගේ කන්තෝරුවේදී මම මේ ප්‍රශ්නය ඇහුවාම එතුමා මට පැය දෙක හමාරක්, තුනක් ඔය කථාව කිව්වා. මේ හේතු කොට ගෙන පෝර, අතුරුගිරිය, හෝකන්දර කියන සියලුම පළාත්වල වැසි වතුර ඇවිල්ලා බොරැල්ලේ ආයුර්වේද ඉස්පිරිතාලය ළඟ නතර වෙනවා. මේ වතුර බහින්නේ නැහැ. මේ වතුර නිතිපතා මෙහෙම එන නිසා දැන් කොළඹ නගරය දියබත්වෙලා. මේකට අතිරේකව ලබුගමින්, කලටුවාවෙන් සහ අඹතලෙන් දිනපතා වතුර ගැලුම් කෝටි අටක් කොළඹට පොම්ප කරනවා. මේ කෝටි අටෙන් කෝටි දෙකක් කරාමවලින් පිට වෙනවාය කියලා ජල සම්පාදන මණ්ඩලය කියනවා. ඒවා එහෙමම ගලා ගෙන යනවා. මේ පොළොවේ වළක් කැපුවොත් අඩි එකහමාරක් යන කොට භූගත ජල මට්ටම උඩට ඇවිල්ලා. ඒ නිසා කොළඹ නගරයේ තිබෙනවා, මහා අර්බුදයක්. එන වතුර බැහැලා යන්න ක්‍රමයක් නැහැ. දැනට තිබෙනවා, ක්‍රම තුනක්. එකක් දෙහිවල පාලම. අනික, වැල්ලවත්තේ පාලම. අනික, පරණ පාර්ලිමේන්තු ගොඩනැඟිල්ල ගාව තිබෙන බේසම කියන එක. තව එකක් තිබෙනවා Ellie House culvert කියලා කොටහේනේ. ඔය හතරෙන් විතරයි-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මෝදර - Mutwal .

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
ඔව්. Mutwalවල. ඔය හතරෙන් විතරයි වතුර බහින්න තිබෙන්නේ. නමුත් අවාසනාවකට ඒ හතරෙන් මුහුදු වැලි ඇවිල්ලා ඒ ඇළවල්වල කටවල් වැහිලා; දෙහිවල ඇළේ, වැල්ලවත්ත ඇළේ කට වැහිලා. සැමදාම ගංවතුරකින් පස්සේ ඒක විවෘත නොකළොත් වතුර ආපසු එනවා. ඒ නිසා තමයි මේ කෝට්ටේ නගරයේ තිබෙන දියවන්නා ඔයේ කවදාවත් වතුර බහින්නේ නැත්තේ. මේකේ වතුර බහින්න එක ක්‍රමයක් තිබුණා. කලපළුවාව හරහා වැල්ලම්පිටියෙන් ගඟට යන්න ඇළක් කැපුවා. අවාසනාවකට ගඟේ මට්ටම දැන් ඉහළයි, මේ ඇළට වඩා. ඒ නිසා කැලණි ගඟේ අතිරේක වතුරත් ඇවිල්ලා කලපළුවාවේ රැඳෙනවා, අතිවිශාල වශයෙන්. ඒකයි ඔය දැන් වළවල් කපා ගෙන යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එබැවින් මේ කාරණය විශාල වශයෙන් ලංකාවේ ප්‍රධාන ප්‍රශ්නයක් හැටියට සාකච්ඡා කළ යුතු දෙයක්. මේක සාකච්ඡා කරලා මේ කටයුත්ත නිම කළ යුතුයි කියලා මම යෝජනා කරනවා. මොකද, කොළඹ නගරය සොබා දහම විසින් හදාපු නගරයක් නොවෙයි, මඩ වගුරක්. මේ මඩ වගුරේ යන්තම් හරි නගරයක් හදන්න ගංවතුරෙන් බේරුවේ ඔරුගොඩවත්ත ගොතටුව බැම්මයි.

ඊට පස්සේ ඉංග්‍රීසි ආණ්ඩුකාරයෙක් ආවා. එයා තමා මැකලම් ආණ්ඩුකාරයා. එයා ඇවිල්ලා මඩ වළක් ගොඩ කරලා McCallum Road කියලා එකක් හැදුවා. තව ඉංග්‍රීසි ආණ්ඩුකාරයෙක් ආවා, ග්‍රෙගරි කියලා. ග්‍රෙගරි ආණ්ඩුකාරයා තව මඩ වළක් ගොඩ කරලා Gregory's Road කියලා එකක් හැදුවා. තව ආණ්ඩුකාරයෙක් ආවා, එයා පස් දාලා පුරවලා Manning Town කියලා එකක් හැදුවා. ඊට පස්සේ තව එක්කෙනෙක් ආවා, එයා Havelock Town කියලා එකක් හැදුවා. ඔච්චරයි මේ මඩ වගුරෙන් යන්තම් පාදලා ගත්තේ.

දැන් අපට සිද්ධ වෙලා තිබෙනවා, වතුර බහින එකයි මේ අසූචි හා මළ ප්‍රවාහය පිට කරන එකයි හදන්න. මම ශිෂ්‍යයෙක් හැටියට සිටි කාලෙදී, Deans Road එකේ Bake House එක තියෙන තැන තිබුණු ලොකු manhole එක ඇරලා repair කරන වෙලාවේ මම ඒ කංකානමත් එක්ක යාලු වෙලා කිව්වා, "මට ඒක ඇතුළට බහින්න ඕනෑ" කියලා. ඔහු කිව්වා, "shirt එක ගලවලා බහින්න නැත්නම් එනකොට කළුපාට වෙනවා" කියලා. මම බැස්සා. බැහැලා ටිකක් දුර ගියා. දැවැන්ත පයිප්ප දෙකක් යනවා. එක පයිප්පයක බොන වතුර එනවා. අනෙක් එකේ මළ මූත්‍ර යනවා, අනෙක් පැත්තට. මේ දෙකම එකට ගැව්ලා තිබුණේ. ඒ නිසා බෝඩ් ලෑල්ලක් ගහලා තිබෙනවා, "ටොන් දෙකකට වඩා බර වාහන ඒ පාරේ යෑම තහනම්"ය කියලා. නමුත් කවුරුවත් ගණන් ගන්නේ නැහැ, ඒක. ලොකු වාහන යනවා. ඒ නිසා මම Water Department එකේ කංකානම් කෙනෙක්ගෙන් ඇහැව්වා,

ලොකු වාහන ගියාට ඒවාට හානියක් වෙලා නැද්ද කියලා. "මහත්තයෝ, ඒවා කථා කරන්න එපා. එහෙම වෙලා තිබුණොත් අපි සිමෙන්ති දාලා වහනවා." කිව්වා.

අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කොළඹ වැසියෙක්. මා එතුමාට කියනවා, කොයි පයිප්පයේ කොයි වතුර යනවාද කොයි ඒවා එහාට යනවාද මෙහාට යනවාද කියලා එතුමාටත් බලන්නය කියලා. ඒක බැහැලා බැලිය යුතු දෙයක්. මේක අවුරුදු 100ක් පරණ ජරාව ඉවත් කරන එකක්. මේවා ඔක්කොම ගිහිල්ලා මට්ටක්කුලියට වැටෙන්නේ. මම එතැනටත් ගිහිල්ලා බැලුවා. එතැනදි ඒ ඔක්කොම අරගෙන මිරිකන යන්ත්‍රයක් තිබෙනවා. වතුර ටික කැලණි ගඟට දානවා, කහ පාටයි. ඉතුරු ටික පොහොර හැටියට ගන්නවා. බවර්ගේ පොහොර කියලා අරගෙන යනවා. ඒක තමයි අද වෙන්නේ. මේක සෞඛ්‍යයට හානිදායකයි. මේක හරි නරක වැඩක්. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ මේ යෝජනාව අනුව කොළඹ නගරය මුල ඉඳලා අග දක්වා අලුත් නගරයක් හැටියට හදනවා නම් ලංකාවේ නගර නිර්මාණයේ අලුත් පරිච්ඡේදයක් ඇති කරමින් එය කළ යුතුයි කියලා මම කියනවා. මේක මීට වඩා වාද කිරීමට අවස්ථාවක් ගත යුතු යෝජනාවක්. තමුන්නාන්සේ හරි නිර්භීත ක්‍රියාවක් අද කළේ. මම ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාට මගේ ගෞරවය පිරිනමනවා, මේ යෝජනාව මේ විධියට සංක්ෂිප්ත ලෙස හරි ඉදිරිපත් කළාට. වග කිව යුතු අයගේ අවධානයට මීට යොමු වේවා කියා ප්‍රාර්ථනා කරමින් මෙතුමාගේ යෝජනාව ස්ථිර කරමින් මගේ කථාව අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. දැන් පිළිතුරු කථාව. ගරු ඉන්දික බණ්ඩාරනායක නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා.5.52 ]

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලංග සුමතිපාල මැතිතුමා ඉතාමත් වැදගත් කාලෝචිත යෝජනාවක් අද ඉදිරිපත් කළා. එතුමා කොළඹ නගරයේ ජීවත් වන පුද්ගලයකු වශයෙන් ඒ අත් දැකීම් එක්ක ඉතාමත්ම වැදගත් අදහස් ගණනාවක් මේ සභාවට ඉදිරිපත් කළා.

ඒ නිසා එතුමාට අපි විශේෂයෙන් ස්තුතිවන්ත වනවා. ඒ වාගේම අපේ ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමාත් කොළඹ නගරයේ ජීවත් වන පුද්ගලයකු වශයෙන් මේ යෝජනාව ස්ථිර කරමින්, එය ඉතාමත් කඩිනමින් සැලකිල්ලට ගෙන, සාකච්ඡා කොට ක්‍රියාත්මක කළ යුතු බවට ඉතාමත්ම වටිනා අදහස් ප්‍රකාශ කළා. ඒ පිළිබඳව විශේෂයෙන් එතුමාටත් අපි ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ නගරයේ රැස් වන වැසි ජලය ප්‍රධාන වශයෙන් මාර්ග දෙපස කානු මඟින් ගලා ගොස් පහත් බිම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව - SLRDC - සතු ඇළ මාර්ග ඔස්සේ, නාගලගම් වීදිය අසලින් කැලණි ගඟටද, වැල්ලවත්ත බේරේ වැව හරහා ද, කෝට්ටේ දියවන්නා ඔය හරහා ද බැස යනවා.

කොළඹ නාගරිකය තුළ සිටින පදිංචිකරුවන් ලක්ෂ හතෙන් සියයට පණහක් පමණ වූ අඩු පහසුකම් සහිත පදිංචිකරුවන් සිටින්නේ ඇළවල් ආශ්‍රිතවයි. එහෙයින් ජලය බැස යාම ක්‍රමවත් කිරීම සඳහා ඒකාබද්ධ සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාව කොළඹ මහනගර සභාව විසින් මේ වන කොට හඳුනා ගෙන තිබෙනවා.

මේ වන විට මහකොළඹ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතිය රුපියල් බිලියන 42ක ලෝක බැංකු ආධාර යටතේ ආරම්භ කර තිබෙනවා. එය ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබනවා. එහි මූලික සැලසුම් පිළියෙල කර අවසන් කර ඇති අතර, ඊ ළඟ අදියර සඳහා පුවත් පත් දැන්වීම් පළ කිරීමට කටයුතු යොදා තිබෙනවා. මෙම ව්‍යාපෘතිය මඟින් වැසි ජලය බැස යාම ක්‍රමවත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් කටයුතු කරනු ලබනවා. මීට අමතරව පසු ගිය වැසි කාලයන්හිදී කොළඹ නගරය තුළ ජලය බැස යන සියලුම ජල මාර්ගයන්හි ඒකාබද්ධ වැඩිදියුණු කිරීමක් සිදු කර තිබෙනවා. එහිදී ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති නාගරික සංවර්ධන අධිකාරිය, නාවික හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය, පහත් බිම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යන ආයතනවල සහාය සෘජුවම ලබා දී තිබෙනවා.

තවද කොළඹ මහනගර සභාවේ අය වැය ප්‍රතිපාදන මඟින් මෙම වැඩසටහන් සඳහා රුපියල් මිලියන 60ක් මේ වසර සඳහා වෙන් කර තිබෙනවා. මෙම වැඩසටහන් තුළින් වැසි ජලය බැස යාමට ප්‍රධාන වශයෙන් අවහිර වන අනවසර ඉදි කිරීම් ප්‍රමුඛතා පදනමක් මත ඉවත් කරන්න කටයුතු කර තිබෙනවා.

ඊට අමතරව කසළ ඉවත් කිරීම ක්‍රමවත් කිරීම මඟින් කානුවල ජලය ගලා යාමට සිදු වන බාධාවන් අවම කර තිබෙනවා. ඒ සඳහා පොලීසියේ පරිසර අංශයේ සහාය නිරතුරුව ලබා ගෙන තිබෙනවා. තවද ඉහත ව්‍යාපෘතිය මඟින් ජලය බැස යාම සඳහා ඉතා වැදගත් ස්ථාන 47ක් හඳුනා ගෙන, එයින් ස්ථාන 15ක් ප්‍රමුඛතා පදනම මත වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් මේ වන කොට සකස් කර තිබෙනවා.

ඒ වාගේම පසු ගිය කාලයේ ගත් ඒ ක්‍රියාමාර්ග සමඟ ගංවතුර සහ අධික වර්ෂාව හේතුවෙන් පීඩාවට පත් නගරවාසීන් සඳහා පිසූ ආහාර සහ වියළි ආහාර බෙදා දීම අධික වශයෙන් පැවතුණු නමුත් මේ වන විට එවැනි වැඩ පිළිවෙළවල් සම්පූර්ණයෙන්ම නැවැත්වීමට හැකියාව ලැබී තිබෙනවා. එසේ වන්නේ මෙම වැඩසටහන්වල කිසියම් හෝ ප්‍රගතියක් දක්නට තිබෙන නිසායි. මේ අනුව මම හිතන්නේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ ඉතාමත් වැදගත් යෝජනාවකුයි.

අපි කවුරුත් දන්නවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අද මේ සම්පූර්ණ බලතල තිබෙන්නේ පළාත් සභාවටයිකියලා. විශේෂයෙන් පළාත් සභා අතර සම්බන්ධීකරණය කරන්නේ පළාත් පාලන අමාත්‍යාංශයයි. ඒ නිසා විශේෂයෙන්ම මේ ඉදිරිපත් කළ යෝජනා, අදහස් අපි ඒ පළාත් සභාවලට, ඒ නගර සභාවලට යොමු කරලා, ඒ කටයුතු කඩිනම් කරන්න අවශ්‍ය කටයුතු කරනවා. ඉතාමත්ම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාටත්, ඒ වාගේම එම යෝජනාව ස්ථිර කිරීම පිළිබඳව අපේ ගරු සූරියප්පෙරුම මන්ත්‍රීතුමාටත් නැවතත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Thilanga Sumathipala has five minutes to reply.

[අ.භා. 5.56 ]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මේ යෝජනාව ස්ථිර කරමින් අදහස් දැක් වූ ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමාටත්, විෂය භාර අමාත්‍යතුමා වෙනුවෙන් අදහස් දැක් වූ ගරු ඉන්දික බණ්ඩාරනායක නියෝජ්‍ය ඇමතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. එම අදහස් ඉදිරිපත් කිරීම ගැනත් විශේෂයෙන් මා සන්තෝෂ වනවා.

මෙහිදී මල ප්‍රවාහනය ගැන ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා කිව්වා. එයත් අතිශය වැදගත්. මේ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගරයේ අවුරුදු සියයකට වඩා පරණ ක්‍රමයක් තිබුණේ. පොළොව යටින් මල ප්‍රවාහනයට තිබුණේ මැටිවලින් හදන ලද නැත්නම් clayවලින් හදන ලද ක්‍රමයක්. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් දැන් ඉතාම නවීන තාක්ෂණය යොදා එම පරණ නළවලටම ඇතුළට බැලූනයක් ආකාරයෙන් යම් කිසි අමු ද්‍රව්‍යයක් යවා එම නළ සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කරලා තිබෙනවා.

මේක අපි අත් දැකීමෙන් දැක්කා. අපි මේ පරීක්ෂණයට ගියා. අපට ඒවා දකින්න අවස්ථාවක් ලැබුණා. මුළු කොළඹ නගරයේ ලක්ෂ හතහමාරකට වැඩි ජනගහනයක් ජීවත් වන නිවාස තිබෙනවා. දිනකට ලක්ෂ 30ක පමණ පිරිසක් කොළඹ නගරයට ඇවිල්ලා යනවා. මේ මල ප්‍රවාහන පද්ධතිය - sewerage system එක - අවුරුදු 100කට පස්සේයි පළමුවැනි වතාවට ප්‍රතිසංවිධානය වන්නේ. මේකේ පළමුවැනි අදියර හැටියට දකුණු කොළඹ ප්‍රදේශය වැල්ලවත්ත පොම්පාගාරය දක්වා ප්‍රතිසංවිධානය කෙරෙනවා. උතුරු කොළඹ ප්‍රදේශය මෝදර දක්වා ප්‍රතිසංවිධානය කෙරෙනවා. මේ තුළින් මුළු කොළඹ නගරය සඳහා තිබෙන මල ප්‍රවාහන පද්ධතිය දෙකට බෙදලා සම්බන්ධීකරණය කරලා තිබෙනවා. එය ඉතාම වැදගත්. නමුත් මෙහි අන්තිම අවස්ථාව, ඒ කියන්නේ last mile එක ගෙවල්වලට සම්බන්ධීකරණය කිරීමේ ක්‍රමය තවම ඉවර කරලා නැහැ. ප්‍රධාන නළ මාර්ගය - backbone එක - අපි හදලා ඉවරයි. මේ රජය පසු ගිය වසර දෙක ඇතුළත තමයි මෙය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඒක ඉතාම හොඳ දෙයක්. ඒ වාගේම මීට කලින් මෙම පද්ධතිය ගැන විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් තිබුණේත් නැහැ. දැන් එයට මුදල් ආධාර ලැබී තිබෙන නිසා ඒ කටයුතු ශක්තිමත් වෙලා තිබෙනවා.

මේ කාරණය කිව යුතුමයි. නීත්‍යානුකූල අයිතියක් නැතුව ගෙවල්වල අපද්‍රව්‍ය, ඒ වාගේම වැසිකිළි ද්‍රව්‍ය ඇළ දොළවලට බැහැර කරනවා. ඒවා වැරැදියි. ඒක වෙන්නෙත් අවිධිමත් නිවාස පද්ධතියක් තිබෙන විටයි; අනවසර ඉදිකිරීම් තිබෙන විටයි. අවසර දෙන ඉදි කිරීමකදී හැම තිස්සේම මල ප්‍රවාහනය වෙනමත්, වතුර බැස යන ක්‍රමය වෙනමත්, ගෙදරට ලබා ගන්නා බොන වතුර වෙනමත් වශයෙන් හඳුනා ගෙන තිබෙනවා. ඒ නිසාම වැසි ජලය බැහැලා යන ක්‍රමය ගැන හිතන එකේ වැදගත්කමක් තිබෙනවා. එහෙම විධිමත් ක්‍රමයක් තිබුණොත්, අවිධිමත් විධියට මල ප්‍රවාහන පද්ධතිය සම්බන්ධ කරන්නත් බැරි වනවා.

මෙම යෝජනාව ස්ථිර කරමින් අදහස් දැක්වූ ගරු සූරියප්පෙරුම මැතිතුමාට මා ස්තුතිවන්ත වනවා.

ඒ වාගේම ඉන්දික බණ්ඩාරනායක නියෝජ්‍ය අමාත්‍යතුමා කියපු දේ ඇත්තයි. මේ වැඩසටහන්වල ප්‍රගතියක් තිබෙනවා. මේ වතාවේ වැස්සටපාර්ලිමේන්තුව යට වුණේ නැහැ. පාර්ලිමේන්තුවට එන කොට අපට පෙනෙනවා, විශාල සංවර්ධනයක් සිදු වන බව. පොළොව හාරනවා, කැණීම් කරනවා අපට පෙනෙනවා. ඒවා හොඳයි. අඩි 20ක් හාරන්නත් පුළුවන්, අඩි 80ක් හාරන්නත් පුළුවන්. නමුත් පොළොව හාරන ප්‍රමාණයට සාපේක්ෂිතව වතුර රඳා පවතින්නේ නැහැ. මේ සඳහා විශාල අධ්‍යයනයක් අවශ්‍යයි; තාක්ෂණය අවශ්‍යයි. අපට ඒ තාක්ෂණය සහ අධ්‍යයනය තිබෙනවා. ඒ පිළිබඳව අවබෝධය තිබෙන ඉංජිනේරු මහත්වරු අපට ඉන්නවා.

විශේෂයෙන්ම සංචාරකයන් හැටියට විදේශිකයන් ලංකාවට එයි කියා විශාල බලාපොරොත්තුවක් තිබෙනවා. ඒ තුළින් සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනයක් ඇති වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. වැසි ජලයෙන් නගර යට වනවා නම්, වැසි ජලයෙන් යට වන කානු පද්ධතියක් සහිත පාරවල් තිබෙනවා නම් එවැනි රටකට යන්න සංචාරකයෝ කැමති වන්නේ නැහැ.

අපි බලාපොරොත්තු නැති කාලයක අපේ රටේ වර්ෂාපතනය වැඩි වෙලා තිබෙනවා. වැසි ජලය ගලා ගෙන යාමෙන් පාරවල් යට වන එක ගැන අපට මීට වඩා අලුතෙන් අධ්‍යයනය කරන්න සිද්ධ වනවා. මේ අවස්ථාවේදී ඒ සඳහා අවශ්‍ය නායකත්වය දීමට නාගරික සංවර්ධන අධිකාරිය - UDA එක - ඇතුළු සියලු දෙනා දරන උත්සාහය අපි ඇගැයීමට ලක් කරනවා. එය විධිමත්ව කළ යුතුයි කියන එකයි මගේ යෝජනාව වන්නේ. එහෙම නොවන්නේ නම් ඉස්සෙල්ලාම දුක් විඳින්නේ බොහොම අඩු පහසුකම් තිබෙන, නැති බැරි, දුප්පත් දුගී ජනතාවයි. ඉස්සෙල්ලාම පොඩි ගංවතුරකටත් යට වන්නේ පාලමක් අයිනේ, වැටක් අයිනේ, එහෙම නැත්නම් ගඟක් අයිනේ, ඇළක් අයිනේ බොහොම අමාරුවෙන් අනවසරයෙන් පොඩි ගෙයක් හදා ගෙන ඉන්න අයයි. ඒ අය වැස්සකට නගරයට දුව ගෙන ඇවිල්ලා, කොහේ හෝ තාවකාලික hut එකක් ගහ ගෙන ඉඳලා වතුර බැස්සාට පස්සේ ආපසු යනවා. මේ ගෙවල්වල පාඩම් කරන දරුවෝ ඉන්නවා. ඒ අයට පාඩම් කර ගන්න බැහැ. ඒ අයට විදුලිය නැති නිසා පහනක් පත්තු කර ගන්න සිද්ධ වනවා. ඒකත් කර ගෙන යන්න බැරි වනවා. අභිගුණ්ඨික ජීවිත ගත කරන අය මේ අප කථා කරන කොළඹ නගරයේත් ඉන්නවා.

අපි බලාපොරොත්තු වන සංවර්ධන දියුණුවේදී, පහත් බිම් ප්‍රමාණය ගැන අධ්‍යයනය කරලා විධිමත් වැඩසටහනකට යෑමෙන් අපට විශාල වාසියක් සිද්ධ වනවා. ඒ සඳහා වැය වන මුදල වාගේ දහ ගුණයක විතර වාසියක් අපට ලැබෙනවා. සංචාරක ව්‍යාපාරය පැත්තෙන් බැලුවත්, රටේ සෞඛ්‍ය පැත්තෙන් බැලුවත්, ප්‍රවාහන සේවාව ගැන බැලුවත්, රටේ ජනතාවගේ ශුභ සිද්ධිය ගැන බැලුවත් අපට වාසියක් වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නු ඔබතුමාටත්, මේ වෙනුවෙන් මට සම්පූර්ණ සහයෝගය දුන්නු අයටත්, සභානායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා ඇතුළු රජයේ සියලු මැති ඇමතිවරුන්ටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, " පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## හොරණ ශ්‍රීපාලි මණ්ඩපය ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලයට අනුයුක්ත කිරීම
## ஹொரணை ஶ்ரீ பாலி வளாகத்தை அரங்காடற் பல்கலைக்கழகத்துடன் இணைத்தல்
## AFFILIATION OF HORANA SRIPALEE CAMPUS WITH UNIVERSITY OF PERFORMING ARTS

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කොළඹ විශ්වවිද්‍යාලයට අයත් හොරණ ශ්‍රීපාලි මණ්ඩපය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ඉවත්කොට ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලයට අනුයුක්ත කිරීමට ආණ්ඩුව කටයුතු කරමින් සිටින බවට ජනමාධ්‍යවල වාර්තා පළ විය. ශ්‍රීපාලිය යටතේ ඊටම අනන්‍ය වූ ශ්‍රී ලංකාවේ ප්‍රසාංගික කලා කර්මාන්තයේ සංවර්ධනයට හා ජනමාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ වන පරිදි පවතින පාඨමාලාවක් ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලයට අනුයුත්ත කිරීමට තීරණය කර ඇත්තේ ඒ සඳහා වූ පුළුල් සංවාදයකින් නොවේය. ශිෂ්‍යයින් හා ආචාර්ය මණ්ඩලයේවත් එකඟතාවක් මේ සඳහා නොමැත. සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ හෝ හොරණ ශ්‍රීපාලි මණ්ඩපයේ හෝ කිසිවකුගේ එකඟතාවක් නොමැතිව සිදු කිරීමට යන මෙම ඒකාබද්ධ කිරීම පුද්ගල ඕනෑකම මත හෝ දේශපාලන අවශ්‍යතාවයක ප්‍රතිඵලයක් බව පෙනී යයි.

එම නිසා මෙම අත්තනෝමතික ඇඳා ගැනීමේ තීරණය ඉවත් කර ශ්‍රීපාලි මණ්ඩපය කොළඹ විශ්වවිද්‍යාල මට්ටමට දියුණු කිරීමට කටයුතු කරන ලෙසත් යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාලීන මාතෘකාව මේ ගරු සභාවේ අවධානයට යොමු කරන්නට තීරණය කළේ විශේෂයෙන්ම මේ වකවානුවේ විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ -උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ- අධ්‍යාපනය දියුණු කිරීම පිළිබඳව, අධ්‍යාපන මට්ටම දියුණු කිරීම පිළිබඳව විවිධාකාර සංවාදයන් තිබෙන නිසායි. ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාත් එක්ක මේ මාතෘකාව වඩා ශාස්ත්‍රීය මට්ටමින් ඵලදායී සාකච්ඡාවක් බවට පත් කර ගන්නට පුළුවන් වේය කියා මා විශ්වාස කරනවා. එසේ නැතිව අප අතර තිබෙන දේශපාලන සංවාදයට යටත් කරන්නේ නැතිව -ජනතා විමුක්ති පෙරමුණ මේ විශ්වවිද්‍යාල අවුල් කරනවාය කියන එස්.බී. දිසානායක ඇමතිතුමාගේ කටේ තිබෙන සාමාන්‍ය වාක්‍ය රටාවට මේක ඇඳා ගන්නේ නැතිව- ඇමතිතුමා මේක තේරුම් ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා.

මොකද, සෞන්දර්ය විශ්වවිද්‍යාලය, ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලය අපේ රටේ තිබෙන්නේ සෞන්දර්ය ක්ෂේත්‍රයේ විෂය පාඨමාලාවන් සඳහායි. පහත රට, උඩරට සබරගමු ආකාරයේ නර්තන, ඒ වාගේම ගීත සහ මූර්ති කලා අංශය ඒවායේ තිබෙනවා. බැලූ බැල්මට හොරණ ශ්‍රීපාලි මණ්ඩපය, ප්‍රසාංගික කලා ක්ෂේත්‍රයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනයක හැඩය තිබෙනවා තමයි. නමුත් ඇත්තටම මේ විෂය නිර්දේශ ගත්තොත් එහෙම - විෂය පථය ගත්තොත් එහෙම- අද හොරණ ශ්‍රීපාලි මණ්ඩපයේ විෂය පථය තිබෙන්නේ පැහැදිලි ලෙසම ජන සංනිවේදන ක්ෂේත්‍රයේත් ඒ වාගේම ප්‍රසාංගික කලා කටයුතුවල වෙනත් ක්ෂේත්‍රයක් නියෝජන කරන්නයි. ඒ විෂය ධාරාවන් සම්පූර්ණයෙන්ම වෙනස්. ඒ වාගේම තමයි හොරණ ශ්‍රීපාලි මණ්ඩපය ලබා දෙන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධියයි. එතකොට සෞන්දර්ය විශ්වවිද්‍යාලය, ප්‍රසාංගිකකලා විශ්වවිද්‍යාලය ලබා දෙන්නේ ලලිත කලාවේදී උපාධියයි. උපාධි මට්ටමින් ගත්තොත් මේක තල දෙකක තිබෙන්නේ. මෙතැන තිබෙන ප්‍රධානම ගැටලුව මෙයයි. මේ ඒකාබද්ධ කිරීම පිළිබඳ මේ යෝජනාව ගරු පාර්ලිමේන්තුවට ගෙන එන්නට මට බල කළේ අපේ ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා පසු ගිය දවස් වල මාධ්‍යයට කියා තිබුණු දෙයක්. මා 2011 මැයි 09වන දා "ලක්බිම" පත්තරයෙන් ඒ කොටස උපුටා දක්වනවා:

"කවුරු විරුද්ධ වුණත් ඒකාබද්ධ කරනවා."

එතකොටම හොරණ ශ්‍රීපාලි මණ්ඩපයේ මණ්ඩපාධිපති ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතා කියනවා:

"ප්‍රායෝගික නැති නිසා දැඩි ලෙස විරෝධය පානවා"

මණ්ඩපාධිපති කියා කියන්නේ, ඕනෑම අධ්‍යාපන ආයතනයක පීඨයක් ගත්තොත් ඒ පීඨයේ ප්‍රධානියා. අපේ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා කියනවා, "කවුරු විරුද්ධ වුණත් මේක කරනවා" කියා. මණ්ඩපාධිපතිතුමා කියනවා, "මේක ප්‍රායෝගික නැති නිසා විරුද්ධ වනවා "කියා. මා 2011 මැයි 04වන දා තවත් මාධ්‍ය වාර්තාවක් උපුටා දක්වනවා. "ශ්‍රීපාලි මණ්ඩපාධිපති කියයි. ශ්‍රීපාලි සෞන්දර්ය සරසවිය ඈඳීමෙන් දෙපැත්තටම වැඩක් සිදු වන්නේ නැහැ. හොරණ ශ්‍රීපාලි මණ්ඩපය සෞන්දර්ය විශ්වවිද්‍යාලයට පැවරීමේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තීරණයට ශ්‍රීපාලි මණ්ඩපාධිපති ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතා දැඩි ලෙස විරෝධය පායි"කියා. තවදුරටත් එහි මෙහෙම කියනවා. "සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ සහ හොරණ මණ්ඩපයේ උගන්වන විෂයයන් එකිනෙකට වෙනස් ඒවා යයි කී ඒ මහතා එම විෂයයන් පිළිබඳව ඇති කර ගෙන තිබෙන වැරදි අදහසක් මත උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මෙවැනි තීන්දුවක් ගෙන ඇතැයි විශ්වාස කරන බව ද පැවසීය". එතකොට ප්‍රශ්නය තිබෙන්නේමෙයයි. 1998 වර්ෂයේ ආරම්භ කළ හොරණ ශ්‍රීපාලි මණ්ඩපය පරිපාලනය වන්නේ කොළඹ විශ්වවිද්‍යාලය යටතේයි. මේකේ ජනමාධ්‍ය අධ්‍යයන පීඨය සහ ප්‍රසාංගික කලා අධ්‍යයන පීඨය නමින් පීඨ දෙකක් පවත්වා ගෙන යනවා. ඒ පීඨවල නවීන තාක්ෂණය, සිනමා කලාවන්, ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන දේවල්, මේ විද්‍යුත් තාක්ෂණයත් එක්ක සම්බන්ධ වෙච්ච වෙනම විෂය මාලාවක් පවතින්නේ. එතකොට ඒකේ මණ්ඩපාධිපතිතුමාම කියනවා, "මේක ප්‍රායෝගික නැහැ, උඩරට පහත රට, සබරගමුව ආදී වශයෙන් තිබෙන සෞන්දර්ය විෂය ධාරාවත් එක්ක ඈඳීම" කියලා. මේක කාගේ අවශ්‍යතාවකට සිද්ධ වෙනවා ද? අපට තිබෙන්නේ ඔය ප්‍රශ්නයයි. රටේ අධ්‍යාපනය පුළුල් වන්නට ඕනෑ බව අප දන්නවා. අධ්‍යාපනය පුළුල් වන්නට ඕනෑ. අධ්‍යාපනය රටේ දියුණුවත්, ලෝකයේ දියුණුවත් එක්ක විද්‍යාවේ, තාක්ෂණයේ දියුණුවත් එක්ක සංවර්ධනය වන්නට ඕනෑ.

උපාධි පාඨමාලාවන් සංවර්ධනය වෙන්න ඕනෑ. ඒක ගැන ගැටලුවක් නැහැ. සාමාන්‍යයෙන් වෙන්නේ, විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයෝ විරුද්ධ වෙන එක නේ. මෙතැනදී ශිෂ්‍යයෝ පමණක් නොවෙයි, ඒ විෂය ධාරාවත් එක්ක ඉන්න ආචාර්යවරු, මණ්ඩපාධිපතිතුමන්ලා, පීඨාධිපතිවරු, ඒ සියලු දෙනාගේම විරෝධතාව තිබියදී, එහෙම නැත්නම් ගරු ඇමතිතුමනි, මගේ යෝජනාවේම තිබෙන විධියට පළල් සංවාදයක් නැතුව, පළල් සාකච්ඡාවක් නැතුව, අදහස් හුවමාරු කර ගැනීමක් නැතුව, අවශ්‍යතාව මොකක්ද කියලා තහවුරු කර ගැනීමක් නැතුව සිද්ධ කර ගන්නා වූ මේ ක්‍රියාවලියෙන් ආචාර්ය ටියුඩර් වීරසිංහ මහත්මයා කියන්නා වාගේ කාටද මේකෙන් යහපතක් සිද්ධ වෙන්නේ? කාටද මේකේ අවශ්‍යතාව තිබෙන්නේ? ඇයි මෙහෙම දෙයක් කරන්නේ? මේ කාරණාව තමයි මම මේ ගරු සභාව තුළ මතු කර ගන්න උත්සාහ කළේ. මොකද, ගරු ඇමතිතුමා අවස්ථා කිහිපයකදීම මේ පිළිබඳව අදහස් දක්වද්දී දෙගිඩියාවකින් තොරවම කියනවා, "සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් මේ තීරණය ගන්නවා, කවුරු විරුද්ධ වුණත් මේක කරනවා, අකැමැති කෙනෙක් ඉන්නවා නම් ඉල්ලා අස් වෙලා යන්න පුළුවන්" කියලා. ඒක ඔබතුමාගේ භාෂා රටාවෙන් කියැවෙන හැටිද දන්නේ නැහැ. නමුත් එහෙම කියනවා. නමුත්, ප්‍රශ්නය වෙන්නේ, අකැමැති කෙනෙක් ඉන්නවා නම්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අයින් වෙලා යන්න කියලා කිව්වාම පීඨවල සිටින ආචාර්යවරු අයින් වෙලා ගියාම, පීඨාධිපතිතුමන්ලා අයින් වෙලා ගියාම, ඒ අය නැතුව මේක කරන්නේ කොහොමද? මම කියන්නේ, විශ්වවිද්‍යාල පද්ධතියේ අද ප්‍රශ්න ගොඩක් ඇති වෙලා තිබෙනවා. වැටුප් ප්‍රශ්නය වුණත්, එහෙම නැත්නම් අනෙකුත් සියලුම ප්‍රශ්න වුණත්, අපේ තිබෙන ක්‍රමය වන වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක ගන්නවා වාගේ හදිසි තීරණවලින් විසඳන්න බැහැ. ඒක නිසා තමයි දැන් පැහැදිලි කර ගන්න ඕනෑකම තිබෙන්නේ. ඒක නිසා තමයි මම අත්තනෝමතික තීරණයක් කියන වචනය පාවිච්චි කළේ. මෙහෙම ඈඳා ගැනීමක් සිද්ධ වෙනවා නම්, මෙහෙම ඒකාබද්ධ වීමක් සිද්ධ වෙනවා නම් ඒක අත්තනෝමතිකයි. ඒක පළල් සාකච්ඡාවක්, සංවාදයක් ඇතුළේ සිද්ධ වෙන්නේ නැහැ.

හොරණ ශ්‍රී පාලි මණ්ඩපයේ තිබෙන විෂය ධාරාවන් මොනවාද, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ තිබෙන විෂය ධාරාවන් මොනවාද, මේවා ඒ ළමයින්ට බලපාන්නේ කොහොමද, දැනට ඉගෙන ගෙන තිබෙන ළමයින්ට මේක බලපාන්නේ කොහොමද, මේක විෂය සංවර්ධනයට බලපාන්නේ කොහොමද, මේ හැම ක්ෂේත්‍රයක් ගැනම පළල් අධ්‍යයනයක් කෙරෙන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, ඇත්තවශයෙන්ම මේ මාධ්‍ය වාර්තා සියල්ල අනුව මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි -ඔබතුමා අවසාන වශයෙන් දෙන තීරණය හැටියට මම එය සලකනවා- මේ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් කරලා තිබෙනවාද, මේ පිළිබඳව පළල් සංවාදයක් කරලා තිබෙනවාද, මේ පිළිබඳව එකඟතාව ඇති කර ගත්තේ මොන පදනමකින්ද, එහෙම එකඟතාවකට එන්න බලපෑ හේතු සාධක මොනවාද කියලා.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය හා ශ්‍රී පාලි මණ්ඩපය ඒකාබද්ධ කරනවාය කියාලා 2011.04.23 වැනි දින නැවත "ලක්බිම" පත්තරේටත් කියලා තිබෙනවා. මේක ඉඩම් මංකොල්ලයක්ද කියලාත් එක වෙලාවකට හිතෙනවා. මොකද, "හොරණ ශ්‍රී පාලි මණ්ඩපය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට ඒකාබද්ධ කිරීම" යන්නෙන් තමයි මේ පිළිබඳ යෝජනාව එන්නේ. හැබැයි, මේක අනෙක් පැත්තට කැරකෙන්නත් පුළුවන්. මොකක්ද, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය දැන් පිහිටා තිබෙන කොළඹ Horton Placeවලින් -නොමැඩ්ස් ක්‍රීඩාංගනය අවට තිබෙන එම ස්ථානයෙන්, ඒ කියන්නේ කෞතුකාගාරය ළඟ තිබෙන කොටසින්- ඉවත් කිරීම කියන පැත්ත. මොකද, වාණිජමය වටිනාකමක් හොයමින් යන ලෝකයක් නේ දැන් තිබෙන්නේ.

ඉඩම්වල වටිනාකමින් තමයි සියල්ල තීරණය කරලා තිබෙන්නේ. ඒ සෞන්දර්ය ආයතනය කොළඹින් ගලවලා හොරණට ගෙන යන්න මේකෙන් උත්සාහ කරනවාද කියලා කියන්නත් බැහැ. පෞද්ගලික හේතු සාධක ඇතිව තමයි මම එහෙම කියන්නේ. මට මතකයි 1998 දී හොරණ ශ්‍රී පාලි මණ්ඩපය පිහිටුවන්න ඉස්සෙල්ලා, අපි විශ්වවිද්‍යාලයේ ඉන්න කාලයේ, 1996 දී විතර, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය දැන් තිබෙන තැනින් ගලවලා ගෙන යන්න යෝජනාවක් ආවා. ගරු ඇමතිතුමනි, එහෙම ගෙන යන්න යෝජනා වුණේ හොරණට. එදා එහෙම ගෙන යන්න යෝජනා කරද්දී අපි ඒකට විරුද්ධ වුණා. මම පෞද්ගලිකවම කියනවා විරුද්ධ වෙන්න අදාළ හේතු මොනවාද කියලා. මොකද, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයක් අග නගරය ඇතුළේ තිබීමේ වටිනාකමක් තිබුණා. මොකද, ඒ ළමයින්ගේ හැකියාවන්, දක්ෂතාවන් පෙන්වන්න මේ පැත්තෙන් ජෝන් ද සිල්වා සමරු රඟහල තිබෙනවා; ගුවන් විදුලි සංස්ථාව තිබෙනවා; රූපවාහිනී සංස්ථාව තිබෙනවා. ඒ සියල්ල අතර තමයි විවෘත කරන්න ආසන්නව තිබෙන සංස්කෘතික මධ්‍යස්ථානය පවා හදන්න යෝජනා වුණේ. ඒ අර්ථයෙන් ගත්තාම මේක කොළඹ පිහිටුවන්න ඕනෑ බව ඇත්ත. අද ඉඩම්වල වටිනාකම මුදලින් මණින නිසා, වාණිජ මුදලින් මණින නිසා, මෙහෙම ඈඳීමේ ප්‍රයත්නයක් තිබෙනවාද කියන සාධාරණ සැකයක් මතු වනවා. මේක මෙතැනින් ඉවත් කරලා වෙන කොහේට හෝ ගෙන යන්න එහෙම හේතුවක් තිබෙනවාද කියන සැකය මතු වනවා. මා එහෙම කියන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි. මේ ඒකාබද්ධ කිරීමේ කටයුත්තේ තර්කානුකූල, සාධාරණ, යුක්ති සහගත හේතුවක් පෙනෙන්න නැති නිසා.

කැලණිය විශ්වවිද්‍යාලයේත් ලලිත කලාවේදී - Fine Arts- උපාධිය තිබෙනවා. ඒ ලලිත කලාවේදී උපාධියත් එක්ක බොහොම සමාන්තරව - parallel - යනවා, ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අංශයේ තිබෙන පාඨමාලාව. ඒ සියල්ල ඒකාබද්ධ කරලා ලංකාවේ සෞන්දර්ය විශ්වවිද්‍යාලයක් හදනවා නම් ඒක වෙනම කාරණාවක්. හොරණ ශ්‍රීපාලි මණ්ඩපය ඇතුළේ දැනට තිබෙනවා විෂය ධාරාවන්. ජනසන්නිවේදන විෂය මාලාව තිබෙනවා - Visual Arts. ඒ විෂය ධාරා එකට ඈඳන්න, පූට්ටු කරන්න ක්‍රමයක් නැහැ. මා මාධ්‍ය වාර්තාවල දැක්කා, සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ පීඨාධිපති කෝට්ටේගොඩ මැතිතුමා කියලා තිබෙනවා, සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ සංගීත ගුරුවරු හොරණ මණ්ඩපයට ගිහින් උගන්වනවා කියලා. ඒ නිසා මේ දෙක ඒකාබද්ධ කරන්න ඕනෑ කියනවා වාගේ සාධාරණ හේතුවක් ඉදිරිපත් කරලා තිබුණා. නමුත් ඒක වැරදියි. සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරු දෙදෙනෙක් ගිහින් එතැන උගන්වනවා නම්, ඒකෙන් මුළු සෞන්දර්ය විශ්වවිද්‍යාලයම හොරණ ශ්‍රීපාලි මණ්ඩපය හැටියට අර්ථකථනය කරන්න බැහැ.

ගරු ඇමතිතුමනි, උපාධි හැටියට ගත්තත් මේ ආයතන දෙකේ දෙන්නේ උපාධි දෙකක්. කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය විශේෂ උපාධියක් හැටියට වර්ගීකරණය කිරීම මේ එකට ඈඳීමෙන් කොහොමද සමාන කරන්නේ කියන ප්‍රශ්නය එනවා. මේවා ප්‍රායෝගික ගැටලු. මේවා ඔබතුමා දන්නවා. මේවා උපාධි අරගෙන එළියට ගියත් ඒ ක්ෂේත්‍රවල නිර්මාණය වන ගැටලු. මොරටුව විශ්වවිද්‍යාලයේ BSc උපාධියයි NDT උපාධියයි අතර ගැටලුව ක්ෂේත්‍රයට ගියාට පසුවත් තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය ඇතුළේත් ගුටි ගහගන්නවා. අමුතු ගැටලු නිර්මාණය කරන ප්‍රශ්න බවට මේවා ඇතිකර ගන්න ඕනෑ නැහැ. ඔබතුමා යෝජනා කරන කාරණාව ඉතාම සද්භාවයෙන්, සාධාරණ හේතු තර්ක ඇතුව කෙරෙන දෙයක් නම්, ආචාර්යවරුන්ගේ, විශ්වවිද්‍යාලයේ ඉන්න ළමයින්ගේ -මෙතැන ළමයි 600ක් විතර ඉන්නවා.- විරෝධතාවක් නැතුව ඔබතුමාගේත් එකඟතාවයෙන් කාගේත් එකඟතාවයෙන් කරන්න පුළුවන්. ඒක කරන්න මීට වඩා පළල් සාකච්ඡාවක් ඕනෑ. මීට වඩා විද්වත් සාකච්ඡාවක් ඕනෑ. මේ ක්ෂේත්‍රයේ ඉන්න සහ හිටපු ප්‍රවීණයන්ගේ අදහස් උදහස්වලින් එකතු වූ කථිකාවතක් හැදෙන්න ඕනෑ; සංවාදයක් හැදෙන්න ඕනෑ. එහෙම සාකච්ඡාවක සංවාදයක ප්‍රතිඵලයක් හැටියට නම් මේ දේ සිද්ධ වන්නේ, ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. එහෙම නැතුව, "හොරණ ශ්‍රීපාලි මණ්ඩපය අනිවාර්යයෙන් සෞන්දර්ය/කලා විශ්වවිද්‍යාලයට අනුයුක්ත කරනවා. ඒකට එකඟ නැති කවුරු හරි ඉන්නවා නම් ගෙදර යන්න පුළුවන්" කියලා එකපාරටම ඔබතුමා කියනකොට ඒක ලොකු ප්‍රශ්නයක්. ඒ නිසා තමයි මේ මාතෘකාව අද ඔබතුමාගේත්, මේ ගරු පාර්ලිමේන්තුවේත්, මේ ගරු පාර්ලිමේන්තුව හරහා රටේ ජනතාවගේත් අවධානයට ලක් කරන්න අපට සිද්ධ වන්නේ. ඔබතුමා හා අපි අතර මොන පරස්පරතා තිබුණත්, මොන වාද විවාද තිබුණත් ඔබතුමා ඒ මට්ටමේ දේශපාලන තීන්දුවක් ගනියි කියා මා හිතන්නේ නැහැ.

"ඔය සෞන්දර්ය කරලා රුපියලක්වත් හම්බ කරන්න පුළුවන්ද?" කියලා අහපු ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ යුගයේ මට්ටමින් ඔබතුමා මේ කාරණය ගැන නිගමනය කරයි, මේ කාරණය මනියි කියලා මම හිතන්නේ නැහැ. මම කොහොමවත් ඒක විශ්වාස කරන්නේ නැහැ. ඔබතුමා මේ පිළිබඳව ඊට වඩා පළල් විධියට දකියි කියලා මම හිතනවා. එහෙම දකිමින් ඉතා

සද්භාවයෙන් තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ. මේ මණ්ඩපය මෙහෙම ඒකාබද්ධ කිරීමට, මෙහෙම ඈඳීමට තිබෙන වුවමනාව, අවශ්‍යතාව තවත් අර්බුදයක් නිර්මාණය කරන්නේ නැති එකක් වෙන්න ඕනෑ; තවත් ගැටලුවක් නිර්මාණය කරන්නේ නැති එකක් වෙන්න ඕනෑ. එහෙම අවශ්‍යතාවක් තිබෙනවා නම් ඒ අවශ්‍යතාව සාධාරණීකරණය කරන පැහැදිලි කිරීමක් එක්ක ඒ කටයුත්ත සිද්ධ විය යුතුයි. මේ කටයුත්ත හොඳ දෙයක් නම් - පෞද්ගලික විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පතට වුණා වාගේ අකරතැබ්බයක් කර ගන්නේ නැතිව- ඒකට හැමෝම සහයෝගය පළ කරයි. ශ්‍රීපාලි මණ්ඩපයේ තිබෙන්නේ කොළඹ විශ්වවිද්‍යාලය යටතේ තිබෙන පාඨමාලා. ලංකාවේ ජන සන්නිවේදනය පිළිබඳව උපාධියක් තිබෙන්න ඕනෑ; Visual Arts පිළිබඳව උපාධියක් තිබෙන්න ඕනෑ. ඒ මට්ටමට ලංකාවේ ප්‍රවීණයෝ ඉන්නවා. අද උපාධි නැති අයත් මේ ක්ෂේත්‍රයේ ඒ ඉහළ මට්ටමට ඉන්නවා. හොරණ ශ්‍රීපාලි මණ්ඩපයේ විෂය මාලා පළල් ලෙස සංවර්ධනය වෙලා, විශ්වවිද්‍යාල මට්ටමට එනවා නම්, මණ්ඩපයක් වෙනුවට විශ්වවිද්‍යාලයක් එනවා නම් දෙගිඩියාවකින් තොරව අපි ඒකට සහාය පළ කරනවා. හැබැයි මේ ඈඳීම තුළ එහෙම දෙයක් නොවෙනවා කියා දකින නිසා, ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරමින්, මේ පිළිබඳ රජයේ ස්ථාවරය කුමක්ද කියා පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ යෝජනාව මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේදී ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා එම යෝජනාව ගැන ඉතාම විස්තරාත්මකව කරුණු දැක්වූවා. ඒ නිසා මම එක කරුණක් පමණක් මෙම ගරු සභාවේදී උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ යෝජනාවේ ප්‍රධාන කාරණයක් වුණේ මේ පිළිබඳව ප්‍රමාණවත් සංවාදයක් ඇති කරන්න කියන එකයි.

සෞන්දර්ය විශ්වවිද්‍යාලයට එහෙම නැත්නම් ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලයට ශ්‍රීපාලි මණ්ඩපය ඒකාබද්ධ කිරීම පිළිබඳව උසස් අධ්‍යාපන ඇමතිතුමා විසින් ප්‍රකාශ කරන කරුණු නිසා, පොදු සමාජයටත් විශේෂයෙන් මේ විශ්වවිද්‍යාලයේ සහ මේ මණ්ඩපය ඇතුළේ ඉන්න ශිෂ්‍යයන්ටත්, ආචාර්යවරුන්ටත් සැකයත් මතු වෙනවා ගරු ඇමතිතුමනි. ඒ තමයි, මේ තරම් හොඳ නම්, ඵලදායී නම් ඇයි මේ යෝජනාව මේ විධියට, අත්තනෝමතික විධියට ගෙන එන්නේ කියන එක. කෙසේ හෝ කරනවා කියන විධියට එන්නේ ඇයි කියන ඒ සැකය මතු වනවා. එවැනි සැකයක් නිර්මාණය වුණේ මේ විධියේ සංවාදයක් නැතිව, අත්තනෝමතික විධියට කරන එවැනි ප්‍රකාශ හරහා මේ අදහස ඉදිරිපත් වීම නිසායි. ඒ නිසා ඒ සැකය දුරු කිරීමේ වගකීම රජය පැත්තෙන්, ඔබතුමාගේ පැත්තෙන් තිබෙනවා.

පසු ගිය කාලයේ විශ්වවිද්‍යාල ඇතුළේ විවිධ අර්බුද, ගැටලු මතු වන කොට උසස් අධ්‍යාපන ඇමතිතුමා විසින් ඉදිරිපත් කළ ප්‍රධාන කාරණා තිබුණා. ඒ ප්‍රධාන කාරණා තමයි, විශ්වවිද්‍යාල කියන්නේ විශ්වවිද්‍යාල වෙන්න ඕනෑ; මේවා ඇතුළේ පුළුල් සංවාද ගොඩ නැඟෙන්න ඉඩකඩ තිබෙන්න ඕනෑ; ලෝකයටම විවෘත වෙච්ච මනසක් තිබෙන දරුවෝ මේකෙන් එළියට එන්න ඕනෑ; එක කණ්ඩායමක, ඒකාධිපති කණ්ඩායමක මත මේක ඇතුළේ තිබෙන්න බැහැ; පුළුල් සංවාදයක් හැදෙන්න ඕනෑ කියන එක. විශේෂයෙන් ඔබතුමා උසස් අධ්‍යාපන ඇමතිවරයා විධියට එවැනි කථාවක්, අදහසක් මතු කළා. නමුත් අද මේ කටයුත්ත ඇතුළේ ඊට වඩා පරස්පර දෙයක් තිබෙනවා. එක්කෝ අමාත්‍යාංශය, එක්කෝ ඔබතුමා, එක්කෝ තව කිහිප දෙනකු විසින් ගත්ත තීරණයක් පුළුල් සංවාදයකට ඉඩකඩක් විවෘත කරන්නේ නැතිව ඉස්සරහට දාලා තිබෙනවා.

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් කියන්නේ, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් කියන්නේ, මණ්ඩපාධිපතිවරු කියන්නේ, කථිකාචාර්යවරු කියන්නේ යම් ක්ෂේත්‍රයක් ගැන අවබෝධයක්, දැනුමක්, විශේෂයෙන් විෂය දැනුමක් තිබෙන, පුළුල් මනසක් තිබෙන අය; අත් දැකීම් තිබෙන අය. එවැනි පිරිසක් එක්ක මෙවැනි සංවාදයක් හදා ගන්න ඕනෑ. එවැනි අවශ්‍යතාවක් තිබෙනවා. එවැනි සංවාදයක් හදා ගන්න පුළුවන් බුද්ධිමය තලයක ඒ අය ඉන්නවා. ඒ නිසා එක පැත්තකින් ඔබතුමාම ඉදිරිපත් කරපු තර්කයක් ඔබතුමාගේ පැත්තෙන්ම බිඳපු එක ගැන අපි කනගාටු වනවා. අද පාර්ලිමේන්තුව ඇතුළේ මේ සංවාදය ගොඩ නැඟීමත් එක්ක, මේ ක්ෂේත්‍රයේ අද සිටින, ඒ වාගේම මේ ක්ෂේත්‍රයේ කලින් හිටපු ප්‍රවීණයන් එක්ක, ඒ ආචාර්ය මහාචාර්යවරු, මණ්ඩපාධිපතිවරු එක්ක, ශිෂ්‍යයන් එක්ක මේ පිළිබඳව පුළුල් සංවාදයක් ඇති කරලා, මේ ඒකාබද්ධ කිරීම කරන්නේ ඇයි කියන කාරණය සාකච්ඡාවට ගනියි කියලා විශ්වාස කරනවා. මේ පිළිබඳව ඔබතුමාගේ රජයේ ස්ථාවරය පැහැදිලි කරන්න කියන ඉල්ලීම කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය මේ පාර්ලිමේන්තුව තුළ මතු කරපු එක ගැන ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට මාගේ ස්තුතිය පුද කරන්න කැමැතියි.

මේ පිළිබඳව විශ්වවිද්‍යාලය ඇතුළේත්, මේ පිළිබඳව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය තුළත්, මේ පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළත් බොහොම කාලයක් තිස්සේ සාකච්ඡාවට භාජනය වනවා. ගරු හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ අවධානයට යොමු නොවුණු කරුණු කීපයකුත් මෙහි තිබෙනවා. පළමුව මම එතුමාට කියන්න කැමැතියි, මේ පිළිබඳව අපි අවසන් තීන්දුවක නැති බව. හැබැයි අද ගරු හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණුවලත්, ඒ වාගේම ස්ථිර කරමින් ඉදිරිපත් කළ කරුණු තුළත්, මණ්ඩපාධිපති ටියුඩර් මැතිතුමා කියන කරුණුවලත්, ශිෂ්‍ය නියෝජිතයෝ කීප දෙනකු ඇවිත් අපට කිව්ව කරුණුවලත් අඩංගු කාරණාවලට අනුව තවමත් අපට පෙනෙන්නේ, හොරණ ශ්‍රී පාලි මණ්ඩපය කොළඹ විශ්වවිද්‍යාලය තුළ රඳවා ගැනීමට තිබෙන වුවමනාව, තමුන් හා තමුන්ගේ තනතුරු පිළිබඳව තිබෙන පෞද්ගලික වුවමනාවක් හැටියටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුව මම ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි කවදාවත් මේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය හොරණට යන්නෙත් නැහැ; හොරණ ශ්‍රී පාලි මණ්ඩපය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට එකතු කළත්, ඒ හොරණ සෞන්දර්ය විශ්වවිද්‍යාලය මෙහාට එන්නෙත් නැහැ කියා. එක කාරණයක් මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. මේක අපේ ශ්‍රේෂ්ඨ කලාකරු විල්මට් පෙරේරා මැතිතුමාගේ දේපොළක්. එතුමා එතැන කලායතනයක් කළා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එය සංගීත, නැටුම් හා චිත්‍ර අධ්‍යාපන ආයතනයක් බවට පත් කරන්න ඕනෑ කියලා රබීන්ද්‍රනාත් තාගෝර් මැතිතුමා ගෙනැල්ලා තමයි එයට මුල් ගල තැබුවේ.

[ගරු එස්.බී. දිසානායක මහතා]

ඊ ළඟට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, භාරකාර මණ්ඩලයක් යටතේයි මෙය පාලනය වුණේ. පසු කාලීනව, -හැට හැත්තෑ ගණන්වල- මේ පිළිබඳව විශාල නඩුවක් තිබුණා. ඒ නඩුවේ තීන්දුව වුණේ ශ්‍රී පාලි මණ්ඩපය නර්තනය, සංගීතය හා චිත්‍ර කලා ආදී වූ සෞන්දර්යය විෂයයන්ගෙන් උසස් අධ්‍යාපනයට යොමු වෙච්ච ආයතනයක් බවට පත් කර ගන්න කියලායි. මේ පිළිබඳව අපේ හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ අවධානය යොමු වෙලා නැහැ.

දෙවනුව තව කාරණයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මණ්ඩපය පටන් ගත්තේ 1979 දී, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා විසින් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ කොටසක් හැටියට. හැබැයි කොළඹ විශ්වවිද්‍යාලයේ කොටසක් හැටියට නොවෙයි. වෙච්ච දේ තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ කොටසක් හැටියට පටන් ගත්ත හොරණ ශ්‍රී පාලියේ ළමයි ටික බලහත්කාරයෙන් ඇවිත්, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පදිංචි වීම. එතැන පහසුකම් නැහැයි කියලා බලහත්කාරයෙන් ඇවිල්ලා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පදිංචි වුණා. ඊට පස්සේ එය වැහුණා. පසුව කොළඹ විශ්වවිද්‍යාලයත් එක්ක සම්බන්ධ කරලා මේ මණ්ඩපය ආපහු සෞන්දර්ය පීඨයක් එහෙමත් නැත්නම් මණ්ඩපයක් විධියට පත් කර ගත්තා. මේකට ටියුඩර්ලා එහෙම ගිහිල්ලා එහෙන් මෙහෙන් අමුණා ගත්ත පාඨමාලා ටිකක් තිබෙනවා. ඔබතුමාට මම කියන්න කැමැතියි, ඔය කියන පාඨමාලා එකක්වත් සංවිධානාත්මකව හදපුවා නොවන බව. -මම කැමැති නැහැ, මේක දිගට කථා කරන්න. මොකද, ඒක හොඳ නැහැ.- ඒ වාගේම මේ පාඨමාලා කරන්න අවශ්‍ය සියලු සම්පත් තිබෙන විශ්වවිද්‍යාල තිබෙනවා. හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කීප වතාවක් කථා කළා, ජනමාධ්‍ය වේදය කියන එක ගැන. ඒකට ඉතාම ඉහළ මට්ටමේ පාඨමාලා කීපයක් කැලණිය විශ්වවිද්‍යාලයේ තිබෙනවා. ඉතාමත් හොඳ මට්ටමේ පාඨමාලා කීපයක් තිබෙනවා. ඒ විධියට මේ මණ්ඩපය පටන් ගෙන තිබෙනවා.

හොරණ ශ්‍රීපාලි මණ්ඩපයට යන ළමයි සියලු දෙනා ඉල්ලුම් කරන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයයි. ඒකත් අමතක කරන්න එපා. මේ ශිෂ්‍යයන්ගෙන් සියයට 90ක්ම ඉල්ලන්නේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය. ඒක ලැබෙන්නේ නැති වන කොට තමයි, දෙවන තෝරා ගැනීම හැටියට හොරණ ශ්‍රීපාලිය ඉල්ලන්නේ. ඒකත් අමතක කරන්න එපා. හොරණ ශ්‍රීපාලි මණ්ඩපය පටන් ගත්ත අරමුණ ඒකයි.

දීර්ඝ කාලීන උසාවි නඩුවෙන් දීපු තීන්දුවෙන් පස්සේ මේක සංගීත හා නර්තන අධ්‍යාපන ආයතනයක් හැටියට පවත්වා ගැනීමේ අවශ්‍යතාව අපට තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, අදත් මේ ආයතනයට අවශ්‍ය සම්පත් කොළඹ විශ්වවිද්‍යාලයත් එක්ක කිසිම ගැළපීමක් නැහැ. කොළඹ විශ්වවිද්‍යාලය වෙනම විශ්වවිද්‍යාලයක්. ඇත්තටම හොරණ ශ්‍රීපාලි මණ්ඩපය අපට පෙනෙන්නේ අරාජික වෙච්ච තැනක් හැටියටයි. ටියුඩර් ඒකට කැමැතියි කියලා මම දන්නවා. එතැන තව දෙතුන් දෙනෙකුත් ඉන්නවා ඒකට කැමැති. අපට විශාල චෝදනා ඉදිරිපත් වෙලා තිබෙනවා. ශිෂ්‍ය ශිෂ්‍යාවන් බරපතළ චෝදනා ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි අපට දැනට පෙනෙන විධියට කොළඹ විශ්වවිද්‍යාලයේ මේ පිළිබඳව තිබෙන සැලකිල්ල ඉතාම අඩුයි. අපි ආචාර්යවරුත් එක්ක කථා කළා. ඒ ආචාර්යවරුත් එක්ක නැවත කථා කරනවා. ඒ ශිෂ්‍යයෝ එක්ක කථා කළා. නැවත මේ ශිෂ්‍යයෝ එක්ක කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි පළමුවැනිම කාරණය තමයි මේක සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අනුබද්ධව පටන් ගත්ත ආයතනයක් වීම. ඒක අමතක කරන්න එපා. ශිෂ්‍යයෝ බලහත්කාරයෙන් ඇවිල්ලා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට කඩා පැනලා කොළඹ නැවතිච්ච නිසා තමයි මෙතැන පොඩි ගැටලුවක් වුණේ. එදා ඒ ශිෂ්‍යයන්ගේ දඩබ්බර ක්‍රියාවට යට වුණා. හැබැයි ඒක යුක්තිසහගත නම්, ඒක හරි නම් ඒක දිගට ගියාට කමක් නැහැ. මේ පිළිබඳව විශ්වවිද්‍යාලය ඇතුළේත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඇතුළේත් විශාල සංවාදයක් තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට පෙනෙන විධියට මේ හොරණ ශ්‍රීපාලි මණ්ඩපය තුළ විල්මට් පෙරේරා මැතිතුමාගේ අවසාන කැමැති පත්‍රය අනුව දීපු නඩු තීන්දුව හරහා මේක සෞන්දර්ය විශ්වවිද්‍යාලයක් නම් මේකේ නැටුම්, සංගීතය හා චිත්‍ර වැනි පාඨමාලා තිබිය යුතුයි. ඒ වාගේම මේක දියුණු කරනවා නම් මේකට අවශ්‍ය සම්පත් සියල්ල තියෙන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ නොවෙයි; සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ. ඔබතුමා කිව්වා මේ ආයතන සේරම එකතු කරනවාය කියලා. එහෙමත් යෝජනාවක් තිබෙනවා. අපි ඒ ගැනත් සලකා බලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යාපනය විශ්වවිද්‍යාලයේ තිබෙන මේ සෞන්දර්ය අධ්‍යයන ආයතන එකතු කරන්න කියලා ටීඑන්ඒ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේදීත් අපට කියලා තිබෙනවා. කොළඹ විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය තුළ මේ සෞන්දර්ය ආයතනය වැඩෙන්නේ නැහැ. මේක සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට ඒකාබද්ධ කරන්න කියා යෝජනාවක් තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේ කැලණිය විශ්වවිද්‍යාලයේ එහෙම යෝජනාවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපට පෙනෙනවා, මේ හොරණ ශ්‍රීපාලි මණ්ඩපයේ විශාල අරාජිකකමක් තිබෙනවාය කියලා. ඔබතුමාට මම කියන්න ඕනෑ, මේ හොරණ ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍ය විෂයයන් ටිකක් දාගෙන පාඨමාලාවක් හදලා තිබෙන බව. හැබැයි මේක නොවෙයි කරන්න ඕනෑ. මේක විශ්වවිද්‍යාලයක්. මේකේ ප්‍රමිතීන්ට අනුව විශ්වවිද්‍යාල උපාධියක් හදාරන්න අවස්ථාව තිබෙනවා. අපි හදිසි වන්නේ නැහැ, ඒ සඳහා කටයුතු කරන්න. විශ්වවිද්‍යාල උපාධියක් ලබා ගැනීම සඳහා අවශ්‍ය සම්පත් කොහේ හරි තිබෙනවා නම් -ලලිත කලා ජනමාධ්‍ය සියල්ලට අවශ්‍ය සම්පත්- එනම් මානව සම්පත සහ භෞතික සම්පත තියෙන ප්‍රධාන තැන තමයි සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය. ඒක නිසා තමයි අපි මේ ගැන මෙහෙම කල්පනා කරන්නේ.

ඒ අතරම මේ විශ්වවිද්‍යාලය තුළ පරිපාලනය ඉතාම දුර්වලයි, දූෂ්‍යයි කියලා තොරතුරු තිබෙනවා. නවකවදය වාගේ දේවල් කිසිම පාලනයකින් තොරව ඉතාම අමානුෂික විධියට තිබෙනවා. මොකද මේ ගැන මව් ආයතනයේ ඇලුම් බැලුම් අඩුයි; සම්බන්ධය අඩුයි.ශිෂ්‍යයෝ ගිහිල්ලා සම්පූර්ණයෙන් පෞරුෂත්වය කඩලා දමන මට්ටමක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ලිංගික අල්ලස් පිළිබඳව ඔය සමහර ආචාර්යවරුන්ට විරුද්ධව ශිෂ්‍යාවන් අපට චෝදනා -පැමිණිලි- ඉදිරිපත් කරලා තිබෙනවා. මම ඔබතුමාට ඒ ගැන කියන්නම්.

ලිංගික අල්ලස් ඉල්ලූ බවට ඔය විශ්වවිද්‍යාලයේ සමහර ආචාර්යවරුන්ට චෝදනා තිබෙනවා. පෞද්ගලික හේතූන් මත සමහර අයට දෙන මහා වරප්‍රසාද, විශේෂ සැලකිලි, පන්ති සාමාර්ථ ආදී මේවා පිළිබඳව චෝදනා ඉදිරිපත් වෙලා තිබෙනවා. එකක් නොවෙයි. ඒ නිසා මේ ආයතනය පිළිබඳව අපි කලබල වන්නේ නැහැ. අපි ඔබතුමන්ලා සමඟ උපදේශක කාරක සභාවේදී මේ පිළිබඳව කතා කරනවා. අපි කලබල වන්නේ නැහැ. නමුත් අපි මේ ප්‍රශ්නය දිහා බලනවා. ටියුඩර් ඇතුළු දෙන්නෙක්, තුන් දෙනෙක් තමයි කලබල වෙලා තිබෙන්නේ. ඒ අයට මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අය අවුස්සපු ළමයි ටිකකුත් ඔතැන

ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අමතක කරන්න එපා, මෙන්න මේ කාරණය. ඔතැනට ගිය ළමයින්ගෙන් එක batch එකක් නොවෙයි, දෙකක් නොවෙයි, තුනක් නොවෙයි, සියලුම ළමයින් බලහත්කාරයෙන් ඇවිල්ලා සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ නැවතුණා. එහෙමයි වුණේ. ඊට පසුව අමුණා ගත්තු කැලි ටිකක් දමා ගෙන තමයි මේ කියන්නේ. හැබැයි අමතක කරන්න එපා, රබීන්ද්‍රනාත් තාගෝර්තුමා ඇවිල්ලා මුල්ගල තියලා මේක හැදුවේ සෞන්දර්ය ආයතනයක් හැටියටයි කියලා.

විල්මට් පෙරේරා මැතිතුමා මේක පටන් ගත්තේ සෞන්දර්ය ආයතනයක් හැටියටයි. එතුමාගේ දේපළ එතුමා දුන්නේ සෞන්දර්ය ආයතනයකටයි. එතුමා කිව්වේ "සංගීතය, නැටුම්, චිත්‍ර යන විෂයයන් මේ ආයතනයේ පටන් ගන්න"ය කියායි. උසාවියේ නඩුවක් ගිහින් තීන්දු කළේත් ඒකයි. ඉතින් මේ සියල්ල තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේක මතු කරපු එක ගැන මම කැමැතියි. නමුත් මේ පිළිබඳව විශාල කලබලයක් ගිහිල්ලා තිබෙනවා. අපි මේ පිළිබඳව අවංකවම බලනවා. කාටවත් මේකේ පෞද්ගලික න්‍යාය පත්‍රයක් නැහැ. කිසි දවසක මේ සෞන්දර්ය ආයතනය හොරණට ගෙනියන්න බැහැ. ඔබතුමා කියපු කාරණය හරියට හරි. එදා ඔබතුමන්ලා විරුද්ධ වුණා වාගේම කවුරුවත් යන්නේ නැහැ. ඒ සෞන්දර්ය ආයතනයේ ළමයින්ට, ඒ සෞන්දර්ය ආයතයේ ආචාර්යවරුන්ට නගරය අවශ්‍යයි; මාධ්‍ය ආයතන අවශ්‍යයි; රූපවාහිනිය අවශ්‍යයි; කලායතන අවශ්‍යයි; ගුවන්විදුලි සංස්ථාව අවශ්‍යයි. ඒ නිසා එහෙම වන්නේ නැහැ. නමුත් මේක ගැන අපි බොහොම විවෘතවයි ඉන්නේ. මට මේ ආචාර්යවරුන් කියපු කරුණු, ඒ ශිෂ්‍යයන් කියපු කරුණු, මේක පිළිබඳව තිබෙන සංවාදය අනුවත් තවමත් අපට පැහැදිලි ස්ථිර හේතුවක් සොයා ගන්න නැහැ, මේක කොළඹ තියා ගන්නේ ඇයි කියන කාරණය ගැන. අපට පෙනෙන්නේ මේක කොළඹට නොගැළපෙන තැනක් විධියටයි.

අපි මේ ගැන තව කතා කරමු. මේකට අවශ්‍ය මානව සම්පත්, මේකට අවශ්‍ය භෞතික සම්පත් තිබෙන්නේ සෞන්දර්ය විශ්වවිද්‍යාලයේයි. මේකට යන්න ඉන්න ළමයි සෞන්දර්ය විශ්වවිද්‍යාලය ඉල්ලා නොතේරෙනකොට ඊට පසුව ඉල්ලලා තමයි මෙතැනට යන්නේ. ඒ නිසා මේ දරුවන්ගේ අධ්‍යාපන පසුබිමත් බලන්න ඕනෑ. ඇත්තයි, මෙතැන ජනමාධ්‍ය පාඨමාලාවක් හදාගෙන තිබෙනවා. හැබැයි එහෙම නොවෙයි. මෙතැන කාලයක් තිස්සේ වැඩිච්ච සෞන්දර්යයට, ජනමාධ්‍යට යන ඒ සියල්ලට අවශ්‍ය මහා සම්පත් ගොඩක් තිබෙනවා. මහාචාර්යවරු, ආචාර්යවරු, වෙනත් පහසුකම් ආදී සියල්ල තිබෙනවා. ඒ නිසා මේ දිහා ප්‍රවේසමෙන් බලා නිවැරදි තීරණයක් ගන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට මම කියන්න කැමැතියි, මේ ප්‍රශ්නයේදී අපට කිසිම දෙයක් වුවමනා නැහැ කියලා. ඉතාම ශක්තිමත් ලෙස අපට හොරණ ශ්‍රීපාලි මණ්ඩපය අනාගතයේදී මේ රටේ තවත් සෞන්දර්ය විශ්වවිද්‍යාලයක් ලෙස වැඩෙන්න අවශ්‍යයි කියන එකයි අපි කියන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.36 ට, 2011 ජූනි 21 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 6.36 மணிக்கு பாராளுமன்றம், 2011 யூன் 21, செவ்வாய்க்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 6.36 p.m. until 1.00 p.m. on Tuesday, 21st June, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.